

Hemantha007
For Free Distribution Only

Hemantha007
For Free Distribution Only

*එක දුප්පත් කෙල්ලෙක්*
*පුංචි කුමාරයෙක්ට ආදරය කළා...*
*ඊට පස්සේ ඒ ආදරේ ඒ කෙල්ලගේ ජීවිතයම වුණා...*
*මේ ඒ ජීවිත කතාවයි...*





# 01

නිවසින් පිට වන්නටත් ප්‍රථම මේධාගේ දෑස්වල කඳුළු පිරුණි. මහගෙදරට ආවේ මොන මෝඩකමකටදැයි ඇය සිතුවාය.

මේධා ගේට්ටුවෙන් පිටතට ආවේ ත්‍රීවීලරයක් වත් අල්ලා ගන්නට සිතාගෙනය. පාර පුරා තද අව්වය.

ඇය පාර අයිනේ බලාගෙන උන්නේ කෙල්ලවද පපුවට තුරුල් කරගෙනය. සක්විති ගිය ගමන නොගොස් යළි මහගෙදරට ආවේ මොනවද්දේ දනී මෙනි. මේධා පාර අයිනේ දුවවද තුරුල් කරගෙන බලා සිටිද්දී ඔහුගේ පපුවම ඇකිළී ගියේය.

ගැණිගේ ඇස්වල කඳුළු බව සක්විති ඇතදීම දුටුවේය. සක්විතිගේ වාහනය දකිද්දී මේධාගේ සිතට සැනසීමක් දැනුණි. එහෙත් පපුවෙන් ආ දුකට කඳුළු අලුත් විය.

˙ඇ..යි බ..බා මේ...˙

සක්විති වාහනයෙන් බැස දුවගෙන විත් ඇසුවේය.

˙ගෙ..ද..ර ය..න්...˙

මේධා කීවේ කට ඇද කරගෙනය. සක්විති ඇයව වත්තන් කරගෙන මෙන් වාහනයට නංවා ගත්තාය.

'ම..ට..යි කෙ..ල්ලටයි දෙන්නටම මේ ගෙදරින් කළේ එ..කම දේ... මං ආයෙත් මේ ගෙදරට පය තියන්නෑ මහත්තයෝ... කවදවත් නෑ...'

මේධා කීවේ අඬමිනි.

'ඒ..ත් මං කවදහරි මල්ලිවයි කෙල්ලවයි එකතු කරනවා.. කරනවමයි...'

මේධා කීවේ ඇස් ගිනියම් වෙද්දීය.

පපුව තවමත් දෙදරන්නාක් මෙන්ය. මෙහෙම කළේ තමන්ගේම අය නොවේදයි සිතෙද්දී මේධාට ඉහිලුම් දෙන්නේ නැත.

'ම..ට මේ කොල්ලව සනීප කරගන්න මාස තුන හතරක් දෙන්න බබා... ඊට පස්සේ අපි මේ ඔක්කොම දලා යන්...'

සක්විති අසරණ බව මේධා දනී. වැඩියක්ම ඔහු අසරණව ඇත්තේ විමුක්ති නිසාය.

'මටත් කොහොමත් දන් මේ රටේ ඉන්න හිතෙන්නෑ... යන්න තියෙන එකම දුක මේ කොල්ලයි කෙල්ලයි...'

'මල්ලිව මං සනීප කරනවා... ඊට පස්සේ එයා ගන්න තීරණයක් ගනී...'

'අපි ඔක්කොම අමතක කරන දෙයක් තියෙනවා මහත්තයෝ...'

'මොකක්ද...'

'කෙල්ල අද හෙටම දරුවෙක් බිහි කරනවා... ඒ බිහි කරන්නේ මොරගොඩ පවුලේ දරුවෙක්... මල්ලිගේ දරුවෙක්... එහෙම නෙමේ කියලා කියන්න බෑ... අපි කොහේ ගියත් යන්නෝන ඒ ඇත්ත මල්ලිට කියලා...'

සක්විති හිස වැනුවේ මේධා කියන්නේ ඇත්ත නිසාය. සක්විතිගේ දරුවෙක් ඇරෙන්නට වෙන කාගෙවත් දරුවෙක් කෙල්ලගේ බඩට එන්නට විදිහක් නැත.

'කෙල්ලට තිබ්බා අපි ළඟටවත් එන්න...





'එන්න තත්වයක් නෑ මහත්තයෝ... අපි කෙල්ලගේ පැත්තෙනුයි හිතන්නෝන... අපි කවුරුවත් ඒ ඇත්ත පිළිගන්න එකක් නෑ කියලා හිතනවා ඇති... ඒ ඇත්ත කවදහරි පිළිගන්නේ ඒකිගේ කොල්ලා විතරයි කියලා ඒකි දන්නවා... ඒකයි හැංගිලා ඉන්නේ...'

'අම්මා අපිට මෙහෙම කරන්නේ අපි මල්ලිවයි කෙල්ලවයි එකතු කරයි කියලා බය නිසා...'

'ඒක..ම..ත් නෙ..මේ... මේ ඔක්කොම පිටිපස්සේ හිමාලි ඉන්නවා... ඒකිට මේක ස්වීප් එකක් ඇදුනා වගේ... අද ගෙදරින් එළියට යද්දී මෙච්චර වාහන තියෙන ගෙදර අම්මා යන්නේ කොහොමද කියලා ඇහුවේ නෑ... මේ දරුවා ගැනවත් එයා හිතුවේ නෑ... එයා එච්චර වියරු වැටිලා ඉන්නේ ඇයි කියලා ඔයාට හිතන්න බැරිද...'

සක්විති අසරණව මේධා දෙස බැලුවාය.

'අම්මා මහත්තයෝ හිමාලිගෙන් මත්වෙලා... එයා හිතන්නේ තාත්තගේ නංගිගේ දූවට වඩා එයාගේ පැත්තේ නන්දනීගේ දූව හොඳයි කියලා... ඒ දෙන්නගේ මොකක්ද තියෙන වෙනස... කෙල්ල තාත්තගේ පැත්තේ... හිමාලි අම්මගේ පැත්තේ... දෙන්නම දුප්පත්... ඒ පවුල් දෙකේම තාත්තලා නෑ... අම්මලා විතරයි ඉන්නේ... අද හිමාලිව ඔළුව උඩ තියාගෙන ඉන්න අම්මට ඒක තේරෙන්නෑ... තේරුණත් කෙල්ල මොරගොඩ පරම්පරාවෙනෙ... ඒකිට දෙන්න කැමති නෑ... ඒත් අම්මා මහත්තයෝ ලොකු නාඩගමක් නටයි...'

'අපි යන්නේ ඒක තමා බබා... අම්මට ඒ නාඩගම කරගන්න දීලා... මල්ලී මේ ප්‍රශ්න වලට උත්තර හොයා ගනී... කෙල්ලගේ බඩේ ඉන්නේ උගේම දරුවෙක් නම් ඌ සටනක් කරන්නම එපැයි... කෙල්ලවයි දරුවවයි අනාථ කරන්න බැනේ...'

'ම..ල්..ලි..ට ලේසි වෙන්නෑ...'

මේධා කීවේ බියමුසුවය.

'ම..ට..යි කෙ..ල්ලටයි කවදාවත් ඔය පවුලෙන් සාධාරණය ඉටු වෙන්නෑ... ඕන වෙලාවක කතා කරන්න... මං රට යන්න එන්නම්...'

මේධා කතාව අවසාන කරමින් කීවාය. මේ ප්‍රශ්නවලට කොහොමත් උත්තර නැතැයි සක්විතිට සිතුණි.

*   *   *   *   *   *   *   *   *   *   *   *   *   *

විමුක්ති උන්නේ කාමරයේය. ඇඳ මත ඉඳගෙන උන් ඔහු එකවරම නැගිට්ටේ යමක් සිහි වූවාක් මෙනි. එහෙත් ඇඳෙන් නැගිටිද්දී යළිත් ඔහුට තෝන්තු ගතියක් දනුණි. විමුක්ති ඇඟිලි තුඩුවලින් නළලත මිරිකා ගත්තේය. ඔහු කාමරය පුරා ඇවිද්දේ පුදුමාකාර ලෙසිනි.

එකවරම විමුක්ති ඔහුගේ අල්මාරිය ළඟ නැවතිණි. එය විවෘත කරන ආකාරය පවා ඔහුට මතක තිබුණේ නැත. විමුක්ති අල්මාරි දොර අතින් තද කළේය. එය තල්ලු කළේය.

ඊටත් පසුව කේන්තියෙන් මෙන් එයට ගැසුවේය. කොල්ලාගේ මුහුණ පුරා තිබුණේ වෙහෙසබර අසරණ බවකි.

කාලයකට පසු අනුලා විමුක්තිගේ කාමරයට ආවේ ඒ මොහොතේදීය. විමුක්තිව දකිද්දීම අනුලාට අමුත්තක් දනුණි.

'පු.. පුං..චි ම..හ..ත්..ත..යෝ...'

අනුලා කතා කළේ විමුක්තිගේ දහදිය ගලන මුහුණ දෙස බලාගෙනමය. කොල්ලා අද ඇත්තටම අමුතු යැයි අනුලාට සිතුණි.

'ඇ..යි පුංචි ම..හත්..තයෝ... මො..නාද හොයන්නේ...'

විමුක්ති බැලුවේ අසරණවය.

'ම්... මේ දඩියත් දලා...'

අනුලා ඇගේ දැතින්ම විමුක්තිගේ මුහුණේ වූ දහදිය පිසදැම්මාය.

'අල්මාරිය අරින්නද ඕ..න... ම්...'

විමුක්ති මොනවද කියන්න උත්සාහ කළේය. එහෙත් ඔහුගේ





මුවින් කිසිවක් පිටවූයේ නැත. 'අනේ දෙයියනේ මොනවද කියන්න හදන්නේ...'

'මො..නා..ද ඕ..න ම්... මෙ..න්න මං ඇරියා... බලලා පෙන්නන්න... මං අරන් දෙන්නම්...'

අනුලා ආදරයෙන් කීවාය. විමුක්ති ඇරුණු අල්මාරිය දෙස බලාගෙනම උන්නේය. 'අල්මාරිය අරින්න යන්නැත්තේ මොකක් හරි මතක් වෙලා...' අනුලා සිතුවාය. 'ඒත් මොනවද...'

අනුලා අල්මාරිය දෙස පරිස්සමින් බැලුවාය. එක තට්ටුවක ඇඳුම් යට වූ ඇල්බමය ඇය දක්කේ එවිටය. 'හෙව්වේ ඒක වෙන්න බැරිද...' අනුලා කුතුහලයෙන් එය අතට ගත්තාය.

අනුලා ඇල්බමය අතට ගත්තේ විමුක්ති දෙස බලාගෙනමය. ඇල්බමය දකිද්දීම විමුක්තිගේ මුහුණේ වූ වෙනස අනුලා දක්කාය.

'මේ..ක..ද පුංචි ම..හත්තයෝ හෙව්වේ...'

විමුක්ති සිනාසුණේ පොඩි දරුවෙකු ලෙසිනි. අනුලාගේ බඩ පපුව දගෙන ගියේය. 'මෙකේ කෙල්ලගේ පින්තූරත් තිබ්බා...' අනුලාට සිහිවිය.

'ම්.. අපි ඇඳ උඩ වාඩිවෙලා බලමු...'

අනුලා ඇඳ මත ඔහුව වාඩි කරවා හිස අතගෑවේය. විමුක්ති ඇල්බමය විවෘත කරන්නට ගියේ වැරදි පැත්තෙනි.

'මේ පැත්තට... ම්.. දන් හරි.. අපි බලමු...'

අනුලා එකින් එක පිටු පෙරලුවාය. ඒ ඇල්බමයේ මුල් පිටුවල තිබුණේ විමුක්ති පිටරටදී ගත් පින්තූරය.

'මේ පුංචි මහත්තයා පිටරට ඉගෙන ගන්නකොට ගත්ත ඒවා... මේ සුදු යාළුවෝ... මතක නෑ...'

ඔහුගේ මුහුණ අසරණය.

'මේ තියෙන්නේ... පුංචි මහත්තයගේ බුක් ෂොප් එක ඕපන් කරද්දී ගත්තු පින්තූර...'

විමුක්තිගේ දෑස් ඒ පින්තූර මත වේගයෙන් දුව යනු අනුලා

බලා උන්නාය. 'කාවද හොයනවා... අනේ කෙල්ලව මතක් වෙලා වත්ද...'

අනුලා ඇල්බමයේ පිටු පෙරළමින් වර්ෂා පෙනී ඉන්නා පින්තූරයක් සෙව්වාය. 'පින්තූර බාගෙට බාගයක් ගලවලානේ... මේ සමහර පිටු හිස්...' අනුලා ඉක්මනට පිටු පෙරලුවාය. එහි වූ එක පින්තූරයක වත් වර්ෂා උන්නේ නැත. 'එකත් එකටම අර ගෑණී මේ පින්තූර ගලවලා අයින් කරන්න ඇති... එයා... මේවා ඔක්කොම අදිනවනේ...' අනුලාට හීල්ලින.

'කා..ව..ද පුං..චි මහත්තයෝ හෙ..ව්වේ...'

අනුලා කරුණාබරව ඇසුවාය. විමුක්ති අසරණ දෑසින් ඇල්බමය දෙස බලා උන්නේය. ඔහුගේ ඇස්වල වූයේ බලාපොරොත්තු සුන් වූ බවකි.

'අනුලාට කවුද කිව්වේ ඔය ඇල්බම් පුංචි මහත්තයට පෙන්නන්න කියලා.. ආ...'

හිමාලි එකවරම කාමරයට පැමිණ අසද්දී අනුලා උඩ ගොස් බිම වැටුණී. ඒ තරම් සැරට මේ ගෙදර කිසිවෙක් කතා කර නැත.

'ක..වු..රුවත් කි..ව්වේ නෑ... මං එද්දී පුංචි මහත්තයා ඒක අරගෙන බලනවා...'

අනුලා කීවේ තරමක කේන්තියකිනි.

'දෙනවා ඕක මෙ..හෙට... මෙතන විකාර නටන්න ලෑස්ති වෙන්නෙපා...'

හිමාලි ඇල්බමය ඇද්දය. එහෙත් විමුක්ති එය දැතින්ම අල්ලා ගත්තේය. අනුලා ඒ දෙස බලා උන්නේ යටි සිතෙන් සිනාසෙමිනි. 'හිතන් ඇති කෙල්ලගේ පින්තූර ගැලෙව්වා කියලා පුංචි මහත්තයට කෙල්ලව අමතක වෙයි කියලා... ඒකි ඉන්නේ මේකගේ පපුවේ...' අනුලා සිතින් කීවාය.

විමුක්ති හිමාලි දෙස බලා උන්නේ අමුතුම ආකාරයකටය. අනුලා ඉදිරියේ විමුක්ති එසේ බලද්දී හිමාලිට අපහසුතාවයක් දැනුණි. හිමාලිගේ පපුව රත්වූයේ තමා දෙස එහෙම බලා උන් විමුක්ති





අනුලා දෙස බලා ආදරයෙන් සිනාසීමය. 'මූන්ව මෙයාගේ ළඟට වත් ළං කරන්න නරකයි...' හිමාලි සිතුවාය.

'අනුලට මෙතන වැඩක් නෑනේ... ගිහින් කුස්සියේ වැඩක් බලාගන්නවා...'

ඒ වචනවලට අනුලාගේ පපුව රිදුනේ නැත. ඇයට අද ඇත්තටම සතුටුය. කොල්ලාට හොඳ වෙන්නට පටන් ගෙන ඇතැයි සක්විති කී කතාව ඇත්ත බව අනුලාට තේරුණේ මේ දන්ය.

'විමුක්තිම හිතලා ඇල්බම් එක ගත්ත නම් ඒක හොඳ දෙයක් වෙන්න බෑ...' හිමාලි සිතුවේ තවමත් ඇල්බම් එක අල්ලාගෙන ඉන්නා විමුක්ති දෙස බලාය.

'අපි බැල්කනියට ගිහින් පාර බලමු... ම්... දන් ඕක තියන්න...'

හිමාලි කීවේ විමුක්තිගේ පිටට බර වීය. ඇය එහෙම බර වන්නේ ඇගේ මුළු පපුවම ඔහුගේ වතට තද වෙන්නට තබාගෙනය.

'යං... එ..න්..න..කෝ...'

විමුක්ති ආවේ නැත. හිමාලි තරමක් තැති ගත්තාය... 'මෙහෙම ගිහින් සිහිය ආවොත් මගේ හීන ඔක්කොම ඉවරයි... සිහිය එන්න කලින් එයා මට ගොඩාක් ළං වෙන්න ඕනේ... ගො..ඩා..ක්...' හිමාලි සිතුවාය.

'අද ඉඳලා මං ඔයා එක්කම නිදගන්නවා... ඔයාව මගෙන් ඈත්වෙලා යන්න මං ඉඩ තියන්නෑ...'

හිමාලි සිතුවාය. 'අර බැල්ලිව ඔළුවෙන් අයින්ම වෙලා යන විදිහට එයාට ළං වෙන්න ඕනේ...' හිමාලි දැඩි තීරණයක් ගත්තාය. සියල්ල හොඳ අතට හැරෙද්දී කොතනක වත් කොස්සක් තබාගත යුතු නැත.

'නැන්ද ඇරෙන්න අනිත් ඔක්කොම උන්ට ඕනෙ වෙලා තියෙන්නේ විමුක්තිව අරකිටම දෙන්න... ඒකිත් මේ කොහේ හරි ළඟකම ඇති... සක්විති එළියට අරන් ගියාම ඒකිට ගිහින් පෙන්නනවද දන්නෑ...'

හැම දෙයක් ගැනම දන් පරිස්සමින් සිටිය යුතුය. අමාරුම දේ විමුක්ති මේ ඉන්නා තත්වෙන් ඉදිද්දීම විවාහ වන්නට බැරි කමය. විවාහ උනද ඒ විවාහය වලංගු නැත. කෙනෙක්ගේ සිහිය නරක තත්වයේ තිබියදී කරනා කියනා දේවල් නීතියෙන් වලංගු ඒවායැයි පිළිගන්නේ නැත.

*   *   *   *   *   *   *   *   *   *   *   *

මේධා දිගටම කල්පනා කළාය... එද අවසන් වරට ඇය කෙල්ලව දක්කේ අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධි මළුවේදීය. එද සිට දවස් බලද්දී දන් ඒ බඩට මාස නමයක් පිරී ඇතැයි මේධාට නිකමට සිතුණි. ‘එද දකිද්දී තිබ්බේ මාස හතරක පහක බඩක්...’ මේධා සිතුවාය.

ඇය මේ සිතන්නේ කෙල්ල කොහේ ඉන්නවා ඇත්ද කියාය. කෙල්ලව දක්කේ අනුරාධපුරයේදීය. ඒ ප්‍රියංවද සමහය. කෙල්ල ඉන්නේ කොළඹ නම් ඇය මෙපමණ කරදර තියාගෙන අනුරාධපුර යන්නේ නැත. ඇරත් ප්‍රියංවද සමහ තනිවම යන්නේද නැත.

රත්නපුර ඉන්නවා නම් කෙල්ල යන්නේ මහ සමන් දේවාලයටය. වැඩිම උනොත් මාළිහාවටය. බඩකුත් උස්සාගෙන අච්චර දුර යන්නේ නැත.

‘කෙල්ල ඉන්නේ අනුරාධපුර අවට වෙන්න බැරිද...’

මේධා සිතුවාය. කෙල්ල එද පැමිණ උන්නේ වට්ටිත් ඔසවාගෙන මහ බෝධියේ බෝධි පූජාවක් කරන්නටය.

‘කෙල්ල ඉන්නේ අනුරාධපුර අවට නම් ඒ අවට තියෙන ක්ලිනික් එකකට තමා කෙල්ල යනවා ඇත්තේ... ඒ පැත්තේ බබෙක් ලැබෙන්න ප්‍රයිවට් ක්ලිනික් නෑ මේ කොළඹ වගේ...’

මේධා සෑහෙන වේලාවක් සිතුවාය. අවසානයේ ඇය දුවව කොට් එකේ තබා නැගිට්ටේ දෙයක් සිතාගෙනය.

‘කොහොම හරි කෙල්ලව හොයා ගන්නවා... ඇත්තටම අපි





පහුගිය කාලේ උත්සාහ කළේ නෑ... කළා නම් කෙල්ලව හොයාගෙන... ඒකි මේ දරුවා ලැබෙද්දී හොස්පිට්ල් එකටම පංචායුදේ එච්චා... ඒත් අපට බැරි උනා කෙල්ලව හොයාගන්න... මේ රට හරි පුංචි රටක්... කෙනෙක් හොයාගන්න අමාරු නෑ...’

මේධා දහ අතේ සිතුවාය. වටයක් දම්මොත් අඩුම ගණනේ කෙල්ල ගැන හෝඩුවාවක් වත් සොයා ගත හැක.

‘සක්විතිවත් කතා කරගෙන යනවා... උන් දෙන්නගේ ජීවිතේට මෙහෙම වෙන්න දෙන්න බෑ... කොහොමත් බෑ... මට මහ ගෙදර නැති උනත් කමක් නෑ... මේ පින්කම කරලා...’

මේධා දඩි තීරණයකට ආවාය. ඇය සිතින් සිහි කළේ නාලනී නැන්දවය. ‘හීනෙන් වත් ඇවිත් කෙල්ල ඉන්න තැනක් පෙන්නන්න... අඩුම ගානේ ඒකිට පිහිට වෙන්නවත්...’ මේධා සිතින් නාලනීට කීවාය.

සක්විති හදන්නේ මේ සියල්ල දමා රට යන්නටය. ඔහුත් දුවත් සමහ අපායට යන්නට වුව මේධා සූදානම්ය. එහෙත් ඒ යන්නට පෙර මේ කෙල්ලත් කොල්ලාත් වෙනුවෙන් මේ යුතුකම ඉටු කරන්නට ඇයට ඕනය.

‘ඒත් කෙල්ලව හොයා ගත්ත කියලා ප්‍රශ්න නැති වෙන්නෑ...’

එහෙත් අඩුම ගණනේ කවදක හෝ විමුක්තිට සිහිය ආ දට මේ සියල්ල ඔහුට කිව හැක.

‘ඉතුරු ටික මල්ලි බලා ගනී... කෙල්ල සමහර විට හැංගිලා ඉන්නේ දරුවත් හදගෙන තනියම ඉන්න වෙන්න ඇති... ඒත් උන් දෙන්නා ආදරේ කරපු විදිහට එහෙම හිතන්න අමාරුයි...’

වර්ෂාගේ ඇහේ ඉන්නේ විමුක්තිගේම දරුවෙකැයි තමාට සිතෙන සිතිවිල්ල පුදුමාකාරයැයි මේධාට සිතෙයි. ‘එහෙම නැත්නම් ආදරේ බොරුවක්...’ මේධා සිතුවාය.

ප්‍රශ්න විසඳුනේ නැතත් කෙල්ලව හමුවේ නම් සිතට සැනසීමකි. අඩුම ගණනේ ඇය ඉන්නා තත්වය බලා පිහිටක් විය හැක.

කෙල්ල කොතරම් අසරණ තත්වයකට වැටී ඇත්දැයි මේධාට සිතාගත හැක. 'ප්‍රියංවදත් දුප්පත් කෙල්ල...' ඇයට පිහිට වෙන්න ඇත්තේ ඇයය.

'කෙල්ල ඉන්නේ මේ ඔක්කොම දැනගෙන හිත හදාගෙන නම්... කෙල්ලට එහෙමම ඉන්න දෙන එක නේද හරි... මේ ගිනි ගොඩ ඒකිගේ පපුවේ ආයේ මොළවන එක හරිද...'

මේධා අනිත් අතට සිතුවාය. කෙල්ල මේ වෙන සියල්ල දන්නවා ඇත. දැනගෙනත් ඇය හැංගී ඉන්නේ හේතුවක් ඇතුවය.

'ඒත් කෙල්ලගේ බඩේ ඉන්න දරුවා... ඒ දරුවා විමුක්තිගේ නම්...'

පපුව හිරි වැටීගෙන යන්නේ එහෙම සිතද්දීය.

'ඔක්කොම අවුල් කළේ හිමාලි... මංජුලා මල්ලී අසනීප වෙනවත් එක්කම අයින් වෙලාම ගියා වගේ... එහෙම උනා නම් මේ ප්‍රශ්නේ කාලයට බාර දෙන්න තිබ්බා... ඒත් දැන් බෑ...'

හිමාලිව මහ ගෙදරින් අයින් කරන්නට හිතන්නවත් බැරිය. සුරම්‍යා ඉන්නේ ඇයව හිසේ තියාගෙනය.

'ඉගෙන ගන්න ආපු කෙනා කැම්පස් එකත් අතෑරලා ඉන්නේ ඊට වඩා පිදේනියක් හම්බ වෙන නිසා...'

මේ ප්‍රශ්නය කතා කරන්නට ඉන්නා හොඳම කෙනා විමුක්තිය. එහෙත් ඔහු තව කී කාලයක් ඔහොම ඉදීදැයි දන්නේ දෙවියන්ම පමණී.

•





# 02

අම්මිව බලන්න ඉක්මනට එන්න රත්තරන්...' වර්ෂා අමාරුවෙන් කුස අතගා කීවේ කුසේ ඉන්නා දරුවාටය. වෛද්‍යවරිය අමාරුවෙන් කුස අතගා කීවේ අනිද්දය. එහෙත් ඊට කලින් අමාරු රෝහල් ගත වන්නට කීවේ අනිද්දය. එහෙත් ඊට කලින් අමාරු වේයැයි වර්ෂාට සිතෙන තරම්ය. පිටකොන්ද ඇවිලීගෙන මෙන් එකවර වේදනාවක් එයි. එහෙත් ඒ වේදනාව විළි රුදුව නොවන බව වර්ෂා දනී.

'බලන්නකෝ ඔයා එනකොට අපේ තාත්තිට වෙලා තියෙන දේ... හරි දුකයි... මේ වගේ දවස්වල ඔයාගේ තාත්ති මං ළඟ උන්නනම් එයා මටත් වඩා ආසාවෙන් ඉදී...' මෙහෙම සිතෙද්දී ඇවිලෙන්නේ වර්ෂාගේ කොන්ද නොවේ. පපුවය.

වර්ෂා අවසාන වරට ඔහුව හමුවූ දිනය සිහි කළාය. ඒ කළුගං මෝය අසබඩ නිකේතනයේදීය. මේ පුංචි පැටියා කුසේ පිළිසිඳ ගන්නට ඇත්තේ එදාය. 'එදා ඔයා මගේ බඩට ඇවිත් කියලා නිකමටවත් මට හිතුණේ නෑ... ඔයාගේ තාත්තිත් හිතන්නේ නැතුව ඇති...' වර්ෂා සිතුවාය.

වර්ෂා ඇඳෙන් නැගිට නිවස පුරා ඇවිද්දේ ඉඳගෙනම ඉඳිද්දී කොන්ද ඇවිලෙනවා වැඩි නිසාය. අඩි දෙක තුනක් ඇවිද ගොස් ඇය යළිත් නැවතී කොන්ද අතගායි.

'අ..මා..රු..ද මැණික...'

අම්මා පැමිණ ඇසුවේ කෙල්ලගේ කොන්දට අතක් තබාගෙනමය. වර්ෂා හතියෙන් මෙන් සිනාසුණාය.

'ටි..ක..ක් කොන්ද දිගේ ගින්දරක් වගේ එනවා අම්මේ...'

'ළං වෙද්දී එහෙම තමයි... අමාරුවෙන් හරි ටිකක් ඇවිදින්න... නැත්නම් දරුවා එද්දී අමාරුයි...'

කොච්චර වේදනාවක් දනුණත් කමක් නැත. පැටියාගේ මුහුණ දුටු පසු ඒ වේදනාව යනු ඇත.

'ප්‍රියා ආ..වද අම්මේ...'

'එයා එළියට ගියාම එහෙමයි... දරුවට ඕන කරන ඔක්කොම උස්සගෙන එයි දන්...'

'ප්‍රියාටයි අම්මටයි පින්...'

'මොනවද මේ කියන්නේ... මේ එන්නේ අපි ඔක්කොමගේ දරුවා...'

දෙවියන් ජීවිතයට මේ සෙනෙහස ළං නොකරන්නට අද දවස කොතරම් පාළුවෙන් තනිකමෙන් ගත කරන්නට සිදු වෙනවාද... එසේනම් ජීවිතයේ මේ දුෂ්කර මොහොතට මුහුණ දෙන්නට වන්නේ තනිවමය.

'අදයි හෙටයි හොඳට නාලා එහෙම බත් ටිකක් කාලා හවසට උඩ මළුවට ගිහින් මලක් එහෙම පූජ කරලා ඉමු... දෙයියන්ගේ පිහිටෙන් කරදරයක් නැතුව දරුවා බිහි වෙන්න කියලා බාරයක් වෙමු...'

'ම්...'

'පපුවත් බරයි වගේද...'





'ඕ..ව් අම්මේ... එයාගේ කුක්කු පිරිලා වගේ...'

වර්ෂා පිරී ආ ඇගේ කිරි බර ළමැද අම්මාට පෙන්නුවාය.

'අම්මත් කොහේ හරි ඉඳගෙන ඔයා දිහා බලාගෙන ඇති... මාත් නාලනී නංගිව හීනෙන් දැක්කා ඊයේ පෙරේද...'

'පැටියා ලැබුණාම අම්මව මතක් කරලා දනයක් දෙන්නෝන අම්මේ...'

'ම්.. ඔක්කොම කරමු... හිතේ දුක් කන්දරා තියාගන්නෙපා... සමහර විට මේ එන දරුවා ඔක්කොම ප්‍රශ්න විසඳයි...'

එහෙම වෙනවා නම් කොතරම් හොඳද... දරුවන් එවන් වාසනාවන් ගෙනෙන බව වර්ෂාද අසා තිබුණි. 'මට මොනවත් එපා... ඔයාගේ තාත්තිව අපි ළඟට ගෙන්න ගන්න... ඒ ඇති...' වර්ෂා උපදින දරුවාට කීවාය.

'මං තේකක් හදගෙන එන්නම්... උයන්න ගත්තෙත් නැත්තේ මේ කෙල්ල උයන්න මොනා හරි උස්සගෙන එයි කියලා...'

මේ දවස් ටිකේම ප්‍රියංවද අරහෙට මෙහෙට දුවමින් මාළු කොස් පලා හොයාගෙන ආවාය. ඒ වර්ෂාට රහට බත් කටක් හද දෙන්නටය. වර්ෂා පද්ද පද්ද ඇවිදගෙන ගොස් ඇඳේ බඩද දිගා කරගෙන ඉඳ ගත්තාය. 'සෙනසුරාද උදේ වෙද්දී ඔයා ඉපදිලා... අම්මිගෙන් සූස් සූස් ගගා කුක්කු බොයි...' මේවා සිහි කරද්දී වර්ෂාගේ දෙනෙත් කඳුළින් තෙත්වීගෙන යයි.

'අපේ තාත්ති කවදහරි අපට ලැබෙයි... ඔයයි මායි එතකල් බලන් ඉමු... අපේ තාත්තිට අපි නැතුව ඉන්න බෑ... දන් තාත්ති අසනීප වෙලානේ... නැත්නම් එයා රට පුරාම අම්මිව හොයනවා... අම්මිටත් බැරි වෙයි තාත්ති ළඟට නොයා ඉන්න...'

වර්ෂා ඇඳ උන් ඇඳුම යටින් අත දමා සිතින් මිමිණුවාය.

'කවදහරි ඔයාගේ තාත්තා මටයි ඔයාටයි ඇවිත් කතා කරයි... සමහර විට එයා අපි දෙන්නවත් එක්කගෙන රටකට යයි... ඒත්

කමක් නෑ... තාත්ති ඉන්නවනම් අපි දෙන්නට කොහේ උනාම මොකද...'

ඔහොම සිතමින් සිටිද්දී වර්ෂාගේ දෙනෙත් එහෙමම පියවීගෙන ගියේය... 'හී..නෙ..න්..ව..ත් එ..න්..න ර..ත්..ත..රන් මං ළඟට...'

*  *  *  *  *  *  *  *  *  *  *  *

සක්විති මහ ගෙදරට ආවේ පාන්දරමය. ඔහු එද්දී නිවසේ ඇහැරී උන්නේ අනුලාත් තනූජාත් පමණි.

'සු..දු මහත්තයා... අද පාන්දරම...'

'ආ.. චූටික්කිත් අද ඇහැරිලා...'

සක්විති අනුලා අතේ උන් කිරි කැටි සිහිත්තියගේ පුංචි අතක් අල්ලා ගත්තේය.

'අපේ කෙල්ලත් පාන්දරම ඇහැරෙනවා... මේධගේ තනේ එල්ලිච්ච ගමන්... ගෑණිට වැඩක් කරගන්නවත් නෑ...'

'අ..නේ මේධා නෝනට උදව්වටවත් කෙනෙක් නැනේ...'

'අපි ඔක්කොටම උදව්වට හිටියේ එක්කෙනයි...'

සක්විති කීවේ දුකෙනි. අනුලාද සෝ බරව හිස වැනුවාය.

'තනූජා... කෙල්ලේ අද උදෙන්ම කෑම ටික ඕන...'

'හා සුදු මහත්තයා...'

'උදෙන්ම ඩොක්ටර් ගාවට යන්නද සුදු මහත්තයා...'

'මං හිතුවේ අනුලක්කේ කොල්ලව ටික දවසක් බුක් ෂොප් එකට එක්කං යන්න... ඒකට පුරුදු තැනනේ...'

'ඒක හොඳයි... මාත් ඊයේ පුදුම දෙයක් දක්කා...'

අනුලා ඇල්බමයේ කතාව සක්විතිට කීවාය.

'ගෑණි කෙල්ලගේ පින්තූර ඔක්කොම ටික හංගලා...'





'මේකගේ පපුවෙනෙ අක්කේ කෙල්ල ඉන්නේ...'

'මා..ත් හිතුවේ ඒකයි... මෙයා නිකං ඇවිස්සිලා දඟලනවා...'

අනුලා සුද්ද සිංහලෙන්ම කීවාය. තනූජා සිනාසුණේ මුව තද කරගෙනය.

'මේධා ආයෙත් මෙහේ එන්නෑ අනුලක්කේ... ඔය ධනේ අයියා එක්ක පාරට යන වෙලාවක ගිහින් එන්න ඒ පැත්තේ... ගෑණිත් හරි පාළුවෙන් ඉන්නේ...'

'මං දන්නවා සුදු මහත්තයා... මේ ගෙදරට කොහොමත් හොඳ ගෑණු යා දෙන්නෑ...'

සක්විති උඩට ගියේ අනුලා කී කතාව සිතමිනි. වර්ෂා අද මේ ගෙදර ලේලිය වූවා නම් මේ ගෙදර අද මඟුල් ගෙයකි.

විමුක්ති උන්නේ නිදිබරවය. සක්විති ඇඳ මත වාඩි වී විමුක්තිගේ වතට අතක් තැබුවේය.

'රෑ මේ ඇඳේ හිමාලි ඉඳලා තියෙනවා...'

සක්විති සිතුවේ විමුක්ති නිදගෙන උන් කොට්ටයට එහා කොට්ටය දෙස බලමිනි. ඒ කොට්ටය මත ගෑණු හිසකේද විය. 'අනුලක්කා කියන්නේ ඇත්ත... එයා ඉන්නේ ඇවිස්සිලා...' සක්විති සිතුවේය. එහෙත් මේ කිසිවකින් වෙන දේ නැවැත්විය නොහැක. විමුක්තිගේ සිහිය ආ දට කෙල්ල ගංවතුරක් සේ කොල්ලාගේ පපුවට එනු ඇත.

'අ..යි..යා...'

විමුක්ති ඇහැරී කීවේය. සක්විතිගේ මුව මත ලස්සන සිනහවක් ඇඳුණි.

'අද රවුමක් දමුද... බුක් ෂොප් එක පැත්තේ ගිහින්... ම්...'

විමුක්ති සිනාසුණේය.

'තේ බීලා නාමු... නාලා ඇඳගමු...'

හිමාලි උඩට ආවේ සක්විති විමුක්තිව නාන කාමරයේ තබාගෙන ඉඳිද්දීය. ඔහු විමුක්තිව නාවන හඬ හිමාලිට ඇසෙද්දී ඇගේ පපුව

රත් විය. 'පාන්දරම නාවලා කොහේ හරි එක්කං යන්න ඔය හදන්නේ...' හිමාලි පහළට ආවේ කර කියා ගන්නට දෙයක් නැතුවය.

ඇය කාමරයට විත් එහෙට මෙහෙට ඇවිද්දේ වටේම ගිනි මෙළවී ඇතුවාක් මෙනි. 'මෙහෙම මෙහෙම අරන් ගිහින් අරකිව පෙන්නනවද කියලා කවුද දන්නේ... එ..හෙම උනොත් මාස හයෙන් නෙමේ දවස් හයෙන් සිහිය එයි...'

'ලොකු අයියා ඇවිත්... අයියව කොහෙද එක්කං යන්න හදන්නේ නැන්දේ...'

හිමාලි උදේම සුරම්‍යාට ගිනි ගෙඩිය දුන්නාය.

'අද ඩොක්ටර් ළඟට එක්කං යනවා ඇති...'

'නැ..න්දේ...'

'ඇයි දුවේ මේ...'

'අයියව... අ..ර ක..ලින් යාළුවෙලා හිටපු කෙල්ල ගාවට එ..ක්..කං යනවද ද..න්නෑ.. නේ..ද...'

හිමාලි ඇවිලවූ ගිනි මෙළය සුරම්‍යාගේ පපුවේ ඇවිලෙන්නට වැඩි වෙලා ගියේ නැත.

'එද මේඩක්කත් මෙහෙන් ගියේ හරි තරහින්... ඒ ත..ර..හ..ට..ත් එ..ක්..ක...'

හිමාලි පෝර දැම්මාය.

'එයත් මේ කොහේ හරි ළඟකම ඇ..ති...'

සුරම්‍යා උඩට ගියේ හිමාලි කියූ දේවල් ගැනම සිතමිනි. සක්විති කොහොම වෙතත් මේධා එහෙම දෙයක් කරන්නට බැරි නැත. 'කෙල්ල කිව්වත් වගේ ඔය බැල්ලි මේ ළඟකම ඇති...' සුරම්‍යා සිතුවේ පිපිරෙමිනි.

සුරම්‍යාට උඩට යන්නට ඉඩක් නොලැබිණි. සක්විති විමුක්තිව ඉස්සර ඔහු පොත් හලට යද්දී මෙන් ලස්සනට සුදු කමිසය අන්ද නිල් පාට ටයි එක දමා හොඳින් මැදූ සපත්තුද දමා කාමරයේ සිට එක්කාගෙන ආවේය.





එය දකිත්ම සුරම්‍යාගේ පපුව උණු වී ගියාය. හිමාලි උඩ බැලුවේ පුදුමයෙනි. ඇය සක්විතිගේ ඇත්ත ලස්සන දක්කේ අදය. අරම අසනීපයක් ඇති පාටක් ඒ මුහුණේ පෙනෙන්නට වත් නැත.

'මෙ..ච්..චර හැඩ කරගෙන... ලොකු පුතා කොහේ මල්ලිව එක්කං යන්නද...'

සක්විති සිනාසුණේය.

'කොහොමද අම්මේ... මල්ලී නිකං සනීප වෙලා ආවා වගේ නේ..ද... තව ටික දවසකින් බලන්නකෝ...'

සක්විති කීවේය.

'තනූජා පුංචි මහත්තයගේ කෑම දන්න...'

හිමාලි සාලයේ උන්නේ බිම බලාගෙනය. 'ඇත්තටම සනීප වෙයි වගේ...' හිමාලි සිතුවේ බඩ පපුව ද යද්දීය.

'කොහෙද ලොකු පුතා යන්නේ...'

'අද ඉඳලා අම්මේ මං මල්ලිව බුක් ෂොප් එකට එක්කං යනවා... ඩොක්ටර් තමා කිව්වේ... කාමරයක් ඇතුලෙම තියන්නෙපා කියලා...'

හිමාලිට හීල්ලින. 'අර ගෑණී බුකෝගෙන යනකොට මට හිතුණා මොනවා හරි වෙයි කියලා...' හිමාලි ඇවිලෙමින් සිතුවාය.

'ඉ..තින් මෙ..හෙම...'

'මාත් ළඟ ඉන්නවනේ අම්මේ... ධනේ අයියට කියන්න කෑම ගේන්න කියලා දවල්ට... ඒ ළමයි එක්ක ඉන්නකොට කොල්ලගේ හිතේ තියෙන තෝන්තු ගතිය යයි...'

සුරම්‍යාට කිසිවක් කියන්නට පුළුවන් වූයේ නැත. ඇයටද ඕනා කොල්ලාව සනීප කර ගන්නටය. සක්විති මේසයට ගොස් ඉඳි ආප්ප ටිකක් බෙදගෙන පරිප්පු ටිකකුත් බිත්තරයකුත් ඊට දමා ගත්තේය.

'අ..ම්මේ...'

'ම්...'

'බුක් ෂොප් එකේ සල්ලි වෙනමම මල්ලිගේ එකවුන්ට් එකට දනවනේ...'

'ඔයා එද කිව්වේ...'

'ඒකේ සල්ලි ටිකක් දැන් එකතු වෙලා තියෙන්නේ... පනහක් විතර...'

'දෙයියනේ ලක්ෂ පනහක්...' හිමාලි සිතුවේ ලෝබකමින් ඇවිලෙමිනි.

'ඉ..තින්...'

'නෑ ඒකට මොනවද කරන්නේ... මං මල්ලිගේ නමින් ඩිපොසිට් එකක් දන්නද... නැත්නම් එහෙමම තියන්නද...'

'එයාගේ සල්ලිනේ... එහෙනම් ඩිපොසිට් කරන්න...'

'ඔව් ඒක හොඳයි...'

'ඔයාට ඕන කමක් තියෙනව නම් ගන්න ඉතින්... මල්ලි මොනවත් කියන්නැනේ...'

'මූන්ට සල්ලි නිකං කජු කිරි වගේ...' හිමාලි සිතුවාය.

'එපා අම්මේ... මං පිරිමහගෙන යනවා... අපට මහ වියදමක් නැනේ...'

සක්විති ඉඳි ආප්ප අනමින් විමුක්තිට කැව්වේය.

'ලොකු පුතා යන්නේ බුක් ෂොප් එකට විතරනේ...'

'ඔ..ව් අ..ම්මේ ඇයි...'

'නෑ... මල්ලිට එක එක්කෙනාව මුණගස්සවලා ආයෙත් මේ සනීප වෙන ඔළුව නාස්ති කරන්න හදන්නෙපා...'

සක්විති අම්මා දෙස බැලුවේ වේදනාවෙනි. අම්මාව මේ තරම්ම විස කරන්නේ හිමාලි බව සක්විති දනී.

'මං අම්මට එදත් කිව්වා... අදත් කියනවා... මං මේ දහදුක්





විඳින්නේ මල්ලිව සනීප කරගන්න... මං සනීප කරලා දුන්නම අම්මා මල්ලි එක්ක කතා කරලා කැමති විදිහට වැඩ කරන්න... මං කිව්වනේ මං ඉන්නෑ කියලා... මේකා මෙහෙම ඉඳිද්දී මට රටකට නෙමේ ගාල්ලට වත් යන්න හිතෙන්නෑ... අම්මා කැමති විදිහට මල්ලිගේ වැඩ කරන්න... ඒවට ඇඟිලි ගහන්න මං ඉන්නෑ... මගේ ගෑණි ඉන්නෙත් නෑ...'

අනුලා කෑම මේසයේ සිට මේ සියල්ල අසාගෙනය. 'මේ පට්ට බැල්ලිව ගෙදරින් පැන්නුව නම් මේ ප්‍රශ්න මොනවත් නෑ...'

'සුදු මහත්තයටත් තේ එකක් ගේන්නද...'

'එපා අනුලක්කේ... මල්ලිගේ කෑම එක හදලා ධනේ අයියා අතේ එවන්න... තනූජට කියන්න මල්ලිගේ කමිස ටිකයි කලිසම් ටිකයි මැදලා තියන්න කියලා...'

සක්විති නැගිට්ටේ එහෙම කියාය. ඔහු නැගිටිද්දී බැලුවේ හිමාලි දෙසය. සක්විති විමුක්තිව වාහනයේ නංවාගෙන යන අයුරු දෙස සුරම්‍යාත් හිමාලිත් දෙරකඩට වී බලා උන්නෝය. 'මම ලස්සනට ගැහුවා...' හිමාලිට සිතුණි.



Hemantha007
For Free Distribution Only

# 03

හිමාලි නුවර යන්නට ඇඳ ගත්තේ යමක් සිතාගෙනය. ඇය මේ ගැන ඊයේ රෑ පුරාවට සිතුවාය. හිමාලි ඇඳගෙන ආවේ සුරම්‍යා වෙතය.

'කොහේ ය..න්..නද පුතේ...'

'මං හි..තුවේ නැ..න්දේ ගෙදර ටිකක් ගිහින් එන්න... ලොකු අයියා අයියව දිගටම බුක් ෂොප් එකට එක්කං යනවලුනේ... ඉතින්...'

'එක පැත්තකින් ඒක හොඳයි දුවේ... අයියට සනීප උනොත් ඉතින් මේ වැඩ ඉවර කරගන්න පුළුවන්නේ...'

'අ..නේ අ..යියට සනීප වෙනව නම් කො..ච්..චර දෙයක්ද... ම..ට දුක ලොකු අයියා මා..වත් ඕ..වලට එකතු කරගන්නැති එක... එ..හෙනම් මාත් යනවනේ... අයියා තාම මං ගැන දන්නෑ... අක්කා දන්නෙත් නෑ...'

'එයාලා කවදහරි තේරුම් ගනී... කවදද එන්නේ...'

'මං හෙට ඉඳලා අනිද්ද එන්නම් නැන්දේ...'





'බස් එකේ යන්න බැනේ... මං වාහනයක් ගෙනල්ලා දෙන්නම්...'

'ක.. ක..ම..ක් නෑ නැන්දේ...'

නුවර යන්නට සුදු කාර් එකක් ගෙනවිත් දෙනවා නම් ඇයද ආසය. දන් බස්වල ගාටන්නට කොහොමත් හිතක් නැත. 'මොරගොඩ පවුලේ ලේලි බස්වල ගියාම එයාලටමනේ නින්දව...' හිමාලි ඇතුලෙන් සිනාසෙමින් සිතුවාය.

හිමාලි ගෙදර ගියේ සුරම්‍යා ගෙනවිත් දුන් ලස්සන සුදු කාරයේ නැඟීය. එහි පිටුපස අසුනට වී යද්දී හිමාලිට දනුණේ පුදුමාකාර ආඩම්බරයකි. 'මේ සැප ජීවිත කාලේ පුරාම තියාගන්නෝන... නැත්නම් වැඩක් නෑ... එහෙම වෙන්නේ විමුක්තිව බැන්දොත් විතරයි... මට රැජිණක් වගේ ඉන්න පුළුවන්... නිකම්ම නිකං හිමාලි වෙලා වැඩක් නෑ...' හිමාලි පසුවෙන නුවර පාර දෙස බලාගෙන සිතුවාය.

හිමාලි අම්මාට ගත්තේ මහදීය.

'මො..නාද ඔයා කරන්නේ...'

'මං මේ ගෙවල් ටිකක් අස් කළා මැණික... ඉතින්...'

'මං මේ නුවර එන ගමන්...'

'ද..න් එ..න..වා...'

'ම්...'

'පුතත් එ..ක්..කද...'

'නෑ අම්මා තනියම...'

'බ..ස් එකේද මැණික එන්නේ...'

'මිහ්.. කා එකේ...'

'හදිස්සියේ...'

'හදිස්සිමත් නෑ... මං ඇවිත් කියන්නම්කෝ.. දවල්ට කන්න මං එනවා හොඳේ...'

'ම්.. එන්නකෝ...'

හිමාලි දුරකථනය වසා දිග කල්පනාවකට වැටුණාය.

'කරන දෙයක් කරන්න වෙන්නේ යන්තර මන්තර ගුරුකම් පැත්තෙන් තමා... මං එන්නේ හොඳ ගුරුකමක් කරගෙන...'

හිමාලි සිතුවාය. ඇයට ගුරුකම් වැඩ හොඳට විශ්වාසය.

'සක්විති පවා මට ඇදිලා එන විදිහට ගුරුකම කරන් එන්නේ... එතකොට කවුරුවත් මට එරෙහි වෙන්න කෙනෙක් නෑ...'

හොඳ ගුරුකම් කරන අය ගැන අම්මා දනී. හිමාලි ආවේ විමුක්තිගේ කේන්දරය පවා කොළයක ලියාගෙනය. එය දවසක් සුරම්‍යා එළියට ගත්තාය. ඇය එය තබා ගිය අතරවාරයේදී හිමාලි නිකමට එය පිටපත් කර ගත්තාය.

කෙනෙක්ගේ කේන්දරයක් ඇත්නම් හොඳට යා දෙන ගුරුකමක් කළ හැක. 'අරකිව එපාම වෙලා යන්න ගුරුකම කරන්නෝන... ඒකි ඔළුවේ නැත්නම් විමුක්ති මට බැඳෙනවා... ඒකිත් ඉන්නවනම් නල්ල මලේ බඩුව වගේ මෙයා ඇදිලා යන්න ඇති...' ඒ දවස්වල මං ආවානම් මං එක්කයි විමුක්ති යාළු වෙන්නේ...' හිමාලි සිතුවේ එහෙමය.

ආදරයක් යනු සංසාර ගතින් සමඟ බැඳෙන බැඳීමකි. ඒවා බැඳෙන්නේ පූර්වාත්මවල කළ කී දෑ අනුවය. ඒ බව හිමාලි ඇත්තටම දන්නේ නැත. කෙනෙකුගේ පපුවේ ආදරයක් පැළ වූ පසු එය වඳ කරන්නට අමාරුය. මැරි මැරීත් ඒ පපුවේ පැළ වන්නේ ඒ ආදරයමය.

ආදරය දුකක් යැයි කියන්නේ මේ රුදුරු තෘෂ්ණාව නිසාය.

'විමුක්තිට සිහිය ආපු ගමන් එයා අරකි ළඟට යන්න පුළුවන්... එහෙම නොයන්නයි ගුරුකම කරන්නෝන... සනීප වෙච්ච ගමන් එයා මාව දකලා මත් වෙන්න ඕන... එකපාරක් මං ළඟට ආවම ඇති... මං සදකල්ම එන විදිහට එයාව පිස්සු වට්ටවනවා...'

හිමාලි අධිෂ්ඨාන කර ගත්තේ එහෙමය.

'ගුරුකම් එකක් නෙමේ... දෙක තුනක් කරගෙන හරි තමා මං එන්නේ... මහ ගෑණිට නම් ගුරුකම් කරන්නෝන නෑ... වශියක් දම්මා වගේ මට ගෑණි වශී වෙලා ඉන්නේ...'





හිමාලි ආවේ එද්දී සුරම්‍යා දුන් රුපියල් විසි පන්දහසද රැ ගෙනය. 'ම්... වියදමට අම්මටත් කීයක් හරි දෙන්න ඕනනේ...' සුරම්‍යා සල්ලි ටික දී කීවාය. 'ඒ ගෙදර සල්ලි උතුරනවා... ඇයි ට්‍රාන්ස්පෝට් එකේ රෝද කැරකෙන ගාණට සල්ලි උතුරනවනේ...'

'ඔයාගේ නම මොකක්ද...'

හිමාලි ඇසුවේ රියදුරාගෙනි.

'මං පුංචි නෝනා අබේපාල...'

'අබේපාල හොඳ තැනක නවත්තන්න තිබහයි...'

'හොඳයි පුංචි නෝනා...'

අද වරකාපොල පනින්නටත් පෙර තිබහ වී ඇත්තේ වෙනදට පිටකොටුවෙන් ගිනි කාෂ්ටකයේ නැග වතුර පොදක් නැතුව නුවරින් බහින හිමාලිටය.

අබේපාල නැවැත්වූයේ තරමක් හොඳ අවන්හලක් ඉදිරියේය.

'ආ.. අබේපාල මට කෝක් එකකුයි කැන්ඩොස් චොකලට් එකකුයි ගේන්න... අබේපාලත් මොනවා හරි බොන්න...'

හිමාලි දිගු කළේ පන්සීයේ කොළයකි. 'කාලෙන් කාලෙට එක එක ගෑණු... එකෙක් යනකොට තව එකෙක්...' අබේපාල බැස්සේ එසේ සිතමිනි.

* * * * * * * * * * * *

ප්‍රියංවද වර්ෂාව ත්‍රී වීලරයෙන් බස්සා ගත්තේ පරිස්සමිනි. අද කෙල්ල වෙනදට වඩා පින් පාටය. සුදු ගැබිණි ඇඳුම ඇඳ කොණ්ඩය එක මිටකට බැඳ පුදුමාකාර චාම් පාටකින් උන් කෙල්ල දරු ප්‍රසූතියට ආශාවෙන් සූදානම්ව උන්නාය.

'මේ චුට්ට පයින් ඇවිදගෙන යන එක තමා වැඩේ...'

මෙතන සිට ශ්‍රී මහ බෝධි මළුවට සෑහෙන දුරක් ඇත. ඒ දුර යා යුත්තේ පයිනි.

'හි..මි..න් හිමින් ය..න් ප්‍රියා... මට එ..හෙම අමාරුවක් නෑ...'

'අද විතරනේ නේද... අනේ අනිද්ද වෙද්දී පැටියා ඇවිත්නේ...'

'ම්.. මූණ දකිනකල් ඉවසිල්ලක් නෑ...'

ප්‍රියංවද කෙල්ලගේ අතින් අල්ලා ගත්තාය. ඇසළ මල් ගස් සිටවූ මේ පාර දිගේ ඇවිදගෙන යාම සනීපය. මුළු මහමෙව්නාවම සිපගෙන එන සුළඟ ගතට වඩා සනීප සිතටය.

'ප්‍රියා...'

'කෙල්ලේ...'

'පැටියා ලැබුණට පස්සේ අපට හෝටලේ පටන් ගන්නම වෙනවා...'

'මට තේරෙනවා කෙල්ලේ... බැංකුවේ තිබ්බ සල්ලිත් ඉවරයි නේද...'

'අනේ ඒකට කමක් නෑ... මං කිව්වේ අපි හතර දෙනෙක්නේ...'

'අපි කරමු... අපට වරදින එකක් නෑ...'

'තව ටික කාලයක් මෙහෙම ඉන්නත් ඕන.. නේද ප්‍රියා...'

'ජිවිතේ ප්‍රශ්න විසඳන්න දෛවය ගන්න කාලය කොහොමත් ගන්නවම තමා කෙල්ලේ...'

වර්ෂා මොහොතකට නැවතුණාය. ඇයට හතිය.

'ටිකක් ඉඳගෙන යන් කෙල්ලේ... හදිසි නෑනේ...'

'කොන්ද දිගේ එන ඇවිලිල්ල තමා අමාරු... හිරිවැටිලා යනවා...'

ප්‍රියංවද කෙල්ලව ටිකක් ඈතැල ගහක් යට වූ සිමෙන්ති බංකුවේ ඉන්දෙව්වාය.

'හෙට උදේ කිරිබත් චුට්ටකුත් කාලා අපි ගිහින් ඇඩ්මිට් වෙමු...'

ප්‍රියංවද කෙල්ලගේ හිස අතගා කීවාය. වර්ෂා ඒ අතගෙන උකුල මත තබාගෙන පිරිමැද්දය.





'මේ කරපු හැමදේටම ප්‍රියා... මායි මගේ පැටියයි...'

'ඇති කෙල්ලේ...'

ප්‍රියංවද ඇය කියන්නට ගිය දේ වැළැක්වූවාය.

'යං...'

ප්‍රියංවද කෙල්ලව අල්ලා ගත්තාය.

'සුදු මල් ටිකක් ගමු...'

'ම්.. ම..ට ප්‍රියා පොල් තෙල් ටිකකුත් ඕන.. තිර ටිකකුයි...'

ජය ශ්‍රී මහ බෝධිය ළඟ පහනක් පත්තු කර යන එක කෝකටත් හොඳය. මළුවට යද්දී කෙල්ලගේ ගත පුරා දඩිය බිංදු පවා නැග තිබුණි.

'ඇ..යි කෙ..ල්ලේ...'

'නෑ ප්‍රියා... හ..තියක් වගේ ආ..වා...'

'හිමින් උඩ මළුවට යං...'

'ම්...'

වර්ෂා උඩ මළුවට ගියේ ප්‍රියංවදගේ උරතලය මත අත තබාගෙන ඇගේ ඇඟට බර දීගෙනය.

'ම්.. කරදරයක් නැතුව පැටියා ලැබෙන්න කියලා හිතාගෙන පූජ කරපං...'

වර්ෂා බෝධීන් වහන්සේට නෙළුම් මල් පූජා කළේ ඇස් පියාගෙන මෙනි. මල් පූජා කර මළුවෙන් පහළට එද්දී වර්ෂාගේ සිතට නිවනක් දනුණි.

ප්‍රියංවද පහන් වැටි ටිකක් සොයාගෙන එන්නට ගියාය... නිසංසල මළුවේ සිටිද්දී වර්ෂාට තමාත් සමඟ තව කවුදෝ ඉන්නාක් වැනි හැඟීමක් දනුණි. ඇය බඩ ඔසවාගෙන ඒ මේ අත කැරකුණාය.

'අ..ම්..මේ...'

වර්ෂා කතා කළේ තනිවමය. ඇත්තටම අම්මා මේ මොහොතේ තමා ළඟ ඇතැයි වර්ෂාට සිතුණි.

‘ඇයි කෙල්ලේ...’

කෙල්ලගේ අමුතු වූ මුහුණ දැක ප්‍රියංවද ඇසුවාය.

‘නිකං ප්‍රියා අම්මා ළඟ ඉන්නවා වගේ දැනුණා...’

‘නැන්ද උඹව දලා යන්නෑ කෙල්ලේ...’

‘ම්...’

වර්ෂා පහන් වැටි ටිකට තිර දමා දල්වන්නට සූදානම් කළාය. යළිත් අර හැඟීමම දැනෙද්දී වර්ෂා හැරී බැලුවාය. ‘ඔළුවත් අත ගානවා වගේ දැනුණා... ඔයාම තමයි...’ වර්ෂා සිතින් කීවාය.

*　*　*　*　*　*　*　*　*　*　*

වර්ෂාට අමාරු වූයේ මහ රෑය. වර්ෂා ඒ වේදනාව දරාගෙන ඉන්නට වෙර දැරුවාය. එහෙත් ඒ වේදනාව දරාගෙන ඉන්නට පුළුවන් වේදනාවක් නොවීය.

‘ප්‍රි..යා...’

වර්ෂා ඇඳේ පෙරළීගෙන කෑ ගැසුවේ කොන්දට අතක් තද කරගෙනය. පැටියා දැන් ලැබේයැයි සිතෙන්නාක් මෙන්ය.

වර්ෂාගේ කෑ ගැසීමට ප්‍රියංවද පමණක් නොව අම්මාද දුවගෙන ආවාය.

‘අ..නේ දරුවට අමාරු වෙලා වගේ...’

අම්මා කාමරයට දුවගෙන ආවේ දෙවියන් බුදුන් යදිමිනි.

‘ඇ..යි කෙ..ල්ලේ...’

‘ම..ට අ..මා..රු..යි අ..ම්මේ...’

ඒ ඇස් වලින් කඳුළු ගලාගෙන ගියේ එක දිගටය.

‘අ..නේ ප්‍රියා...’

‘හ..රි ර..ත්..ත..ර..න්... අ..ම්..මේ කෙල්ලගේ ඇඳුම් මාරු කරන්න... මං දුවලා ත්‍රීවීල් එකක් අරන් එන්නම්...’





ප්‍රියංවද පාරට දිව්වේ තොල් පට තද කරගෙනය. දැන් රෑ එකොළහටත් ආසන්නය.

කෙල්ලගේ කෑ ගැසීම පාරට ඇසෙයි. ප්‍රියංවදව වෙව්ලන්නට විය. ඇය දහ අතේ දෙවියන් යැද්දය.

‘අ..නේ දෙයියනේ වාහනයක් එවන්න...’

පුදුමය. වාහන සිය ගණනක් ඇති මොරගොඩ ට්‍රාන්ස්පෝට් ඒජන්සිය හිමි බාල පුතාගේ දරුවා ලැබෙන්නට යද්දී අම්මාව ගෙන යන්නට ත්‍රී වීලරයක් වත් නැත. ප්‍රියංවදගේ දෙපා පවා වෙව්ලන්නට විය. රෝහල් ගත වන්නට දින දී තිබුණේ හෙටටය. ඊට කලින් කෙල්ලට අමාරු විය.

ත්‍රීවීලරයක් ඈත එනවා දකිද්දී ප්‍රියංවදගේ පපුවට සැනසීමක් දැනුණි. ඇය පාර මැදටම ගොස් මෙන් අත වැනුවාය.

‘කොහාට යන්නද...’

‘මේ අ..යියේ...’

කලබලයට ප්‍රියංවදට වචන පවා එන්නේ නැත.

‘නං..ගිට බ..බා ලැබෙන්න අමාරු වෙලා... අ..නේ ඉ..ක්..ම..නට හොස්පිට්ල් එ..කට ගෙ..නියමු...’

ප්‍රියංවද කීවේ දෑත් එක්කර මෙනි.

‘ය..මු...’

‘ඇතු..ළ..ට දනවද... මං එක්කං එන්නම්...’

ගෙට දුවද්දී ප්‍රියංවදගේ බඩ කොරවූ ගාණය. ඇය එහෙමම ඇඳුම උනා දමා අතට හසු වූ සායත් බ්ලවුසයත් වතට දමා ගත්තාය.

‘අ..නේ අ..ම්..මේ...’

කෙල්ල අඬනවා ඇහෙද්දී ප්‍රියංවදගේද දෙනෙත් තෙත් වෙයි.

‘හ..රි කෙ..ල්ලේ... හ..රි අපි යන් ර..ත්..ත..ර..න්... අ..ම්මේ ඇඳුමක් දගන්නවද... කෙල්ලගේ ඇඳුම් බෑග් එකත් ගන්න...’

ප්‍රියංවද කෙල්ලව වත්තං කර ගත්තේ දැතින්මය.

'පැ..ටි..යා එ..න්..න ව..ගේ ප්‍රි..යා...'

'හ..රි කෙ..ල්ලේ.. වි..නා..ඩි දහයෙන් අපි හොස්පිට්ල් එකේ...'

ප්‍රියංවදගේ වතට බරවී ආ වර්ෂා පහන් පැළ ළඟදී අමාරුවෙන් දෑත් එක් කර වැන්දාය.

'හ.. හ..රි කෙ..ල්ලේ... ප..රි..ස්..ස..මි..න්... බයවෙන්නෙපා වස්තුවේ... අපි චුට්ටකින් හොස්පිට්ල් එකේ...'

කෙල්ලව මැදි කරගෙන ප්‍රියංවදත් අම්මාත් දෙපසින් ත්‍රීවීලරයට නැග්ගේ කෙල්ලව අල්ලාගෙනමය.

'ටි..ක..ක් ප..රි..ස්..ස..මින් යං අ..යියේ...'

යන මඟ දිගටම වර්ෂා වේදනාව දරාගෙන ප්‍රියංවදගේ උරතලයට හිස තියාගෙන උන්නාය. අම්මා දිගටම කෙල්ලගේ යටි බඩ පිරිමැද්දය.

'අ..ම්..මේ... රෑට පැටියා ලැබෙයිද...'

ප්‍රියංවද ඇසුවේ කෙල්ලගේ හිස අතගාමිනි. වර්ෂා ඉන්නේ සිහිමද ගතියෙනි. ඒ තරම්ම අමාරුය. කෙල්ලගේ වතම දහදියෙන් තෙත්ව ඇත.

'අ..මා..රුව දෙතුන් පාරක් එනවා පුතේ... රත්නත්තරේ පිහිටෙන් කරදරයක් වෙන එකක් නෑ...'

එය එසේම වේවායි ප්‍රියංවද පැතුවාය. මේ තරම්ම දුක් දුන් කෙල්ලට තව ගින්දර දෙන්නට දෙවියන්ට පවා අයිතියක් නැත.

ප්‍රියංවදගේ උරතලයට හිස තබාගෙන යද්දී වර්ෂාට සිහිවූයේ විමුක්තිවය... 'අපේ පැටියා එ..න්න යන්නේ රත්තරන්... මට අමාරුයි... එයා ඉක්මනට එන්න යන්නේ... උදේ වෙද්දී ඔයාගේ පැටියා ඇවිත් තියෙයි... මේ දන් මට වද දෙනවා...' වර්ෂා දත්මිටි කාගෙන හුස්මක් පිට කළාය. අද හුස්ම ගන්නට පවා අමාරුය.

අනුරාධපුර ශික්ෂණ රෝහල ඉදිරිපිට ත්‍රීවීලරය නැවතිණ. ප්‍රියංවද කෙල්ලව ත්‍රීවීලරයෙන් බස්සවා ගත්තේ හිතින් ජය ශ්‍රී මහ බෝධියට බාර වෙමිනි.

'කරදරයක් නැතුව පැටියා අරන් දෙන්න... අ..ම්මටවත් දරුවට





වත් කැපුමක් තුවාලයක් වත් කරන්නෙපා...'

කෙල්ලව වත්තං කරගෙන යද්දී ප්‍රියංවදගේ ඇස්වල කඳුළුය.

'ප්‍රි..යා...'

'හ..රි ර..ත්..ත..ර..න් උඹ බයවෙන්නෙපා...'

'ම..ට අ..මා..රු..යි ප්‍රි..යා...'

'මට තේරෙනවා කෙල්ලේ... දන් බයවෙන්නෙපා... අපි හොස්පිට්ල් එකේනේ ඉන්නේ...'

ප්‍රියංවද කීවේ වර්ෂාගේ හිස අතගාමිනි. කෙල්ලව වෙව්ලන බව ප්‍රියංවදගේ දෑතට දනෙයි.

# 04

වර්ෂාව රෝහලට ඇතුල් කරන මොහොතේ විමුක්ති උන්නේ තද නින්දේය. හිමාලි ඔහු ළඟම ඇඳේ ඇලවී රූපවාහිනිය බලමින් උන්නාය. එකවරම හීනෙන් බය වූවා සේ විමුක්ති නැගිට්ටේය. ඔහු එහෙමම ඇඳ මත ඉඳගත්තේය.

හිමාලි විමුක්ති දෙස බැලුවේ කලබලයෙනි. පුදුමයෙනි. 'ඔයාට මොනාද එකපාරටම වෙන්නේ...' හිමාලි සිතුවාය.

'නි..ද..ග..න්..න... දන් රෑ...'

හිමාලි විමුක්තිගේ බාහුවකට සුරත තබා කීවාය. ඔහු එහෙමම ඒ අත ගසා දැමුවේය.

'මො..ක..ද මේ...'

විමුක්ති බිත්තියේ තැනක් දෙස බලාගෙනම ඉඳියි. ඇස් පියන් වත් සෙලවෙන්නේ නැත. ඔහු බලා සිටින්නේ කොහේදැයි හිමාලි බැලුවාය. නැත. සුදු බිත්තිය මිසක කිසිවක් නැත.

කොහෙද බලන්නේ... බිත්තියේ හොල්මනක් වත් ඉන්නවද...





හිමාලි රෑ ඇඳුම පිටින්ම විමුක්ති ඉදිරියට ආවාය. දුහුල් රෑ ඇඳුමට ඇගේ පියයුරු පවා පිටතට පෙනෙයි. හිමාලි විමුක්තිගේ මුහුණ ඇගේ පපුවට ළං වන සේ ඔහු ඉදිරියට ආවාය.

විමුක්ති එහෙමම නැගිට්ටේ ඇය ඉන්නා බවක් වත් ගණන් නොගෙනය. විමුක්ති ඇගේ ඇහේ හැප්පී මෙන් නැගිට්ටේය. හිමාලි වැටෙන්නට ගොස් බේරුනේ අනූනමයෙනි. 'මොන යකෙක් වැහිලද මේ මහ රෑ ඇහැරගෙන දඟලන්නේ...' හිමාලි සිතුවේ පපුව ගැහෙද්දීය.

'එ..න්..න යං නිදගමු... මට තුරුල් වෙලා දෙයියගමු... යං...'

ඇය විමුක්තිගේ පිටට වතම තද කර කීවාය. විමුක්ති එහෙමම දෙර වෙත යද්දී හිමාලි තවත් බය වූවාය.

'කො..හෙද යන්නේ... කාමරෙන් එළියට යන්නෑ...'

හිමාලි දෙර අවුරාගෙන උන්නාය. විමුක්ති ඇය දෙස බැලුවේ ගිනියම් වූ දෙනෙතිනි.

'යකෙක් වැහිලද...'

විමුක්ති දෙරින් පිට වූයේ හිමාලිව තල්ලු කරගෙනය. තමාව තල්ලු කළේ විමුක්තිම නොවේනම් වෙන කවුරුහරිදැයි හිමාලි වටපිට බලමින් සිතුවේය. තමාව විසි වූයේ විමුක්ති ළඟට එන්නටත් පෙරය.

හිමාලි බලද්දී විමුක්ති උන්නේ වේගයෙන් පියගැට පෙළ බසිමිනි. හිමාලි පහළට දිව්වේ ඇඳ උන් රෑ ඇඳුම උඩින් ඕවර් කෝට් එකක් දමාගෙනමය.

'කො..හෙද ය..න්..නේ... යං උඩට...'

පියගැට පෙළ දිගේ වේගයෙන් දිව ආ හිමාලි විමුක්තිව අල්ලාගෙන කීවාය. එහෙත් විමුක්ති නතර වූයේ නැත.

'ඔළුව හොඳ නැති උනාට ඇඟ යකඩයෙක්ගේ වගේ...'

හිමාලි සිතුවේ විමුක්තිගේ අත් පහරක් වැදුණු පපුව අල්ලාගෙනය.

'නැ..න්..දේ...'

හිමාලි කෑගැසුවේ විමුක්ති සාලයේ එහේ මෙහේ යද්දීය. ඔහු දෙරත් ඇරගෙන ගෙදරින් එළියට යාවි යැයි දන් හිමාලිට බයය.

හිමාලිගේ කෑ ගැසීමට සුරම්‍යා පමණක් නොව මොරගොඩ මහතාද දුවගෙන ආවේය.

'මොකද ළමයෝ...'

'අ..යි..යා... එකපාර පහළට දුවගෙන ආවා... එළියට යයි කියලා බයට කතා කළේ...'

මොරගොඩ මහතා කොල්ලා දෙස බැලුවේය.

'පොඩි පුතේ...'

ඔහු කතා කළේ ආදරයෙනි. විමුක්ති මේසය ළඟ නතර වී තාත්තා දෙස බැලුවේය.

'නින්ද යන්නේ නැද්ද පුතේ...'

මොරගොඩ මහතා ඇසුවේ කරුණාවෙනි. 'එයාට මොනවා හරි උනා...' හිමාලි යටි සිතින් සිතුවාය. 'ඒත් මොකක්ද...'

'යං... උඩ නිදගන්න බැරිනම් අපි සැටියට වෙලා නිදගමු...'

ඔහු විමුක්තිව වත්තං කරගෙන මෙන් සාලය මැද වූ විශාල සැටියට එක්කාගෙන ආවේය.

'වතුර ටිකක් ගේන්න... මේ කොල්ලට දඩියත් දලා...'

විමුක්ති වතුර වීදුරුව බීගෙන බීගෙන ගියේය. මොරගොඩ මහතා පමණක් නොව සුරම්‍යාද කොල්ලා දෙස බලා උන්නේ දුකෙනි.

'මට හිතෙන්නේ කොල්ලට ටික ටික සනීප වෙන්න යන්නේ... මොනවා මොනවා හරි මතක් වෙනවා...'

මොරගොඩ මහතා කීවේය. 'මටත් ඒක හිතෙනවා... මේ වෙලාවේ සනීප උනොත් මං ඉවරයි... සනීප වේගෙන එද්දී මාව එපාවෙලා...' හිමාලි සිතුවාය.

සැටියට බරවී විමුක්ති දෑස් පියාගෙනම උන්නේය. එහෙත් ඔහු උන්නේ නිදගෙන නොවේ. මොනවාද සිතමින් මෙනි. විමුක්ති ළඟ උන්නේ කවුරුවත් නොවේ. නාලනීය. අනුරාධපුර රෝහලේ තව මොහොතකින් බිහිවන්නට යන්නේ විමුක්තිගේ දරුවාය. නාලිනී





මේ වරින් වර පැමිණ කොල්ලට සිහි කරන්නට යන්නේ ඒකය.

'නැ..න්දේ...'

හිමාලි කුස්සියට ගියේ සුරම්‍යා පිටුපසිනි.

'අයියට මොනවා හරි කරලා මට හිතෙන්නේ... වෙලාවකට භූතයෙක් ඇවිත් ඇහැරවනවා වගේ... ඒ වෙලාවට හරි නපුරුයි...'

සුරම්‍යා හිමාලි දෙස බැලුවේ පුදුමයෙනි.

'ඇයි ඔයා එහෙම කියන්නේ...'

'ම..ට එ..හෙම හිතෙනවා... උඩදී මාව කවුරු හරි තල්ලු කළා... ඒ අයියා නෙමේ... එයා ළඟ කවුරුහරි උන්නා වගේ...'

සුරම්‍යාගේ යටි පතුල් පවා සීතල වීගෙන ගියේය. පුදුමයකට මෙන් සුරම්‍යාට සිහි වූයේ නාලනීය. 'එහෙම වෙන්නත් බැරි නෑ... දුවට කරපු දේට අම්මා ඇවිත් මෙහේ සැරිසරනවා වෙන්නත් පුළුවන්...' සුරම්‍යා සිතුවාය.

'අපි කෝකටත් අයියගේ කේන්දරේ බලවමු...'

'ඔ..ව් ඒක හො..දයි නැන්දේ...'

හිමාලිට සිහිවූයේ ඇය අම්මාට කරන්නට බාර දුන් ගුරුකමය. එය ලැබෙන්නේ මේ පෝයෙන් පසුය.

සුරම්‍යාත් හිමාලිත් යළි සාලයට එද්දී විමුක්ති උන්නේ සැටිය මත ඉඳගෙන මොනවද කල්පනා කරමිනි. 'ඔහොම ඉන්නකොට හිතෙන්නේ සිහිය ඇවිත් කියලා...' හිමාලිට සිතුණි.

'ඔ..ය... හරි අමුතුයි...'

'ම්...'

'වෙලාවකට එක තැනක් දිහාම බලාගෙන ඉන්නවා...'

සුරම්‍යා ළඟටම ගියද විමුක්ති බැලුවේ නැත.

* * * * * * * * * * * *

පාන්දර පහකුත් ගණනකට වර්ෂා අනුරාධපුර රෝහලේ ධාරකාගාරයේදී ලස්සන පුතෙක් වැදුවාය. දරුවාව සෝද ගෙනවිත් වර්ෂාට පෙන්වද්දී ඇයට ඇඬුණි. දහසක් වේදනාවන්ගෙන් හිරිවැටී ගොස් උන් වර්ෂාට පුතාගේ කිරිකැටි මුහුණ දකිද්දී ඒ හැම වේදනාවක්ම අමතක විය.

'ඔන්න ඔයාට ලස්සන පුතෙක්...'

හෙදිය කීවේ දරුවාව සුදු රෙදි කඩකින් ඔතාගෙන විත් වර්ෂාගේ වම් ඇලයේ තබද්දීය. වර්ෂා දරුවාව පපුවට ළං කර ගත්තේ පපුව කඩාගෙන ආ ඇඬුම් වාවාගෙනය.

'ම..ගේ ර..ත්..ත..රන්...'

ඇඬුම් මැදම වර්ෂාට කියවිණි. 'ඔයා ඔයාගේ තාත්තමයි... ඒ මූණමයි... අ..නේ ඒ ඇස් දෙකමයි... සුදු තාත්තිමයි... ම..ට ඒ.. ඇ..ති...' වර්ෂාගේ දෙනෙත් දෙකෙළවරින් වේගයෙන් කඳුළු ගලා යන්නට විය.

'අ..පේ පැටියා ආවා ර..ත්තරන්... අ..නේ ඉන්න තැනකින් එන්නකෝ... සුදු බෝලයක් අපට ලැබුණෝ... මං ද..න් කාටද මගේ පැටියව පෙන්නන්නේ...' වර්ෂාට ඉහිලුම් දෙන්නේම නැත. පපුව ගැහෙන්නේ පුදුමාකාර ලෙසිනි.

'අ..ම්..මේ...'

වර්ෂා කතා කළේ මේ මොහොතේ තමා ළඟ අම්මා ඉන්නාක් මෙන් දැනුණු නිසාය. ඇය දරුවා ලැබෙන මොහොතේ තමා ළඟම උන් බව වර්ෂා දනී... කවුදෝ හිස අතගාන්නාක් මෙන් දැනුණු බව ඇයට මතකය. ඒ අම්මාමය.

'ඔයාගේ මුණුපුරා ඇවිත්... අයියා ව..ගේමයි නේ...'

වර්ෂාට නැගිටින්නට අමාරුය. එහෙත් ඇය අමාරුවෙන් හිස උස්සා පැටියා දෙස බැලුවාය. පුංචි කුරුළු ඇස් දෙක ඉඹින්නටම හිතෙන තරම්ය.

ප්‍රියංවදත් අම්මාත් දුවගෙන ආවේ කෙල්ලව බලන්නට පුළුවන් යැයි කියූ මොහොතේමය. දුවගෙන එද්දීම ප්‍රියංවදගේ ඇස්වල





කඳුළුය. අම්මාගේ ඇස්වලත් කඳුළුය.

'ම..ගේ ර..ත්..ත..ර..න් ආවා අ..ම්මේ...'

වර්ෂා කීවේ අඬමිනි.

'අපට කිව්වා පුතේ...'

ප්‍රියංවද හරි පරිස්සමින් පැටියාව දේතින්ම ගත්තේ කඳුළු බේරෙද්දීය.

'උ..ඹ කි..ව්..වා එ..න්නේ පු..තෙ..ක් කියලා... අ..පට සුදු පු..තෙ..ක්..ම ඇවිත්...'

'අ..නේ සමන් දෙයියන්ට බාරයි...'

'ප්‍රියා...'

'ම්...'

'අ..යි..ය..මයි නේ..ද...'

'මේ ඒ මූණමනේ කෙ..ල්ලේ... චූ..ටි ම..හ..ත්..ත..යා... ලොකු අ..ම්..මිව අඳුන..න..වද ම්... අ..ම්..මිගේ සුදු බෝලේ...'

වර්ෂා ප්‍රියංවදගේ දෑසින් ගලන කඳුළු දෙස බලා උන්නේ ඇගේ දෙනෙත්ද බොඳව යද්දීය.

'උ..ඹ ස..නී..පෙ..න් නේ..ද කෙ..ල්ලේ...'

ප්‍රියංවද කෙල්ලගේ හිස අතගා ඇසුවාය.

'ම්.. එයා හිටියනම් නේද ප්‍රි..යා...'

'ක..ව..ද..හරි එ..යි කෙ..ල්ලේ... දැන් අපිට පාළු නැනේ... පුංචි වි..මු..ක්..ති ඉ..න්..නව..නේ...'

කෙල්ලගේ වෙව්ලන තොල් පට දකිද්දී ප්‍රියංවදට ඒ පපුවේ ඇති දුක තේරෙයි. හෙදියක් ආවේ ඒ මොහොතේදීය.

'අ..පේ පැටියා සනීපෙන් නේද නර්ස්...'

'ඔය ඉන්නේ සනීපෙට... තව ටිකකින් අම්ම කිරි දෙන්න ගන්න... හැරෙන්න පුළුවන්ද...'

'පු..එව..න් නර්ස්..'

අමාරු වුවත් පැටියාට මේ තනේ ළං කරන තුරු ඉවසිල්ලක් නැත.

'ආ... බබා ඉපදුනේ පහයි තිස් තුනට...'

හෙදිය කොළ කැබැල්ලක ලියා උපන් වෙලාව දුන්නාය.

'කෙ..ල්ලේ...'

'ම්...'

'මං හොඳ තැනකින් කේන්දරේ හදවන්නම්... නමකට අකුරු ගන්න ඕනද...'

වර්ෂා සිනාසුණේ පැටියාගේ තුනී හිසකේ පිරිමදිමිනි.

'එ..පා ප්‍රියා... තා..ත්තගේ නමමනේ දන්නේ...'

ප්‍රියංවද හිස වැනුවාය. කෙල්ල ඒ කතාව කීවේ පැටියා බඩේ සිටිද්දීමය.

'මං ගෙදර ගිහින් රහට කෑම ටිකක් හදන්න ගන්නම්... ගෙවල් දෙරවලුත් අස් කරලා තියන්නෙපැයි...'

'අ..ම්මේ...'

'පුතේ...'

'මේ ප..ඩු..ර අ..ම්මේ ය..න ගමන් බෝධිය ඉස්සරහ කැටේට දගෙන ය..න..වද...'

කෙල්ල බෙඩ් ජැකට් එකේ ගැට ගසාගෙන උන් පඬුරක් අම්මා අත තැබුවාය. අම්මාගේ දෙනෙත් තෙත් විය. ලෝකයේ හැම අම්මලාම මෙහෙමය.

'මං දගෙන යන්නම් පුතේ...'

ප්‍රියංවද දිගටම කෙල්ලගේ හිස පිරිමැද්දය. අම්මාත් පුතාත් සනීපෙන් ඉන්නවා දකිද්දී මාස දහයක් පුරා කළ සටන ජය ගත්තා නොවේදැයි ප්‍රියංවදට සිතෙයි.

'ප්‍රි..යා...'





'කෙ..ල්ලේ...'

'මා..යි ම..ගේ පැටියයි උඹටයි අම්මටයි ණයගැතියි...'

'මොනවද වස්තුවේ මේ කියන්නේ... මේ ර..ත්තරන් බෝලේ දක්කහම මට ඇති... සුදු බෝලයක් නේ..ද...'

'ම්... නිරෝගී බරලු...'

'උ..ඹ මට දහක් දේවල් හොයාගෙන ඇවිත් කැව්වනේ ප්‍රියා...'

'ගෙදර ගියාම අපි උඩ මළුවට අරන් යං... මේකා අපේ පපුවේ තිබ්බ ලොකු දුකක් අහක් කළා කෙල්ලේ... ම..ගේ පැටි..යෙ..ක්..ට වගේ මං ආ..ද..රේ..යි...'

වර්ෂා ප්‍රියංවදගේ අත තද කරගෙන පපුවේ තබා ගත්තාය.

'මොරගොඩ පවුලේ කට්ටිය දන්නවනම් මේකා ගැන... පළවෙනි මුණුපුරා... මේඩක්කට ඉපදුනෙත් දුවෙක්නේ...'

'ම..ට ම..ගේ පැ..ටි..ය..ගේ තාත්තව ලැබුණොත් ඇ..ති ප්‍රියා...'

'කොල්ලා වාසනාවන්තයි... මේ ජේන්නැද්ද මුණ... හරි පින් පාටයි...'

'මං.. තා..ම එ..යා දි..හා හ..රි..ය..ට බැලුවේ නෑ ප්‍රි..යා... ලෝබ..යි... චු..ට්..ට චු..ට්ට බල..නවා...'

'උ..ඹට පණ වගේ ඉඳී...'

'මං දු..ක් විඳලා හදනවා... හිතට ලොකු ශක්තියක් ආවා ප්‍රියා...'

'කොල්ලා එන්න ඇත්තේ අම්මගේ දුකත් වහගෙනම වෙන්න ඇති... අ..පි කු..ක්කු බො..මු ස..ත්..ත..රන්... ම්... කු..ක්..කු.. අ..ම්..ම් කු..ක්..කු... බෑ... බ..ඩ..ගිනි නෑ මගේ ම..හත්තයට... ම්...'

ප්‍රියංවද කීවේ ඒ චූටි දෙපා සිප ගනිමිනි.

# 05

මේධා වර්ෂාව හීනෙන් දක්කේ මහ පාන්දරය. එහෙමම ඇය පිබිදුනාය. ඒ වෙලාවේ සිට මේධාගේ හිතට අමුතුය. ඇය උදේ ඇඳේම ඉඳගෙන බබාට කිරි පොවමින් සිතුවේ වර්ෂා ගැනය.

'උඹට මේ වෙද්දී බබා ලැබිලා ඇති... නැත්නම් උඹට බබා ලැබෙන්න ළං වෙලා ඇති... මෙහෙම උඹව පේන්නේ උඹට පිහිටක් ඕන වෙලාද කියලත් හිතෙනවා...'

මේධාට දිග සුසුමක් පිට විය. නාන කාමරයේ සිට ආ සක්විති මේධා ළඟම ඉඳගත්තේය.

'ඇයි බබා...'

'පාන්දර කෙල්ලව හීනෙන් දක්කා... ප..වි...'

'මේ කෙල්ල ළඟ පාතක ඉන්නවා වෙන්න බෑ බබා...'

'ඇයි එහෙම කියන්නේ...'

'ඉන්නවා නම් කෙල්ල පාරක තොටකදීවත් දකිනවා...'





'ම්.. මටත් හිතුණා... අනුරාධපුරේම ඉන්නවද දන්නෑ... එද අපි දක්කෙත් එහෙදිනේ...'

'එච්චර දුර කොහේ ඉන්නද...'

'ජීවිතේ කණපිට පෙරලුනාම පිටරටවලත් යන එකේ කෙල්ල අනුරාධපුරේ යන එක මහ දෙයක් නෙමේ මහත්තයෝ...'

'ම්...'

සක්විති දිග සුසුමක් හෙලා කීවේය. දුරකථනය නාද වූයේ ඒ මොහොතේදීය. සක්විති එය ගත්තේය.

'ලොකු පුතා...'

'තාත්තේ...'

'මං ඊයේ රෑ පොඩි පුතාගේ අමුත්තක් දක්කා...'

මොරගොඩ මහතා ඊයේ වූ සිදුවීම විස්තර කළේය.

'කොල්ලට සනීප වෙන්න පටන් අරන් තාත්තේ තියෙන්නේ... මටත් ඒක තේරුණා...'

'මේ අම්මගේ පිස්සු වැඩ හිතන්නැතුව ඔයා මල්ලිව සනීප කරගන්න බලන්න...'

'හොඳයි තාත්තේ...'

'ලොකු පුතා...'

'මේ කෙල්ල ගැන ආරංචියක් නැද්ද...'

තාත්තා අසන්නේ වර්ෂා ගැන බව සක්විති දනී.

'මායි මේධයිත් හොයනවා තාත්තේ...'

'ම..ට දිගටම නාලිනීව හීනෙන් පේනවා ලොකු පුතා... නැන්ද එන්නේ එයාට පින් ඉල්ලන්න නෙමේ... මේ කෙල්ල කරදරේක කියලා මට හිතෙන්නේ...'

'මේධටත් නංගිවයි නැන්දවයි හීනෙන් දිගටම පේනවා තාත්තේ... මේ ඊයේ රෑත් කෙල්ලව දකලා...'

‘මොනවා උනත් ඒ අපේ දරුවෙක්...’

‘මං නංගි පිට කෙනෙක් කියලා හිතන්නෑ තාත්තේ...’

‘මාත් හොයලා බලන්නම්...’

දුරකථනය තබා සක්විති බැලුවේ මේධා දෙසය.

‘තාත්තටත් නාලිනී නැන්දව දිගටම හීනෙන් පේනවලු... එයත් කියන්නේ කෙල්ල කරදරේක කියලා...’

‘කෙල්ල ඉන්නේ කරදරේක තමා මහත්තයෝ... තාත්තා කෙනෙක් නැති දරුවෙක් බඩේ තියාගෙන ඉන්නවා තරම් කරදරයක් තව නෑ...’

‘තාත්තට ඇත්තම කියන්නත් හිතෙනවා...’

‘දෑ..න්..ම එපා... අපිත් කෙල්ල ගැන හොයලා බලලම කියමු...’

‘ම්... මල්ලි රෑ නැගිටලා පහළට ඇවිත්... මූණත් අමුතුයිලු... තාත්තත් කියන්නේ කොල්ලට සනීප වෙන්න යනවා කියලා... ඩොක්ටත් ඔය කතාවම කිව්වා...’

‘දෙයියන්ගේ පිහිටෙන් සනීප වෙනවනම්...’

විමුක්තිට සිහිය ආවානම් මේ සියල්ලම ඔහුව පැත්තකට කරගෙන කිව හැක. ඉන් පසු කොල්ලා කරන්නට ඕනා දේ කරනු ඇත. එදට හිමාලිලාට යන්නට වෙන්නේ ඇපත් නැතුවය.

* * * * * * * * * * * * *

පැටියා අම්මාගේ සුදු තනය බදගෙන එය උරන්නේ පුරුදු කාරයෙක් මෙනි. වර්ෂාට පුදුමය. ඇගේ දෙනෙත් එක දිගටම තෙත්ව යන්නට විය. ‘අ..නේ ඔයා මගේ සුදු කිරි බෝලෙනේ...’ වර්ෂා සිතන්නේ පපුව ඇවිලීගෙන යද්දීය.

ප්‍රියංවද පැමිණ අම්මාගේ තනය දගෙන උරන පැටියා දෙස බලා උන්නේ ආශාවෙනි.





‘මේ තුන්වෙනි පාර ප්‍රියා... කොහොම ඉන්නවද දන්නෑ... පුරුදු වෙලා ඇවිත් වගේ...’

කෙල්ලගේ දෑස් තෙත්ව ඇත්තේ දරු සෙනෙහසටය.

‘කක්කි දලා සෝදලා ගෙනත් දුන්නා... සමන් දෙයියන්ගේ පිහිටෙන් පැටියා සනීපෙන් ඉන්නවලු ප්‍රියා...’

‘අපි ඇස්දෙක වගේ බලාගමු...’

‘ම්.. එ..යා..ම..යි ප්‍රි..යා... එයාගේ තිකටත් මෙහෙ..ම..මයි...’

‘අරන් යන්න හිතෙනව නේද...’

‘ම්... එකපාරක් කට්ටියට පෙන්නලා එන්න ආසයි... ඒත් පිළිගන්න එකක් නෑ...’

‘මේ මූණට එයාලට මොනවත් කියන්න බෑ...’

ප්‍රියංවද කොළයක් පිටතට ගත්තාය.

‘පොඩි මාමා හොඳ කේන්දර බලන කෙනෙක් ගැන කිව්වා... මං ගියා...’

‘උ..ඹ පව්... මේ හදිස්සියේ දිව්වද...’

‘නැතුව බෑනේ කෙල්ලේ... හ..රි..ම බලගතු වෙලාවකදිලු ඉපදිලා තියෙන්නේ...’

‘ඉ..ති..න්...’

‘පුතා මේෂ ලග්නේ... වෘෂභ නවාංශකේ...’

‘පු..දු..ම..යි...’

‘ඇයි...’

‘අයියත් මේෂ ලග්නේ... මං වෘෂභ ලග්නේ...’

ප්‍රියංවද දිග හුස්මක් ගත්තාය.

‘ඒකනේ... අම්මගෙයි තාත්තගෙයි ලග්න දෙකම ඇවිත්... දෙන්නා මේ වෙලාවේ එක තැන නැලු... ඒක එ..හෙ..මම කි..ව්වා කෙ..ල්ලේ...’

'පුතාට ලොකු අපලයක් එහෙම නැලු... හොඳට ඉගෙන ගන්නවලු... පුතාගෙන් තාත්තට හොඳයිලු...'

'එ..යා..ට හො..ද..ක් වෙ..න..ව..න..ම් මට ඇති...'

'පුතාට අවුරුදු දෙකහමාරක් වෙන්න කලින්...'

'ඉතින්...'

'අම්මයි තාත්තයි එකතු වෙනවලු... ඒක ස්ථිරයිලු...'

වර්ෂාගේ දෙනෙත් වලින් කඳුළු බෝලයක් ගිලිහිණි. 'මට ඒ ඇති...' වර්ෂා සිතුවාය.

'කරදර කාලේ ගෙවෙයි කෙල්ලේ...'

'ම්.. මට මේ මූ..ණ ද..ක්..කා..ම ඒක හිතෙනවා ප්‍රියා...'

වර්ෂා දෑස් පිස දමමින් කීවාය.

'ප්‍රියා...'

'ම්...'

'පැටියට...'

'කියපන් කෙල්ලේ...'

'නෑ.. පංචායුධයක් ග..න්..න ඕ..නනේ...'

ප්‍රියංවද සිනාබරව ඇගේ හෑන්ඩ් බෑගයේ වූ පුංචි ස්වර්ණාභරණ පෙට්ටිය ගත්තාය.

'අ..නේ.. උ..ඹ..ට පි..න්...'

වර්ෂාට ඇඬුණි.

'එ..හෙ..ම කර..න..වද කෙල්ලේ මේ සුදු බෝලෙට...'

ප්‍රියංවද පංචායුධය පුතාගේ පුංචි මල්පීස් කමිසයේ කුඩා කට්ටකින් ගැසුවේ ආශාවෙනි.

'චූට්ටක් ලොකු උනාම පොඩි චේන් පටක් හදවලා දමු... තාම බෙල්ල චූටිනේ...'

වර්ෂාට ප්‍රියංවදගේ අතකින් ඇල්ලිණි.





'මං නෙ..මේ එ..යා ක..වදහරි උ..ඹට පින් දෙයි... එයාගේ පුතාට මෙ..හෙම ක..ළාට...'

ප්‍රියංවද සිනාසුණා මිසක කිසිවක් කීවේ නැත.

'මෙන්න නිදි... අම්මි කුක්කු බීලා බඩ පිරිලා ඇති...'

'හෙට ටිකට් කපයිද ප්‍රියා...'

'මං හිතන්නේ... උඹට අමාරුවක් නෑනේ කෙල්ලේ...'

'ඉ..ක්..ම..න..ට ගෙදර යන්න ආසයි...'

'හිතේ තිබ්බ ලොකු බරක් නිදහස් කෙල්ලේ... දන් අපි අනාගතේ ගැන බලමු...'

ප්‍රියංවද කීවේ වර්ෂාගේ හිස අතගායා.

# 06

විමුක්ති සක්විතිගේ අත අල්ලාගෙනම උන්නේය. සක්විති විමුක්ති දෙස බලා උන්නේ පුදුමයෙන් මෙනි.

'ම..ල්ලී...'

සක්විති කතා කළේ පුදුමාකාර ආදරයකිනි. කොල්ලාගේ මුහුණේ ලොකු වෙනසක් සක්විති දක්කේය.

'මො..නාද බං හිතන්නේ... ම්...'

සක්විති කතා කළේ විමුක්ති අසනීප වෙන්නට ප්‍රථම ඔහු හා කතා කළ කුළුපග භාෂාවෙනි. දෙන්නා කතා කළේ යාළුවන් දෙදෙනෙකු මෙනි.

'බ..බා...'

නොසිතූ මොහොතක ඒ වචනය විමුක්තිගේ මුවින් පිට විය.

'බ..බා.. ඔව් කොල්ලෝ...'

කොල්ලා බබා යැයි කීවේ වර්ෂාටය.

'බබාව මතකද... නංගිව...'





යළිත් විමුක්ති කතා නැත. ඔහු වෙනස්ම බැල්මකින් සක්විති දෙස බලා උන්නේය.

'බබා ඉන්නවා... සනීප වෙලා බලන්න යං...'

අනුලා තේ හදගෙන උඩට ආවේ ඒ මොහොතේදීය.

'අනුලක්කේ මේ බලන්නකෝ... හිටපු ගමන් බබාලු...'

'බබා කිව්වේ වර්ෂා නංගිටනේ සුදු මහත්තයා...'

'ඒකනේ...'

'වර්ෂා නංගිව පුංචි මහත්තයට මතක් වෙන්නැත්නම් පුදුමයක්...'

වර්ෂා යන නම අනුලාගේ මුවින් පිටවෙද්දීම විමුක්ති ගැස්සී මෙන් අනුලා දෙස බැලුවාය.

'වර්ෂා නංගිව මතකද... ආ පුංචි මහත්තයා... පුංචි මහත්තයගේ බබා... ලස්සන නංගී...'

'බ..බා...'

විමුක්ති යළිත් කීවේය. අනුලාත් සක්විතිත් මූණට මූණ බලාගත්තෝය.

'කෙල්ල ආවනම් දවස් දෙකෙන් සිහිය එනවා...'

'අපි හොයනවා අනුලක්කේ කෙල්ලව...'

'ඉක්මනට ලොකු දෙයක් වෙයි කොහොමත්...'

'ම්.. නිකං ඉන්න වෙලාවට ඇවිත් කතා කරන්න අනුලක්කේ...'

'එනවා සුදු මහත්තයා... කොහෙද අර මිරිස් කරල හෙළුවෙන් මෙතනනේ හැම වෙලාවෙම අතුල්ල අතුල්ල ඉන්නේ...'

අනුලා එහෙමම කීවාය. ඇය ගැන කිව හැක්කේ එහෙමමය.

'මා ළඟ තියෙනවා වර්ෂා නංගිගේ ෆොටෝ එකක්... හවස ගෙනත් පෙන්නන්න ඕන...'

'එක දෙයක් මතක් උනොත් හරි අනුලක්කේ... වැලම කොල්ලට මතක් වෙයි... මං ආයුර්වේද තැනකටත් එක්කං යන්න හිතන්

ඉන්නේ...'

'ඔව්.. ඒ බෙහෙත් වලට තද වෙච්ච නහරත් පණ ගහලා ගන්නවලුනේ...'

සක්විති පහළට ගියේ සැහෙන වේලාවක් විමුක්ති දෙස බලා හිඳය.

'අ..ම්මේ...'

ඔහු කතා කළේ සාලයේ සිටය. සූරම්‍යා කාමරයේ සිට ආවාය.

'මං හවස එනවා මල්ලිව ටිකක් එළියට එක්කගෙන යන්න... දැන් ටික ටික සනීප වෙගෙන එන්නේ... ගෙදරම හිර කරලා තියන්න නරකයි...'

'ම්...'

'මං අම්මට දෙයක් කියන්න නතර වුණේ...'

'මොකක්ද ලොකු පුතා...'

'මල්ලිට සනීප උනාට පස්සේ ටික කාලයක් උගේ පාඩුවේ ඉන්න දෙන්න...'

සූරම්‍යා මහ පොළොවට රැව්වාය.

'එයා ඉන්නේ ලොකු ප්‍රශ්න දරාගන්න පුළුවන් මට්ටමක නෙමේ... සනීප උනත්...'

'ගෙදර ප්‍රශ්න නැනේ... එළියේ ඉන්න බැල්ලියෙක් ප්‍රශ්න දම්මොත් මිසක්...'

අම්මා සමඟ කතා කර තේරුමක් නැතැයි සක්විතිට සිතුණි.

'මං යනවා...'

සක්විති සුසුමක් හෙළා කීවේය. 'හොඳ වැඩේ අහගත්තා දෙකක්...' කාමරයේ උන් හිමාලි ඉන් කුරිරු සතුටක් වින්දය.

හිමාලි විමුක්තිගේ කාමරයට ගියේ අටට පමණය. ඇය යද්දී යන්නේ විලවුන් නාගෙනය. පිරිමියෙකුගේ සිත සසල වන්නේ ගැණු





සුවඳට මිස විලවුන් සුවඳට නොවේ. කොහොමත් එක ගැණියෙකුගේ සුවඳින් මත් වූ පසු පිරිමියෙකුට අනිත් ගැණුන්ගේ සුවඳ සුවඳක් නොවේ.

කාමරයට ඇතුල් වූ වනම දුටු දෙයින් හිමාලිගේ පපුව හිරි වැටිණි. විමුක්ති කාමරයේ වූ ඇඳ මත නිදගෙන ඇඳ විට්ටමට හිස තබාගෙන පොතක් බලමින් උන්නේය. ඒ දර්ශනය දැක ඇය කොතරම් බිය වූවාද කිවහොත් ඇයට වදනක් කතා කර ගන්නට පවා බැරි විය.

'ඔළුව පිස්සු හැදිච්ච කෙනා පොත් කියවන්නේ කොහොමද...'

හිමාලි සිතුවේ පුදුමයෙනි. 'මං ආවවත් දන්නෑ... දිගටම පොත කියවනවා...' හිමාලි කාමරය තුළට එමින් සිතුවාය.

හිමාලි විමුක්තිගේ පය පාමුළ ඉඳගෙන ඔහුගේ දෙපාවලට සුරත තැබුවාය. පොත මෑත් කළ විමුක්ති හිමාලි දෙස බැලුවේ වෙනස්ම බැල්මෙනි. ඒ මානසික ආබාධයක් ඇති රෝගියෙකුගේ බැල්ම නොවේ.

'ඇයි.. ම්...'

හිමාලි ඇසුවේ අනුරාගයෙනි.

'පො..ත් කියවනව..ද ම්...'

ඇය ඔහුට තවත් ළං වූවාය. විමුක්තිගේ වතට ඒ වත ඇලෙන්නට විය.

'මො..ක..ක්..ද පොත... මටත් ඇහෙන්න කියවන්න...'

විමුක්ති කතා කළේ නැත.

'පිස්සෙක්... කියවන්නෑ... නිකං බලන් ඉන්නවා... මාවත් බය කරනවා...'

ඇගේ සුරත ඔහුගේ පපුව පුරා යන්නට විය.

'ල..යි..ට් වහලා නිදගමු බබා.. ම්... තු..රුල් වෙ..ලා...'

හිමාලිගේ තෙත තොල්පට විමුක්තිගේ උණුසුම් බාහුවකට තද විය. විමුක්ති පොත දෙසම බලාගෙන උන්නේය.

අනුලා විමුක්තිට තේකක් හදගෙන ආවේ හිමාලි එසේ විමුක්තිගේ බාහුවට දෙතොල් තබාගෙන ඉඳිද්දීය. 'ගෑණුන්ටත් නින්දවක් මේ වල් සමයම...' අනුලා සිතින් කීවාය.

අනුලා කාමරයට ඇතුල් වෙද්දීම හිමාලි විමුක්තිගේ උරතලයෙන් දෙතොල් ගත්තාය. අනුලා සිනාසුණේ බිම බලාගෙනය.

'දන් තේ මොනාටද...'

'පුංචි මහත්තයා ඉල්ලුවා...'

හිමාලි දෙනෙත් එසෙව්වාය.

'පුංචි මහත්තයා ඉල්ලන්නැනේ...'

'ඉ..ල්..ලු..වා තේ.. ඕ..නා කිව්වා...'

'අනුලා නිකං බොරු කියන්නෙපා...'

'පුංචි මහත්තයා තේ ඕන නේද...'

අනුලා ඇත්තටම ඇසුවේ අසරණවය.

'තේ ඕන...'

විමුක්ති පොත දෙස බලාගෙනම කීවේය. හිමාලිට තරු විසි විය. 'එහෙනම් ඇත්තටම සනීප වේගෙන එන්නේ...'

'දැ..ක්..ක..ද...'

'තියලා යන්ඩ... මං පොවන්නම්...'

'අතට දුන්න නම් දන් බොයි...'

'ය..න..වා ය..න්..න...'

හිමාලි කියද්දී අනුලාට දුක සිතුණේ නැත. ඇය පඩිපෙළ බැහැගෙන ගියේ සිනාසෙමිනි. 'ගෑණී රත්වෙලා ඉන්නේ... පුංචි මහත්තයට සිහිය ආපු ගමන් එයාට මොනාද වෙන්නේ කියලා දන්නවා...' අනුලා සිතුවාය.

හිමාලි තේ එක අතට ගත්තේ වෙව්ලමින් මෙනි. 'එහෙම දෙයක් උනොත් මට මොනාද වෙන්නේ... ඇඳුම් ටිකත් අරගෙන බස් එකේම නුවර යන්න වෙයි...' හිමාලි සිතුවාය.





'බො..න්..න... අනිත් දවසේ මොනව හරි ඕන නම් චූටි නංගිට කියන්න...'

හිමාලි ආදරයෙන් කීවාය. විමුක්ති තේ එක බිව්වා මිසක ඇය දෙස බැලුවේ නැත.

'මො..න..ව..ද මං දන් කියන්නේ...'

හිමාලි විමුක්තිට තේ පොවමින් සිතුවාය. 'මේ සැප සම්පත් එක්ක ජීවත් වෙන්න හීන දකලා දන් පලයංකෝ නුවරට... උපාධියත් නෑ... කාරුත් නෑ... කසාදත් නෑ...' හිමාලිට හීල්ලින.

'නෑ... එ..හෙ..ම වෙ..න්න බෑ... මං මො..නවා හ..රි කරනවා...'

හිමාලි අධිෂ්ඨාන කර ගත්තාය. හිමාලි රූපවාහිනිය දම්මේ කම්මැලිකමටය. එහි හින්දි චිත්‍රපටයක් විකාශනය වෙමින් තිබුණි. පොත දෙස බලාගෙන උන් විමුක්ති හිටි හැටියේම ඒ හින්දි ගීත දර්ශනය දෙස බලාගෙන උන්නේය. හිමාලිගේ නෙත් තිබුණේද ඒ වෙතය. විමුක්ති එදෙස ආශාවෙන් බලා ඉන්නා බව ඇය දක්කේ පසුය. 'මොකද ඒ තිළිය දිහා බලාගෙනම ඉන්නේ...' හිමාලි සිතුවාය.

'බ..බා...'

ඉබේටම විමුක්තිගේ මුවින් ඒ වදන් පිට විය. හිමාලිව ගල් ගැසුණි. විමුක්ති බබා කිව්වේ කාටද...

'ක..වු..ද බ..බා...'

හිමාලි වෙව්ලමින් මෙන් ඇසුවාය. විමුක්ති කතා නැත. ඔහු දිගටම ඒ තිළිය දෙසම බලාගෙන උන්නේය. 'අරකි වගේද...' හිමාලි සිතුවාය.

'සිහිය ආවොත් ඒකි ළඟටම යනවා... අද රෑ ඉඳලා බෙහෙත් දෙන්නෑ... හෙටත් දෙන්නෑ...'

හිමාලි සිතුවේ කුරිරු ලෙසිනි.

* * * * * * * * * * *

වර්ෂාවත් පුතාවත් ගෙදර එක්කාගෙන ආවේ සෙනසුරාද උදේකය. ප්‍රියංවද වෑන් රියක් කතා කර ගත්තේ කොල්ලාව ත්‍රීවීලරයකින් ගෙදර එක්කාගෙන එන්නට දුක නිසාය.

රෝස පාට බෙඩ් ජැකට් එකට චීත්ත රෙද්දක් ඇඳගෙන උන් වර්ෂාව වත්තන් කර ගත්තේ අම්මාය.

'අමාරුද පුතේ...'

'වාට්ටුවේ ඇවිද්දනෙ අම්මේ... එ..හෙ..ම අමාරු නෑ...'

'අපි ගියාම කොහොඹ දුම් ටිකක් අල්ලමු...'

මේ අම්මා අම්මාමය. වර්ෂාට පුදුමත් ඒකය. පුතා ඉන්නේ ප්‍රියංවද අතේය. ඇය රෝස පාට රෙදි වලින් පොරවාගෙන පුතාව රත්තරන් කරඬුවක් සේ ගෙන ආවාය.

'මැණිකක් ගෙදර අරන් යනවා වගේ නේ අම්මේ...'

'ඒකනේ... දැන් මොන දුකක්ද...'

'ඉක්මනට කිරි පොවලා ලොකු කරලා දියන්... මං බත් කවන්නම්...'

ඇත්තටම පුතා වාසනාවන්තය. වර්ෂා වෑන් රියේ ඉඳගත් පසු ප්‍රියංවද පරිස්සමින් පුතාව ඇය අතට දුන්නාය.

'අම්මිගේ බඩෙන් එද්දී ආවේ... දැන් ෂපාන් එකට උකුලේ දෙයියගෙන යනවා...'

'ඇස් කරකවනවා ප්‍රියා...'

වර්ෂා කොල්ලාව පපුවටම ගත්තාය.

'අපිට කරදරයක් උනේ නෑ...'

ප්‍රියංවද වාහනයට නැග කීවාය.

'ම්.. කාටවත් ලැබිලා නෑනේ මෙහෙම ලොකු අම්මා කෙනෙක්...'

වර්ෂා කට පුරා කීවාය. ප්‍රියංවද සිනාසුණේ දිළිසෙන දෑසිනි. වර්ෂා යන අතරතුර බලා උන්නේ ප්‍රියංවද දෙසය. මේ අද තමාගේ ජීවිතයට යෝධ ශක්තියක් වී ඉන්නේ එද ෆර්ගසන් බාලිකාවේ





එකට උන් මිතුරියමද කියා වර්ෂා සිතුවාය.

දෛවය ජීවිතයට කොතරම් නම් දේ කළාද... මොන තරම් දේවල් අහිමි කළාද... මොන තරම් දුක් වේදනාවන් දුන්නාද... ඒ හැම වේදනාවක් ළඟදීම සඳක් මෙන් ළඟ උන් මිතුරියකගේ සෙනෙහස ගැන අද වර්ෂාට කියන්නට වචන නැත.

දෙවියන් දේවතාවියන් මිනිස් වෙසින් ළඟට එන වෙලාවල් ඇත... මිතුරියක් ලෙසින් සොයුරියක් ලෙසින් තමා ළඟට ආවේ එවන් ඉෂ්ඨ දේවතාවියකැයි අද වර්ෂාට සිතෙයි.

වර්ෂා ප්‍රියංවදගේ උරතලයට බර වූයේ ඒ හැඟීම් වලින් පපුව කැවීගෙන යද්දීය.

* * * * * * * * * * * *

විමුක්ති උන්නේ හිස තදින් අතින් තද කරගෙනය... ඔහු උන්නේ ඒ තරම්ම වේදනාවකිනි. ඔළුව මොනවායින්ද තෙරපෙන්නාක් බඳුය.

'අ..යි..යා...'

විමුක්ති කෑගැසුවේ සක්විතිටය. සුරම්‍යාත් හිමාලිත් උඩට දුවගෙන ආවේ එක විටමය. ඇඳ මත හිස අල්ලාගෙන උන් විමුක්තිව දකිද්දී සුරම්‍යාගේ පපුව ඇවිළිණ. 'බෙහෙත් දුන්නෑනේ... පිස්සුව තද වෙලා...' හිමාලි කුරිරු ලෙස සිතුවාය.

'ඇ..යි ම..ගෙ පු..තේ...'

විමුක්ති හිස බදගෙන ඇඳ මත ඇඹරුනේ අමාරුවෙනි.

'අ..යි..යා...'

කොල්ලා කියන්නේ ඒ වචනය පමණි.

'ඔළුව තද කරනවා ඇති... මේ අසනීපේ ආවෙත් මෙහෙමයි...'

'එහෙනම් ආයෙත් සනීප කරනවා බොරු... දෙයියෝ මගේ මූණ බැලුවා... සනීප වෙන්නම එපා...' හිමාලි පැතුවාය.

'ඌ... අ..යි..යා...'

සුරම්‍යාට කොල්ලා මෙහෙම ඉඳිද්දී බලා ඉන්නට බැරිය. ඇය දුවගෙන ගොස් ගත්තේ සක්විතිටය.

‘ලො..කු පු..තේ ම..ල්..ලී...’

‘ඇයි අ..ම්..මේ කො..ල්ලට මො..ක..ද...’

‘ම..ල්ලී ඔළුව අල්ලගෙන කෑගහනවා පුතේ... අයියව හොයනවා...’

‘මං විනාඩියෙන් එන්නම්...’

‘කොල්ලට එකපාර මොකද වුණේ...’ සක්විති යතුර අතට ගනිමින් සිතුවේය.

‘දුවල ය..න්..න.. කෙළින්ම ඩොක්ටර් ගාවට ගෙනියන්න මහත්තයෝ... හොඳද...’

‘හරි බබා... මං කතා කරන්නම්...’

සක්විති මහ ගෙදරට ආවේ විදුලි වේගයෙනි. කොල්ලාට සනීප වෙද්දී මෙහෙම දේවල් වන බව එද වෛද්‍යවරයා කීවේය. එහෙත් අද එකවර ආ අමාරුව කුමක්ද...

සක්විති උඩට දුවගෙන ආවේය. එද්දී කොල්ලා ‘අයියා...’ කියමින් කෑ ගසන හඬ සක්විතිට ඇසුණි. ඒ හඬ ඇසෙද්දී සක්විතිගේ පපුව දගෙන ගියේය.

‘ඇ..යි ලො..කු පු..තේ මේ...’

සක්විති එහෙමම විමුක්තිව අල්ලා ගත්තේය.

‘දන්නෑ අම්මේ... මං ඩොක්ටර්ට කතා කරගෙන ආවේ... දන්මම එක්කං එන්න කිව්වා... මං අන්දගන්නම්...’

‘ඔ..ව් එ..හෙම හොඳයි...’

හිමාලි කාමරයෙන් පිටතට ගියේ වදනක් වත් නොදෙඩාය. ‘අයියව නවත්ත ගනීද...’ හිමාලි සිතුවේ බියෙනි. එසේ වුවහොත් තමාට ඔහු ළඟ ඉන්නට නොලැබෙන බව හිමාලි දනී.

‘මං මල්ලිව පෙන්නලා කතා කරන්නම්...’





‘හොඳයි...’

සක්විති නවලෝක රෝහල වෙත වාහනය පැදවූයේ පිම්මේය. විමුක්තිව රෝහල් ගත කෙරුණේ වර්ෂාත් පුතාත් රෝහලෙන් පිටවී පැය කිහිපයක් තුළය.

‘සමහර විට විමුක්තිට සනීප වෙන්නත් පුළුවන්... ඔයා ඇඩ්මිට් කරන්න... මං දිගටම බලන්නම්...’

වෛද්‍යවරයා කීවේය.

‘හොඳයි ඩොක්ටර්...’

‘තෙරපිච්ච ස්නායු ලිහිල් වෙද්දීත් ඔහොම අමාරුවක් එනවා...’

සක්විතිගේ පපුවට තිවනක් දනුණි. ඔහු එහෙමම විමුක්තිව රෝහලේ කාමරයක නතර කළේය.

‘අ..යි..යේ...’

අද කොල්ලා කතා කරන විදිහද වෙනස්ය.

‘හරි කොල්ලෝ... මං ඔළුව මසාජ් කරන්නම්... ගොඩක් රිදෙනවද...’

විමුක්ති ඇඳේ පෙරලුනේය. සක්විති රෝහල් ඇඳේ ඉඳගෙන විමුක්තිගේ හිස මසාජ් කළේය.

‘රයිට් අපි බලමු... මං පැයකින් සක්විතිට කතා කරන්නම්...’

‘හොඳයි ඩොක්ටර්...’

විමුක්තිව දැඩි සත්කාර ඒකකයට ගත්තේ ඉන් පසුය. කොල්ලාගේ ජීවිතයට හොඳ දෙයක් වේවායි සක්විති පැතුවේය.

සක්විති මුලින්ම ගත්තේ මේධාටය. ගැණි බයේ ඉන්නා බව ඔහු දනී.

‘මල්ලිව ඉන්ටෙන්සිව් ගත්තා බබා... ටික දවසක් හොස්පිට්ල් ඉන්න වෙයි...’

‘හ..දිස්සියේ මෙ..හෙ..ම..’

‘මං හිතන්නේ කොල්ලට රිකව වෙන්න... ඩොක්ටර්ත් කිව්වා...’

'අ..නේ දෙයියන්ගේ පිහිටයි... මල්ලී ගාවම ඉන්න... මං හවස එන්නම්...'

'ම්... මං ඉන්නම ඕන...'

'හරි මහත්තයෝ මං දන්නවා...'

මොනවා හෝ දෙයක් වෙන්නට යන බව සක්විතිටද නොදනෙනවා නොවේ.

'අ..ම්මේ මල්ලිව ඇඩ්මිට් කළා... දැන් ඉන්ටෙන්සිව් එකේ...'

'ම..ල්ලිට අමාරුද පුතේ...'

'ටිකක්... බයවෙන්නෙපා... මල්ලිට අනතුරක් වෙන්නෑ... සමහර විට සනීප වෙන්නත් පුළුවන් මේ ගමන්ම...'

'ඇත්තද...'

'ඔ..ව්.. මං කතා කළාම එන්න...'

සක්විති කතා කරද්දී හිමාලි බලා උන්නේ සුරම්‍යාගේ කට දෙසමය.

'ඇයි නැන්දේ...'

'අයියව නවලෝකේ නවත්තලා... දැන් ඉන්ටෙන්සිව් දලා...'

'ඇයි.. ඒ...'

හිමාලි ව්‍යාජ ලෙස කඳුළු ගත්තාය.

'බයවෙන්නෙපා පුතේ... ඩොක්ටර් බලනවා... සමහර විට මෙහෙමම අයියට සනීප වෙන්නත් පුළුවන්ලු...'

'ස..නීප වෙන්න...'

'ම්.. කොච්චර දෙයක්ද එහෙම උනොත්...'

'දෙයියනේ මේ මොනවද වෙන්නේ...' හිමාලි පපුවට අතක් තබා ගත්තාය. 'එයාට යංතමට සිහිය එන්න විතරයි ඕන අර ගෑණි මෙයාගේ ඇඟ පුරාම...'

හිමාලි කාමරයට ගොස් ඇඳ මත ඉඳගත්තේ පරාජිත බවිනි.





මොරගොඩ නිවසේ පොඩි ලේලිය වන්නට මැවූ සිහින වලට මොනවා වෙන්නට යනවාදැයි දන්නේ නැත.

'මහ ගෑණි මගේ අධ්‍යාපනෙත් නැවැත්තුවේ මට බලාපොරොත්තු දීලනේ... දැන් බන්දලාම දෙන්න වෙනවා...'

හිමාලි සිතින් කීවාය. එහෙත් විමුක්ති මොනවා කරාවිදැයි දන්නේ නැත.

'කොහොමද එකපාරටම එ..හෙම වු..ණේ... අරකිවත් මතක් උනාද... ඒකි පුදුම විදිහට හොල්මන් කරන්නේ... කොහොම පිස්සු වට්ටලද මන්ද...'

ආදරය... සෙනෙහස පිස්සු වට්ටන්නේ නැත. හදවතට සදකාලික පුරුද්දක් ඇති කරනවා පමණි. පසුව ඒ පුරුද්දට ඇබ්බැහි වෙයි. ඉන්පසු ආත්මයක් වෙනස් වුවද ගැලවීමක් නැත. ඇත්තටම නැත.

# 07

විමුක්තිව දැඩි සත්කාර ඒකකයෙන් රෝහල් කාමරයට දැම්මේ රාත්‍රී අටටය. ඒ වෙද්දී සක්විති සමඟ මොරගොඩ මහතාද උන්නේය.

'මං නින්ද යන්න බෙහෙත් දීලා තියෙන්නේ... ඔළුවට ලොකු රෙස්ට් එකක් ඕන...'

වෛද්‍යවරයා කීවේය.

'ඩොක්ටර් පුතාට කොහොමද...'

'එයාගේ සිහිය ටික ටික එනවා... එයා අහන්නේ එයාගේ ගර්ල්ව... අද මාත් එක්ක ඒ නම කිව්වා...'

'මො..ක..ක්ද ඩොක්ටර්...'

'වර්ෂා... හරිද...'

'හ..රි ඩොක්ටර්...'

සක්විති වෙව්ලමින් මෙන් කීවේය. මොරගොඩ මහතා ඔහු දෙස බලාගෙනම උන්නේය.





'ටි..ක ටි..ක සිහිය එයි... මාස තුනකින් රිකව වෙයි... ඒත්...'

'ඇයි ඩොක්ටර්...'

'මේ ප්‍රශ්නේ විමුක්තිගේ හිතේ තියෙනවා... මතක් වෙන්නේ එයාව විතරයි... ඒත් පැහැදිලිව නෙමේ... අපි උදේට කතා කරමු...'

'හොඳයි ඩොක්ටර්...'

වෛද්‍යවරයා ගිය පසු විමුක්තිගේ නළල පිරිමදිමින් සක්විති බැලුවේ තාත්තා දෙසය.

'තාත්තේ...'

'ලොකු පුතා...'

'තාත්තට දෙයක් කියන්න තියෙනවා...'

'කිය..න්..න ලොකු පුතා...'

එහෙත් සක්විතිට එය කියන්නට ලැබුණේ නැත. සුරම්‍යාත් හිමාලිත් රෝහල් කාමරයට ඇතුල් වූවෝය.

'කොහොමද පොඩි පුතාට...'

සුරම්‍යා ඇසුවේ බොඳ වූ දෙනෙතිනි.

'කොල්ලා හිම්හිට සනීප වෙයි...'

මොරගොඩ මහතා සන්සුන්ව කීවේය.

'පුතාගේ මතකේ එනවා...'

'ඩො..ක්ටර් එහෙම කිව්වද...'

'ම්...'

'එයාට මතක් වෙන්නේ අපි කාවවත් නෙමේ...'

'එ..හෙ..න..ම්...'

'වර්ෂව...'

මොරගොඩ මහතා කියද්දී සුරම්‍යාගේ පමණක් නොව හිමාලිගේද පපුව රත් විය.

හිමාලි සුරම්‍යා දෙස බැලුවේ බඩ කොරවූ ලෙසිනි. සුරම්‍යාගේ

මූහුණේ අබ ඇට පුපුරන්නට විය.

‘මොන බැල්ලිව මතක් උනත් මං පොඩි පුතාගේ ජීවිතේ ගැන තීරණ අරගෙන ඉවරයි...’

සුරම්‍යා කීවේ ඇවිලෙමිනි. වෙව්ලමිනි.

‘එකපාරක් සුරම්‍යා තීරණ අරගෙනනේ මෙහෙම වුණේ... නේද... දරුවව දන් මරා ගන්නද ඕන...’

‘කොල්ලව මංජුලාට බන්දන්න තීරණය කළේ මංද... වේස බැල්ලියෝ ගෙයි දගෙන තමන්ගේ දරුවන්ගේ ජීවිත විනාශ කළේ කවුද දන්නෑ...’

සුරම්‍යා කීවේ හිත් පිත් නැති ලෙසිනි.

‘සනීප වෙන විදිහකට පොඩි පුතා සනීප වෙද්දෙන්... ඊට පස්සේ මං එයාගේ අනාගතේ ගැන බලාගන්නම්...’

මොරගොඩ මහතා මොහොතක් කතා නොකර උන්නේය.

‘දරුවෝ අපි කියන තැන්වල නවතින්නෑ සුරම්‍යා... එහෙම හිතාගෙන ඉන්නත් එපා...’

‘මහත්තයා ඉන්න.. මං ඒවා බලාගන්නම්...’

‘මොනවා උනත් පොඩි පුතා ඒ කෙල්ලව අමතක කරන්නෑ...’

මොරගොඩ මහතා සන්සුන්ව කීවේය.

‘මට මගේ කොල්ලා ගැන විශ්වාසයි... හොඳට විශ්වාසයි...’

සක්විති වචනයක් වත් කතා කළේ නැත. මේවාට දවසක කතා කරන්නට වෙන්නේ කොල්ලාටමය.

*　*　*　*　*　*　*　*　*　*　*　*

වාහනයේ එද්දී හිමාලි සුරම්‍යාට පෙනෙන්නට මහ දිගට ඇඬුවාය. තොල් පට හපාගෙන ඇය මහා දුකක් විඳින බව පෙන්වන්නට තැත් කළාය. සුරම්‍යා වාහනයේදී කතා නොකළේ





රියදුරු ඉන්නා නිසාය. වාහනය මහ ගෙදර මිදුලේ නවත්වද්දීම හිමාලි ඉන් බැස කාමරයට දුවගෙන ගියේ අඬාගෙනමය. ‘ඒ පාර මළ සමයමට මොකද වුණේ...’ සාලයේ උන් අනුලා හිමාලිව දැක සිතුවාය.

සුරම්‍යාද වාහනයෙන් බැස කෙළින්ම ගියේ හිමාලිගේ කාමරයටය. ‘එක්කෝ අර හෙර හොඳ රංගනයක් කරනවා... නැත්නම් මොකක් හරි දේකින් දෙන්නගෙම පපුව ගිනි අරගෙන...’ අනුලා සිතුවාය.

හිමාලි ඇඳේ හරහට මුනින් අතට වැටී පුදුමාකාර ලෙස අඬමින් උන්නාය. ඇය මේ අඬන්නේ බොරුවටම නොවේ. අද හිමාලිට ඇත්තටම දුකය. ඇගේ පපුව හෝස් හෝස් ගා පිච්චී යයි. හදවතේ මවාගෙන උන් සුරංගනා ලෝකයම හිස මත කඩාගෙන වැටුණාක් මෙනි. ගැණි අඬන්නේ ඒ සුරංගනා හීනය අහිමි වීමේ දුකිනි.

‘ඔයාට අඬන්න තරම් දෙයක් උනේ නැනේ මැණික... ඔයා දුක් වෙන්නෙපා...’

සුරම්‍යා හිමාලිගේ හිස පිරිමදිමින් කීවාය. හිමාලි ඇඬුම් වැඩි කළාය. ඇඬුම් මැදම හිස ඔසවා සුරම්‍යා දෙස බැලුවාය.

‘ම..ට මේ.. මො..නා..ද නැ..න්..දේ උ..නේ... මං.. මං කො..හො..ම..ද දැ..න් ජීවත් වෙන්..නේ...’

හිමාලි ඇඬුවේ පුදුමාකාර ලෙසිනි. ඒ ඇඬුම සුරම්‍යාට කොහොමටවත් දරාගන්නට හැකි ඇඬුමක් නොවීය.

‘මං ඔයාට කිව්වනේ මැණික... ඒ පොරොන්දුව එහෙමම තමයි...’

‘ඒ..ත් මේ ගෙ..දර අයට ඕ..න අයියව අ..ර කෙ..ල්ලට දෙ..න්..න නේ..ද නැ..න්දේ... එයාව බලාගත්තේ ම..ම... කැත කුණු අතගෑවේ ම..ම... ම..ට නින්දක් තිබ්බේ නෑ... ජීවිතයක් ති..බ්..බේ නෑ... අ..ද ම..ට...’

සුරම්‍යා තොල් පට තද කරගෙන හිමාලිගේ හිස අතගෑවාය. හිමාලිගේ නෙතින් ගිලිහෙන කඳුළක් කඳුළක් පාසා ඇවිලුණේ සුරම්‍යාගේ වෛරයය. වර්ෂා ගැන ඇතිවන වෛරයය.

'අ..ර බැල්ලි මේ කොහේ හරි ඉන්නවා... ඉඳගෙන නූල් සූත්තර දනවා... ඇයි මොරගොඩ පවුලේ දේපොල ටික දක්කනේ කොළඹ ඇවිත්... පුතාගේ බුක් ෂොප් එකට උනන සල්ලි අතගෑවනේ... ඒවලට හීන දක දක උන්නේ... රත්නපුරේ හාල් හුණ්ඩු බාගේ හදගෙන කකා හිටපු වේසි... මෙහේ ආවට පස්සේ පවුම් දෙකේ තුනේ මාල දම්මේ...'

සුරම්‍යා කීවේ වෙව්ලමිනි... එහෙත් ඇය කියන කතාව අදල වර්ෂාට නොවේ. හිමාලිටය. මේවලට ආසාවක් විනි නම් අද කෙල්ල අනුරාධපුරයේ මහ රෝහලේදී මොරගොඩ පවුලේ මුණුපුරාව රහසේම බිහි කරන්නේ නැත. කොළඹ පැමිණ මොරගොඩ නිවස දෙදරන්නට බඩත් උස්සගෙන ඇවිත් කෑ ගහලාය.

එහෙත් කෙල්ල ඒ කිසිවක් කළේ නැත. ඇය පැතුවේ මොරගොඩ පවුලේ උරුමය නොවේ. විමුක්තිගේ සෙනෙහසේ අයිතියය.

'මා..ම..ත් එ..යා..ට අ..යිය..ව දෙ..න්..න..නේ ය..න්..නේ නැන්දේ... නැ..න්ද මො..නවා කරන්නද... මේ ගෙදර වැඩකාරයෝ පවා ඒ කෙල්ලට ආදරෙයි...'

'පට්ට බැල්ලි ගියේ එහෙම ඉනාවක් කවලා තමයි... ඒකිට මට විතරයි ඔය ඉනාව කවන්න බැරි උනේ... ඒකයි මං ගහලා පැන්නුවේ... ඒ බැල්ලිව ආයෙමත් මේ ගෙදරට ලේලි කරලා ගේන්න මං ඉඩ තියන්නෑ...'

සුරම්‍යා හිමාලිගේ හිස මත සුරත තබා දිව්රුවාය. ඇගේ මේ වචන ගිනිගනිමින් ඇති හිමාලිගේ හිසට පැන් වක්කරන්නාක් බඳුය.

'නැ..න්..දේ...'

හිමාලි කඳුළු පිටින්ම ඇඳ මත ඉඳගත්තාය. ඒ ඇගේ අවසන්





තුරුම්පුවත් ගහන්නටය.

'ම..ට නැ..න්දේ පිහිට වෙ..න්..න.. ම..ට අ..ම්..ම..ට වත් කිය..න්..න බැරි දෙයක් තියෙනවා...'

'මොකක්ද පුතේ...'

හිමාලි යළිත් ඇඬුවාය.

'මං.. මං.. කො..හො..ම..ද නැ..න්..දට ඒක කි..ය..න්..නේ...'

'කමක් නෑ මට කියන්න...'

'ම.. ම.. ම..ට ද..න් වෙ..න කෙ..නෙ..ක් එ..ක්..ක ය..න්..න බෑ...'

'අ..නේ දෙ..යිය..නේ මේ මොනාද ඔයා කියන්නේ...'

'ම.. මා..ව විශ්වාස කරන්න නැ..න්..දේ... අ..යියා ගැ..න ම..ගේ හි..තේ ලොකු ආදරයක් තියෙන්..නේ... එයාට කවදවත් දෙසක් කියන්..න එ..පා...'

'මො..ක..ක්..ද උ..නේ...'

'අ..යියා.. අ..ති..න් මං.. අ..නා..ථ වු..ණා...'

හිමාලි ඒ අහස පොළොව නුහුලන බොරුව සුරම්‍යා ළඟ අඩමින් කීවාය.

'අ..නේ...'

'එ..හෙම වු..ණා නැ..න්දේ... මං.. මං එයාට විරුද්ධ වෙන්නේ කොහො..ම..ද...'

සුරම්‍යා එහෙමම හිමාලිව වැළඳ ගත්තාය. හිමාලි මහ හයියෙන් ඇඬුවේ යටි සිතින් සතුටු වෙමිනි.

'ඔ..යා..ට දරු..වෙක් එ..හෙ..ම...'

'ද..න්..නෑ නැ..න්දේ... මං මො..න..වත් ද..න්..නෑ... ජීවිතේ රැකගත්ත හැම දේම මං එයාට දු..න්..නා... මං.. ද..න් ගෑණියෙක්... ම..ගේ ඉ..ගෙනීමත් මං කඩාකප්පල් කර ගත්තා... මං මෙ..හෙම

අ..ම්මා ළඟට වත් යන්නේ කො..හොම..ද...'

සුරම්‍යා හිමාලිගේ හිස පිරිමැද්දේ ඇය කියන සියල්ල විශ්වාස කරමිනි.

'ඔ..යා බය නොවී ඉන්න... මේවා අම්මට කියන්න යන්න ඕන නෑ...'

'එ..යාගේ දුවට මේවා වෙලා කියලා ඇහුවොත් එ..යා පැලෙයි... මා..ව අදම නුවර එ..ක්කගෙන යයි... මං.. මං.. අසරණ වෙලා නැන්දේ...'

'ඔයා බයවෙන්නෙපා... මං ඔයාව බලාගන්නවා.... එහෙම ඔයාට අනාථ වෙන්න මං ඉඩ තියන්නෑ...'

'අ..යි..යා නැ..ති උ..නො..ත් මං ගෙ..දර ය..න්..නෑ... මහදිම මැරෙනවා... හ..රි අමාරුවෙන් ඉගෙන ගෙන ප..රිස්සමින් ජීවත් උ..නේ...'

'ඒවා මං දන්නවනේ මැණික...'

හිමාලිට ඕන වුණේ සුරම්‍යා ලවා යළි යළිත් විමුක්තිව තමාටම ලැබෙන බවට පොරොන්දු ගන්නටය.

'මො..ක..ක් හ..රි වෙනස..ක් උ..නො..ත් මට කිය..න්..න...'

සුරම්‍යා රහසින් මෙන් කීවාය.

'ම්.. ම..ට මේවා කි..ය..න්..න කෙ..නෙ..ක් නෑ... මං හි..තේ හිර කරගෙන උන්නේ... ම..ට එ..හෙ..ම කරලා එයා දන් ඒ කෙල්ල ගාවට ගියොත් නැන්දේ මං...'

'පොඩි පුතාට ඒවා කරන්න මං ඉඩ තියන්නේ නෑ...'

හිමාලි ඒ වචන වලින් ගිනිගත් පපුව සනසා ගත්තාය.

'අයියා මේ තත්වෙන් උන්නත් ම..ට එයාව දෙනවනම් මං බලාගන්නම්...'

'ඒත් පුතේ සනීප නොවී කසාදයක් කරන්න බෑනේ...'





'මාමයි අයියයි මේධක්කයි මං දිහා බලන්නේ හරියට...'

කියන්නට ගිය දේ හිමාලි ගිල ගත්තාය.

'ඒ ඔක්කොම අර බැල්ලිගේ වැඩ... මේධා ඒකිත් එක්ක හරි එකතුයි... මට පේන්නේ මේධා මාමවත් අල්ලගෙන වගේ...'

'මං.. මා..ම..ට නැ..න්..දට වගේම ආදරෙයි... මං.. මේ ගෙදර වැටිලා මාමවයි නැන්දවයි බලාගන්නම්... මට වෙ..න ජීවිතයක් ඕන නෑ...'

'ඒක මං දන්නවා මැණික...'

'කො..ළ..ඹ ඇ..වි..ත් හැ..ම..දේම නැ..ති වු..ණා ව..ගේ නැ..න්..දේ... මං කවදවත් පිරිමි ළමයෙක් එක්ක යාළුවෙච්ච වත් කෙල්ලෙක් නෙමේ...'

'නැතිවෙච්ච දේවල් දැන් හිතන්නෙපා... කවදහරි මේ ගෙදර යතුරු ටික ගන්නේ මේ අත්දෙකින්...'

සුරම්‍යා ඒ පොරොන්දුව දී නැගිට්ටාය. හිමාලි කොට්ටයේ මුහුණ තද කරගෙනම සිනාසුණාය. ඒ කපටි සිනහව සුරම්‍යා දක්කේ නැත.

# 08

විමුක්ති දැස් අරිද්දී ඔහු ළඟ උන්නේ සක්විතිය. කොල්ලාගේ මුහුණත් වෙනදට වඩා පැහැපත්ය. බැල්මද අසනීප කාලයේ මෙන් නොවේ. පැහැදිලිය. කොල්ලාට ඉක්මනින් සුව වෙන බව සක්විතිට දැන් විශ්වාසය.

'ම..ල්..ලී...'

සක්විති කතා කළේ විමුක්තිගේ මුහුණටම එබීය. ඔහු විමුක්තිගේ හිස පිරිමදිමින්ම විමුක්ති දෙස බලා උන්නේය.

'දැ..න් ඔළුව රිදෙන්නෑ නේද...'

විමුක්ති පුදුමාකාර අහිංසක කමකින් සිනාසුණේය.

'මේ පාර සනීප වෙලාම ගෙදර යන්... හොඳද කොල්ලෝ...'

කොල්ලාට සනීප වෙනවා කියා හිතද්දීත් සක්විතිට සතුටුය. හුස්මක් ගන්නේ මල්ලීට සනීප වූ පසුවයැයි සක්විති එක දවසක තීරණයක් ගත්තේය.

'බ..බා...'





විමුක්ති උගුරෙන් මෙන් ඒ වචන පිට කළේය.

'වර්ෂා නංගී උඹව බලන්න එයි... කෙල්ල ඉන්නේ ටිකක් දුරනේ මල්ලී...'

'නං..ගී...'

යළිත් විමුක්ති කීවේය. විමුක්ති මේ කතා කරන්නේ වර්ෂා ගැනම බව දැන් සක්විතිට විශ්වාසය.

'උඹට නංගිවද ඕන.. ම්...'

ඒ මුහුණ දෙස බලා සිටිද්දී සක්විතිට එන්නේ පුදුමාකාර දුකකි. ජීවිත දෙකක් අද දෙතැනක දුක් විඳින්නේ අම්මාගේ හිතුවක්කාර තීරණය නිසා නොවේදැයි ඔහු සිතුවේය.

'ජ්ලේන්ටියක් බොමුද... ආ කොල්ලෝ...'

විමුක්ති සිනාසුණේය. සමහර සමහර දේවල් දැන් කොල්ලාට තේරුම් ගන්නට පුළුවන් යැයි සක්විතිට සිතුණි. සක්විති තේ එකක් ගෙන්වා ගෙන විමුක්තිව නැගිට්ටවා හිමිහිට පෙව්වේය.

විමුක්තිට සුප් එකකුත් කැමත් රැගෙන ආ හිමාලි රෝහල් කාමරයට එබුණේ ඒ මොහොතේය. සක්විති ඇය ආ බව දැන දැනත් ඇයව ගණන් නොගෙනම තේ පෙව්වේය.

'මං සුප් හදගෙන ආවා... දැන් තේ පොවන්නෙපා...'

සක්විතිගේ කටට ආවේ කුණුහරුපය. එහෙත් ඔහු අමාරුවෙන් හැඟීම් වාවාගෙන තේක පෙව්වේය.

'සුප් එක අපරාදෙනේ... රස්නෙන් පෙව්වනම් හොඳයිනේ...'

යළිත් ඇය කීවාය. සක්විති හිමාලි දෙස බැලුවේ දවෙන දෙනෙතිනි. සක්විතිගේ දෙනෙත් වල වූ ගිනියමට හිමාලි බිම බලාගත්තාය. 'මාත් එක්ක පුදුම වෛරයකින් ඉන්නේ...' හිමාලි සිතුවාය.

'මං අයියා ගාව ඉන්නම්... නැන්ද කිව්වා ලොකු අයියට ගෙදර ගිහින් එන්න කියලා...'

හිමාලි අත් බැඳගෙන කීවාය. සක්විති සිනාසුණේය.

'ගෙනාපු දෙයක් තියෙනවනම් තියලා හිමාලි යන්න... මං මල්ලි ගාව ඉන්නවා...'

'මා..ත් ඉ..න්..න බ..ල..න් ආ..වේ...'

සක්විති කතා නොකර උන්නේ අමාරුවෙනි.

'ඉතින් ඉන්න... මට ප්‍රශ්නයක් නෑ...'

හිමාලි සක්විති ළඟටම ආවේ සක්විතිවත් නොසිතූ ලෙසිනි. නිල් පාට ඩෙනිම් සායට මැජෙන්ටා පැහැගත් විල්ලුද බ්ලවුසයක් ඇඳ උන් හිමාලි වෙතින් ආවේ නුවර කෙල්ලෙකුගේ පෙනුම නොවේ. කොළඹ හොඳ පෝසත් පවුලක කෙල්ලෙකුගේ පෙනුමය. ඇය දැන් සතියකට වතාවක් කොළඹ හොඳම සැලෝන් එකකට යයි. මොරගොඩ පවුලේ ලේලිය වන්නට ඇය කල්තියාම සූදානම් වූයේ එලෙසිනි.

'ලො..කු අයියේ...'

හිමාලි කතා කළේ පහත් හඬිණි.

'ඇ..යි...'

'ම..ට අ..යි..යා එ..ක්..ක ටි..ක..ක් ක..තා ක..ර..න්..න ඕ..න...'

'කියන්න හිමාලිට කියන්න තියෙන දෙයක් කියන්න... මටත් ඔයාට දෙයක් කියන්න තියෙනවා...'

සක්විති කීවේ ඇගේ මුහුණ දෙසම බලාය.

'මෙ..හෙ..ම ක..තා කරන්න බෑනේ...'

'එ..හෙ..න..ම්...'

'කො..හාට හ..රි ගිහින් ක..තා ක..ර..මු... මං එ..න්..නම්... මගේ හිතේ ලොකු අයියා ගැන තරහක් නෑ...'

ගෑණී මේ එන්නේ අමුතුම කතාවකට බව සක්විතිට ඉවෙන් මෙන් දැනුණි. 'උඹේ අරමුණ ඉටු කරගන්න උඹ ඕන පහත් වැඩක් කරයි...' සක්විති සිතින් කීවේය.

'මා..ව තේ..රුම් ග..න්..න මට අයියත් එක්ක මෙ..හෙම තරහ





වෙලා ඉ..න්න බෑ... අයියලා දෙ..න්නටම මං ආදරෙයි...'

ඒ මොහොතේ හිමාලිගේ දෙනෙත් පවා තෙමී ගියේය. ගෑණී අම්මාව රවටා ගන්නට ඇත්තේ කොහොමදැයි දැන් සක්විතිට සිතාගත හැක.

'එ..හෙම කොහෙවත් යන්න මට වෙලාවක් නෑ හිමාලි... කියන්න තියෙන දෙයක් කියන්න...'

සක්විති කීවේ සන්සුන්වය.

'ක..ම..ක් නෑ... මා..ත් එ..ක්..ක මෙ..හෙම තරහ වෙන්නෙපා... මං ඇත්තටම වරදක් කරලා නෑ...'

හිමාලිගේ කඳුළු වැටිණි.

'හ..රි.. හිමාලි පොඩ්ඩක් මේ ප්‍රශ්නෙන් අයින් වෙලා ඉන්නකෝ... මටත් ඔයත් එක්ක අමුතු තරහක් නෑ...'

හිමාලි කතා කළේ නැත. 'මිනිහව නම්ම ගන්න පුළුවන්...' ඇය සිතුවේ එහෙමය.

'ම්.. මං රෑත් ඉන්න බලන් ආවේ... කමක් නෑ.. මං යන්නම් අයියේ... කෑම උණුවෙන්ම තියෙනවා... මං යනවා...'

හිමාලි අහිංසකව එසේ කියා විමුක්ති දෙස බැලුවාය.

'ය..න්..නම් අයියේ...'

හිමාලි රෝහල් කාමරයෙන් ගිය පසු සක්විති බැලුවේ විමුක්ති දෙසය.

'සනීප වෙලා මේවා විසඳගන්න ඕන උඹ... උඹ වෙනුවෙන් මං තීරණ ගන්නෑ... උඹට කැමති දෙයක් කරපන්... හැබැයි උඹට පැලෙන්න ආදරේ කළේ අර කෙල්ල... උඹේ බබා...'

'බ..බා..'

විමුක්තිද ඒ අවසන් වදන කීවේය.

'ම්... ඒකි මේ වගේ සූත්තර ගෑණියෙක් නෙමේ... හරි හොඳ කෙල්ල... උඹට හරියන්නේ ඒකිවම තමා...'



Hemantha007
For Free Distribution Only

සක්විති අවංකවම කීවේය.

* * * * * * * * * * *

වර්ෂා උන්නේ කිරිකැටියා දෙස බලාගත් ගමන්මය. පැය කීයක් මෙහෙම බලාගෙන උන්නාදයි ඇයටම මතක නැත. රෑ නමයට පමණ ඇය පුතාව ඇහ සෝදගෙන චිත් දිග කිරි වඩියක් දුන්නාය. තවම ඇවිදින්න අමාරුය. එහෙත් වර්ෂා නැගිට්ටේ හිතේ ශක්තියෙනි.

දන් කරන්නට මහ වැඩ ගොඩක් ඇත. සියල්ලටම පෙර ජීවත් වන්නට විදිහක් පාද ගත යුතුය.

'තාත්තියි අම්මියි එකතු වෙන්න තව චූට්ට කාලයක් යයි... එතකල් මං ඔයාව සැපෙන් බලාගන්නෝන... අම්මිට පුංචි දුකක් විදින්න උනත් ඒක මට දුකක් නෙමේ...'

වර්ෂා නිදන පුතුගේ සිනිඳු හිසකේ අතගා කීවාය.

'ඔයා තාත්තිමයි... එයා දැක්කොත් පැලෙයි පැටියෝ... අනේ ඔයාව එකපාරක් මට එයාට පෙන්නගන්න විදිහක් නැනේ... එකපාරක්...'

එහෙම සිතද්දී වර්ෂාගේ දෙනෙත් තෙත් වීගෙන යයි.

'එයා හරි ආස වෙයි... ඔයාව ගිහින් අතට දුන්නොත් එයා අම්මිව ඉඹගෙන ඉඹගෙන යයි... හැංගිලා ඉඳගෙන මේකද කළේ කියලා අහයි... තාත්තිට ඇඩෙයි... ඒත් බලන්නකෝ අපිට තාත්ති ගාවට යන්න බැනේ... තාත්තිට ඌවත් වෙලානේ...'

වර්ෂා දෙනෙත් පිටි අත්ලෙන් පිසදගෙන පහත් වී පුතාව සිප ගත්තාය.

'තාත්තිත් විමුක්ති මොරගොඩ... ඔයත් විමුක්ති මොරගොඩ... පුදුමයි...'

වර්ෂාගේ නම වර්ෂා සත්සරණී මොරගොඩය. ඇගේ වාසගමට





මොරගොඩ වාසගම ආවේ නාලිනීගෙනි. නාලිනී වර්ෂාව ඉපදෙද්දී ඇයට දුන්නේ වර්ෂාගේ පියාගේ වාසගම නොවේ. ඇගේ වාසගමය. අද වර්ෂා පුතාව ඉපදෙද්දී ඔහුට දුන්නේ තමාගේ වාසගමය. පුදුමයකට මෙන් කොල්ලාගේ තාත්තාගේ වාසගමත් මොරගොඩමය.

'තාත්තිවයි පුතාවයි පැටලෙයිද දන්නෑ... ඒත් කමක් නෑ... ලොකු විමුක්තියි පොඩි විමුක්තියි... තාත්ති අපිට හම්බඋනාම එයා හිනාවෙයි...'

දෛවය ඒ දවස කවද උදා කරයිද... එහෙත් කවද හෝ ඒ සිහිනය සැබෑ වන බව වර්ෂා දනී.

'ඉස්සරටත් වඩා දන් මං තාත්තිට ආදරෙයි... එයත් එහෙම ඇති... ඔන්න ඔයා තමයි තාත්තිවයි අම්මිවයි එකතු කරන්න ඕන...'

එදට මේ දැස් යළිත් දිගටම තෙත්වෙනු ඇත. අසාමාන්‍ය ලෙස තෙත්ව යනු ඇත. එහෙත් එදට මේ හිස අතගා තමාව ළඟට කරගෙන සනසන්නට කෙනෙක් ඇත.

'කොල්ලා දෙයිද කෙල්ලේ...'

ප්‍රියංවද පැමිණ ඇසුවේ රහසින් මෙනි.

'ම්.. කිරි බීගෙන බීගෙන ගිහින් දෙයි... ඇස් කරකව කරකව බලනවා ප්‍රියා...'

වර්ෂාට එහෙම කියද්දීත් දැස් තෙත් වෙයි. ප්‍රියංවද ඇගේ අත පිරිමැද්දය.

'මං වටේම දුම් ඇල්ලුවා... පැටියට කැස්ස එයි කියලා කාමරේට ගෙනාවේ නෑ...'

'මට සුවඳ ආවා...'

'කොල්ලා හරි සනීපෙට ඉන්නේ නේද කෙල්ලේ...'

'ම්...'

'කොහොම ඉන්න ඕන පැටියෙක්ද... ලොකු ගෙදරක... ලස්සන

කාමරේක... පනස්දහක් විතර වටින කොට් එකක...'

'ඒත් පැටියා ඉපදුන මේ පැල මට මාළිගාවක් වගේ ප්‍රියා... මේ කටු බිත්ති දිහා බලාගෙන කොල්ලා හැදිච්චදෙන්... මටවත් මගේ කොල්ලටවත් මොරගොඩ පවුලේ සැප ඕනේ නෑ... එයාව ලැබුණොත් ඇති...'

ප්‍රියංවද වර්ෂා දෙස බැලුවාය.

'ඇයි ප්‍රියා...'

'අයියගේ අසනීප තත්වේ දන් කො..හො..ම..ද දන්නෑ නේද...'

'ඒ ගැන මාත් ඉන්නේ ගින්දරේ ප්‍රියා...'

'මං ශ්වේතා නංගිට ඕන නම් කතා කරන්නම්...'

'අපි බලමු ප්‍රියා...'

කෙල්ල මොනවා කිව්වත් කොළඹ වෙන්නේ මොනවාද කියා දනගත යුතුය. මොනවා වුවද මේ පැටියාගේ තාත්තා විමුක්තිය. ඒ අයිතිය මොනම හේතුවක් නිසාවත් නැති වන්නට දිය නොහැක.

'මො..නා..ද හිතුවේ ප්‍රියා...'

'අ..යියා ගැ..න...'

'එයා අසනීපෙන්නේ ඉන්නේ...'

'මි.. සනීප වෙන්නත් පුළුවන් නේද කෙල්ලේ...'

'දන්නෑ ප්‍රියා...'

හිම්හිට මොරගොඩ නිවසට වත් ගත යුතුය. නැතහොත් පොත්හලට කතා කළ යුතුය. ප්‍රියංවද සිතුවාය.

'අම්මගේ කිරිමාළු හොද්දේ සුවඳ කොහොමද... පරා පැටව් කිරි මාළු හදලා පොළොස් උයලා ඉඳි ආප්ප හදනවා... කිරි එරෙන කෑම...'

'අම්මගේ කෑමවලට පැටව් දෙන්නෙකුට කිරි එරෙනවා ප්‍රියා...'

'කොල්ලෝ තනේ එල්ලිච්ච ගමන්ලු... අම්මට තිවනක් දෙන්නෙම





නැලු...'

'එයාට අමාරු නිසා මං යටට මොනවත් අඳින්නෙත් නෑ ප්‍රියා...'

'බයවෙන්න එපා උඹ කැත වෙන්නෑ...'

'එ..ක්..කෙ..නෙ..ක්ට ලස්සන උනොත් මට ඇති...'

වර්ෂා සිනාසී කීවාය.

# 09

ප්‍රියංවදා ගත්තේ පොත්හලට නොවේ. පොත්හලට ගන්නවානම් කතා කළ යුත්තේ ශ්වේතාටය. දන් ඇතිවී තිබෙන තත්වය අනුව කෙල්ල ඉන්නා තැනක් අසන බව ප්‍රියංවද දනී. ප්‍රශ්නය ඒ තරම්ම අවුල් කරගත නොහැක.

ප්‍රියංවදට ඕන වූයේ විමුක්තිගේ තත්වය බලාගන්නට පමණි. මොනවා වුවද අර ඉපදී ඉන්නා දරුවාගේ පියා ඔහුය. කෙල්ල කියන්නාක් මෙන් මොන දේ නැතත් ඔහුව ලැබිය යුතුය. අද කෙල්ල ඉවසන ඉවසිල්ල පුදුමාකාරය. කෙල්ල එහෙම ඉවසන්නේ කවද හෝ විමුක්තිව ලැබේයැයි සිතාගෙනය.

එහෙත් මේ ලෝකයේ වෙන්නේ හිතාගෙන ඉන්නා දේම නොවේ.

මහගෙදර කවුරුවත් තමාගේ හඬවත් අඳුනන්නේ නැත. විමුක්තිගේ මිතුරියක් කියා කතා කළ හැක.

පොළට කිට්ටුවෙන් වූ කොමියුනිකේෂන් එකකට ගිය ප්‍රියංවද මහ ගෙදරට ඇමතුමක් ගත්තාය. හිතට චකිතයක් ආවද ඇය ධෛර්යයක් ගත්තාය. දන් මේ ජීවිතයේ කරන්නට බැරි දෙයක්





නැත.

'හෙ..ලෝ...'

එහා පසින් ආවේ ලාබාල කටහඬකි. ඇත්තටම කතා කළේ තනුජාය.

'කවුද කතා කරන්නේ...'

'ආ.. විමුක්තිට කතා කරන්න පුළුවන්ද...'

'පුංචි මහත්තයටද...'

'ආ.. ඔව්...'

'මේ කවුද කතා කරන්නේ...'

'මං විමුක්තිගේ යාළුවෙක්... නතාෂා කියන්නකෝ... විමුක්ති දන්නවා...'

ප්‍රියංවද කටට ආ බොරුවක් කීවාය. කතා කරන්නේ ගෙදර වැඩට ඉන්නා කෙනෙකි. ඒත් අනුලක්කා නොවන බව ඇය දනී. අනුලාගේ කටහඬ ප්‍රියංවදට මතකය.

'පුංචි මහත්තයා ගෙදර නැනේ...'

'ආ.. එළියට ගිහින්ද...'

'මේ මිස් මොනවත් දන්නැද්ද...'

'මං ළඟදි ආවේ... මොනාද උනේ...'

'පුංචි මහත්තයා උන්නේ අසනීපෙන්නේ... දන් ඉන්නේ නවලෝකේ... එහෙට ගියොත් බලන්න පුළුවන්...'

'නවලෝකේ...'

'ඔ..ව් කොළඹ හොස්පිට්ල් එකක් තියෙන්නේ...'

'ආ.. මං දන්නවා... විමුක්තිට අමාරුද ගොඩක්...'

ප්‍රියංවද නළලතින් වැගිරෙන දහදිය පිසදමමින් ඇසුවාය.

'දන් ගොඩක් හොඳයි... අමාරු වෙලා උන්නේ... දන් ටික ටික සනීප වෙනවා...'

'ආ.. ඇත්තද... නවලෝකෙට ගියොත් විමුක්තිව හම්බවෙන්න පුළුවන්ද...'

'පුළුවන් මිස්... රූම් නම්බර් එක නම් මං දන්නෑ...'

'මං බලන්නම්...'

'හොඳයි මිස්...'

ප්‍රියංවද දිග හුස්මක් ගත්තාය. කතා කළ එක හොඳයැයි ප්‍රියංවදට සිතුණි.

'දන් ඉස්සරට වඩා අයියට හොඳයිලු... ට්‍රීට්මන්ට් වලට නවලෝකේ නවත්තලා ඇති... කෙල්ල දන්නවනම් දුවයි...'

ප්‍රියංවද සිතුවාය. ඇය පොළට ගියේ මේවා ගැන සිතමිනි. ප්‍රියංවද පොළට ආවේ කිරි එරෙන කෑම ටිකක් සොයාගෙන එන්නටය. සුද්ද කළ අලුත්ම වැව් කොරළි පොලේ තිබෙනු දක ප්‍රියංවද ඉන් ටිකක් වැඩිපුර ගත්තාය. අම්මා කොරළි මාළුව හදන්නේ කහත් දෙහි ඇඹුලුත් අල්ලා බැදය. රහ එච්චරය.

ඇතිවී තිබෙන තත්වය කෙල්ලට කියනවාද නැද්ද කියා ප්‍රියංවද සිතුවාය. විමුක්ති මේ මොහොතේ ඉන්නේ ගෙදර නොවන නිසා ඕනා නම් බලන්නට යන්නටද පුළුවන. එහෙත් විමුක්ති ඉන්නේ තනිවම නොවන බව ප්‍රියංවද දනී.

'සමහර විට හැමදේම අවුල් වෙන්නත් පුළුවන් එහෙම ගියොත්...'

ප්‍රියංවද ගෙදර ආවේ මේවා සිතමිනි.

'අම්මා කියපු ඔක්කොම ගෙනාවා...'

බඩු මලු දෙක කුස්සියෙන් තබමින් ප්‍රියංවද කීවාය.

'කොල්ලට පණ ඇරලා... බල බල අඩනවා... ඉඹගත්ත ගමන්...'

අම්මා කීවේ රහසින් මෙනි.

'හැ..මදේම නැතිවෙච්ච කෙල්ලනේ අම්මේ...'

'ඒත් මේ දරුවා වාසනාවන්තයි පුතේ...'

'ම්... මං පැටියව නාවන බඩුත් ගෙනාවා... අලුත් වෙනිවැල්





ටිකක් හම්බවුණා...'

'හෙට බ්‍රහස්පතින්ද... හොඳ දවස... හෙටම නාවමු...'

'ඔ..ව්.. එහෙම කරමු... ආ අම්මටත් කිරි පැකට් එකක්...'

ප්‍රියංවද කාමරයට එබුනේ වැනිලා කිරි පැකට් දෙක කපාගෙන බට දෙකක්ද දමාගෙනමය. ඉස්සර පාසැල් කාලයේ කෙල්ලෝ දෙන්නාගේ ප්‍රියතම කෑම වූයේ කැන්ටිමේ රෝල්ස්ය. බීම වූයේ සීතල වැනිලා කිරි පැකට්ය.

'චු..ට්..ටං මහත්තයා... ඇ..යි පැටියෝ... ම්.. අම්මි එක්ක හුරතලේද... ම්... බෑ බෑ... අපිට ගන්න බෑ... ලොකු අම්මි අතේ දුවිලි... පොලේ ගියානේ...'

ප්‍රියංවද කීවේ පැටියගේ මූණ දෙස බලාගෙනය. ඒ මූණ දුටු පසු මහන්සිය කොහේ යනවාද නැත.

'බීපන් කෙල්ලේ... අම්මා උයද්දී පරක්කු වෙයි... අද කොරළි ගෙනාවා... සුද්ද කරලා උයන්නෙපැයි...'

සීතල වැනිලා කිරි පැකට් එක අතට ගනිද්දී වර්ෂාට සිහිවූයේ පාසල් දවස්ය.

'කැන්ටිම මතක් උනා නේ...'

ප්‍රියංවද අසද්දී වර්ෂා සිනාසුණාය.

'ඒක මතක් වෙලා තමා මාත් ගත්තේ...'

'ප්‍රියා අම්මට ඕක දීපන්... අපි දෙන්නා මේක බොමු...'

'අම්මටත් එකක් දීලා ආවේ බං...'

සීතල වැනිලා කිරි උගුරෙන් පහළට යද්දී පුදුම සනීපයක් දනෙයි.

'කෙල්ලේ...'

'ප්‍රියා...'

කොළඹට කතා කළ බව නොකියා ඉන්නට ප්‍රියංවදට සිතෙන්නේ නැත.

‘මං නිකමට කොළඹට කතා කළා...’

‘කො..ළ..ඹ..ට කිව්වේ ප්‍රියා...’

‘ම..හ..ගෙ..දරට...’

‘එ..හෙම ඇ..යි ප්‍රි..යා...’

‘නිකං මං ගත්තේ කෙල්ලේ... අයියට දන් කොහොමද කියලා බලන්න... අපි ඒවත් බලන්නෙපැයි...’

වර්ෂා ප්‍රියංවද දෙස බලා උන්නේ පුදුමයෙනි.

‘එහේ කාට ක..තා ක..ර..න්..නද ප්‍රියා...’

‘මං විමුක්ති අයියගේ යාළුවෙක් කියලා කතා කළේ... ගත්තේ වැඩට ඉන්න ගෑණු ළමයෙක්...’

‘අ..නුල..ක්කා නෙමේ...’

‘නෑ.. වෙන කෙල්ලෙක්...’

‘ඉතින්...’

වර්ෂා හුස්ම හිරවී ගිය ගාණට කතා කළාය.

‘විමුක්ති අයියා ගෙදර උන්නෑ...’

‘ඈ..යි ප්‍රියා...’

‘අයියට දන් චුට්ට චුට්ට සනීප වෙගෙනලු එන්නේ...’

‘ඉ..ති..න්...’

‘දන් අයියා ඉන්නේ නවලෝකේ නවත්තලා...’

‘ස..නීපත් වෙනවනම්...’

‘ට්‍රීට්මන්ට් වලට නවත්තලා ඇති කෙල්ලේ...’

වර්ෂා හුස්මක් වත් නොගෙන බලා උන්නාය.

‘එ..යාට ස..නීප වෙ..න..වනම් කො..ච්..චර දෙයක්..ද...’

‘ම්.. තාම සම්පූර්ණයෙන් සනීප වෙලා නෑ...’

වර්ෂා බැලුවේ පැටියා දෙසය. ‘තාත්ති ඉස්පිරිතාලෙලු... පව්...’





ඇයට හීල්ලින.

‘කෙ..ල්ලේ...’

ප්‍රියංවද කෙල්ල ඇඳ උන් බෙඩ් ජැකට් එකෙන් පිටතට පැමිණ තිබූ ඇගේ උරතලය මත සුරත තැබුවාය.

‘ම්...’

‘අයියා ඉන්නේ ගෙදර නෙමේ...’

‘එ..ත..කොට...’

‘උඹට අයියව බලන්න ඕන නම්...’

‘බලන්න ඕන නෑ කියලා කොහොම කියන්නද ප්‍රියා...’

වර්ෂා කීවේ අඩමිනි. ඒ මුහුණ මේ දන් ළඟ ඉන්නාක් මෙන් මැවි මැවී පෙනෙන්නට විය.

‘කෙ..ට්..ටු වෙ..ලා..ද මහත් වෙ..ලාද... වෙ..නස් වෙලාද... මං මොන..ව..ත් ද..න්..නෑ... ඒ ගින්දර උහුලගෙන තමා කෙල්ලේ මේ ජීවත් වෙන්නේ... ඒක පු..දුම ගින්දරක්...’

‘ම..ට තේ..රෙ..නවා ර..ත්..ත..ර..න්... ඒකනේ මං මේ හොයලා බලන්නේ...’

‘උ..ඹට පින් ප්‍රියා...’

‘ඕනනම් පැටියවත් අරගෙන පාන්දරක ය..න්... වෑන් එකක් කතා කරගෙන... අම්මවත් දගෙන... ම්...’

වර්ෂා කතා නොකර බලාගෙන උන්නාය.

‘අයියා ළ..ඟ ක..වු..රු ඉ..න්..නව..ද ද..න්..නෑ..නේ ප්‍රි..යා...’

‘ඒකනම් දන්නෑ ත..මා කෙල්ලේ...’

වර්ෂාට හීල්ලින.

‘මං.. ටි..ක..ක් හි..ත..න්..න..ම්...’

‘කොහොමත් හිතලා බලලම තමා ය..න්න ඕන... දන් සෙල්ලම් කරන්න බෑනේ...’

'පුතාව එක්කං යන්න පුළුවන්ද...'

'වාහනේකනේ... පුළුවන්... දන්මම නෙමේ... සතියකින් විතර...'

'ම්...'

'හිතලා බලපන්... උඹ දුක් විඳිනවා කියලා මට පේනවා...'

වර්ෂා කල්පනා කළේ දරුවා දෙස බලාගෙනමය. 'මට තාම ඔයා ගැන කාටවත් කියන්න බෑ...' වර්ෂා සිතුවේ දිග සුසුමක් හෙළමිනි.

* * * * * * * * * *

සක්විති ගෙදර ආවේ මහ රෑ දහයට පමණය. මේධාව දකිද්දී සක්විතිට දුක සිතුණි. ඇය ඇරෙන්නට ලෝකයේ වෙන ඕනම ගෑණියෙක් ලැබුණා නම් අද ප්‍රශ්නය. සහෝදරයන්ගේ වැඩවලට සැමියාව එහෙම නිදහස් කරන ගෑණු නැත.

සමහර විට මේධා ඒ තරම්ම කැප කරන්නේ ඇයද මල්ලීට ඒ තරම්ම ආදරේ නිසා විය යුතු යැයි සක්විතිට සිතුණි.

'ම..ල්ලී ගා..ව ද..න් කවුද ඉන්නේ...'

සක්විතිව දුටුවනම මේධා ඇසුවාය.

'ධ..නේ අයියව තිබ්බා බබා... මං පාන්දරම යනවා...'

'මං හිතුවා අර සමයම කියලා...'

සක්විති සිනාසුණේය.

'ඇයි හිනාවුණේ...'

'එයත් හොඳ සමයමක් තමා...'

'ඇ..යි...'

සක්විති හිමාලි ඔහුට කියාගෙන ආ දේ කීවාය.

'පර බැල්ලියෙක්... කරන්න පුළුවන් හැම බලු වැඩම කරයි...'

'මං ඒකි ගැන දන්නවා බබා...'





'ඊට වඩා මං මගේ මහත්තයා ගැන දන්නවා...'

සක්විති ප්‍රිය කළේ මේ විශ්වාසයය. ඔහුව හොඳ මිනිහෙක් කළේ මේ විශ්වාසයය.

'ම..ල්ලිට ඉක්මනට සනීප වෙයි බබා... මේ ප්‍රශ්න ඔක්කොටම විසඳුම් එදාට එයි...'

'කො..ල්ලා ක..තා කරනවද...'

'ටි..ක.. ටි..ක... බබා කියනවා... නංගි කියනවා... හිනාවෙනවා...'

'කෙල්ලව මතක් වෙච්ච එක ඇති... අපිව අමතක උනත් කමක් නෑ...'

මේධා කීවේ සැනසීමෙනි.

'අම්මා පරණ නාඩගම නටන්න යන්නේ... මට බය ඒකයි...'

'දන් තත්වේ වෙනස් මහත්තයෝ...'

'කියන්න බෑ මල්ලිව හිර කරයිද කියලත්... ඌ මං වගේ නෙමේ... අම්මට බයයි...'

'ලොකු පුතාගේ බය ඇරියේ මංනේ ඉතින්...'

සක්විති සිනාසුණේය.

'තාත්තා කෙල්ල ගැන හිතනවා... ඒ ඇති.. අපි බලමු...'

'ම්.. උදේ යද්දී මාවත් එක්කං යන්න...'

'සමහර විට දන් අඳුර ගනී...'

'එහෙම නොවෙන්න විදිහක් නෑ බබා...'

'මං ඉච්චෙත් නෑ එනවා කිව්වේ නැති නිසා...'

'මං නැත්නම් බඩගින්නෙද ඉන්නේ...'

සක්විති ඇසුවේ මේධාව බදගෙනය.

'ම්.. තේකක් බීලා ඉන්නවා... සොසේජස් බැදලා පාන් හදන්නද...'

මේධා ඇසුවේ සක්විති එහෙම කන්නට ආසා බව දන්නා නිසාය.

'මරු... දුව නිදිද...'

'ඒකනේ ඒකිත් නිදි... මං පාළුවෙන් හිටියේ...'

'ඉක්මනට මේ ප්‍රශ්න ඉවර වෙයි... ඊට පස්සේ දලා කොහේවත් යන්නෑ...'

'ම්.. මං දන්නවා...'

මෙඩා කීවේ ඇගේ කුස හරහා වූ සක්විතිගේ දෑත් දෙපසට කරමිනි.





# 10

වර්ෂා මහ රෑ දහ අතේ සිතුවේ විමුක්තිව බලන්නට යනවාද නැද්ද කියාය. ඒ යන ගමන අවදානම්ය. විමුක්ති ළඟ කවුරු උන්නද එවිට තමා ආ බව දනගනී.

'ගොඩක් වෙලාවට ඇත්තේ ලොකු අයියා... ඒත් අර ඉන්නවයි කියන කෙල්ල හිටියොත්... එයා අයියා ගාවමලු... එහෙම දෙයක් මං බලන්නේ කොහොමද...'

එසේ සිතුවද පපුව ඇවිලෙයි. පපුවට දවිල්ලක් ආ විට එය නැති කිරීම පුදුම තරම් අමාරුය.

'දන් හිතෙන්නේ ඔයාව ඇවිත් බලන්නමයි... මං ලොකු දුකක් විදින්නේ... හැම දුකක්ම දරාගෙන ටික කාලයක් උන්නේ අපේ පුතා නිසා... ඉස්සරහට ජීවත් වෙන්න මාත් හිත හදගන්න ඕන...'

වර්ෂා සිතුවේ පැටියාට කිරි දෙමිනි. දැන් වේලාව රෑ දහයත් පසුවී ඇත. අද හැන්දෑවේ නිදගත් නිසාදෝ පුතා රෑ වන තුරු ඇහැරගෙන ඉඳියි.

'පුතා ඉපදිලා අදට සතියයි... එයාව දුරක එක්කන් යන්නත්

මොකක්ද වගේ... ඒත් ඔයාව ආයෙත් ගෙදර එක්කගෙන ගියාට පස්සේ මට බලන්නවත් බෑ... නැන්ද ඉන්නවා...'

වර්ෂා දහ අතේ සිතුවාය.

'ඔයාව එකපාරක් දක්කොත් තව අවුරුද්දක් වත් මට හිත හදගෙන පුතාව හදගෙන ඉන්න පුළුවන්... මං ගොඩක් වැඩ කරන්න ඕන... අපට රත්තරන් ජීවත් වෙන්නත් විදිහක් නෑ... පොඩි හෝටලයක් කරන්නයි ඉන්නේ... ඒවා කරන්නත් මේ හිඟන්නිට ශක්තිය ඕන... විනාඩි පහකට ඔයාව දක්කොත් ඒ හයිය මට එයි...'

කොල්ලා නිදිය. ඒත් වර්ෂා ටික වේලාවක් එහෙමම තබාගෙන උන්නාය. සනීප පාට නින්දක් පැටියාට ගොස් ඇත. වර්ෂා පපුවට කෙලින් තබාගෙන පැටියාගේ ගුඩුස් ඇරියාය.

'හදිස්සියට ඔයා කුක්කු බීගෙන බීගෙන ගිහින් බඩේ හුළං පිරිලා... පව්...'

පුතාගේ මුවින් ලොකු ගුඩුස් එකක් යද්දී වර්ෂා සිතුවාය. ඇය පුතාව සනීපෙට ඇඳ මත තබා රෝසපාට පොරවනයෙන් පෙරෙව්වාය.

'යනවනම් පාන්දර ගිහින් එන්නත් පුළුවන්...'

වර්ෂා සිතුවාය.

'ඔයාව මං බලන් නැත්නම් කවුද බලන්නේ... ඇරත් ඔයාට හැමදේම මතක නැලු... මට බලාගන්න ඕන මාවත් මතක නැද්ද කියලා...'

එසේ වන්නට කොහොමත් විදිහක් නැතැයි වර්ෂාට සිතුණි. 'මම උන්නේ ඔයාගේ පපුව උඩම... ඔයාට මාව අමතක වෙන්නෑ... මං ඒක දන්නවා...'

'සමහර විට ඔයාගේ බබා ඔයාව බලන්න එනකල් ඔයා බලාගෙනත් ඇති... දවසක අහයි ඇයි මාව බලන්නවත් හිතුනේ නැද්ද කියලා... එදට මට උත්තර නැති වෙයි... ඔයාව බලන්න ආයෙත් අවස්ථාවක් එන්නෑ...'





වර්ෂා නැගිට්ටේ දිග සුසුමක් හෙළාය.

'ප්‍රියා...'

කාමරයේ දෙරකඩ හිටගෙන වර්ෂා කතා කළාය.

'එනවා කෙල්ලේ...'

ප්‍රියංවද ආවේ දුවගෙනය.

'අම්මා උයනවා බලන් හිටියා... රෑ වෙලා ඉව්වේ උණුවෙන් කන්නෝන නිසා... ඇයි කෙල්ලේ...'

ප්‍රියංවද වර්ෂාගේ අතකින් අල්ලාගෙනම ඇසුවාය.

'මේ වෙලාවේ බලාගන්න බැරි උනොත් අයියව ආයේ බලාගන්න බැරිවෙයි... නේද ප්‍රියා...'

'ගෙදර එක්කං යනවනේ කෙල්ලේ... අපි කොහොමද මහ ගෙදරට යන්නේ...'

'ම්.. ඒත් අයියා ළඟ කවුරු ඉන්නවද කියලා අපි දන්නෑනේ... ගිහින් හැරිලා එ..න්..න උනොත්...'

'ඒක ඇ..ත්..ත... කවුරු ඉන්න වෙලාවට ගියත් ප්‍රශ්නයක්...'

'ම්.. තනියම දලා නෑනේ නේ..ද...'

ප්‍රියංවද ඇඳේ ඉඳගෙන දහ අතේ කල්පනා කළාය.

'කෙ..ල්ලේ...'

'ම්...'

'උඹ අයියව බලන්න ආවා කියලා එයාලා දැනගත්තට කමක් නෑනේ...'

'මා..ව දැ..කි..න්..නැ..තුව දැනගත්තට කමක් නෑ... ඒත් යද්දී දකිනවනේ...'

'අර කෙල්ල හිටියොත්...'

'ම..ට කමක් නෑ... එයා මාව දන්නෑනේ...'

'ම්..'

'ඒත් ලොකු අයියා හිටියොත්... නැන්ද හිටියොත්... අනුලක්කා ධනේ අයියා හිටියොත්... මං මොනාද කියන්නේ...'

'ඒකත් ඇත්ත...'

ප්‍රියංවද දහ අතේ සිතුවාය.

'ම..ට පැය බාගයක් දීපන් කෙල්ලේ...'

'කොහෙ ය..න්..නද...'

'මං මාමලගේ ගෙදරට දුවලා එන්නම්... ඩිරෙක්ටරියේ නවලෝක එකේ නම්බර් එක ඇති නේද...'

'ඔ..ව්...'

ප්‍රියංවද මොනවා කරන්නට යනවාදැයි වර්ෂාට සිතා ගන්නට නොහැකි විය. ප්‍රියංවද එන තුරු වර්ෂා උන්නේ පිච්චි පිච්චීය.

'ඇයි ප්‍රියා...'

හති දගෙන දුවගෙන ආ ප්‍රියංවදගෙන් වර්ෂා ඇසුවාය.

'මං හිතපු කෙනා තාම නවලෝකෙ ඉන්නවා... ඒක වාසනාවක් කෙල්ලේ...'

'කවුද...'

'ගෙවල් ළඟ කෙල්ලෙක්... සුජාති කියලා... දවසක් හම්බවෙලා කිව්වා නවලෝකේ ට්‍රේනි පියුපිල් නර්ස් කෙනෙක් විදිහට වැඩ කියලා...'

'ඉතින්...'

'මං දන් කතා කළා...'

'එ..යා හිටියද...'

'නෑ ඕෆ් වෙලා... හොඳ වෙලාවට ෆෝන් එකේ හිටපු ගර්ල් කෙල්ලව දන්නවා... සුජාති පත්බේරිය... කෙල්ල ඕෆ් වෙලා හතට... උදේට නමයට වැඩට එනවලු...'





'ඒත් ප්‍රියා...'

'හිටපං වස්තුවේ... මං පොටක් පාදලා දෙන්නම්... ෆෝන් එකට උදෙන්ම රිලෝඩ් එකක් දගෙන මං වැඩේ කරන්නම්...'

'එ..ත..කො..ට...'

'අපි අනිද්ද යං... ගිහින් එන විදිහකට මූණ දෙමු... අයියා ඉන්න රූම් නම්බර් එක වත් අපි දන්නෑනේ...'

'ම්.. උඹ පව්...'

ප්‍රියංවද සිනාසුණේ කාරුණිකවය.

'ම..ට වි..නා..ඩි ප..හ..කට අ..යියව බල..න්න තිබ්බොත් ඇති ප්‍රියා...'

'ඒ බලලා උඹට මෙච්චර සතුටක් නම් සදහටම අයියව අයිති උන කාලෙක...'

'මං මැරෙයි...'

වර්ෂා කිව්වේ අඩමිනි.

* * * * * * * * * * * * * *

ප්‍රියංවද උදේ පාන්දරම හන්දියට ගොස් ඇගේ ජංගම දුරකථනයට රුපියල් පනස්සියක රීලෝඩ් එකක් දමා ගත්තාය. ෆෝන් එකක් එක දිගට තියාගෙන ඉන්නට තරම් වත්කමක් කෙල්ලෝ දෙන්නාටම නැත. ඇරත් එහෙම තියාගෙන කතා කරන්නට කෙනෙක් මේ ලෝකයේ ඇත්තේද නැත.

එහෙත් මේ වැඩේ කළ යුතුමය. කෙල්ල කොහොම කිව්වද ඇය ඉන්නේ අමාරුවෙනි. පපුවක් එහෙම තද කරගෙන ඉඳීම පහසු නැත. ඇරත් ඇය මේ සියල්ල දරාගෙන පැටියාව හැදිය යුතුය. හෙට අනිද්ද ජීවත් වන්නට මොනවා හෝ කළ යුතුය. කලින් ප්‍රියංවද සිතා උන්නේ මෝලක බිල් ලියන්නට යන්නටය. එහෙත්

මොනවා හරි එකතු වෙලා කරමු කියා ප්‍රියංවදව නවත්වා ගත්තේ වර්ෂාය.

ඒ මොනවා කරන්නත් හිතේ නිදහසක් තිබිය යුතුය. ගැණියෙක්ගේ පපුව ගැන ප්‍රියංවද හොඳට දනී. ඊටත් වඩා බට්ටා කාලයේ සිට මේ කෙල්ලගේ හැටි ප්‍රියංවද ඊටත් වඩා හොඳින් දනී.

විමුක්ති ඉන්නේ කෙල්ලගේ හිත පුරාමය. ඇඟ පුරාමය. විමුක්තිව ඒ ජීවිතයෙන් ඇත් කර ජීවිතයක් හද ගන්නට කියා තේරුමක් නැත. රාම නැතුව සීතාට සැනසීමක් නැත. ඇත්තටම නැත.

ප්‍රියංවද රිලෝඩ් එක දගෙන ගෙදර ආවේ ඉක්මනිනි. නවලෝකේ සේවය කරන ඇගේ මිතුරිය වූ සුජානි එන්නේ නමයටය. සුජානි හොඳ කෙල්ලය. උදව්වක් ඉල්ලුවොත් නොකර ඉන්නේ නැති බව ප්‍රියංවද දනී.

වර්ෂා කොල්ලාවද තියාගෙන මිදුලේ ඇවිදිමින් උන්නාය. කොට් ෂීට් එක හතරට නවා ඒ මත පැටියාව තබාගෙන රෝස පාට රෙද්දෙන් වසාගෙන ඇය පුතාව රකින්නේ පුදුමාකාර ලෙසිනි.

'එළියට ආවාම ඇස් පොඩි කරනවා... ඇතුලෙමනේ ඉන්නේ...'

'තා..ත්..තා..ම තමයි...'

ප්‍රියංවද කීවාය. එහෙම කියනවාට වර්ෂා ආසය.

'රිලෝඩ් එක දගත්තද ප්‍රියා...'

'දගත්තා... හිටපංකෝ නමය වෙනකල්...'

'ප්‍රියා...'

වර්ෂා ප්‍රියංවද දෙස බැලුවේ ආදරයෙනි.

'උ..ඹ..ට පි..න්...'

'මේ අපි ඔක්කොමගේ ජීවිතේ කෙල්ලේ... උඹ මම අම්මා පැටියා කියලා හතර දෙනෙක් මෙතන නෑ...'

ඒත් මේ ලෝකයේ එහෙම හිතන අය ඇත්තටම අඩුය. තමන්ගේම සහෝදරියකට කරදරයක් වුවත් අහක බලන සහෝදරියන් ඉන්නා ලෝකයක ප්‍රියංවද ඇත්තටම බෝසත් සොයුරියකි.





'අම්මි තාත්තිව චුට්ටක් බලලා එන්න යන්න හදන්නේ... බලලා ඇවිත් මං විස්තර කියන්නම් හොඳේ...'

වර්ෂාගේ දෙනෙත් තෙමී ගියේ ඉබේටමය. 'ඔයාව දකිද්දී මට ඇඩෙයි.' වර්ෂාට සිතුණි.

* * * * * * * * * * * *

ප්‍රියංවද හරියටම නමයට දහයක් තියෙද්දී නවලෝකයට කතා කළාය. ඊයේ ඇය වැඩ කරන අංශය දනගත් නිසා අද ප්‍රියංවදට පහසු විය.

'ම..ට සුජානි පත්බේරිය මිස්ට කතා කරන්න පුළුවන්ද...'

'සුජා.. කෝ..ල්...'

ප්‍රියංවදගේ පපුවට සැනසීමක් දනුණි. ඇය වර්ෂා දෙස බැලුවේ සතුටිනි.

'කෙල්ල ඉන්නවා...'

ප්‍රියංවද සතුටින් කීවාය.

'හෙ..ලෝ...'

'සුජා... අඳුනන්න පුළුවන්ද... මං ප්‍රියංවද...'

'අ..නේ ප්‍රියා... ඉතින් කෙල්ලේ... කොහොමද මං මෙහේ කියලා දන්නේ...'

'ඇයි බං දවසක් රත්නපුරේදී හම්බවෙලා උඹ කිව්වේ... මං ඊයෙත් කතා කළා...'

'ම..ට...'

'මි.. උඹෙන් ලොකු උදව්වක් ඉල්ලගන්න... ඉතින්.. උඹට කොහොමද...'

'මෙහේ ෂෝක් ප්‍රියා... කරදරයක් නෑ... මං නුගේගොඩ බෝඩ් වෙලා ඉන්නේ... ඉතින් කෙල්ලේ උඹට කොහොමද...'

‘අපි දැන් ඉන්නේ රත්නපුරේ නෙමේ සූජා... අනුරාධපුරේ...’

‘එ..ච්..චර දුර...’

‘දැ..න්..නැ..ද්..ද පුංචි පුංචි කරදර ආවා... දැන් මෙහේ පොඩි ගෙයක් හදගෙන ඉන්නවා...’

‘අ..නේ... මට ඇඩ්‍රස් එක දීපන්... මං වෙලාවක එන්නම්...’

‘අනේ වරෙන්...’

‘ඉතින් ප්‍රියා... මොකක්ද උදව්වක් ඕන කිව්වේ...’

‘ඒක ජීවිතේටම අමතක නොවෙන උදව්වක් සූජා... කළොත් උඹට පින්...’

ප්‍රියංවද විස්තරය කීවාය. සුජානි අසා උන්නේ දුකෙනි.

‘ඉ..තින් ඒ අයියා මේ වෙලාවෙත් නවලෝකේ...’

‘ම්.. රූම් එක අපි දන්නෑ...’

‘මං නම ගහලා ගන්නම්...’

‘විමුක්ති මොරගොඩ...’

‘ඉතින් බලලා...’

‘කෙල්ලට අයියව චුට්ටකට බලන්න ඕන... එක විනාඩි පහකට...’

‘මට තේරෙනවා... උඹලා හෙටද එන්නේ...’

‘ඔ..ව්.. අයියා ළඟ ඉන්නේ කවුද කියලා දැනගන්නෝන... ප්‍රශ්නයක් වෙන කෙනෙක් නැත්නම් කෙල්ලට ඇවිත් අයියව චුට්ටක් බලලා යන්න පුළුවන්...’

‘මට තේරෙනවා... මං විස්තර බලලා කියන්නම් කෙල්ලේ... මේ නම්බර් එක ඔන් නේද... මගේ මොබයිල් නම්බර් එකත් ලියාගනින්...’

සුජානි ඇගේ ජංගම දුරකථන අංකයත් ප්‍රියංවදට දුන්නාය.

‘මං බලලා ගන්නම් කෙල්ලේ... අපේ කෙල්ලෙක්ට උදව්වක් නොකර බෑනේ...’





‘උඹට පින් සූජා... මං බලන් ඉන්නවා...’

ප්‍රියංවද දුරකථනය තැබුවේ සැනසීමෙනි.

‘ප්‍රශ්නයක් වෙන එකක් නෑ කෙල්ලේ... සූජා බලලා කියයි... එන දේකට මූණ දෙන්න බලාගෙන අපි හෙට කොළඹ යන්...’

‘ප්‍රියා... පූ..තා..ට අමාරුවක් වෙන එකක් නෑ නේ..ද...’

‘අ..නේ එ..හෙම වෙනවද කෙල්ලේ... නේ..ද පැටියෝ... අපි තාත්තිව බලන්නනේ යන්නේ... නේද සත්තරං...’

විමුක්තිව බලන්නට යනවා කියා හිතද්දීත් වර්ෂාට පුදුමය.

‘හෙට කොහොමත් මට ඔයාව බලන්න පුළුවන්... ඒක මට දැනෙනවා...’

එහෙම දැනෙන දෙයක් වරදින්නේ නැති බව වර්ෂා දනී.

‘ඔයාව විනාඩි පහක් බලලා මං අවුරුදු පහකට ශක්තිය ගන්න ඕන...’

ජීවිතයට... මේ පපුවට මේ ශක්තිය හැමදම දුන්නේ ඔහුගේ ආදරයය.

# 11

විමුක්ති අතින් අනාථ වූවා යැයි හිමාලි කියූ කතාව සුරම්‍යා එහෙමම විශ්වාස කළාය. මානසික ආබාධයකට ලක් වූ කෙනෙක් අතින් එහෙම දෙයක් වෙන්නට පුළුවන්ද කියා වත් සුරම්‍යා සිතුවේ නැත.

'හිමාලි හිටියේ පොඩි පුතා එක්කමයි... මහ රෑ පවා කෙල්ල පොඩි පුතාව බලාගෙන හිටියේ... කෙල්ලත් ඉන්නේ පොඩි පුතාට හරි ආදරෙන්... එහෙම දෙයක් වෙන එකේ පුදුමයකුත් නෑ...'

සුරම්‍යා සිතුවේ එහෙමය. එහෙත් එය අහස පොළොව නුහුලන කතාවක් බව සුරම්‍යා සිතුවේ නැත.

'එහෙම දෙයක් වුණා නම් ඒ කෙල්ලට සාධාරණයක් කරන්නම ඕන... කෙල්ල පොඩි පුතා ළඟ උන්නේ විශ්වාසෙන්... මේ ගෙදරට ආපු කෙල්ල එහෙම අනාථ කරලා එළියට දන්න දෙන්න බෑ...'

සුරම්‍යා දැඩිව සිතුවාය. එහෙත් එදා වර්ෂාව මේ ගෙදරින් එළියට දමද්දී කෙල්ලගේ බඩට විමුක්තිගේ ලෙයින් දරුවෙකු පිළිසිඳ ගෙන බව සුරම්‍යා දන්නේ නැත.





එහෙම දෙයක් දන උන්නද ඇය විමුක්තිව කෙල්ලට මේන් කියා දෙන්නේද නැත. එද සුරම්‍යා කෙල්ලට ලේ පනින තුරු ගසා මේ ගෙදරින් පැන්නුවේ ඒ කුසට දරුවෙක් පැමිණ තිබියදීය.

මේ සියල්ල එද කවුරුවත් දන උන්නේ නැත. අඩුම ගණනේ වර්ෂාවත් විමුක්තිවත් දන උන්නේ නැත. එහෙත් දෙවියන් සියල්ල බලාගෙනය. දෙවියන් බඩදරු අම්මාව රැක්කේ ඇයව රජරට ගෙන ගොස්ය. ජය ශ්‍රී මහ බෝධියේ පවන් පොද වැටෙන ඉසව්වට ගෙන ගොස්ය.

කෙල්ල සියල්ල දරාගෙන ඉවසාගෙන අනුරාධපුර ශික්ෂණ රෝහලේ දරුවාව බිහි කළාය. එයද දෙවියන් බලාගෙනය. ඇය එහෙම කරද්දී හිමාලි මේ තරම් පට්ට පල් බොරුවක් කරනවාත් දෙවියන් බලාගෙනය.

සුරම්‍යා ඉන්නේ වර්ෂා කෙරේ බැඳගත් ජම්මන්ත වෛරයකිනි. ඒ වෛරය මේ ආත්මය පුරා මෙහෙමම තිබෙනු ඇත. වර්ෂා විමුක්තිගේ දරුවාව පපුවේ තියාගෙන හදන්නේ එහෙම තිබියදීය.

ඇය ඉල්ලන්නේ පරම්පරාවේ අයිතිය නොවේ. මොරගොඩ ට්‍රාන්ස්පෝට් එකේ වාහන වල අයිතිය නොවේ. නාවල මහ ගෙදර අයිතිය නොවේ. ආදරයේ අයිතියය. විමුක්තිගේ අයිතියය. පුංචි විමුක්තිගේ තාත්තාගේ අයිතියය.

විමුක්තිගේ ලෙයින් උපන් පුංචි විමුක්ති දන් මේ ලෝකයට බිහිවී අවසානය. ඒ බව මොරගොඩ පවුල දන්නේ නැත. දන්මම දනගන්නට කෙල්ල ඉඩ තබන්නේද නැත. ආදරයක් වෙනුවෙන් අසාමාන්‍ය ලෙස ඉවසන්නට කෙල්ල සූදානම්ය. දවසක ඔහු එන බව ඇය දනී.

වර්ෂා ජීවත් වන්නේ ඒ විශ්වාසයේ එල්ලීගෙනය. විශ්වාසයක එල්ලීගෙනම ජීවත් වන කෙනෙකුට දෙවියන් කරන්නේ පුදුමාකාර දේවල්ය.

දෙවියන් තවම කවුරුන්වත් පුදුම කරන්නට ගත්තේ නැත.

'සනීප වෙච්ච ගමන්ම මේ මඟුල කරනවා... ඒක එහෙමම තමයි... වෙඩින් එකක් පස්සේ ගන්නවා... දනට රෙජිස්ටර් කරලා

දෙන්නව එක් කරනවා...'

සුරම්‍යා සිතුවේ එහෙමය. මෙහෙම කරන්නට තමාට අයිතියක් ඇතැයි ඇය දැඩිව සිතුවාය. අම්මලා එහෙම සිතීම වැරදි නැත. බඩේ බොක්කේ තියාගෙන පුතාලාව හදන්නේ අම්මලාය.

එහෙත් එහෙම අම්මලා අතින් පුතාලාගේ ජීවිතවලට අනන්තවත් වැරදි සිදුවී ඇත.

ඒවාට අම්මලාට මරණ මංචකයේදී හෝ හැපි හැපී අඬන්නට සිදු වනු ඇත.

වර්ෂාට වූ මේ සියලු දේත්... විමුක්තිට වූ සියලු කරදරත් පිටුපස ඇත්තේ සුරම්‍යාගේ දැඩි තීරණයය.

'මං මැරුණත් මගේ කොල්ලව මං උඹට දෙන්නෑ... බැහැපන් බැල්ලි දෙට්ට... හිඟන බැල්ලි...'

සුරම්‍යා වර්ෂාව පැන්නුවේ එහෙම කියාය. ඇගේ ඇඳුම් බෑගය සුරම්‍යා මිදුලටම විසි කළාය. කෙල්ලට දණහිස් ලෙලි යද්දී ලේ ගලද්දී ඇදගෙන එළියට දම්මාය.

'පුළුවන් නම් ඔයාගේ පුතාට වෙන කෙල්ලෙක්ව බන්දලා පෙන්නන්න... විමුක්ති මැරුණත් මැරෙන්නේ මේ හිඟන කෙල්ල ළඟ... ඒක මතක තියාගන්න නැත්දේ...'

කෙල්ල මේ ටික කීවේ මහ ගෙදරින් පිට වෙන්නට මොහොතකට පෙරය. ලේ පෙරි පෙරීය. කඳුළු පෙරි පෙරීය.

මේ ආදරය සත් ගුණයකින් නොව දස කෝටියකින් වැඩි වූයේ එදය.

වර්ෂාගේ ඒ ආදරයේ විශ්වාසයට... භක්තියට දෙවියන් කෙල්ලට දනට පුංචි ආදර තිළිණයක් දුන්නේය.

ඒ පුංචි විමුක්තිය.

පුදුමය. ගෑණි ජීවිතය අලුතෙන් පටන් ගන්නට සිතුවේ ඒ මූණ දුටු පසුය. අනුරාධපුර රෝහලේ ලේබර් රූම් එකේදීය.

ජීවිතයට බොහෝ දේ වූ පසුව... කන්දක් තරම් දුක් වින්ද පසුව... ගඟුලක් තරම් කඳුළු හෙලූ පසු කෙල්ලෙක් ජීවිතයට බය





නැත.

අද වර්ෂාද එහෙමය.

අද විමුක්ති ළඟ හිමාලි නම් කෙල්ලෙක් ඇලි ඇලී ඉන්නා බව වර්ෂා දනී. ඒ දැන දැනත් කෙල්ලගේ පපුවට ගින්දරක් නැත.

ඒ ආදරයේ විශ්වාසයය. කතරගම දෙවියන්ව කවුරුවත් හැබැහින් දැක නැත. ඒත් දස ලක්ෂ ගණන් කතරගම දෙවියන්ට පඬුරු බඳිති. බාර වෙති. ඒ විශ්වාසයය. ආදරයේ විශ්වාසයද එහෙමය. පුදුමය.

එය සුරම්‍යා දන්නේ නැත. හිමාලි දන්නේද නැත. විමුක්ති අතින් තමාව අනාථ වූවා යැයි හිමාලි කියූවේ ඒකය. විමුක්ති අතින් තමාව අනාථ වූවා යැයි වර්ෂා කවදාවත් කීවේ නැත. කිව්වේ ඔයාගේ ආදරේ මගේ බඩ ඇතුලේ ජීවත් වෙනවා කියාය. එහෙත් හිමාලි විමුක්ති අතින් තමාව අනාථ වූවා කියා කීවාය. සුරම්‍යා ඒ කතාව එහෙමම විශ්වාස කළාය. එහෙම කියද්දී තවත් කෙල්ලෙකුට විමුක්ති නමින් දරුවෙකුද ලැබී අවසානය.

මේ අවනඩුව කියන්නේ කාටද... කියන්නට කෙනෙක් නැත. ඒ නඩු අසන්නේ දෙවියන්ය. නඩුව අසන දිනය දන්නේද දෙවියන්ම පමණි.

'මං මේ ගෙවල් දෙරවල් දලා යනවා කිව්වාම පොඩි පුතා අහක බලන්නෑ... ලොක්කට වඩා ඌ මට ආදරෙයි...'

සැබෑය. විමුක්ති සක්විතිට වඩා අම්මාට ආදරේය. ඒත් මේ ලෝකයේ තමාද තාත්තා කෙනෙකු වී ඇති බව දැනගත් විට විමුක්තිගේ පපුවට එන දරු සෙනෙහස... පිය සෙනෙහස ඒ කිසිවකට නවත්වන්නට නොහැක.

හිමාලි දෙර පලුව අල්ලාගෙන කාමරයට එබුණාය.

'එ..න්..න මැණික...'

සුරම්‍යා කතා කළේ ආදරයෙනි.

'මේ කොහේ යන්නද ඇඳගෙන...'

සුරම්‍යා ඇසුවාය.

˙මං කැම්පස් එකට ගිහින් එන්නම් නැන්දේ...˙

˙ම්.. පරිස්සමින්... වාහනේ යන්න...˙

˙නැතුව බස් එකේ යන්නයැ...˙ හිමාලි තමාටම කියා ගත්තාය.

˙අයියා ළඟ ඉන්නත් නෑ... මං හෙටවත් ඉන්නම් නැන්දේ...˙

˙මං ලොකු පුතාට කියන්නම්...˙

˙එයා එහෙම හොස්පිට්ල් ඉඳිද්දී මට මෙහෙම ගෙදර ඉන්න බෑ නැන්දේ...˙

˙අපි හෙට ඉමු... සතියක් විතර කොහොමත් අයියට හොස්පිට්ල් ඉන්නෙපැයි...˙

හිමාලි ගොස් වාහනයට ගොඩ වූයේ අමුතුම ගමනකිනි. අනුලා ඒ දැක හීල්ලුවාය. මේ ගෙදරට මේ වෙන්නට යන්නේ මොනවාදැයි ඇයට පවා සිතා ගන්නට අමාරුය.

˙දවල්ට අඩනවා... රෑට හොඳට ලොකු නෙස්ටමෝල්ට් එකක් හදගෙන චොකලට් කේකුත් එක්ක බොනවා... මරු බඩුවක්...˙

ඇත්තටම හිමාලි එහෙමය. ඇය උන්නේ මේ සැප සම්පත් වලින් මත් වීගෙනය.

˙මට ඉඳි ආප්පයි හාල් මැස්සොයි එපා... බිත්තරයක් දලා බටරුයි පානුයි තියන්න...˙

අද උදේ තනූජාට එහෙම කියනු අනුලා අසාගෙනය. මේවා දකිද්දී අනුලාට සිහිවන්නේ වර්ෂාවමය.





# 12

සුජාති විනාඩියක් තුළ විමුක්ති ඉන්නා රෝහල් කාමරය සොයා ගත්තාය. ඇය ඒ රෝහල් කාමරයට ගොඩ වූයේ නිකමටය. ඒ මොහොතේ විමුක්ති ළඟ උන්නේ ධනසිරිය. විමුක්ති උන්නේ යංතමට දෑස් පියාගෙනය. ˙ඔයාගේ කෙල්ල ඔයාව බලන්න විඳින දුක දන්නව නම් ඔයා˙ සුජාති විමුක්ති දෙස බලා සිතුවාය.

˙ශ්..ස්...˙

ධනසිරි සුජාති එද්දී නැගිට්ටේය. ඇය උන්නේ හෙද ඇඳුමිනි.

˙නෑ.. මං නිකං ආවේ බලන්න... මේ අයියද පේෂන්ට් ගාව ඉන්නේ...˙

˙ඔව් මිස්...˙

˙න..ම...˙

˙මං ධනසිරි මිස්...˙

˙හරි හොඳයි...˙

සුජාති නර්ස් ඩෙස්ක් එකට පැමිණ විමුක්තිගේ තත්වයද අසා බැලුවාය.

'එයා කලිනුත් මෙහේමයි හිටියේ... දැන් ගොඩක් හොඳයි... සූජා දන්න කෙනෙක්ද...'

'ඔ..ව්.. ඒත් ඒ අයියට මාව මතක නෑ...'

'කාවවත් මතක නෑ සූජා... කෙල්ලට විතරයි මතක...'

'ක..වුද කෙල්ල...'

'බබා කිය කියා නිතරම කියනවා... හොඳ බබෙක් ඉඳලා ඇති...'

සූජානි හිස වැනුවේ ඒ කෙල්ල කොතරම් හොඳදැයි දන්නා නිසාය. සූජානි පහළට ආවේ මේ සියල්ල දැනගෙනය. මෙහෙම දෙන්නෙක්ව වෙන් කර අර තරම් දුකක් දෙන්නාටම දෙන්නේ ඇයිදැයි ඇය සිතින් විමසුවාය.

'ආදරේ කරන කාලෙක මේ වගේ පත්තු වෙවීම ඉන්න වෙයි...'

සූජානි සිතුවේ හූල්ලමිනි.

ඇය නිස්කලංක තැනකට ගොස් ප්‍රියංවදට ගත්තාය.

'ප්‍රියා මම සූජා...'

'මං උඹ කෝල් කරනකල් හිටියේ කෙල්ලේ... ඉතින්...'

'උ..ඹ කිව්වා වගේ මේක මහ පින්කමක් තමා කෙල්ලේ... ලො..කු පි..න්..කමක්...'

'ඇ..යි සූ..ජා...'

'ඔතන ඔය කෙල්ල මේ අයියා වෙනුවෙන් මැරෙනවා... ඒ වගේම තමා මේ අයියත්...'

'කි..ය..න්..නේ සූජා...'

'ඒ අයියට මොනවත් මතක නෑ... කාවවත් මතක නෑ... සිහියත් නෑ... ඒත්... ඒත් එක්කෙනෙක්ව මතකයි...'

'ක..වු..ද...'

'එ..යාගේ බ..බාව...'





'අ..නේ ඇත්තද කෙල්ලේ...'

'ම්.. එයා ඔතන ඉන්නවද...'

'ඔ..ව් උඹම කියපන්...'

ප්‍රියංවද එහෙමම වර්ෂා අතට දුරකථනය දුන්නාය.

'සූජා කෙල්ලේ... උඹට කතා කරන්නෝනලු...'

වර්ෂා පුතාව අල්ලාගෙනම දුරකථනය ගත්තාය.

'සූ..ජා...'

'ඔයා දුක් වෙන්නෙපා කෙල්ලේ... ඒ අයියා බබා කිව්වේ ඔයාටද...'

'ඔ..ව් සූජා...'

'හැම තිස්සේම බබා බබා කියනවලු... එච්චරමයි කියන්නේ... එයාට සිහිය නෑ... ඒත් පපුවේ ඔයා ඉන්නවා...'

වර්ෂාට ඇඬුණි. ප්‍රියංවද කෙල්ලගේ අතින් දුරකථනය ගත්තේ කෙල්ලගේ හිස අතගාය.

'කෙල්ල අඬනවා සූජා... ඒකිට දුකයි...'

'දුක නැද්ද ප්‍රියා... හැබැයි ඔච්චර ආදරයක් දෙයියෝ වෙන් කරන එකකුත් නෑ...'

'ම්...'

'හරි.. මං විස්තර බැලුවා... විමුක්ති අයියා ගාව ඉන්නේ ධනසිරි කියලා කෙනෙක්... හැම වෙලාවෙම ඉන්නේ එයාද කියලා දන්නෑ... උඹ ධනසිරි කියන කෙනාව දන්නවද...'

'ඔව් සූජා... අයියලගේ ගෙදර වැඩ කරන අයියා කෙනෙක්...'

'හොඳ කෙනෙක් වගේ.. විටින් විට බලන්න අය එනවා ඇති... රැට ඉන්නේ විමුක්ති අයියගේ අයියලු...'

'ඔ..ව් සක්විති අයියා...'

'ඉතින් කෙල්ලේ වරෙන්... මාත් හෙට ඉන්නවා... ඇවිත් මට ගනිං... මං බලලා කෙල්ලට හම්බවෙන්න හදලා දෙන්නම්...'

'උඹට පින් කෙල්ලේ... මං උදෙන්ම උඹව ගන්නම්...'

'උදේ වරුවෙම එනවා නම් හොඳයි ප්‍රියා... හවස කලබල වැඩියි...'

'මං පුළුවන් තරම් උදෙන් එන්නම් සුජා...'

'හරි... මං කෝකටත් හවස ඕෆ් වෙන්න කලිනුත් යන්නම්...'

ප්‍රියංවද දුරකථනය තබා කෙල්ලගේ හිස අතගෑවාය.

'කොල්ලා උඹේම තමා...'

'මං ද..න්..නවා ප්‍රියා... පව්... මට බලාගන්න තිබ්බ නම්...'

'ඒ තරම් දුර හිතලා දුක් වෙන්නෙපා කෙල්ලේ... අපිට හෙට බලන්න පුළුවන් අයියව...'

'ම්.. ම..ට..ත් හිතෙනවා...'

'මෙතන කැම්ප් එක ගාව කැබ් සර්විස් එකක් තියෙනවා... මං ගිහින් බලන් එන්නම්... අපට පාන්දරම යන්න වෙයි...'

'ඕ..ව්...'

ප්‍රියංවද ඇඳ උන් ඇඳුම පිටින්ම පාරට දිව්වාය.

'තා..ත්..ති පැටියට අම්මිව මතකයිලු... එයා බබා කිව්වේ මට... බබා බබා කියලා විතරලු තාත්ති කියන්නේ... පව්.. අපි හිටියනම් මං ඔයාවයි තාත්තිවයි දෙන්නවම ළඟ තියාගෙන බලාගන්නවා...'

වර්ෂා කොල්ලාට කීවේ පපුව හැරෙද්දීය. වර්ෂාට විමුක්තිගේ රුව මැවි මැවී පෙනෙන්නට විය.

'ඔයාගේ පපුවේ එහෙම මම නැත්නම් මං ජීවත් වෙන්නෙවත් නෑ... බලමු හෙට තාත්ති මාව අඳුරගනීද කියලා...'

කාට මතක නැති වුවද මොන සිහිය නැති වුවද ඔහුට මේ වර්ෂාව අමතක නොවන බව වර්ෂා දනී.





'ඔයාට පුතාව පෙන්නන්න ආසයි... ඒත් දැන්මම ඒක කරන්න බෑ... වෙන අය පැටියව දකිනවට මං ආස නෑ... ඔයාටයි මට පෙන්නන්න ඕන... සිහිය හොඳටම ආපු වෙලාවක මං පුතාව අරගෙන එන්නම්...'

ජීවිතය මත දෛවය මවන මේ දවස් පුදුමාකාරය. දෛවය මීට වඩා කොතරම් පුදුම සහගත දේවල් ජීවිතයට කළාද...

'ඔයාට මොනවා අරගෙන යන්නද කියලා මට තේරෙන්නෑ රත්තරන්... මං අනුරාධපුරේ ඉඳලනේ මහත්තයෝ එන්නේ...'

ඔහුව දකින මොහොත ළං ළං වෙද්දී පපුව කකියනවා වැඩිය.

* * * * * * * * * * * *

ප්‍රියංවද කැබ් සර්විස් එකට යමින් සිතුවේ හෙට ගමන ගැනය. සුජානි කීවේ පුළුවන් තරම් උදෙන් එන්න කියාය. ඒ තරම් උදෙන් යන්නට නම් පාන්දර පිටත් වී අමාරුය. කොතරම් පාන්දර පිට වුවද කොළඹ වාහන තදබදයට හසු වූ පසු දෙළහ වේ. ඒ වෙලාවට කෑම වෙලාව නිසා විමුක්තිව බලන්නට මහ ගෙදර කට්ටියද එන්නට පුළුවන.

ප්‍රියංවද සිතුවේ රෑට යන්නටය. රෑ දහයට එකොළහට ගියොත් පාන්දර වෙද්දී කොළඹය. එවිට ටිකක් ඉඳ හෝ බලන්නට පුළුවන.

ප්‍රියංවද කැබ් සර්විස් එක සමඟ කතා කර ගත්තේ එහෙමය.

'එහෙනම් එකොළහට වෑන් එක එවනවද...'

'හොඳයි... හෙටම එනවනේ...'

'ඔව්...'

කෙසේ හෝ මේ දේ කළ යුතුමය. මේ බැඳීමට අනාගතයක් තිබිය යුතුය. පැටියාගේ තාත්තා විමුක්තිය. දවසක ඔහුගේ බිරිඳ විය යුත්තේ කෙල්ලමය.

'කීයටද ප්‍රියා වාහනේ එන්නේ...'

'අපිට රෑම යන්න වෙනවා කෙල්ලේ... පාන්දර ගියොත් දෙළහ වත් වෙනවා... ඒ වෙලාවට ගිහින් අයියව බලන්න බෑ... අපි පාන්දර හොස්පිට්ල් එක ළඟ ඉන්න ඕන...'

'එ..හෙ..නං රෑම යං... නේ.. එහෙම හොඳයි...'

ඉක්මනට ඔහුව බලාගන්නට ලැබෙන තරමට කෙල්ල ආසය.

'අපි දහයාමාර වෙද්දී ලැස්ති වෙලා ඉමු... පැටියගේ බඩු ටික ලැස්ති කරගමු කෙල්ලේ...'

'මං ලැස්ති කරන්න ගත්තා ප්‍රියා...'

'රෑ යන එක හොඳයි... කොල්ලත් නිදගෙනම ඉදී...'

'අයියා ගාව ඉන්නේ ධනේ අයියලුද ප්‍රියා...'

'ඔව්...'

'ධනේ අයියා උන්නොත් හොඳයි...'

'මං හිතන්නේ උදේ වරුවේ ඉන්නේ ධනේ අයියා... රෑ සක්විති අයියා ඉඳලා පාන්දර යනවා ඇති...'

'ම්...'

'අර අම්මණ්ඩි ඉන්නේ කොයි වෙලාවෙද දන්නෑ...'

'එයා උන්නට මට කමක් නෑ ප්‍රියා...'

ප්‍රියංවද සිනාසුණාය. ආදරයක් ජීවත් කරන්නේත් පිරිසිදුව තබන්නේත් මේ විශ්වාසයය.

* * * * * * * * * * * * * *

හවස සක්විති විමුක්ති ළඟ ඉන්නට එද්දී මේධාවත් දුවවත් රැගෙනම ආවේය. මේධාත් සක්විතිත් එද්දී එතන ධනසිරිත් සමඟ හිමාලිත් උන්නාය.

ඇය සක්විතිවත් මේධාවත් දක ගැස්සුණාය. හිමාලිව දක





මේධා සක්විති දෙස බැලුවේ සක්විති කියූ අර කතාව සිහිවීය.

'ඩොක්ටර් ආවද ධනේ අයියේ...'

සක්විති ඇසුවේය.

'මං නර්ස් ඩෙස්ක් එකෙන් ඇහුවා... ඩොක්ටර් එනවා කිව්වේ සෙවන් තර්ටි...'

ධනසිරි වෙනුවට පිළිතුරු දුන්නේ හිමාලිය. මේධා මේ කිසිවක් ගණන් නොගෙන විමුක්ති ළඟ ඉඳගෙන ඔහුගේ හිස අතගෑවාය.

'කො..හො..මද මහත්තයෝ... ම්...'

විමුක්ති සිනාසුණේය. ඒ සිනහව ඔහුට සිහිය තිබූ කාලයේ තිබූ සිනහව වාගේමය. කොල්ලාට සනීප වේගෙන එන බව මේධාටද තේරුණි.

'මූණ හරි සනීප පාටයි... මේ චූටි මැණික... දෙන්නද අතට.. ම්...'

මේධා දුවව විමුක්තිගේ බඩ මත තැබුවාය. හිමාලි අහක බලාගත්තේ යටි තොල හපාගෙනය.

'බාප්පි ෂෝයි... ආ පැටියෝ... මේ.. අපේ සුදු බාප්පි...'

පුදුමයකට මෙන් විමුක්ති දුවගේ වත මෑදුව අල්ලා ගත්තේය. මේධාගේත් සක්විතිගේත් මුවඟට තුනී සිනහවක් නැගුණි.

'මං සැන්ඩ්විච් හදන් ආවා... කට්ලට් එක්ක... ඔයා ආසනේ...'

මේධා දුවව සක්විති අතට දී පුංචි බොක්ස් එක අතට ගත්තාය.

'දෑ..න් තේ..ත් බිව්වා...'

හිමාලි කීවාය.

'මේකා බත් කකාත් තේ බොයි...'

මේධා කීවාය. 'උඹ මොනාද මේකා ගැන දන්නේ' මේධා සිතුවේ කේන්තියෙනි.

'ම්.. කට්ලට් කටයි සැන්ඩ්විච් කටයි...'

විමුක්ති මේධා කැවූ සැන්ඩ්විච් හා කට්ලට් කෑවේ ආශාවෙනි.

'බ..බා...'

විමුක්ති කෑ ගසා මෙන් කීවේය.

මේධා ගැස්සී බැලූ හිමාලි දෙස අමුතුම සිනහවක් පා බැලුවාය.

'ම්... දවසක් බබා හැඳුවේ... මතකද ඔයාට...'

මේධා එහෙමම කීවාය.

'කෙල්ල දවසක් ඇවිත් සැන්ඩ්විච් හදලා කට්ලට් බැද්ද... ඒ වෙලාවෙම මල්ලිත් ආවා... ඔය ඒක මතක් වෙලා...'

හිමාලි දවුණාය. පිපිරුණාය. 'පට්ට බැල්ලි... ඒකිට පුදුම ආදරෙන් කතා කරන්නේ...' හිමාලි දවෙමින් සිතුවාය.

'කෙල්ලව එක පාරක් දක්ක නම් දහපාරක් සනීප වෙයි...'

'නැති එකනේ වැඩේ...'

සක්විති සුසුමක් හෙලා කීවේය. හිමාලි රෝහල් කාමරයේ උන්නේ පුදුමාකාර අපහසුතාවයකිනි.

'දිගටම හොස්පිට්ල් තියාගන්නවද...'

'ඩොක්ටර් එක්ක කතා කරන්න ඕන බබා...'

'කමක් නෑ... සතියක් දෙකක් මෙහෙම හිටපුදෙන්... ඉක්මනට සනීප වෙයි...'

මේධා කීවාය.

'ධනේ අයියේ...'

'මේධා නෝනා...'

'චූටි බබාට කොහොමද ධනේ අයියේ...'

'අනේ සනීපෙන් ඉන්නවා නෝනා... හැබැයි රෑ පුරා අපේ ගෑණිට නින්දක් නම් නෑ...'

'මටත් එහෙම තමයි...'

හිමාලි සිතුවේ වර්ෂා ගැනය. මේ තරමටම විමුක්තිව පිස්සු වට්ටන්නට ඇය ළඟ තිබ්බේ මොනවාදයි ඇය සිතුවාය.





# 13

වාහනයට ගොඩ වෙන්නට ප්‍රථම වර්ෂා කිරි විදුරුවක් බී පුතාට කිරි වඩියත් දුන්නාය. ඇය කොළඹ යන්නට ඇඳගත්තේ චාම් නිල් පැහැගත් සායකුත් සුදු බ්ලවුසයකුත්ය. බොත්තම් ඇති ඇඳුමක් ඇඳගෙන යා යුතුමය. කොල්ලා රෑ දෙතුන් ගමනක් නැගිට්න්නේ කිරි ටික බොන්නටය.

පුංචි විමුක්තිගේ සුදු නැප්කින් විස්සක් පමණත් පුංචි කමිස දහයක් පමණත් වර්ෂා මැද නවා පොඩ්ඩාගේ බෑගයට දමා ගත්තාය. කොල්ලාව තියාගෙන යන්නේ සිනිඳු කොට් ෂීට් එකේ දමා පොඩි කොට්ටයට හිස තබාය.

'කොල්ලාව ඉස්සෙල්ලම එළියට අරන් යන එකේ මං බාරෙකුත් ගැට ගැහුවා ප්‍රියා...'

'ඒක හොඳයි... අපේ පැටියට මොනවත් වෙන්නෑ කෙල්ලේ... උඹ බයවෙන්නෙපා...'

'ම්...'

'උඹ ඔය බ්ලවුස් එකමද හොස්පිට්ල් එකටත් ඇඳගෙන යන්නේ...'

'ඔ..ව්...'

'පොඩිවෙනවනේ වස්තුවේ... අපි හොඳ එකක් ගමු... පාන්දර මාරු කරගන්න පුළුවන්නේ...'

වර්ෂා අසරණව සිනාසුණාය. බලන්න යන්නේ ඔහුවය. කොහොම ඇඳගෙන ගියද කමක් නැත.

'හදිස්සියේවත් ඔය වෙන බැල්ලියෙක් හිටියොත්...'

ප්‍රියංවද කීවාය.

'ඔකේ තියෙනවා ප්‍රියා ලයිට් බ්ලූ බ්ලවුස් එකක්... ඒක චුට්ටක් ගනිංකෝ...'

ප්‍රියංවද අල්මාරිය ඇර එය අතට ගත්තාය.

'ම්.. ඒක හොඳයි...'

'අයියා අරගෙන දුන්නේ... හවුස් ඔෆ් ෆැෂන් එකෙන්...'

ඒ සියල්ල කෙල්ලට මතකය. ආදරයකදී එහෙමය.

'මේන් අපේ පැටියා නිදි...'

'ම්... ඇහැත් සේදුවනේ... ආයේ ඉතින් එකට දෙකට තමා ඇහැරෙන්නේ...'

'අපි නවත්තලා කුක්කු දෙමු... වාහනේ යද්දී කිරි දෙන්නෙපා...'

අම්මා ආවේ ඒ මොහොතේය.

'ආ... මේ ජය ශ්‍රී මහ බෝධියේ බෝ කොළයක්... පැටියගේ කොට්ටේ යට තියාගෙන යන්...'

අම්මා පැමිණ බෝ කොළය කොට්ටේ යට තබද්දී වර්ෂාගේ දෙනෙත්වල කඳුළු පිරුණි.

'මං හිටියේ ඉස්සෙල්ලම බෝධියට එක්කං යන්න තමා අම්මේ...'

'එහෙම නොකර තාත්තා බලන්න ගියාට දෙයියෝ තරහා වෙන්නෑ...'

'ම්...'





කොහොමත් මේ සියල්ල බලා ගත යුත්තේ දෙවියන්ය.

'මං අම්මට කිව්වා සීනි සම්බෝල පාන් හදලා කෝපි ගමු කියලා... රෑට හරියට කෑවෙත් නෑනේ...'

ප්‍රියංවද කීවාය. අද කන්නට හිතක් නැත. කොහොමත් ඔහු ළඟ ඉඳිද්දී කෑමක් බීමක් ගැන ඉස්සරද හිතුණේ නැත.

'වෑන් එක ආවා අපි යං කෙල්ලේ... උඹ පුතාව අරගෙන එළියට බැහැපන්... මං මේවා අරන් එන්නම්...'

වර්ෂා එළියට බැස්සේ කොල්ලාව පරිස්සමින් පපුව ළඟට තියාගෙනය. රෑ නිසා ඇය ඔළුවද යංතමට වැසුවාය. කොල්ලාව පරිස්සමට එතුවාය. මහ යද්දී සීතලය.

එහෙත් මේ අම්මාගේ පපුව ළඟ ඉඳිද්දී කොල්ලාට එහෙම සීතලක් නැත. ඒ තරමට ඒ පපුව රස්නෙය. සමහර විට ඒ විමුක්තිලා දෙන්නා වෙනුවෙන්ම ඇවිලෙන ගින්දර නිසාම විය හැක.

වර්ෂා පුතාවද රැගෙන ගොස් අමාරුවෙන් බුදු පහනට පඩුර තැබුවාය.

'විනාඩි පහක් පුළුවන් නම් මාව එයා ළඟ නිදහසේ තියන්න... එයාව නොදැක ආයෙත් මේ අනුරාධපුරයට එන්න තියන්න එපා...'

ඇය සිතින් කීවේ පුංචි බුදු රූපය දෙස බලාය. ඒ මොහොතේ රෑ සුළඟේ එහි ආ සමන් මල් සුවඳක් හදිස්සියේ මෙන් දැනී වර්ෂා වටපිට බැලුවාය.

කොහේ හෝ මේ ළඟක සමන් පිච්ච මල් පිපී ඇතැයි වර්ෂාට සිතුණි. එන්නේ ඒ තරමටම ඉවසා ගන්නට බැරි සුවඳකි.

'යං කෙල්ලේ...'

ප්‍රියංවද කෙල්ල වාහනයට ගොඩ වෙද්දී ළඟම උන්නාය. නොපෙන්නුවාට කෙල්ල ඉන්නේද අමාරුවෙනි. දරු ප්‍රසූතිය සිදුවී දවස් අටය.

'යං අන්කල්...'

'මං ඔයාව බලන්න එනවා... හරි පුදුමයි...' වර්ෂා සිතින්

සිතුවාය.

'අමාරු නම් මට දීපන් කෙල්ලේ...'

'තුරුල් වෙලා නිදි ප්‍රියා... ටික දුරක් මෙහෙම අරන් යන්නම්...'

'ම්...'

වාහනය අනුරාධපුර පාළු පාර දිගේ ධාවනය විය. වර්ෂාට අර සමන් මල් සුවඳ යළිත් ආවේය. දන් සුළඟක් නැත. වාහනය ඇතුළතින් සමන් මල් සුවඳ එන්නේ කෙසේද...

'ප්‍රියා...'

'කෙල්ලේ...'

'අ..ම්..මා ළඟ ඉන්නවා කෙල්ලේ... මට හරි සමන් පිච්ච සුවඳක් එනවා...'

'ම..ට එ..හෙම එන්නැනේ...'

'ඒකනේ... මට ආවා.. මිදුලෙදිත් ආවා...'

'නැන්ද අපිව ආරක්‍ෂා කරයි...'

ඇත්තටම ආවේ නාලිනීය. කෙල්ල මේ යන්නේ අමාරු ගමනක් බව ඇය දන උන්නාය. කෙල්ලවත් පොඩි එකාවත් පරිස්සමින් කොළඹ එක්කාගෙන යා යුතුයැයි සිතුව නිසාදෝ ඇය මේ රැයේ කෙල්ල ළඟම උන්නාය.

'මම මේ දුකක් විඳිනවා කියලා ඔයා හිතන්නෙපා... එයාව නොදක ඉන්න බෑ අම්මේ... ඔයාට තේරෙනවනේ...' වර්ෂා අම්මාට සිතින් කීවාය.

'අම්මේ...'

'පුතේ...'

'අම්මා ටිකක් ඇහැ පියාගන්න...'

'නිදිමතක් නෑ පුතේ...'

ප්‍රියංවද කෙල්ල ළඟටම වී මෙන් ඇගේ උරතල වලට වමත තබාගෙන උන්නාය.





'ප්‍රියා...'

'කෙල්ලේ...'

'ඇතුලට යද්දී පුතාව අම්මා ළඟ තියලා යන් නේ...'

'නැතුව කෙල්ලේ... එයාලා දන්මම මේවා දනගන්න නරකයි...'

'ම්...'

'අයියා සනීපවෙලා එන්නේ... උඹව දක්කාම ඒ සනීප වෙන එක ඉක්මන් වෙයි...'

'එ..හෙම වෙනව නම් ලොකු දෙයක් ප්‍රියා...'

'සනීප උනාට පස්සේ එයාලා ආයෙත් මඟුල් කතන්දරේ අදියි...'

'මං දන්නවා... ඒත් දන් බයක් නෑ...'

'දන් අලුත් හෝන්තුවකුත් ඇවිත්නේ...'

හිමාලි කියා කෙනෙක්ව වර්ෂා දක තිබුණේම නැත. 'අපි දෙන්නා මැද්දට එහෙම කෙනෙක්ට එන්න බෑ...' වර්ෂා සිතින් සිතුවාය.

රාත්‍රිය නිසා පාර පාළුය.

'රට අයියා ළඟ ඉන්නේ සක්විති අයියා වෙන්න ඇති...'

'සුජානි පාන්දර හය වෙද්දී එනවා කිව්වා කෙල්ලේ... අපට උදේ බලලා කියයි...'

'කෙල්ල අපට කළේ ලොකු උදව්වක්...'

'ඒකිටත් මේ දුක තේරෙනවා කෙල්ලේ...'

දවසක මේ දුක් සංසාරයම නිමා වන දකට ඇඬෙනු ඇත. වින්ද දුකට අඬන්න වත් දන් කොහොමට වත් ඉඩක් නැත.

* * * * * * * * * * * * * *

ඇත්තටම රැ විමුක්ති ළඟ උන්නේ සක්විතිය. මේධාවත් දුවවත්

ගෙදර තනිකර දමා ඉන්නට සක්විතිට අමාරුය. එහෙත් මේධා ඒ දුක දරා ගත්තාය. සියල්ලටම වඩා කොල්ලාගේ ජීවිතය වටිනා බව දන උන්නාය.

'තව ටික දවසනේ මහත්තයෝ... මල්ලී ඉක්මනට සනීප වෙයි... මූණ බලද්දී මට ඒක පේනවා...'

'මටත් හිතෙනවා...'

'අපි වින්ද දුක ඔහොමම විදිමු... කොල්ලා සනීප වෙන්න නම් ඔයා ඒකා ළඟ ඉන්න ඕන...'

ඒ තේරුම් ගැනීමට සක්විති මේධාට ගරු කළේය. සක්විති මහ රෑ මේධාට ගත්තේ පාළු රෝහල් කාමරයේ සිටිද්දීය. විමුක්ති උන්නේද නින්දේය.

'පා..එ..ද...'

ගත් විගසම මේධා ඇසුවාය. සක්විති සිනාසුණේය.

'බත් එක කෑවද...'

'ම්.. කොල්ලටත් කවලා කටවල් දෙක තුනක් කෑවා...'

'පව්... මටත් නින්ද යන්නෑ මහත්තයෝ... දැන් තනියම නිද ගන්නම බෑ...'

සක්විතිට දුකය.

'පාන්දරම මං එන්නම්...'

'තේ එකක් බොන්න...'

'මේ දගත්තා... කෙල්ල නිදිද...'

'ම්... දැන් ටිකකට කලින් කිරි දුන්නේ...'

'ඇහැරලා ඉන්නෙපා බබා... නිදගන්න...'

'ම්.. උදේ මොනාද කන්නේ... කැකුළු කිරිබත් චුට්ටක් හදලා තියන්නද... ආසනේ...'

සක්විති සිනාසුණේය. දුරකථනය තබා සක්විති බැලුවේ විමුක්ති





දෙසය. ඔහු විමුක්තිගේ ඇඳ ළඟම වූ පුටුවට බරවී බලා උන්නේය.

'උඹ සතුටින් ඉන්නවා බලන්නත් ආසයි...'

දෛවය කොල්ලාට සතුටක් සැනසීමක් දුන්නේම නැත. ජීවිතයේ පැතූ දේවල් අහිමි වී ගිය විට ජීවිතයේ සතුට ළඟ පාතක රැ දෙන්නේ නැත.

'මොකක් හරි ලොකු දෙයක් වෙන්නම ඕන...'

සක්විති හූල්ලා මෙන් සිතුවේය.

# 14

අනුරාධපුරයේ සිට ආ වාහනය කොළඹට කිට්ටු වෙද්දී පාන්දර හතරාමාරය. ඒ වෙනතුරු වර්ෂා ඇස් පියවුයේම නැත. පුදුමයකට මෙන් කොල්ලා නැගිට්ටේද එක් ගමනකි. එහෙමම කිරි බී ඔහු නිද ගත්තේය.

කැළණි පාලමෙන් වාහනය කොළඹට දමද්දී වර්ෂාගේ පපුවට වෙනස්ම හැඟීමක් දනුණි.

'ඔයාට ළං වෙද්දී මොනවද වෙනවා... ඒක මට දැනෙනවා...'

ඒවා දැනෙන්නේ මේ පපුවට පමණි.

'පාන්දර ආවානම් අපි තාම මහ...'

'දැන් හිතට නිදහස් ප්‍රියා...'

'ම්... කීය වෙනකල් ඉඳලා හරි අයියව බලලා යන්... බැරි උනොත් රෑ නැවතිලා හරි උදේ බලමු...'

වර්ෂා දුක්බර ලෙස සිනාසුණාය. කොහොමත් දැන් ඔහුව නොබලා අනුරාධපුරයට යා නොහැක.

'එයා මේ මොනවත් දන්නැනේ නේද ප්‍රියා...'





සුවසේ ගුලි වී නිදන පුංචි විමුක්ති දෙස බලා වර්ෂා කීවාය.

'ඒ වුණාට ඒකා තමයි අම්මවයි තාත්තවයි එකතු කරන්නේ...'

කොළඹ නගරයට උඩින් යංතම් පාන්දර එළිය විසිරෙමින් තිබුණි.

නවලෝක පෞද්ගලික රෝහල ළං ළං වෙද්දී වර්ෂාගේ පපුව කඩාගෙන යන්නට විය. කොම්පඤ්ඤවීදිය හන්දියේ කලර් ලයිට් වලින් වාහනය ඉදිරියට යද්දී නවලෝක රෝහල පාන්දර එළියෙන් අපූරුවට දිස් විය.

'අ..නේ ඔයා මේකේ දැන් ඉන්නවනේ...'

ඒ හැඟීම එද්දී පපුව කඩාගෙන මෙන් ගොස් දැස් තෙත් විය.

'උ..දේ ක..වුරු ඉන්නවද දන්නෑ ප්‍රියා...'

කෙල්ල මේ කතා කරන්නේ නොඉවසිල්ලෙන් බව ප්‍රියංවද දනී.

'චූ..ට්..ට..ක් ඉ..ව..ස..ප..න් ර..ත්තරං... හැමදේම හරියයි...'

හිතෙන්නේ ඔහු ඉන්නා පන්සිය තුන කාමරයට දුවගෙන යන්නටය.

වාහනය නවලෝක රෝහල ඉදිරිපිට වූ විශාල වාහන අංගනයේ කොනක නතර විය. වාහන අංගනයේ වූයේ වාහන දහයක් පහළොවක් පමණි.

'අන්කල් ගහක් යට වගේ නවත්තන්න... අව්ව වැටුණාම පැටියට අමාරුයි...'

'හොඳයි දුවේ...'

වර්ෂා දැස් මිරිකා ගත්තාය. 'අපේ තාත්ති අර හොස්පිට්ල් එකේ ඉන්නවා පැටියෝ... අම්මට ඉවසන්නම බෑ...'

ප්‍රියංවද කෙල්ලගේ සුරතින් පිරිමැද්දේ ඇය පෙළෙන දුක දැනගෙනය. වර්ෂා යමක් දක්කේ ඒත් සමඟමය.

'ප්‍රි..යා...'

'කෙල්ලේ...'

'උ..ඩ ඉන්නේ සක්විති අයියා තමා...'

˙උ..ඹ කොහොමද දන්නේ...˙

˙අ..ර අතන තියෙන්නේ සක්විති අයියගේ කාර් එක... අයියා තාම උඩ...˙

˙එ..හෙ..නම් යද්දී අපිට දනගන්න පුළුවන්...˙

˙ම්...˙

දෛවය පුදුමාකාරය. මෙහෙමම උඩට යා හැක. සක්විති මේ සියල්ල දන ගත්තද කමක් නැත. එහෙත් දෛවය ඒ යන මඟ අහුරා ඇත. වළකා ඇත.

˙ගියොත් අයියට මේ හැම දෙයක්ම කියන්න ඕන... හැම දෙයක්ම... අයියා මාව මේධක්කා ළඟටත් අරන් යයි... එ..ත..කො..ට...˙

වර්ෂා සිතුවාය. නැත. මේ එයට වෙලාව නොවේ.

˙අ..යියා උදේ යයි... නේද ප්‍රියා...˙

˙ඒක නම් ඇත්ත කෙල්ලේ... අයියා යද්දී කවුරු එයිද කියලයි මං හිතුවේ...˙

˙ඒ..ක..නේ...˙

ඉන්පසු කවුරු උන්නත් ඔහුව බලන්නට යනවායැයි වර්ෂා සිතා ගත්තාය.

˙උ..ඹ මූණ ටිකක් තෙමාගෙන බ්ලවුස් එක දගනිංකෝ... අම්මා පැටියව ගන්න...˙

˙ඉ..න්..න පු..තේ...˙

˙ඔ..හො..මම තියාගමු අ..ම්මේ... මං ඇඳගෙන කිරි වඩියක් දෙන්නම්...˙

වර්ෂාගේ නෙතින් එක දිගට කඳුළු ගලයි. ˙ඔයා ළඟටම මං ඇවිත්... ඔයාට දනෙනවද... මට නම් හරියට දනෙනවා...˙ වර්ෂා සිතුවේ අඬමිනි.

˙ප්‍රියා...˙





˙කෙල්ලේ...˙

˙මා..ත් එ..ක්..ක උඩට ය..න්..න එ..නව නේද...˙

˙උඹව තනියම යවන්නෑ කෙල්ලේ... තාම අමාරුත් එකේ...˙

˙මං එන්නේ අපේ පැටියා ලැබිලා සුමානෙන්. අනේ ඔයා ඒක දන්නවනම්...˙ වර්ෂා සිතුවාය.

වර්ෂා වතුර පොදකින් මුහුණ තෙමාගෙන තෙත අතින් හිසද අතගා ගත්තාය. අනුරාධපුරේ ළිං වල කිවුල් වතුර වලටවත් කෙල්ලගේ කොණ්ඩය කැත වූයේ නැත. ඉස්සර ඔහු මේ වරලසට පුදුමාකාර ලෙස ආශා කළේය. වර්ෂා තෙත අතින් කොණ්ඩය සකසාගෙන පුතාගේ සුදු නැප්කින් එකකින් මුහුණ පිසද ගත්තාය.

වාහනයටම වී බ්ලවුස් එක මාරු කරගත් ඇය යළිත් රෝහල ගොඩනැගිල්ල දෙස හූල්ලා මෙන් බැලුවාය. මේ තරම් ගින්දරක් දරා ගැනීමට අමාරුය. ආදරය කෙනා ළඟට ළං වෙද්දීත් ගින්දරය. දුරස් වෙද්දීත් ගින්දරය. ආදරය පුදුමාකාර යැයි කියන්නේ ඒකය.

˙දෙන්න අම්මේ...˙

˙ම්.. ඇහැරිලා අම්මව තමා හොයන්නේ...˙

කොල්ලා ඇත්තටම උන්නේ ඇස් කරවමිනි. වර්ෂා දැවී ගිය දෙනෙතින් ඒ මුහුණ දෙස බලාගෙන උන්නාය. ˙ඔයා තාත්ති වගේමයි... අද තාත්තිව දකිද්දී මට ඔයාවම මතක් වෙයි... මේ ඇස්දෙක මේ නහය... මේ තොල් දෙක එහෙමම තාත්තටත් තියෙනවා... මං බලලා ඇවිත් කියන්නම්...˙

පුතාට කිරි දෙන්නට තනය එළියට ගනිද්දී කෙල්ලගේ දැස් තෙමී ගියේය. මේ පපුවේ තියෙන ගින්දරට මෙහෙම කිරි එරෙනවා කියා හිතද්දීත් පුදුමය. කොල්ලා බොන්නේ අම්මාගේ උණු වූ පපුවෙන් ගලන උණු මව් කිරිය.

˙අ..ම්මේ..˙

˙පුතේ...˙

˙උඩට ගියාම පැම්පර් එක චුට්ටක් ගලවලා තියන්න... පව්...˙

'මං බලලා කරන්නම් පුතේ... ඔයා යන්නකෝ...'

දෑස් දිගටම තෙත් වෙයි. ඒවා මත වැලි ගැවාක් වැනිය... දෙවියන් මේ චුට්ටවත් ඔහුව බලාගන්නට දීම පිනකි. විනාඩි පහක් ඔහුව බලා ගොස් අවුරුදු පහකට හිත හද ගත යුතුය. දෛවය සැනසීම දෙන්නේ එහෙමය. කන් හැන්දෙනි.

ඒත් හිතට දුකක් නැත. ඒ ජීවිතය සදකාලයටම තමාගේය. ඒ සැනසීම අර පිච්චෙන රජරට අහස යට හිත හදගෙන ජීවත් වන්නට හොඳටම ඇතිය.

ප්‍රියංවද වාහනයට වී සුජානිට ගත්තාය.

'සුජා මං ප්‍රියා...'

'ප්‍රියා... මං ආවා විතරයි කෙල්ලේ... හිටපන් මං උඩට ගිහින් උඹට ගන්නම්...'

'සැකයක් හිතෙන්න තියන්නෙපා කෙල්ලේ...'

'බයවෙන්නෙපා ප්‍රියා...'

ප්‍රියංවදගේ හිතට සැනසීමක් දැනුණි. ඇය වර්ෂාගේ තනයෙන් කිරි බොන පැටියාගේ පුංචි හිස ආදරයෙන් අතගෑවාය.

'මේකා මේ මොනවත් දන්නෑනේ.. පව්...'

'ම්.. තා..ත්..තා ළඟටම ඇවිත් තාත්තගේ ඇහේ ගැවෙන්න වත් පි..න..ක් නෑ...'

'එ..හෙම හිතන්නෙපා කෙල්ලේ... එහෙම තාත්තා කෙනෙක් ඉන්න එකත් කොච්චර දෙයක්ද...'

'ම්...'

වර්ෂා හූල්ලමින් කීවාය.

'ප්‍රි..යා.. ධ..නේ අයියා ඉඳී... නේ..ද...'

'කවුරුවත් නැති වෙන්නෑනේ කෙල්ලේ...'

'ධනේ අයියා සක්විති අයියටයි මේධක්කටයි කියයි... පව්.. එයාලට දුක හිතෙයි...'





'ඒත් උඹ ගැන නරකක් හිතන්නෑ කෙල්ලේ...'

'යන්න පුළුවන්නම් යනවා ප්‍රියා...'

ප්‍රියංවද අම්මාත් පුතාත් දෙස බලා උන්නේ ඇත්තටම දුකෙනි. අද මෙහෙම මහපාරේ තබා දෙවියන් දුක් දෙන්නේ විමුක්තිට මේ ලෝකයේ වැඩියෙන්ම ආදර කරන කෙනාටය.

සුජානි කතා කළාය.

'ප්‍රි..යා.. දැ..න් වරෙන් කෙල්ලේ... විමුක්ති අයියගේ අයියා දැන් ගියා... මං දෙරකඩට එන්නම්...'

'අ..නේ වරෙන් කෙල්ලේ... අපි පාර දන්නෑ...'

ප්‍රියංවද එහෙමම කෙල්ල දෙස බැලුවාය.

'සක්විති අයියා පිටවෙලා...'

'අ..පි වාහනේ ගියාමම යං ප්‍රියා...'

සක්විති වාහන අංගනයට ආවේ ඒ මොහොතේය. පුරා රැයක් නිදි වැරූ නිසා ඔහු උන්නේ වෙහෙස වූ මුහුණිනි. කමිසය උඩින් දමාගෙන වාහන අංගනයට එන සක්විති දෙස වර්ෂා බලා උන්නේ ඇත්තටම වේදනාවෙනි. 'ම..ට සමාවෙන්න ලොකු අයියේ... ඔයා ළඟට ඇවිත් දවසක මං වැඳලා සමාව ගන්නම්... මේ වෙලාවෙ ඔයා ළඟට මට එන්න බෑ... සමාවෙන්න...' වර්ෂා කීවේ සිතෙනි.

'ප..ව් අ..යියා රෑට නිදිමරලා යන්නේ...'

'ඔව්.. හරි මහන්සි පාටයි...'

'සක්විති අයියා විමුක්ති අයියට හරි ආදරෙයි... ඒකයි මෙහෙම දුක් විඳින්නේ...'

'අ..යි..යා ය..න..වා...'

කෙල්ල ළඟටම පැමිණ ඇති බව සක්විති දන්නේ නැත. ඇය ඉන්නා බව දන්නවා නම් ඔහු රෝහලෙන් හෙළවෙන්නේ නැත. ඒ කිසිවක් නොදත් සක්විති වාහනය නවලෝක රෝහලේ වාහන අංගනයෙන් පිටතට ගත්තේය.



Hemantha007
For Free Distribution Only

'අ..මිමේ පැටියා...'

වර්ෂාගේ දෙනෙතින් එක දිගට කඳුළු ගලයි.

'අ..මි..මි තා..ත්..ති..ව බ..ල..ලා එන්නම් පැටියෝ...'

වර්ෂා කඳුළු පිරි මුහුණින්ම කොල්ලාගේ මුහුණ සිප ගත්තාය.

'අ..ම්මා එහෙනම් පරිස්සමින් ඉන්න... අපි ඉක්මනට එන්නම්...'

'හොඳයි පුතේ... තුණුරුවන් සරණයි... පරිස්සමින් පුතේ...'

ප්‍රියංවද කෙල්ලගේ අතින් අල්ලා ගත්තාය. වර්ෂා ඇවිද්දේ වෙව්ලන දෙපා වලිනි. 'මං ඔයා ළඟට එනවා ර..ත්තරනේ... ඔයාගේ බබා එනවා...' කෙල්ල වෙව්ලමින් සිතුවාය.

'උ..ඹ..ව වෙව්..ල..න..ව..නේ කෙ..ල්ලේ...'

ප්‍රියංවද කීවේ කෙල්ල වෙව්ලන බව ඇගේ අත අල්ලාගෙන ඉඳිද්දී දැනෙනා නිසාය.

'ම..ට ද..රාග..න්..න බෑ ප්‍රියා...'

'හිත හයිය කරගනින් වස්තුවේ...'

'ම්...'

'සුජා එන්ට්‍රන්ස් එකේ ඇති...'

කෙල්ලෝ දෙන්නා ඇවිද්ද නොව දිව්වෝය. සුජානි කෙල්ලෝ දෙන්නාව ඇතදීම දක්කාය. 'ලස්සන කෙල්ලෙක්... කොල්ලාටම මවලා වගේ...' ඇය වර්ෂාව දක සිතුවාය. ඒ ලස්සනට යටින් ඇති අහිංසක බව සුජානි වර්ෂාගේ ඇස් වලින්ම තේරුම් ගත්තාය.

'සු..ජා.. මේ වර්ෂා...'

'යං කෙල්ලේ... ඉක්මනට යං...'

සුජානි ඉක්මන් වූවාය. විදුලි සෝපානය පහළට එනතෙක් යුවතියන් තිදෙනා විදුලි සෝපානය ළඟ නතර වී උන්නෝය.

'ඔ..යාට පි..න් සු..ජා...'

වර්ෂා කීවේ අඬමිනි.

'හ..රි කෙල්ලෝ... පින් තමයි... දන් අඬන්නැතුව යං...'





විදුලි සෝපානය පහළට ආවේය.

'යං කෙල්ලේ...'

වර්ෂා දිගටම වෙව්ලයි.

'මේ කෙල්ලව වෙව්ලනවනේ ප්‍රියා...'

'ගො..ඩ..ක් කාලෙකට පස්සේ සුජා අයියව බලන්නේ...'

'පුළුවන් ඉක්මනට බලලා යං...'

'ම්...'

කල්පයක් ඔහු ළඟ වැතිර ඉන්නට පතන කෙල්ලට ඉන්නට ලැබෙන්නේ විනාඩි පහකි. දහයකි.

විදුලි සෝපානය විවර විය.

'යං.. අඩ අඩා යන්නෙපා කෙල්ලේ... අනිත් අය සැක හිතයි...'

'ම්...'

වර්ෂා දෙනෙත් බර කර ගත්තාය.

'එ..න්..න...'

විමුක්ති ඉන්නා කාමරයේ දොර ඇරිණි. ඒ මොහොතේ ඔහු ළඟ උන්නේ ධනසිරිය. කඳුළින් තෙමී ගිය මුහුණින් වර්ෂාගේ රුව මතුවිය. ධනසිරි එහෙමම නැගිට්ටේය.

'නං..ගී...'

'මං අ..යි..ය..ව බ..ල..න්..න ආවා අයියේ...'

කෙල්ල එහෙමම විමුක්ති දෙසට හැරුණාය. විමුක්ති උන්නේ දෑස් වසාගෙනය.

'අයියේ චුට්ටක් එ..න්නකෝ...'

ප්‍රියංවද ධනසිරිව කාමරයෙන් එළියට රැගෙන ගියාය. වර්ෂාත් විමුක්තිත් මොහොතකට කාමරයේ තනි විය.

වර්ෂා පැලි පැලී කඳුළු ගලන දෙනෙතින් ඔහු දෙස බලා උන්නාය.

'අ..නේ ම..ගේ ර..ත්..ත..ර..න්... ඔ..යාගේ බ..බා ඇවිත්... ඇ..ස්

අ..රි..න්..න..කෝ...’

වර්ෂාට ඇඬුණි. ඇය එහෙමම පහත් වී ඒ මුහුණම දේතට ගත්තාය.

‘අ..යි..යේ... ම..ගේ අයියේ...’

විමුක්ති ඇහැරුණේ සිහිනෙන් මෙන් ඇසුණු ඒ හඬිණි.

‘මං.. මං.. ආ..වා ආ..වා...’

කෙල්ල වෙව්ලමින් ඒ මුහුණ දේතින්ම ගෙන කීවාය. ඇයට කතා කරගන්නට නොහැක. ඒ තරමටම වෙව්ලයි.

විමුක්ති බලාගෙනම උන්නේය. එය පුදුමාකාර බැල්මකි. යමක් කියා ගත නොහැකිව වර්ෂාගේ දෙතොල් ගැහෙයි.

‘බ..බා ආවා.. ඔ..යා..ගේ බ..බා...’

වර්ෂා තොල් පට හපාගෙන මෙන් කීවාය. පපුව ඇවිලෙන්නේ ලෝ දිය හැලියක දැමූ ලෙසිනි.

‘බ..බා.. ආ..වා...’

විමුක්ති ඔහුගේ මුහුණ මත තිබූ ඇගේ සිනිඳු දෑත් මත දෑත් තබාගෙන කීවේය. වර්ෂා එහෙමම පහත් වී ඔහුව වැළඳ ගත්තාය. නොනවත්වා ඒ මුහුණ සිප ගත්තාය.

‘ඔ..ව් ම..හ..ත්..තයෝ... ඔයාගේ බබා ආවා... මං.. මං.. බ..යෙ..න් ආ..වේ... ම..ගේ ර..ත්..ත..රන්..ට මා..ව..ත් ම..ත..ක නැ..තුව ඇ..ති කිය..ලා.. ම..ට ම..ට...’

නැත. ඊට වඩා ඇයට කතා කරන්නට නොහැක. පපුව ගැලවීගෙන මෙන් උඩට එයි.

‘මාව.. ම..ත..ක..යි නේ..ද මී...’

‘බ..බා...’

උහලාගත නොහැක. පැලෙන්නේ ඒකය.

‘ඔ..යාට ස..නීප නෑ මහත්තයෝ... මං දන්නවා... බ..ල..න්..න එ..න්..න විදිහක් ති..බ්..බේ නෑ බබාට... ඒත් මං අ..ද ආවා...’





විමුක්ති දිගටම ඒ අත අල්ලාගෙන ඉඳී...

‘ම..ට තා..ම..ත් ආදරෙයි නේ..ද.. මී...’

වර්ෂා පහත් වී ඒ දෙතොල් අද්දරටම දෙතොල් තබා රහසින් මෙන් ඇසුවාය. ඇගේ දෙතොල් තිබුණේ ලේ පාටට වෙව්ලමිනි. විමුක්ති ලස්සනට සිනාසුණේය.

‘මං.. දැ..න්..නවා අයියේ...’

කෙල්ල එහෙමම ඒ දෙතොලට දෙතොල් තබා වැරෙන් සිප ගත්තාය. එය පුදුමාකාර හාද්දකි. කෙල්ලගේ දෑත් ඒ හිස පුරා උමතුවෙන් මෙන් දිව ගියේය.

‘මැ..රු..ණත් ඔ..යා ම..ගේ... මං දැ..න්..නවා...’

වර්ෂා ඒ පපුවට හිස තබා ඒ පපුවම සිප ගත්තාය. ඒ දෙතොල් වල රස්නය විමුක්තිට බොහෝ දේ සිහිවන්නක් බව කෙල්ල දන උන්නේ නැත.

ඔහු උන්නේ කතා කර ගත නොහැකිවය. ඔහුට වචන මතක නැත.

‘අ..පිට පු..තෙ..ක් ලැබු..ණා... මේ ව..ගේ..ම... තා..ත්ති වගේමයි... එ..යා ප..හළ ඉ..න්..න..වා... මට ගේන්න විදිහක් නෑ... ස..නීප උ..නාම පෙ..න්..න..න්..නම්...’

‘බ..බා ඉ..න්න...’

වර්ෂා ගැස්සී මෙන් බැලුවාය. පුදුමය. එය කීවේ ඔහුමද...

‘මො..ක..ක්..ද ර..ත්..ත..ර..න් කිව්වේ...’

‘බ..බා ඉ..න්..න...’

‘අ..නේ.. මං...’

වර්ෂාව වෙව්ලන්නට විය. ඔහුට හොඳටම සිහිය නැත්නම් එහෙම කියන්නේ නැත.

‘මං.. දැ..ලා ය..න්..නේ කො..හො..මද දැ..න්... ඒ..ත් ම..ට ඔ..යා ළ..හ..ට වෙලා ඉ..න්..න දෙ..න්..නෑ ර..ත්..ත..රන්...’

විමුක්ති ඇය දෙස බලාගෙනම උන්නේය. දිගටම බලාගෙන උන්නේය. ඒ ඇස්වලට ගිලීගෙන බලා උන්නේය.

'කොහේ ගියත් මං ඔ..යා..ගේ අයියේ... කොහොමත් දැ..න් අපිට වෙ..න් වෙන්න බෑ... අපිව වෙන් කරන්නත් බෑ... කාටවත් බෑ...'

වර්ෂාගේ ඇසින් එක දිගට කඳුළු ගලාගෙන යන්නට විය. විමුක්තිගේ සුරත එසවිණි. පුදුමයකට මෙන් එය විත් නතර වූයේ ඇගේ කම්මුල් මතය.

'අ..නේ.. ම..ට...'

උහුලාගත නොහැකිව ඇයව විමුක්තිගේ ළය මතටම කඩා වැටුණි. ඇය ඒ පපුව දහ දෙළොස් වතාවක් සිප ගත්තාය.

'ස..නීප වෙ..ලා මං ගා..ව..ට එ..න්..න සුදු අයියේ... පුතත් දැ..න් ඉ..න්..නවා... ඔයා එනකං මං එයාව බලාග..න්..නම්...'

විමුක්තිගේ හිස තෙරපී යන්නට විය. ඔහුගේ හිසේ මොනවාද පෙරළෙන්නට විය.

'ඇ..යි ම..හ..ත්..ත..යෝ...'

ඔහු නළලත මිරිකා ගනිද්දී වර්ෂා ඇසුවාය.

'ඔ..එව රිදෙනවද... ඉ..න්..න මං අතගාන්නම්...'

වර්ෂා ඔහුගේ හිස අතගෑවේ ඇගේ පපුවටම ඒ හිස තබාගෙනය.

'කෙ..ල්ලේ... දැ..න් ඩො..ක්..ටර් එ..න..වලු...'

ප්‍රියංවද කලබලයෙන් පැමිණ දොර ඇර කීවාය. කෙල්ල විමුක්තිව වැළඳගෙන ඉන්නා අයුරු දකිද්දී ප්‍රියංවදගේ දෑස් පෙඟී ගියේය. 'දූන් යද්දී පැලෙයි'

'මං.. කො..හො..ම..ද දා..ලා ය..න්නේ ප්‍රියා...'

ප්‍රියංවද කාමරයට ආවේ දෑස් කඳුළින් පුරවාගෙනය.

'පේනවා නේද ඔයාගේ කෙල්ල දුක් විඳින හැටි... මං එ..යා..ව බලාගන්නම් අයියේ... ඉ..ක්..ම..නට සනීප වෙ..න්..න...'





ප්‍රියංවද විමුක්තිගේ හිසම අතගා කීවාය.

'අ..යියට සි..හිය ති..යෙ..නවා ප්‍රියා...'

'බ..බාව වි..තරද මතක.. ම්...'

'බ..බා ආ..වා...'

විමුක්ති කියද්දී කෙල්ලෝ දෙන්නාටම ඇඬුණි.

'ඩො..ක්..ට..ර් එහා රූම් එ..කේ කෙ..ල්ලේ... ඉ..ක්..ම..නට වරෙන්... ධ..නේ අයියා අරහේ මේඩක්කට ෆෝන් කරන්න... යනවා... ඉ..ක්මනට...'

'මං.. එ..න්..නම් ප්‍රියා...'

වර්ෂා එහෙමම විමුක්තිගේ හිස පපුවේ තද කර ගත්තාය.

'මං.. කො..හොම හ..රි ආයේ එ..න්..නා..ම්...'

ඇය ඔහුගේ දෑස්වලට එබුණාය.

'බ..බා ඉ..ක්..ම..න..ටම එ..න්..නම්... හො..ඳ..ද... මෙහෙම දුක් විඳින්නෙපා... ඉ..ක්..ම..නට හිතලා ස..නීප වෙ..න්..න... මං දලා ය..න්නේ...'

ඒ දෙතොල් මුහුණ පුරා දුවයි. විමුක්ති වර්ෂාගේ අතකින් අල්ලාගෙන උන්නේ පොඩි දරුවෙකු මෙනි.

හිමාලි නවලෝක රෝහලට ගොඩ වූයේ ඒ මොහොතේය. ඇය විදුලි සෝපානයෙන් උඩට එද්දීත් වර්ෂා විමුක්ති ළඟය. ඔහුව දමා යෑම හිතනා තරම් පහසු නැත. අර වෙන්වීමට වඩා මේ හමුවීම දුකය.

හිමාලි රෝහල් කොරිඩෝව දිගේ එද්දී විමුක්තිගේ කාමරය අසළ පිටත රැඳී උන්නේ ධනසිරිත් ප්‍රියංවදත්ය.

'නංගී.. මේ.. හි..මා..ලි... මං කිව්වේ දැ..න්...'

ධනසිරි කලබල විය. එහෙත් ප්‍රියංවද කලබල වූයේ නැත. 'එහෙනම් උඹයි මේ ගෑණි... දන් උඹේ ඇස් දෙකින්ම බලා ගනින් හැම දේම... උඹ ආපු එක හොඳයි මේ වෙලාවේ...' ප්‍රියංවද සිතුවාය.

˙ධ..නේ අයියේ... එයා ආපුදෙන් ක..ම..ක් නෑ...˙

ප්‍රියංවද සන්සුන්ව කීවාය. හිමාලි ඒ වෙද්දීත් එතනට පැමිණ හමාරය.

˙ධනසිරි... මොකද එළියේ... මේ කවුද...˙

˙මේ... පුංචි මහත්තයව දන්න නංගි කෙනෙක්...˙

ප්‍රියංවද එක එල්ලේ හිමාලි දෙස බැලුවාය. හිමාලිට අමුත්තක් දැනුණි. ˙කවුද මේකි...˙ ඇය දෙර ඇරියේ එසේ සිතමිනි.

දුටු දෙයින් හිමාලිගේ සර්වාංගයම ඇවිලිණි. වර්ෂා උන්නේ විමුක්තිගේ මුහුණටම බරවී නොනවත්වා ඒ මුහුණ සිප ගනිමිනි. කෙල්ලගේ වෙව්ලන දෙතොල් පට ඔහුගේ මුහුණ පුරා අසිහියෙන් මෙන් දුවමින් තිබුණි.

˙මං.. දැ..ලා ය..නවා නෙ..මේ ර..ත්..තරන් හොඳේ... ඉ..ක්ම..නට එ..නවා...˙

කෙල්ල ඔහුගේ දෙතොලින් දෙතොල් ගනිද්දී මුහුණම දේතට ගෙන කීවාය.

දෙර ඇරුණ වගක්වත් වර්ෂා දන්නේ නැත. හිමාලි වෙව්ලුවාය... මේ ඉන්නේ කවුදයි ඇය දැන් දනී. ඇගේ සර්වාංගයම ගිනි ගන්නට විය.

˙මං.. බෝධි පූජා තියනවා... බාර වෙනවා... ඉ..ක්..මනට සනීප වෙයි... හොඳේ...˙

වර්ෂා යළිත් ඒ මුහුණට එබුණාය. හිමාලි වේගයෙන් පැමිණ වර්ෂාගේ උරතලයෙන් ඇද්දය.

˙ව..න..ච..ර බැ..ල්ලී... උ..ඹ ක..වුද ය..කෝ... ම..ගේ කොල්ලව ඉඹි..න්..න... ප..ට්ට...˙

හිමාලි කෑගැසුවේ ආවේෂ වූවෙකු මෙනි. වර්ෂා මොහොතක් තුළ ඇය කවුදයි දැන ගත්තාය. කෙල්ල සිනාසුණේ ආවේෂ වූවෙකු මෙනි.

˙උ..ඹ කවුද...˙





හිමාලි වියරුවෙන් වගේ ඇසුවාය.

˙මංද.. මං විමුක්ති අයියගේ පණ...˙

හිමාලිව වෙව්ලා ගියාය.

වර්ෂා මොහොතකට විමුක්ති දෙස බැලුවාය.

˙මං කවුද...˙

ඇය විමුක්ති දෙස බලා සිනාබරව ඇසුවාය.

˙බ..බා...˙

විමුක්ති එහෙමම කීවේය.

˙අහගත්ත නේද... මේ මගේ මහ..ත්ත..යා... මං ජීවත් වෙන්නෙත් මැරෙන්නෙත් මගේ මහත්තය එක්ක... නිකං දුක් විඳලා ජීවිතේ නාස්ති කරගන්නෙපා... තේරුණාද...˙

වර්ෂා ඒ ටික මුහුණටම කීවාය.

˙වේ..ස බැ..ල්ලි... මං උ..ඹ..ව දැ..න්..ම..ම පොලීසියට අ..ල්ලලා දෙ..නවා... වනචර කම් කරලා ගෙවල් වලිනුත් පන්නලා දැන් එනවා හොරෙන් ඇවිත් වල්කම් කරන්න... බැහැපන් බැල්ලි එළියට...˙

˙මං ම..ගේ ම..හත්තයා වෙනුවෙන් මැරෙන්..න..ම්... අද ආවේ හොරෙන් තමයි... ඒත් දවසක එළිපිටම එනවා...˙

වර්ෂා එහෙමම හැරී විමුක්තිගේ දෙපා සිපගෙන ඊට වැන්දය. ප්‍රියංවද සියල්ල බලාගෙනය. හිමාලි වර්ෂාට ගහන්නට පනිද්දී ප්‍රියංවද පැන අල්ලා ගත්තාය.

˙අ..ත..ක් ඉ..ස්සුවොත් බ..ලාගෙනයි...˙

වර්ෂා එහෙමම අවසන් වරට විමුක්ති දෙස බැලුවාය.

˙මං.. ය..නවා ර..ත්..ත..ර..න්... බු..දු ස..ර..ණයි... පරිස්සමින් ඉ..න්..න...˙

වර්ෂා විමුක්තිගේ හිස අතගානෙම ආවාය.

˙බ..බා ඉ..න්..න...˙

විමුක්ති කෑ ගැසුවේය. වර්ෂාට බැලුණේ හිමාලි දෙසය.

‘දැ..ක්..ක නේ...’

වර්ෂා කාමරයෙන් පිටතට ආවේ එසේ කියාගෙනය. හිමාලි එහෙමම ජංගම දුරකථනය අතට ගත්තාය.

‘අ..යියේ... මං ය..න්..නම් අයියේ... අ..නුලක්කට කියන්න මං ආදරෙන් ම..ත..ක් කළා කිය..ලා හොඳේ...’

වර්ෂා අඬමින් කීවාය.

‘අ..නේ නංගි ටි..ක..ක්...’

‘බෑ අයියේ න..ව..ති..න්..නම බෑ... මේවා මෙහෙම වෙද්දෙන්... මං ජීවත් වෙ..න..වා... ය..න්..නම් හොඳේ...’

වර්ෂා ප්‍රියංවද සමඟ ආවේ දුවගෙනය. ධනසිරි අසරණව බලාගෙන උන්නේය. ඔහුගේ සිතට අද දුකක් නැත. මේ දේ කවද හෝ සිද්ධ විය යුතුමය.

විමුක්ති ඇඳ මත ඉඳගෙන උන්නේ අසරණවය. ඔහුගේ හිස ඇත්තටම පුපුරමින් තිබුණි. හිමාලි විමුක්ති දෙස බැලුවේ ඇවිලෙමිනි. ‘පට්ට බැල්ලි ඇවිත් අවුස්සලා ගියා... දන් ඔය පත්තුවෙලා ඉන්නේ... මේවා උනොත් මං ඉවරයි. එ..හෙම වෙ..න්..න දෙන්න බෑ... එද්දී ඒකිව බඳගෙන හිටපු හැටි... මාස තුනක් මහ රෑ ළඟ හිටියා... එක අතක් මගේ ඇඟට වැටුණේ නෑ.. අද ඒකිව බදගෙන..’ හිමාලි පුපුරමින් සිතුවාය.

හිමාලි ගත්තේ සුරඟනාටය.

‘නෑ..න්..දේ... මං...’

‘ඇයි පුතේ... මොකද මේ කලබලේ...’

‘මං හොස්පිට්ල් එ..කට ආවා... එ..ද්දී අ..ර බැ..ල්ලි ඇ..වි..ත්.. අර... අයියා එ..ක්..ක හිටපු බැ..ල්ලි...’

හිමාලි වෙව්ලමින් සියල්ල විස්තර කළාය.

‘ඒ..කි ම..හ ව..ල් බැ..ල්ලියෙ..ක්... එ..ද්දී අයියව බදගෙන හිටියේ... ඇ..යි එ..හෙම ක..ර..න්..නේ... දැ..න් අයියා...’





හිමාලි ඇඬුවාය. වර්ෂා වැළඳ ගත්තේ ඇගේ ආදරයය. ආත්මයය. ඇගේ දරුවාගේ තාත්තාවය. කොටින්ම ඇගේ පණය.

‘මේවා ස..ක්විති අයියලා දැනුවත්ව කෙ..රෙ..න්..නේ... නෑ..න්දේ... ධනසිරිත් එද්දී හිටියා...’

‘මූ..න් ඔක්කොම එ..හෙ..නම් එකතුවෙලා මේවා කරන්නේ... මං දන්නවා ඕකි යන්නෑ... කොල්ලගේ ජීවිතේම කාලා දැ..න් එන්නේ අයිතිය ගන්න...’

‘මැරුණත් මං උඹට දෙන්නෑ...’ හිමාලි විමුක්ති දෙස බලා සිතුවාය.

‘ම..ට අයියා ළ..ඟ දැ..න්..ව..ත් ඉ..න්..න දෙ..න්..න නෑ..න්..දේ... ම..ට..නේ එයා ගැ..න කැ..ක්..කුම...’

හිමාලි අඬමින් කීවාය.

# 15

රෝහලින් පහළට ආවේ කොහොමද කියාවත් වර්ෂා දන්නේ නැත. තොල්පට ලේ පතින තරම් තදින් හපාගෙන කෙල්ල පහළට ආවේ මහමෙරක් තරම් වූ දුක දරාගෙනය. විමුක්තිව බලා එද්දී මේ දේ වන බව ප්‍රියංවද දැන උන්නාය. දෛවය මේ ආදරය ගෙතියන්නේ මේ තරම් දුක්බර මාවතක නම් මොනවා කරන්නද...

පහළදී වර්ෂා සුජාතිගේ අතකින් අල්ලාගෙන කඳුළු පිරි දෙනෙතින් බලා උන්නාය.

'උ.. උ..ඹට පි..න්...'

ඇය කීවේ එපමණකි.

'දුක දරා ගනිං කෙල්ලේ... මේ වෙන හැම දෙයක්ම මං කතා කරලා කියන්නම්... මට කතා කරපංකෝ ප්‍රියා... හොදේ...'

'අපි ගිහින් එන්නම් සුජා...'

'හොඳයි... කෙල්ලව පරිස්සමින් එක්කං පලයං... ඔය වෙව්ලන විදිහට සිහිත් නැතිවෙයි...'

ඇත්තටම වර්ෂා උන්නේ අමාරු තත්වයකය. ප්‍රියංවද නිහඬව උන්නේ කෙල්ලව මේ මොහොතේ සනසා නලවන්නට බැරි බව දනගෙනය.





හිටිවනම වර්ෂා නැවතී යළි රෝහල දෙස බැලුවාය.

'මං දැ..ලා ය..න..ව..නේ ප්‍රියා...'

එහෙම අහද්දීත් දුකය.

'එ..හෙම හිතන්නෙපා කෙල්ලේ... මෙච්චර ඇත් වෙලා ඉඳලත් වෙනසක් වුණාද...'

වර්ෂා රෝහල දෙස බලාගත්වනම බලා උන්නාය.

'අ..පි ය..න්... අර බැල්ලි දැන් මොකාව මෙතනට ගේන්නයිද දන්නෑ...'

වර්ෂාට ඒ මුහුණ මතකය. ඒ මුහුණින් වර්ෂා හොඳ කෙල්ලෙක්ව දැක්කේ නැත. 'ඒ වගේ කෙල්ලෙක්ට ඔයාගේ පපුව හොල්ලන්න බෑ...' වර්ෂා සිතුවාය.

'අ..නේ මේ දරුවා පු..තේ...'

වර්ෂා දකිද්දී අම්මා ඇගේ මුහුණ දෙස බලා කීවේ පුදුමයෙනි.

'මං.. ම..ගේ දෙ..යියොව දැ..ක්..කා අ..ම්මේ...'

වර්ෂා වාහනයට ගොඩවී කොල්ලාව අතට ගෙන ඇඬුවාය.

'අ..න්..ක..ල් අ..පි ය..න්...'

'අපි කොහාටද යන්නේ දුව...'

'කොහෙට හරි කමක් නෑ... ටි..කක් නිස්කලංක තැනකට යං අන්කල්... මෙතන ඉන්න බෑ...'

ප්‍රියංවද කලබලයෙන් කීවාය. වාහනය නවලෝක රෝහලේ වාහන අංගනයෙන් පිටවෙද්දී වර්ෂාගේ පපුව හෙල්ලෙන්නට විය. ඇය රෝහලේ උඩු මහලේ කාමර දෙස බලාගෙනම උන්නාය. 'අ..ද ඔයාට මගේ හිතේ තිබ්බ ආදරේ කෝටි ගුණයකින් වැඩි උනා... කෝ..ටි ගු..ණ..ය..කින්...' වර්ෂා දෙනෙතට ඉනූ කඳුළක් පුතුගේ මුහුණට වැටෙන්නට නොදී ඇඟිලි තුඩින් පිසද සිතින් කීවාය.

'අ..ම්..මි තා..ත්..තිව බ..ල..ලා ආවේ... මං ඔ..යා ගැ..න..ත් කි..ව්..වා...'

දිගටම ඇඬෙයි. පුදුමය. අද හිතට මේ තරම් සතුටක් දැනෙද්දීත් ඇඬෙයි.

‘පු..තා... ඇඬුවද අ..ම්මේ...’

‘අ..නේ නැ පුතේ... එ..හෙම වද දෙනවද මේ සුදු මහත්තයා...’

‘අද මූ..ණ දකිද්දියි හිතුනේ... ඔ..ක්..කොම තා..ත්..තගේ... මේ ඇඟිලි පවා එයාගේ ප්‍රියා...’

ඇය කියන්නේ තොල් පට හපාගෙන අමාරුවෙන් හැඟීම් වාවාගෙනය. කොතරම් හදවතට දුකද... කොතරම් හදවතට සතුටුද කියා දන්නේ කෙල්ලය. ඒවා විවේකයෙන් ඇසිය යුතුය.

‘ධනේ අයියවත් වෙව්ලනවා වගේ අද... පව්... ගොඩක් දේවල් තියෙනවා උඹට කියන්න... ඒ හිටපු චූට්ටට ධනේ අයියා කිව්වේ... කතා කරන්නමයි ගියේ මේධක්කට... අඩ අඩ උඹව හොයනවලු...’

‘මං අක්කා ගැන දන්නවා ප්‍රියා...’

‘මං කිව්වා අපි ඉන්නේ අමාරු තත්වෙක කියලා... චූ..ට්ට දවසක් කෙල්ලට ඉන්න තිබ්බා... අනුලක්කත් දවසට තුන් හතර පාරක් උඹව මතක් කරනවලු...’

‘ම්...’

‘මොනවා උනත් උඹ අයියව අද බලපු එක හොඳයි නේ..ද...’

‘මං හි..ටි..ය..න..ම් එ..යා ද..ව..ස් දෙ..කෙ.න් ස..නීප ක..ර..න..වා ප්‍රියා... මං ඒක අ..ද තේරුම් ග..ත්..තා...’

‘ඒක ධනේ අයියත් කිව්වා...’

ප්‍රියංවද කෙල්ලගේ උරතලය පිරිමැද කීවාය.

* * * * * * * * * * * *

සුරම්‍යා ධනසිරිට කතා කර පහත්ම විදිහට බැන්නාය. ධනසිරි සියල්ල අහගෙන උන්නේ අමාරුවෙනි.





‘උඹටයි ගෑණිටයි ළමයිත් හදගෙන මෙතන වැටිලා ඉන්න දීලා තියෙන්නේ මේ ගෙදරින් එලවපු වේසියන්ට හිතවත් වෙලා ඉන්න නෙමේ ධනසිරි... කන්නේ කාගෙන්ද කියලා හිතපන්... උඹලා කුණු ලේ තියෙන උන්... ගෙදරක තියාගන්න වටින්නෑ... කුණු ලේ තියෙන උන් කුණු ලේ තියෙන උන්ටමනේ අදින්නේ... පර ගතිය...’

ධනසිරිගේ දෑස්වල කඳුළු පිරුණි. කෙල්ලත් මොරගොඩ පරම්පරාවේමය. ඇගේ ගතේ දුවන්නේත් මොරගොඩ පවුලේ ලේය. ඒ සියල්ල පසෙකට තැබුවද මේ පවුලට තමාත් අනුලාත් මැරීගෙන කරන්නේ පිරිසිදු හැඟීමෙනි. මේ ගෙදර කෙනෙකුට නරකක් කරන්නට කවදවත් හීනෙකින් වත් හිතා නැත. ‘අපිටත් දවසක යන්න වෙන්නේ වේස නාමේ අහගෙන තමා ධනේ...’ දවසක් අනුලා කියූ කතාව ධනසිරිට සිහිවිය.

‘පට්ට බැල්ලියෙක්ට අයියව බලන්න දීලා දන් රස්සාවත් නැති කරගන්නවා... වැටිලා ඉන්නවනම් ඒ විදිහට ඉන්න දනගන්නවා...’

ඔය ටික කීවේ හිමාලිය. ධනසිරි නෙත් ඔසවා බැලුවේය.

‘මේ අත්දෙක හොඳට තියෙනවා පුංචි නෝනා... මාව පාරට දැම්මොත් ලොරි කරකවලා හරි මං මගේ ගෑණිවයි ළමයවයි රකිනවා... මං උන්ව බඩගින්නේ තියන්නේ නෑ... අනිත් අයට තමා යන්න තැනක් හොයාගන්න වෙන්නේ... ඕවා දෙයියෝ හදපු කූඩු... මිනිස්සුන්ට කඩන්න බෑ... මං යන්නම් පුංචි මහත්තයා...’

ධනසිරි ඔය ටික කියා විමුක්තිගේ හිසද අතගා රෝහල් කාමරයෙන් පිට විය. ඔහු යද්දීම සක්විතිගේ ගෙදරට ඇමතුමක් ගත්තේය.

ගත්තේ මේධාය.

‘මේධා නෝනා... මං ධනේ අයියා...’

‘ඇයි ධ..නේ අයියේ... අඬ..ලා වගේ...’

‘කෝ සුදු මහත්තයා...’

‘නිදි... රෑට නිදිමරලනේ එන්නේ ධනේ අයියේ...’

‘අ..ද කෙ..ල්ල පුංචි ම..හ..ත්..තයව බල..න්..න ආවා මේධා නෝ..නා...’

ධනසිරි කියූ දේ එකවරම මේධාට අදහාගන්නට නොහැකි විය.

‘මේ.. අ..පේ කෙ..ල්..ල.. ව..ර්..ෂා නංගි...’

‘ඔ..ව් මේ..ධා නෝ..නා... කෙ..ල්ල ආවා...’

‘අ..නේ දෙ..යිය..නේ දැ..න් ම..ල්ලී ගා..ව ඉ..න්..න..ව..ද...’

‘ම..ට න..ව..ත්..ත..ග..න්..න බැරි වු..ණා මේ..ධා නෝ..නා...’

ධනසිරි සිදුවූ සියල්ල කීවේය. එය අසාගෙන ඉඳිද්දී මේධාගේ දෙනෙත් තෙත් විය.

‘අ..නේ... ඇයි මේ..කි අ..පිට මූ..ණ දෙ..න්..නැ..ත්..තේ...’

‘කෙල්ල ඉන්නේ ලොකු කරදරේක ව..ගේ මේධා නෝ..නා... මේධා නෝනව මතක් කරලා ඇඬුවා... ළඟදීම කතා කරනවා කිව්වා...’

‘ම්.. ධනේ අයියේ...’

‘නෝ..නා...’

‘කෙ..ල්ල ආවේ බ..ඩත් එ..ක්..ක..ද...’

‘නෑ.. ඒත් හ..රි අමාරුවෙන් ඇවි..දගෙන ගියේ...’

‘එ..හෙ..නම් උඹට දරුවා ලැබිලා...’ මේධා සිතුවාය.

‘ය..න්..න යද්දී හිමාලි ආවා...’

‘දෙ..න්..නා මුණගැහුණද...’

‘ඔ..ව් ප්‍රශ්නෙකුත් උ..නා...’

ඒ සියල්ල ධනසිරි කීවේය. ‘එ..හෙනම් උඹ අද අහගත්තා කෙල්ලගෙන්... මට ඒ ඇති...’ මේධා සැනසුම් සුසුමක් හෙළුවාය.

‘කෙල්ල මේ ළඟ පාතකම ඉන්නවා මේධා නෝනා... මේ සිද්ධ





වෙන සේරම බලාගෙන ඉන්නවා...’

‘ඔ..ව්.. ඒකනේ මල්ලී හොස්පිට්ල් කියලා දන්නේ...’

‘සුදු මහත්තයයි මේධා නෝනයි පුංචි මහත්තයව බලාගන්න... ඒ දෙන්නව එකතු කරන්න පුළුවන් ඔය දෙන්නට විතරයි...’

‘ඇයි ධනේ අයියේ... ධනේ අයියයි අනුලක්කයිත් ඉන්නවනේ...’

ධනසිරි මොහොතකට නිහඬ විය.

‘ධ..නේ අයියේ...’

‘අද මට ලොකු නෝනා මහ නරක විදිහට බැන්නා මේධා නෝනා... මං මගේ ගෑණියි ළමයයි නංගිවයි අරගෙන යනවා... මෙහේ ඉන්න බෑ...’

මේධාගේ පපුව එහෙමම ඇවිලිණි. ධනසිරි නවලෝක රෝහල ඉදිරිපිටට වී අඬමින් සියල්ල කීවේය.

‘මං හිමාලිටත් කතා කරලා ආවේ ආයේ මෙහේ ඉන්න බලාගෙන නෙමේ... අපි යනවා මේධා නෝනා...’

‘ධනේ අයියට පිස්සුද... ධනේ අයියා හෙලවෙන්නෙපා... අර කිරිකැටියත් අරන් කොහේ යන්නද... මං කියනවට ටික දවසක් ඉවසන්න... මේ ඔක්කොම ප්‍රශ්න විසඳෙනවා...’

‘මං වත් මගේ ගෑණිවත් මේ පවුලට නරකක් කරලා නෑ මේධා නෝනා...’

‘ඒ..ක නේ..ද අපිත් මේ තරම් ආදරේ...’

‘මං දන්නවා...’

‘මම.. මල්ලී... සුදු මහත්තයා ගැන හිතලා ටිකක් ඉන්න... මට ඔයාවයි අනුලක්කවයි සහෝදරයෝ දෙන්නෙක් වගේ... එහෙම කරන්නෙපා... මේවා විසඳෙනකල් ඉවසන්න... හොඳේ...’

‘ඒත් අනාගතයක් ගැන හිතන්න ඕන මේධා නෝනා... යන්න කිව්වාම යන්න තැනක් නෑ... එහෙම වැටිලා ඉන්න අපට මෙහෙම

කියන එක වැරදියි...'

'මං ඒක දන්නවා අයියේ... මේ පවුලේ දේවල් මේ කොල්ලෝ දෙන්නා බාරගන්නකල් ඉ..න්..න... ඔයාලව එහෙම අගුපිලට දන්නෑ... මගේ දරුවා පල්ලා... මේ..ක ක..රදර කාලයක්නේ අයියේ...'

මේධා කීවේ අඬමින් මෙනි.

'මං සක්විති නැගිට්ට ගමන් අයියට ගන්නම්... දන් හොඳ අයියා වගේ ගෙදර යන්න... මං අම්මගෙන් අහන දේවල් වල හැටියට මං මේ පවුලත් දලා ගිහින්... ඒත් ඒ පවුලේ කොල්ලෝ දෙන්නා එහෙම නෑ...'

'ඒකනේ මේ වැටීගෙන ඉන්නේ මේධා නෝනා... ඒ කොල්ලෝ දෙන්නත් හරි උන් දෙන්නගේ ගෑණු දෙන්නත් හරි...'

ධනසිරි දුරකථනය තිබ්බේ එහෙම කියාය. මේධා සිතුවේ වර්ෂා ගැනය.

'මං දන්නවා උඹට දරුවා ලැබිලා... උඹ අපට මූණ දෙන්න එන්නැත්තේ ඒකයි... අනේ උඹව තේරුම් ගත්ත අක්කා කෙනෙක් ඉන්නවා කියලා උඹ දන්නැනේ... එ..ක තත්පරේකට උඹ මාව හම්බ උනානම්... මං උඹව රකිනවනේ රත්තරන් නංගියේ... හිඟන්නියෙක් වගේ උඹ කොල්ලව බලලා ගිහින්... පව්...'

මේධාගේ හදවත නොනවත්වා දුවයි. මේධා ඕනවටත් වඩා වර්ෂාව තේරුම් ගෙන උන්නාය. මේ තරම් දුෂ්කර මොහොතකදීත් කෙල්ල ආදරය වෙනුවෙන්ම ජීවත් වෙයි.

'උඹට කොහොමත් මේ කොල්ලව නැතිවෙන්න බෑ... හිමාලිලා දහක් ආවත් විමුක්ති උඹේ තමයි...'

මේධා සිතමින් සිටිද්දී දුරකථනය යළි නාද විය.

'මේධා මම...'

ගත්තේ සුරම්‍යාය. 'දන් පරල වෙලා වගේ බැණගෙන යයි' මේධා සිතුවාය.





'අ..ම්මේ...'

'උඹලා එහෙනම් අර බැල්ලිව හොස්පිට්ල් එකටත් ගේනවා... බයක් එහෙම නෑ නේද... මේ..ධා.. එ..ක..ක් ම..ත..ක තියාගන්නවා මං විමුක්තිගෙත් අම්මා සක්විතිගෙත් අම්මා...'

මේධා බිත්තියට සිනාසුණාය. එහෙත් ඇයට මේ බැණුම් දරාගෙන ඉන්නට අමාරුය. ධනේ අයියට අම්මා බණින්නට ඇත්තේ කොහොමදයි දන් මේධාට සිතාගත හැක.

'ක..වුද අ..ම්මෙ ම..ල්ලිව බලන්න ආවේ... මො..න බැල්ලිද... කවුද ගෙන්නුවේ...'

ඇත්තටම වර්ෂා එන බවක් මේධා දන්නේ නැත. එනවා කියා දන්නවානම් ඇය මේ මොහොතේ ඉන්නේ නවලෝකයේය.

'ද..න්..නෙම නෑ.. තො..ත්..ත බබා... මරු ලේලි... මේ පවුල නැති කරලා මොකක්ද තියෙන සැනසීම...'

'අම්මා කියන දෙයක් කියන්නකෝ...'

'උඹලා හිතාගෙන ඉන්න ඒවා කරන්න මං ඉඩ තියන්නෑ... මං මරාගෙන මැරෙන්නේ... මට උඹලා කවුරුවත් ඕනෙත් නෑ... මට දන් ලොකු පුතෙක් කියලා කෙනෙක් නෑ... ඉන්න එකාව මට රැකගන්න දීපන් හොඳද... මං නරක ගෑණි කියන්නෙපා... පට්ට වේසියන්ට මඟුල් සෙට් කරන්න ගිහින් මඟුල් කඩාගන්නෙපා...'

සුරම්‍යා දුරකථනය තැබුවාය. මේධාට ඇඬුණි. ඇය අඬමින්ම ගියේ කාමරයටය. යද්දී සක්විති දුවවද ළං කරගෙන නිදිය. දුවද තාත්තාට තුරුල් වී නිදිය. මේධා අමාරුවෙන් ඇඬුම් වාවාගෙන මොහොතක් තාත්තාත් දුවත් දෙස බලාගෙන උන්නාය.

'ආදරෙන් ඉන්න උන් දෙන්නෙක් එකතු කරන එකාගේ පවුල කැඩෙන්නෑ... බලමු මගේ මඟුල කඩන හැටි...'

මේධා කඳුළු වාවා ගත්තේ අමාරුවෙනි. කොහොමත් හෙට අනිද්ද මේ සියල්ල පුපුරා යන බව මේධා දනී.

# 16

ප්‍රියංවදා ටවුන් හෝල් අසළ වූ හෝටලයක් අසළ වාහනය නවත්වාගෙන උණු වතුර බෝතලයට කෝපි ටිකක් දමා ගත්තාය.

'ඔය ගහක් යට බලලා නවත්තන්න අන්කල්...'

වාහනය නැවැත්වූයේ විහාර මහා දේවි උයන පිටුපස විශාල මැයි මාර ගහක් යටය. එතන නිස්කලංකය.

'අපි කෝපි චුට්ටක් බීලා යන් කෙල්ලේ...'

'අම්මට දීපන් ප්‍රියා...'

'පුතා බොන්නකෝ... කිරි දීලම ඇඟ වේලිලා ඇති...'

ඊයේ රෑ සිට වර්ෂා දහ වතාවක් පමණ කිරි දුන්නාය. උණු කෝපි එක අත තබාගෙන වර්ෂා සිතුවේ ඔහු ගැනය.

'කෙල්ලේ...'

'ප්‍රියා...'

'අපි රත්තරන් ගෙදර ගිහින් ක..තා කරමු... උඹ ටිකක් විවේකෙන් ඉඳපං...'





'ම..ට දු..ක..ක් නෑ ප්‍රියා.. ඇ..ත්..තෙ..ම නෑ...'

එහෙත් ඒ ටික කියද්දීත් කෙල්ලගේ දෑසින් කඳුළු බෝලයක් වැටිණ.

'අ..ම්..මේ...ආ උගුරක් බොන්නකෝ... මං හිමිහිට බොන්නම්...'

'අපි මහට ගිහින් මොනාහරි කමු...'

'ම්...'

'කෙල්ලට උණත් වගේ...'

අම්මා වර්ෂාගේ ගෙළට පිටි අත්ල තබා කීවාය. 'ඒ උණ නෙමේ අම්මේ... මේ ආදරේ ගින්දර...' වර්ෂාට කියන්නට සිතුණේ එහෙමය.

'තව කොහේ හරි යන්නෝනද කෙල්ලේ...'

'නෑ ප්‍රියා... මේ කොළඹ කොහේ යන්නද... අපි යං...'

සැබෑය. මේ කොළඹ කොහේ කියා යන්නද...

'එ..යා..ට ටි..ක ටි..ක සිහිය තියෙනවා ප්‍රියා... පැයක් හිටියනම්...'

හිතනා සියල්ලම කරගත හැකි නම් මේ ලෝකය කොතරම් හොඳ තැනක්ද... එහෙත් දෛවය ඒ තරම් සුන්දර නැත. එක සැනසුම් මොහොතක් දෙන්නේ කල්පයක් දුක් දුන් පසුය.

'ආ..යේ ක..ව..ද එයාව දකින්..න වෙයිද දන්නෑ...'

'හැම දෙය..ක්..ම ඉක්මනට විසඳෙයි කෙල්ලේ...'

'පුතා ලො..කුත් වෙයි...'

කෙල්ලට හීල්ලෙයි.

'අ..පි ය..න්...'

අවසන් කෝපි උගුරද බිවූ වර්ෂා කීවාය. වාහනය යළි කොළඹ බලා ගියේද නවලෝක රෝහල අසළිනි. එතනින් යද්දී කෙල්ල හූල්ලනු ප්‍රියංවද දැක්කාය.

'ප්‍රියා...'

'කෙල්ලේ...'

'මා..ත් එ..ක්..ක බෝධි පූජාවක් කරන්න යං කෙල්ලේ හොදේ...'

'එකට දහයක් කරමු කෙල්ලේ...'

'පුතා සනීපෙන් ඉන්නවද දුවේ...'

'එයාට මතක නැති එක විතරයි අම්මේ... හිටියා වගේමයි... ඇස් චුට්ටක් යට ගිහින්... මූණ චුට්ටක් ඇදිලා ගිහින්... එච්චරයි...'

'තුණුරුවන් සරණින් ඔය ප්‍රශ්න විසඳෙයි...'

'දෙයියෝ ඒක කරයි අම්මේ...'

අද එවැනි විශ්වාසයක් ප්‍රියංවදටද ඇති විය. අද කෙල්ල විමුක්තිව බලා එද්දී ඒ මුහුණින් ඇය දක්කේ පුදුමාකාර කෙල්ලෙකි. ජීවිතයේ දුක තෙරපාගෙන දිරියෙන් නැගී සිටින කෙල්ලෙක් ඇය අද දක්කාය.

'ප්‍රියා...'

'ම්...'

'ගිය ගමන් අපේ හෝටලේ පටන් ගමු...'

'ම්...'

'දැන් මගේ හිතේ බරක් නෑ... උඹ තමා ඒ බර නැති කළේ...'

වර්ෂා ඇත්තටම ප්‍රියංවදට පින් දුන්නාය. ඇය කරන්නේ මිතුරියක් කරනා දේවල් නොවේ. සහෝදරියක් කරනා දේවල්ද නොවේ. අම්මා කෙනෙක් කරනා දේවල්ය.

'මො..න..වද එ..ද්දි උඹ අරන් ආවා නේ..ද...'

'ම්.. එ..යා ඇ..ඳපු වෙස්ට් එ..ක..ක්... මේ.. පුතා ළඟ තියන්න...'

වර්ෂා ඒ සුදු වෙස්ට් එක ගෙන ප්‍රියංවදටත් අම්මාටත් පෙන්නුවාය. ආදරය යනු දෙවියන්ගේ දේ නම් දෙවියන් දේව කරුණාව පෑ යුත්තේ මේ වැනි අයටය.

'මෙ..ත..නි..න් එ..හා ජීවිතේ මට දුකක් නෑ ප්‍රියා... අපි නැගිටිමු... ඉක්මනට නැගිටිමු...'





'මට උඹ සතුටින් නම් ඒ ඇති...'

'මගේ සතුට තියෙන්නේ එයා ගාව ප්‍රියා...'

'අයියා ඉක්මනට සනීප වෙයි... උඹව හොයාගෙන එයි... මං දවසක් හීනෙනුත් දැක්කා අපේ දෙරකඩ අයියා ඉන්නවා...'

'මටත් පේනවා...'

ඒ හීන සැබෑ වේ නම්... එසේනම් දේවාල බිම පෙරලි පෙරලී වූ බාර ඔප්පු කළ හැක.

* * * * * * * * * * * * * * *

සක්විති දවල් ඇහැරුණ පසු මේධා ඔහු ළඟට වී අඬමින් සියල්ල කීවාය.

'මං යනවත් එක්කම වගේ එහෙනම් කෙල්ල ඇවිත් තියෙන්නේ...'

'ම්.. කෙල්ල අපට මූණ පෙන්නන්න එන්නෑ... ඒකි දන්නවා ඒක ප්‍රශ්නයක් කියලා...'

'බ..ඩ..ක් ති..බි..ලා නෑ බබා...'

'නැලු.. බබා ලැබිලා ඇති මහත්තයෝ...'

'ඔව්... ඒත් කෙල්ල මල්ලී හොස්පිට්ල් කියලා දන්නේ කොහොමද...'

'ඒකි මේ අවටම ඇති... පව්... ඒ වෙලාවේ හිමාලිත් ඇවිත්...'

'ඉ..ති..න්..'

මේධා ධනසිරි කියූ සියල්ල කීවාය.

'එ..හෙ..නම් එයා අහගත්තා...'

'ඔ..ව් කෙල්ලගෙන්ම අහගත්තා... ඒත් ගෑණි වටේම ගිහි තියනවා...'

'කිව්වේ...'

'අම්මා ක..තා කළා... ගොඩාක් බැන්නා මට...'

මේධා අඬමින් කීවාය. සක්විති ඇයව ළං කරගෙන හිස අතගෑවේය.

'දන් මගේ ගැණිත් උඹ... අම්මත් උඹ... ඒ කතා ගණන් ගන්නෙපා... මං මැරුණත් දලා යන්නෑ...'

'මං දන්..නවා...'

'අම්මා ආයෙත් ලොකු විනාශයක් කරයි...'

'ම්.. කෙල්ල ආපු එකට නම් මට පුදුම සතුටුයි... ඒකි මැරුණත් මල්ලී ළඟ...'

සක්විතිට පුදුමය. එක මොහොතකට කෙල්ලව හම්බ වුණානම් සියල්ලම කෙල්ලට කියන්නට තිබුණි. කෙල්ලව එහෙමම ඩොක්ටර්ට මුණ ගස්වන්නට තිබුණි. එහෙත් ඇය රහසේ පැමිණ රහසේම ගියේ ඒ තත්වයට මුණ දෙන්නට අමාරු නිසාය. දුටු තැන කෙල්ලව විනාශ කරන්නට අය ඉන්නා නිසාය.

'කෙල්ලත් ආපු එකේ මල්ලිගේ ලොකු වෙනසක් තියෙන්න ඕන...'

'එහෙමම වෙයි මහත්තයෝ බලන්නකෝ...'

සක්විතිටත් එසේ සිතුණි. කෙල්ල මේ ඇවිත් ගියේද ඒ නිසාම වන්නට ඇත.

'බබා...'

'ම්...'

'මං කෝකටත් හොස්පිට්ල් එකට ගිහින් එන්නම්...'

'ඒක හොඳයි... අම්මා ගෙන්න ගනී අද...'

'කතා කළොත් මං එයාටත් කියනවා...'

'මොනාද...'

'මේ ආදරේ වෙන් කරන්න බෑ කියලා...'





'කෙල්ලට පට්ට වේසි කියලා බණින අම්මා එක්ක මොන ආදර කතාද මහත්තයෝ... නිකං ඉන්න...'

මේධා කියන්නේත් ඇත්ත යැයි සක්විතිට සිතුණි.

'කොහොමත් හෙට අනිද්දම අපට කෙල්ලව හම්බ වෙයි...'

'හම්බ වෙන්නම ඕන...'

'ඇයි...'

'මොරගොඩ පවුලේ ඊළඟ කෙනා කොල්ලෙක්ද කෙල්ලෙක්ද කියලා බලන්න... අනේ හිටියනම් මෙකි ළඟින් කියලා තියනවා...'

සක්විති යතුර අතට ගත්තේ මේධාගේ හිස අතගාගෙනය.

'මං ය..න්..න..ම්...'

'ප..රි..ස්ස..මි..න්... මහ දිගට බල බල යන්න මහත්තයෝ...'

'ම්...'

කෙල්ලව එක පාරක් මුණගැහෙනවා නම් ඒකි තමාගෙන් ගුටියක් කන බව මේධා දනී. ඒ තරම් දුකය.

* * * * * * * * * * *

සක්විති රෝහල් කාමරයේ දොරට අත තැබුවේ ඇතුලේ හිමාලි ඉන්නා ඉව දනගෙනය. ධනසිරි ඔහුට සියල්ල කීවේය.

හිමාලි පුටුවට බරවී උන්නේ කෝන්තියෙනි. කොහොමත් අද ඇගේ ජීවිතයේ උද වූ තරකම දවසකි. 'උඹව මුර කරලා පපුව රකින්න බෑ' සක්විති හිමාලි දුටුවනම සිතුවේය.

සක්විති හිමාලි සමඟ සිනාසුණේ නිකමටය. අද ඇයට සිදුවූ දේ පුදුමාකාරය. කාගෙවත් ජීවිත කාටවත් උදුරා ගත නොහැක. දෙවියන් කැප කළ හදවත් කොහොමටත් නොහැක.

'ඩො..ක්..ටර් බැලුවද...'

හිමාලි කතා කළේ නැත. සක්විති බැලුවේ විමුක්ති දෙසය.

ඔහු උන්නේ අනෙක් පසට හැරී බිත්තිය දෙස බලාගෙනය.

'ම..ල්ලී...'

සක්විති ඒ සිරුරට අත තබද්දීම විමුක්ති හැරී බැලුවේය. විමුක්තිගේ දෑස් තෙත පාටට තිබුණි. සිහියක් නැති කෙනා අඬන්නේ කෙසේද...

'ම..ල්ලී ඇයි කො..ල්ලෝ...'

විමුක්ති කතා කළේ නැත. සක්විති තවත් ටිකක් විමුක්ති ළඟට විත් ඒ හිස පිරිමැද්දේය.

'ඇයි කොල්ලෝ...'

මහා දුකක් හිතේ හිර කරගෙන ඉන්නා කෙනෙකුගේ මුහුණක් සක්විති දක්කේය.

'මො..ක..ද වු..ණේ...'

සක්විති කරුණාබරව ඇසුවේය.

'එක එක බැල්ලියෝ ගෙන්නුවාම ඔහොම තමයි... සනීප වෙච්ච එකක් නෑ... එක තේ උගුරක් බිව්වේ නෑ... ඉඳි ආප්පත් කෑවේ නෑ...'

හිමාලි කීවේ තරහිනි. සක්විති මොහොතක් බලා උන්නේය.

'නංගී...'

'ඇයි...'

හිමාලි අත් බැඳගෙන තරහෙන් උන්නාය.

'කවදහරි ආදරේ කරලා තියෙනවද...'

ඒ ප්‍රශ්නයට හිමාලි පිළිතුරු දුන්නේ නැත. ඇය බිම බලාගෙනම උන්නාය.

'ආදරේ දුක පපුවට දැනෙද්දී කන්න බෑ... බොන්න බෑ... හිනාවෙන්න බෑ... ලෝකේ ලස්සන පේන්නෑ... ජීවිතේම මළ ගෙයක්.. මේ වෙලා තියෙන්නේ ඒ දේ... අද කොල්ලා කාලෙකට පස්සේ ඒකගේ කෙල්ලව දැක්කා... ඒ කොල්ලගේ පණ...'





සක්විති හිමිහිට කීවේය.

'අයියේ...'

හිමාලි සක්විති දෙසට හැරුණාය.

'අයියට කවුරු ආදරේ කළාද මන් දන්නෑ... ඒත්.. අ..ද ආදරේ කරන්නේ මම... එ..යා..ගේ ප..ණ... මම...'

හිමාලි කීවේ වෙව්ලමිනි.

'එ..හෙ..නම් මේකගේ සිහිය ගන්න ඔයාට බෑ... ඒත් අද කෙල්ල ඇවිත් ගියා... මේ ඇස්වල කඳුළු... ඇයි කඳුළු... ඌ හිතනවා... හිතනකොටයි ඇඬෙන්නේ... ඒ කියන්නෙත් සිහිය එනවා... එහෙම අපි හිතුවට කාගෙවත් පණ වෙන්න බෑ... පණ තියෙන්නේ මෙතන... මෙතන ඉන්නේ එක්කෙනෙයි...'

සක්විති පපුවට ගසාගෙන කීවේය.

සක්විති විමුක්තිගේ මුහුණ පිස දැම්මේ ආදරයෙනි. කොල්ලාගේ හදවතේ අද ලොකු වෙනසක් වෙන්නට ඇත. කෙල්ල ආවා නම් ඇය නිකං ඉන්නේ නැත. 'දගෙන ඉඹින්න ඇති මේකව' සක්විති සිතුවේය. ඒ උණුසුම් දෙතොල් පහසට කොල්ලාගේ නැවතුණ පපුව වැඩ කරන්නට නොගත්තා නම් පුදුමය.

'ම..ල්ලී...'

සක්විති කතා කළේ ආදරයෙනි.

'බ..බා.. ගි..යා...'

පුදුමය. සක්විති විමුක්තිගේ මුහුණ දෙස බලාගෙනම උන්නේය.

'බ..බා උඹව බලන්න ආවද...'

විමුක්ති පුදුමාකාර ලෙස හිස වැනුවේය. සක්විතිට බැලුනේ හිමාලි දෙසය. ඇය ඉන්නේ දැවෙමිනි. 'පට්ට බැල්ලි මගේ හීන ඔක්කොම නැති කරලා දන්නයි යන්න්...' හිමාලි සිතුවේ වෙව්ලමිනි.

'බ..බා මො..නවද කිව්වේ... ආ කොල්ලෝ...'

විමුක්ති කතා කළේ නැත. තවමත් ඔහුට වචන එන්නේ නැත.

එහෙත් කොල්ලාගේ පපුව වැඩ කරන්නට පටන් ගෙන ඇති බව සක්විති දනී.

'කොල්ලව දන් ගොඩ ගන්න පුළුවන්... කෙල්ල අත තියන්න විතරයි ඕන... මූට පණ එනවා...'

සක්විතිගේ වචන හිමාලිගේ පපුව දෙදරවයි.

'හිතන් ඉන්න ඒවා කරන්න නැත්ද ඉඩ දෙන්නෑ... ඇයි අයියගේ ජීවිතේ ආයෙත් නාස්ති කරන්න යන්නේ... අයියගේ ජීවිතේට ආදරයක් තියෙනව නම් හිමිහිට සනීප වෙන්න දුන්න නම් හරිනේ...'

සක්විති සිනාසුණේය.

'කෙල්ල කවදාවත් මූගේ ජීවිතේ නාස්ති කළේ නෑ... ඒකි එහෙම කෙල්ලෙක් නෙමේ...'

'පුදුම කැක්කුමකින් ඒකි ගැන කියන්නේ... පර බැල්ලි වගියක් දගෙන ආවා වගේ...' හිමාලි සිතුවාය.

'අයියට මෙහෙම උනේ එහෙනම් කවුරු නිසාද දන්නෑ... ඒකි මුසල කෙල්ලෙක්... ගෙදෙට්ට ආපු දවසේ ඉඳලා ප්‍රශ්නලු... දනුත් බලන්නකෝ...'

'දන්නැති දේවල් කතා නොකර ඉන්න හිමාලි...'

'මටත් වැඩක් නෑ... ම..ම.. අයි..ය..ගේ ජී..වි..තේ..ට බැ..දි..ලා ඉ..ව..ර..යි... මා..ව වෙ..න් ක..ර‍ලා ප..ව් වැඩක් කරන්න එපා...'

හිමාලිට ඇඬුණි. ඇයට ඇඬුණේ ඇය කියූ දේට නොවේ. අද දවස පුරාම සිදුවූ සියල්ල වෙනුවෙනි.

'මුන් දෙන්නා මැද්දට එන්නෙපා හිමාලි... තේරුමක් නෑ... ඒක වෙන් කරන්න පුළුවන් බැඳීමක් නෙමේ... මේකගේ පණ ටික තියෙන්නේ වර්ෂා ළඟ... කෙල්ලගෙත් එහෙමයි...'

හිමාලි කතා කළේ නැත. ආදරය ඒ තරම් බලසම්පන්න දෙයකැයි හිමාලි ඇදහුවේ නැත. 'ඒකිත් මේ සැප සම්පත්වලටම නැහෙනවා ඇති... මට තරම්වත් දෙයක් නැතේ... වෙන කොහේ





යන්නද... ලැබුනොත් ගොඩ කියලා දන්නවා...' හිමාලි සිතුවේ එහෙමය.

'නංගි ය..න්..න.. මං කොල්ලා ගාව ඉන්නවා...'

'දන් රෑම උන්නනේ... මං ඉන්නම්...'

'මං අද මල්ලි එක්ක ඉන්න ඕන... ඩොක්ටර්වත් මං ගෙන්න ගන්නෝන...'

'නැත්ද කිව්වේ මට මෙතනින් හෙලවෙන්නෙපා කියලා...'

'එක කාමරේක උන්නට බැඳීම් ඇති වෙන්නෑ හිමාලි... ඔයා පහුගිය ටිකේම මල්ලි ගාව උන්නේ... මොනාද උනේ... කෙල්ල ඇවිත් හිටියේ විනාඩි පහයි...'

'ආපු ටි..ක..ට වල් ගෑණියෙක් වගේ හැසිරුණෝ... ෂිහ්...'

සක්විති සිනාසුණේය.

'ඒකිගේ කොල්ලනේ... දක්කහම වාවන්නෑ තමයි... එහෙමයි... උන් කරපු ඒවා දන්නේ උන්නේ...'

හිමාලි කෙළ පොදක් ගිල්ලේ අමාරුවෙනි. ඇය පුටුවකට බර වූයේ අද යන්නේම නෑ කියා සිතාගෙනය. 'පර බැල්ලි ආයෙත් එන්න පුළුවන්... දන් ඇවිස්සිලානේ ඉන්නේ...' හිමාලි සිතුවේ එහෙමය. ආදරය යනු ඇවිස්සීමක් නොවේ. පිබිදීමකි. වේදනාවකි. එය දන්නේ ආදරය කළ අයම පමණකි.

සක්විති දෙස්තර සමරනායකට කතා කළේ රෝහල් කාමරයේ ඉඳගෙනමය.

'ඩොක්ටර් මම... සක්විති මොරගොඩ...'

'ආ සක්විති... මං උදේ මල්ලිව බැලුවා... හවස මං ආයෙත් එනවා...'

'අද ඩො..ක්..ටර් විශේෂ දෙයක් වුණා...'

'ඒ මොකක්ද...'

'ම..ල්ලිගේ අ..ර ගෑ..ණු ළ..මයා උදේ ම..ල්ලිව බල..න්..න

ඇවිත්...'

'ෂා... ඉතින් මට මුණගස්වන්න එපැයි...'

'එයා ඇවිත් ගිහින් ඩොක්ටර්... එයාට මල්ලි ගාව ඉන්න බැනේ... ඩොක්ටර් දන්නවනේ ප්‍රශ්නේ...'

'අපි බලමු... හවස මාව හම්බවෙන්නකෝ...'

'හොඳයි ඩොක්ටර්...'

සක්විති දුරකථනය තබා බැලුවේ විමුක්ති දෙසය. 'උඹ ඉක්මනට ආයෙත් ජීවත් වෙන්න පටන් ගනී...' සක්විති සිතින් කීවේය.





# 17

සක්විති මහ ගෙදරට ආවේ සුරම්මා එන්නම යැයි කියූ නිසාය. අම්මා කියන්නට යන්නේ කුමක්දැයි සක්විති දන උන්නේය. ඔහු ගියේ ඒ බව දනගෙනමය.

අම්මා අද හැසිරෙන්නේ අන්ධ වෛරයකිනි. ඇයට වර්ෂා ගැන ඇති වෛරය නොසන්සිඳෙන වෛරයකි. ඒ වෛරයෙන් මේ පවුලම දැවී යන්නට පුළුවන.

ගෙදර උන් අහිංසක කෙල්ලට ගසා එළියට ඇද දමූ ඇය අද හිමාලිව ගෙදරම තියාගෙන ඉඳියි. වර්ෂා තාත්තාගේ නංගිගේ දුවය. හිමාලි අම්මාගේ නංගි කෙනෙකුගේ දුවකි. වෙනස එපමණකි. ඒත් මිනිස්කම් වලින් වර්ෂා ඉන්නේ හිමාලිට ගව් ගාණක් ඉදිරියෙනි. ඒ බව අම්මාට තේරෙන්නේ නැත.

අම්මාගේ හිතේ කෙල්ල ගැන ඇති වෛරයට වඩා මල්ලිගේ හිතේ කෙල්ල ගැන ඇති ආදරය විශාල යැයි සක්විතිට හිතෙයි.

සුරම්මා උන්නේ බුම්මාගෙනය. සක්විති නිහඬවම ඉඳගත්තේය.

'අම්මා මේඩට කැඟහලා තිබ්බා... ඒ ගෑණි මේ මොනවත්

දන්නෑ...'

සක්විති හිමිහිට කීවේය.

'උඹේ ගෑණිව සුද්ද කරන්න එන්නැතුව ඉඳපං...'

'මං මගේ ගෑණි ගැන දන්නවා අම්මේ...'

'උඹට වඩා මං දන්නවා... ඒකිට ඕන පවුල් විනාශ කරන්න...'

'අම්මා ඔහොම නම් කතා කරන්නේ මං මේ ගෙවල් වලට පය තියන්නෑ...'

සක්විති කීවේ තරමක් කේන්තියෙනි.

'උඹලා ඔක්කොම දනුවත්ව මේවා කෙරෙන්නේ... නෑ කියන්නෙපා ලොකු පුතා...'

'අම්මා කැමති දෙයක් හිතාගන්න... ඔක්කොටම කලින් අම්මේ තමන්ගේ අයව විශ්වාස කරන්න ඉගෙන ගන්න...'

'උඹලා වැඩ කරන්නේ එහෙම හිතාගෙනද...'

'ඔ..ව්.. මං අම්මට මීට කලිනුත් කිව්වා... මං මල්ලිව සනීප කරලා රට යනවා කියලා... ඕන බම්බුවක් අම්මා කරගන්න කියලා...'

සුරම්‍යා සක්විති දෙස මොහොතක් බලා උන්නේය.

'කරන දේ කියන්න තමා උඹට මං එන්න කිව්වේ... උඹ මේ පවුලේ ලොකු පුතානේ...'

සක්විති කතා නොකර බිම බලාගෙන උන්නේය.

'මං මල්ලි ගැන තීරණයක් අරන් ඉන්නේ...'

ඒත් සක්විති කතා කළේ නැත.

'හිමාලි හොඳ කෙල්ල... ඉගෙන ගත්ත කෙල්ල... මල්ලිට ඔය මොකාටත් වඩා ආදරෙයි... පවුලේ සිරිත් විරිත් දන්නවා... මල්ලිට ගැළපෙන්නේ හිමාලි වගේ කෙල්ලෙක්ව...'

සක්විතට හීල්ලින.

'ව..ර්ෂටත් ඔය ඔක්කොම සුදුසුකම් තියෙනවා...'





'ස..ක්..වි..තී... ඒ පට්ට බැල්ලි ගැන ක..තා ක..ර..න්..න එපා... ඒ ඉගෙන ගත්තේ නැති වල් බැල්ලියෙක්... දනුත් මොන බල්ලා එක්ක බුදියගන්නවද දන්නෑ...'

සක්විතිගේ හදවත කෙල්ල ගැන උපන් අනුකම්පාවෙන් බර විය. 'කෙල්ල බුදියගත්තනම් බුදිය ගත්තේ අපේ එකා එක්ක විතරයි... ඒකිගේ ඇඟට ඉස්සෙල්ලම අත තිබ්බෙත් මූ...' සක්විති ඔය ටික සිතුවා මිසක කීවේ නැත.

'මං කෙල්ලගේ අම්මත් එක්කත් කතා කරලා තියෙන්නේ...'

'අ..ම්..මා මේවා ගැන තා..ත්තා එ..ක්ක ක..තා කළාද...'

'තාත්තා අකමැති වෙන්නේ මොකටද... මොනවට අකමැති වෙන්නද...'

අම්මා හිතන තරම් පහසුවෙන් එය කළ නොහැකි බව සක්විති දනී.

'කොහොමත් දන් හිමාලි අපේ කෙල්ල... කෙල්ල ඒකිගේ අධ්‍යාපනෙත් මල්ලි වෙනුවෙන් කැප කරලා තියෙන්නේ... මාත් කෙල්ලට කියලා තියෙන්නේ...'

'හොඳයි....'

'හොඳයි තමා... මොනවද කෙල්ලට අඩු... ලැජ්ජාවක් නැතුව ලේලි කියලා පෙන්නන්න පුළුවන්... හැදිච්ච පාට තියෙනවා...'

'ඔ..ව් අපි ගත්තේ ඉතින් නැහැදිච්ච ගෑණුනේ...'

සක්විති කීවේ නැගිටිමිනි.

'පවුලකට බැඳුනාම හැදිච්ච විදිහට ඉන්න දනගන්න ඕන... නැහැදිච්ච උන්ගේ වල්කම් වලට උදව් කළාම තමන්ගේ සායමත් යනවා කියලා අනිත් අය දනගන්න ඕන...'

'මං ම..ගේ ගෑ..ණිව අයින් කරගෙන ඉන්නේ අම්මේ... අම්මට මගේ ගෑණි මළකඩ ගෑණියෙක් උනාට මට රත්තරන්... මං මගේ

ගැණිව අරගෙන යන්නම්... මං මාත් එක්ක ආපු ගැණිව අහක දන්නේ නෑ... කැමති දෙයක් කරගන්න... මල්ලිටත් හෙට අනිද්ද වෙද්දී සිහිය එයි...'

'මං ඒක ආවාම බලාගන්නම්...'

යන්නට ගිය සක්විති යළිත් හැරුණේය.

'අ..ම්මේ... දෙයක් තියෙනවා මටත් කියන්න...'

සුරම්‍යා කතා නොකර උන්නාය.

'ඒ..ක... පු..දු..ම ආදරයක් අ..ම්මේ... මං ද..න්..න නිසා කියන්නේ... ටි..කක් මල්ලිගේ ජීවිතේ ගැනත් හිතලම තීරණයක් ගන්න... මේ ගෙදරට ඕනේ මේ ගෙවල් දෙරවල් බිස්නස් බලා ගන්න ගැණියෙක් නෙමේ... මල්ලිව අම්මව තාත්තව බලාගන්න ගැණියෙක්... වැටීගෙන... ඒකට කෙල්ල තරම් හොඳ කෙනෙක් තවත් නෑ...'

සක්විති ඔය ටික කියා සුරම්‍යා දෙයක් කියන්නට ප්‍රථම නිවසින් පිට වූවේය. වාහනයේ යන අතරතුර ඔහු බොහෝ දේ සිතුවේය.

ඔහු ඉන්නේ ඇත්තටම කලකිරීය. තව දුරටත් මේ රටේ රැ දෙන්නට සක්විතිට සිතුණේ නැත. ඉක්මනට මේධාවත් දුවවත් රැ ගෙන මේ රටින් යනවා යැයි ඔහු සිතාගත්තේය.

* * * * * * * * * * * * *

විමුක්ති දවල්ට හිමාලි කැවූ කිසිවක් කෑවේ නැත. කවන්නට ගත් හැම බත් කටකටම විමුක්ති අතින් ගැසුවේය. හිමාලි විමුක්ති දෙස බැලුවේ ඇත්තටම කේන්තියෙනි. මහා ආදරයක් ඇගේ පපුවේ වී නම් මෙහෙම බලන්නේ නැත. මේ අසරණයා ගැන එහෙම කැක්කුමක් ඇගේ පපුවේ නැත. ඇත්තේ තණ්හාවකි. පිරිමියෙක් ගැන උපන් පෙරේත හැඟීමකි. ඒ පිරිමියාගේ දේපොල ගැන උපන් ලොබකමිනි.





'බඩගින්නේ ඉන්න එක හොඳයි... දුර්වල වෙලා සනීප වෙන්නැතුවම ඉඳපං... එහෙම ඉන්න තරමට මට හොඳයි...' හිමාලි පසුව සිතුවාය.

රෝහල් කාමරයට එද්දී වර්ෂා ඔහුව බදගෙන ඉඹිමින් උන් අයුරු හිමාලිට තවමත් සිහිවෙයි. එය සිහි කරද්දී පවා ඇගේ පපුව වෙව්ලාගෙන එයි. 'පිස්සුවෙන් වගේ ඒකි ඉඹගෙන ගියේ... සිහිය තියෙද්දී කොහොම ඉන්න ඇද්ද...' හිමාලි මේවා සිහිකර දවුණාය.

'ක..න්..නැ..ද්..ද...'

ඇය ඇසුවේ විමුක්තිගේ මුහුණ දෙස බලාගෙනමය. විමුක්ති ඇය දෙස බැලුවේ හැඟීමක් නැතුවය.

'ඇ..යි.... චු..ටි..ට..ක් කමු ර..ත්..ත..ර..න්...'

හිමාලි එහෙම කතා කළේ විමුක්තිට සිහිය ඒගෙන එතැයි සිතීය. තත්වය එහෙම නම් ඔහුට මත්වෙන ආදරයක් පෙන්විය යුතුය.

විමුක්ති ඇඳෙන් බැස කවුළුව අද්දරට ගියේය. හිමාලිට පුදුම සිතුණි. දැන් ඔහු හැසිරෙන්නේ සිහිය තියෙනා කෙනෙකු ලෙසිනි. ඇවිදිද්දීද පෙර තරම් පැටලීමක් නැත. 'සිහිය ඇවිල්ල බොරු කරනවාවත්ද...' හිමාලි සිතුවාය.

'ඒකි මූණයි තොල් දෙකයි අතුල්ලලා ගියාම ඔච්චර දෙයක් වෙනවද...' හිමාලි කවුළුවෙන් පිටත බලාගෙන උන් සක්විති දෙස බලාගෙන සිතුවාය. ඇය අත සෝදගෙන විත් එහෙමම විමුක්තිගේ උරතලයට සුරත තැබුවාය.

'බ..ඩ..ගි..න්..නෙ..නේ... තේකක් හදලා දෙන්නද චූටි නංගි...'

ඇගේ සුරත ඔහුගේ පිට පුරා යන්නට විය. විමුක්ති උන්නේ ගල් පිළිමයක් මෙනි. 'ජනේලෙන් බලන් ඉන්නේ ඒකි එනවද කියලා වෙන්න ඇති...'

'එ..න්..න ඉඳගමු...'

විමුක්ති එහෙමම හිමාලිගේ අත ගැසුවේය.

'ඇ..යි ම..ට මෙ..හෙම ක..ර..න්..නේ... මං නේ ඔ..යාව බලාගත්තේ

මෙච්චර කල්...˙

විමුක්ති බලාගත් අත බලාගෙන උන්නේය. ඔහුගේ හිසේ මොන මොනවදේ පෙළෙන්නට විය. බොඳවී බොඳවී යන රූප අතරින් ඔහුට පෙනෙන්නේ එක් රුවක් පමණි. ඒ වර්ෂාගේ රුවය.

විමුක්තිට මේ සිහිවෙන්නේ ඇයව හමුවූ අවසන් දවසේ වූ සිදුවීමය. ඒ කළු ගං මෝය අසබඩ හෝටලේදී සිදුවූ සිදුවීමය. ඇය මේ දෙපා මත මුහුණ තබාගෙන උන් අයුරු විමුක්තිට මැවී මැවී පෙනෙන්නට විය.

සුදු තුවා පට පමණක් ඇඳ උන් කෙල්ල වැටී උන්නේ ඔහුගේ දෙපා පාමුලය. ඒවා බදාගෙනය... ඔහුට මේ විසිරෙමින් බොඳවෙමින් පෙනෙන්නේ ඒ රූපය.

හිටි හැටියේම විමුක්ති ඇඳට චිත් කොට්ටය බදාගෙන හිස තද කර ගත්තේය. ˙අමාරුව තද වෙලා... නර්ස්ලට වත් කියන්න තරකයි...˙ හිමාලි සිතුවාය.

˙බ..බා එ..න්..න...˙

කොට්ටයේ ඔළුව ගසාගෙන තද කරගෙන විමුක්ති කෑ ගැසුවේය. ඒ හඬින් හිමාලි වෙව්ලා ගියාය. ඇගේ පපුව පුරා දහදිය ගලන්නට විය. ˙උඹේ බබාට මං එන්න ඉඩ තියන්නෑ... මං මරනවා ඒකිව...˙ හිමාලි දැවුණේ ඒ තරම්ම වියරු සිතුවිල්ලකිනි.

˙හැම දෙයක්ම අත් ඇරලා මං ඉන්නේ... මේක අත් අරින්නෑ... මේ හිමාලි කොළඹින් යන්නේ ඔයාව අරගෙනම තමයි...˙

හිමාලි තමාටම කියා ගත්තාය. එහෙත් ඇය සිතන මොහොතේදීත් විමුක්තිගේ පපුව පුරා වර්ෂා පෙරලි කරමින් ඉන්න බව ඇය දන්නේ නැත. දන ගත්තද ඒ ගැන සිතන්නට වත් ඇය බිය වූවාය.

* * * * * * * * * * * * * *

වර්ෂා කොළඹින් පිට වූයේ විමුක්තිගේ සිරුරෙන් ඒ ලේ සුවඳ උරාගෙනය. ආදරය රස්නය පපුවටම ගෙනය. ඔහුගේ හුස්මින්





අලුත් හුස්මක් ගෙනය.

වෑන් රිය අනුරාධපුරය බලා නුවර පාර දිගේ යද්දී වර්ෂා දෙනෙත් පියාගෙන ඒ මොහොත යළි යළිත් සිහි කළාය.

˙දැන් මට අපේ ආදරේ ගැන බය නෑ... අපේ අනාගතය ගැන බය නෑ... පුතාගේ අනාගතය ගැන බය නෑ... ඔයා අද ඒ හැම බයක්ම මගේ පපුවෙන් අයින් කළා...˙

වර්ෂා වෙව්ලමින් මෙන් සිතුවාය. දෛවයේ මේ මොහොත කොහොම උදාවූවාද කියා ඇය දන්නේ නැත. එහෙත් අද උදෑසනේ ඔහුගේ දෙතොල් මත මේ දෙතොල් තදවී සිරවී තිබූ බව වර්ෂාට මතකය.

˙අද ඔයාව බදාගනිද්දී මට දැනුණේ එදා අන්තිම දවසේ ඔයාව කළුතරදී බදාගත් වෙලාවේ දැනිච්ච රස්නෙමයි... ඒ රස්නේ කවදාවත් නැති වෙන්නෑ... කවදාවත් නෑ... කාටවත් හොලවන්න බැරි වෙච්ච ඔයාගේ අත අද මගේ මූණටම ආවා... ඔයා මේ මූණ අතගෑවා... ම..ට හොඳට මතකයි...˙

වර්ෂාට පුදුම නැත. මේ ආදරයට එහෙම පුංචි දෙයක් කරන්නට නොහැකි නම් වැඩක් නැත.

˙ඔයා ළඟ ගෑණු දහක් හිටියත් මට කමක් නෑ... එයාලට මොනවත් කරන්න බෑ... එයාලා නිකං වැඩක් නැති වැඩක් කරන්නේ...˙

ඒ මුහුණ වර්ෂාට හොඳට මතකය. ඇය ලස්සනය. සැබෑය. එහෙත් වර්ෂාට බියක් දැනෙන්නේ නැත.

˙නැන්ද මාව ගෙදරින් එලවලා අයියට ළං කළේ එයාව... පුදුමයි... මං මාමගේ නංගිගේ දුව... ඇයි මට ඒ අයිතිය නුදුන්නේ...˙

වර්ෂා සිතුවේ දුකෙනි. දැන් ඊට වඩා අයිතියක් ඔහුගේ ජීවිතය වෙනුවෙන් ලැබී ඇත. ඒ මේ තනය බදාගෙන ඉන්නා පැටියාය. පුංචි විමුක්තිය. මේ මොරගොඩ පවුලේ දෙවෙනි මුණුපුරාය. මේ පැටියාගේ ඇඟේ දුවන ලේ වලට සුරම්‍යාට එරෙහි විය නොහැක.

˙ඔයාට ඉක්මනට සනීප වෙයි කියලා මට හිතෙනවා... එ..හෙම

උනොත් අපි ඉක්මනට හම්බවෙයි... ඒත් මං ආයෙත් ඔයාව බලන්න කොළඹ එන්නෑ... ඔයා දුන් මාවයි පුතයි බලන්න එන්න ඕන... එතකල් මං ඉන්නවා... මට ඉන්නම වෙනවා...'

වර්ෂා දෑස් පියාගෙනම සිතුවාය.

'කෙ..ල්ලේ...'

ප්‍රියංවද කතා කළේ වර්ෂාගේ උරතලය පිරිමදිමනි. වර්ෂා දෑස් ඇරියේ දුප්පත් සිනාවක් පාය.

'මේ.. කො..හෙද ප්‍රියා...'

'මේ පොල්ගහවෙල උ..ඹට උ..ණ ව..ගේනේ කෙල්ලේ...'

ප්‍රියංවද වර්ෂාගේ ගෙළට පිටි අත්ල තබා බැලුවාය.

'ඒ..ක ඇ..රිලා යයි ප්‍රියා...'

'මො..නවද ඇස් පියාගෙන හිතුවේ...'

කෙල්ල ඉන්නේ නිදගෙන නොවන බව දුක ප්‍රියංවද ඇසුවාය.

'දු..න් හිත නිදහස් ප්‍රියා...'

'මට ඕන උනෙත් උ..ඹට ඒ නිදහස දෙන්න කෙල්ලේ...'

'දු..න් ඉ..තින් එයා කවදහරි එනකල් මට ඉන්න පුළුවන්...'

'අ..යියා එ..යි...'

'ම්...'

'මහ නවත්තලා මොනවා හරි බොන්න අරන් දෙන්නද...'

'කුරුණෑගලට ගිහින්ම බොමු...'

වර්ෂා පුතාගේ හිස අතගා කීවාය.

'ගිහින් ඉක්මනට හෝටලේ වැඩ පටන් ගමු...'

'කරමු...'

'ප්‍රියා...'

'කෙල්ලේ...'





'දවසක...'

'ඉතින්...'

'මං උඹවයි අම්මවයි දු..ලා යයි කියලා හිතනවද... අර අනුරාධපුර පොඩි ගෙදර...'

ප්‍රියංවද කතා නොකර සිනාසුණාය. එහෙම ගියද කෙල්ල ගැන අහිතක් නැත.

'එ..හෙම ක..ර..න්..නෑ ප්‍රියා... කවදවත් කරන්නෑ... යනවනම් ඒ උඹවයි අම්මවයිත් අරගෙන...'

කෙල්ලෝ දෙන්නා අත් පටලවාගෙන තද කර ගත්තාය. ඒ බැඳීමක උණුසුමය. ප්‍රියංවද වමතින් දෑස් පිසද ගත්තාය.

* * * * * * * * * * * * *

මොරගොඩ මහතා සක්විති දෙසත් මේධා දෙසත් බැලුවේ අසරණවය.

'ඇයි මේ කෙල්ලට බැරි අපිට මූ..ණ දෙන්..න... අඩුම ගානේ දුව ඔයාටවත්...'

මේධාට බැලුනේ සක්විති දෙසය. ඇත්ත කියන්නට මේධාට සිතෙයි. එහෙත් ඇය හිත දැඩි කර ගත්තාය. කෙල්ල ඉන්නේ මුහුණ දෙන්නට අමාරුම තත්වයකය.

'ද..න්..නෑ තාත්තේ... හම්බවෙලා වැඩක් නෑ කියලා කෙල්ල දන්නවා ඇති... ඒකනෙ හොරෙන් දුවලා ඇවිත් බලලා ගියේ...'

'මේ කෙ..ල්ල කො..හොම ජීවත් වෙනවද...'

'දු..ක් විඳිනවා ඇති.. පව්.. අම්මත් නැති කෙල්ල...'

මේධා කීවේ අඩමින් මෙනි.

'ආවත් අපි කෙල්ලට මූණ දෙන්නේ කොහොමද තාත්තේ... මේ වෙන්න යන්නේ පුදුම දේවල්නේ...'

සක්විති කළකිරීමෙන් කීවේය. මොරගොඩ මහතාද හිස වැනුවේය.

'අම්මා මොන වෛරයක් කෙල්ලගෙන් ගන්නවද දන්නෑ... නාලිනී පවා අම්මටයි මටයි හරි ආදරෙන් හිටියේ...'

'කෙල්ල අවජාතක කෙල්ලෙක් කියලා හිතනවා ඇති...'

'නාලිනී එහෙම නරක ගෑණියෙක් නෙමේ... ආදරේ කළා... ඌ මත්තෙම නැහුනා... පවුලත් නැති උනා... දේපොලත් නැති උනා...'

'එහෙම ගෑණිගේ දුවටත් උනේ ඒකනෙ තාත්තේ... අපියි වැරැද්ද කළේ... අපියි රත්නපුරේ ගෙදර හිටපු කෙල්ලව අරගෙන ආවේ... පව්.. අද ඒකි අනාථ වෙලා...'

මොරගොඩ මහතාටද එය නොතේරෙනවා නොවේ.

'තා..ත්තේ...'

'ලොකු පුතේ...'

'අම්මා තාත්තට මොනවා හරි කිව්වද...'

'කිව්වේ ලොකු පුතේ...'

'හිමාලි ගැන...'

මොරගොඩ මහතා බිම බලාගෙන උන්නේය.

'කිව්වේ නෑ... ඒත් කරන්න යන්නේ මොකක්ද කියලා මං දන්නවා...'

'මල්ලිට මෙච්චර ආදරේ කෙල්ලෙක් ඉද්දිදී එ..හෙම වෙන එක අපරාධයක්...'

'එයා හිතුවොත් කරනවමයි... දරුවෝ හැදු..වේ එයානේ...'

මේධා අසරණව බිම බලා ගත්තාය.

'මල්ලි සනීප වෙච්ච් දවසක එයත් මේවා හිතන්නෙපැයි...'

'කොහොමත් අම්මා මේ කසාදේ කරනවා...'

මේධා කීවාය.





'අම්මා මාව එයාගේ ලේලි කෙනෙක් විදිහට පිළිගන්නෑ... කොහොමටත් නෑ... මං ගොඩක් ඇත්වෙලා ඉන්නේ තාත්තේ... එහෙම එකේ...'

කියන්නට ගිය දේ මේධා ගිල ගත්තාය.

'හි..ත..න්..න අමාරුයි මො..නවා වෙයිද කියලා...'

'ම..ටත් ක..තා කරන්න දවසක් එයි දුව...'

මොරගොඩ මහතා කීවේය. මේධා කතා කළේ නැත.

'මල්ලී කෙල්ලව හොයාගෙන යන දවසට අම්මට ගෙදර තියාගත්ත ගෑණුන්ට උත්තර දෙන්න වෙයි... උන් උසාවි යයි... මල්ලි කෙල්ල නැතුව ජීවත් වෙන්නෑ...'

මේධා කීවේ එපමණකි.

* * * * * * * * * * * * * *

හිමාලි දහ අතේ සිතුවාය. වෙන්නට යන්නේ කුමක්දැයි ඇයට ඉවෙන් මෙන් දැනෙන්නට විය. ඇය රෝහලෙන් පිටවී වාහනයට බරවූයේ දහසක් ප්‍රශ්න හිතේ තබාගෙනය.

'මොනවා හරි දෙයක් කරන්නම වෙනවා... ලොකු දෙයක් කළේ නැත්නම් මෙයා සිහිය ආපු ගමන්ම අරකි ළඟට දුවනවා...'

හිමාලි සිතුවේ මේ ළඟම වර්ෂා ඇතැයි කියාය. මේ සියල්ල මේධාත් සක්විතිත් දන්නවා කියාය.

'එයා යන්න ගත්තම ඒක අර බාගෙට නවත්තන්න බෑ... කඩාගෙන යයි... මටත් පිටකොටුවෙන් බස් එකේ නැගලා හිස් අතින්ම නුවර යන්න වෙයි... මුන්ට මොකද...'

හිමාලිගේ පපුව මේ තරම්ම හෙලවුණේ වර්ෂා අද ආ නිසාය.

'ඒකි නැත්නම් මෙයා මං ගාවට එනවා... කාටහරි ලව් කරන්නත් එපැයි... ඒත් ඒකි එනකං ඒ දේ කරන්න බෑ... කොහොමටවත් බෑ...'

හිමාලි දහ අතේ සිතුවාය.

'හිතුනොත් අද රෑ ගෙදර යනවා... ගිහින්ම හිතනවා... මේ හොස්පිට්ල් වල නැවතිලා හිතන්න බෑ...'

සියළු තීරණ ඇත්තේ විමුක්ති අතය. එහෙත් ඔහු මේ දවස්වල පුදුමාකාර ලෙස තමාව ප්‍රතික්ෂේප කරයි.

'මුල් කාලේ මාත් එක්ක කොච්චර ලස්සනට උන්නද... මං පි..ස්..සු වැටුණා...'

ඒ දවස් සිහිවෙද්දී හිමාලිගේ වතම ඇකිලීගෙන යයි. ඇය ආශා කළේ ඒ විමුක්තිටය. එහෙත් අද ඉන්නේ ඒ විමුක්ති නොවේ. අලුතින් ඉපදීගෙන එන විමුක්ති කෙනෙකි.

'කමක් නෑ.. ගෙදර ගිහින් එනවා... මට විමුක්තිව නැතුව ජීවත් වෙන්නම බැහැ... මම එයත් එක්ක ගෙවන ජීවිතේ ගැන හිතාගෙන ඉවරයි... ආයෙත් ජීවිතයක් ගැන මට හිතන්න බැහැ...'

හිමාලි දඩිව සිතාගත්තාය.

'මොන දේ කරන්නත් ඕකි ඉන්න තැනක් හොයාගන්නම වෙනවා... එහෙම හොයා ගත්තොත් ගොඩ... මහ ගෑණිට කියලම එයාව ඉවරයක් කරලා දන්න පුළුවන්...'

හිමාලි ඒ තරම්ම දුෂ්ඨ ලෙස සිතුවාය. 'දැන් මේ සැප සම්පත්වලට මං පුරුදුවෙලා ඉවරයි... ආයෙත් බස් වල යන්න බෑ... පොඩි ගෙදරක ජීවත් වෙන්න බෑ... වතුර එක පවා ගෙනත් දෙන්න වැඩකාරයෝ ඉන්න ඕන... ඒ ජීවිතේ පුදුමයි...'

'බලමු... ඒකිව මේ පාරෙන් අයින් කරලම දනවා... එතකොට මායි ඉන්නේ... එදාට විමුක්ති මගේ අත අල්ල ගන්නවා...'

එහෙත් මේ මොහොත වෙද්දී විමුක්තිගේ අත අල්ලා ගන්නට ඒ ලේ වලින්ම සැදුන තවත් කෙනෙක් ඉපදී ඇති බව හිමාලි දන්නේ නැත.





# 18

විමුක්ති සිහිසුන් වූ බව රෝහලින් මුලින්ම දනුම් දුන්නේ සක්විතිටය.

'අපි පේෂන්ට්ව අයි සී යූ ගත්තා... ඉක්මනට එන්න... ඩොක්ටර් එන්න කිව්වා...'

සක්විතිව වෙව්ලන්නට විය. ඔහු වෙව්ලමින්ම ගත්තේ වෛද්‍ය සමරනායකටය.

'ඩො..ක්..ට..ර් ම..ල්ලී...'

මේධාගේ පපුව ඇවිලී ගියේ සක්විතිව වෙව්ලන බව දකය.

'ඩො..ක්..ටර් ම..ල්..ලී...'

'සක්විති බයවෙන්න එපා... මේක තත්වය හොඳ අතට හැරීමක් වෙන්න පුළුවන්... එහෙම වෙනවා... ඔයා එන්න...'

'ඩොක්ටර් ම..ල්ලිට කරදරයක් වෙ..න්..නෑ නේ..ද...'

'ප්‍රශ්නයක් වෙන්නෑ... මාත් මේ හොස්පිට්ල් එකට යන ගමන්... ඔයත් එන්න...'

'මට කො..ල්..ල..ව බේරලා දෙන්න ඩොක්ටර්...'

සක්විති දුරකථනය තැබුවේ එසේ කියාය.

'ඇ..යි මහත්තයෝ...'

'ස..නීප වෙන්න පුළුවන්ලු... මං ඉක්මනට යනවා බබා...'

'ය..න්..න... මා..ත් හිතන්නේ මල්ලී සනීප වෙගෙන එන්නේ... එ..හෙම වෙනවා කියලා ම..ට දැ..නෙ..න..වා...'

'මං ය..න්..න..ම්...'

'ම්...'

සක්විති රෝහල කරා වාහනය පැදවූයේ වේගයෙනි. මහදී ඔහුට සුරම්‍යාගෙන් ඇමතුමක් ආවේය.

'පට්ට බැල්ලි කරලා ගිහින් තියෙන දේ පේනවා නේද...'

සක්විතිට සුරම්‍යා කතා කළේ ආවේගයෙනි.

'අ..ම්..මේ ම..ල්ලී...'

'කොල්ලට කරදරයක් උනොත් උඹලා ඔක්කොම වග කියන්න ඕන...'

'මං කොල්ලව ගෙදර ගේන්නේ සනීප කරලම තමයි...'

සක්විති දුරකථනය තැබුවේ එසේ කියාය.

මහ දිගට සක්විතිව වෙව්ලන්නට විය. රෝහල ළඟ නවතා සක්විති දිව්වේය. ධනසිරි දැඩිසත්කාර ඒකකය අසළ උන්නේය.

'ධ..නේ අ..යියේ මො..කද වු..ණේ...'

'බ..ය..වෙ..න්..න එපා සුදු මහත්තයා...'

'මො..කද වුණේ අයියේ...'

'මං හිතන්නේ පුංචි ම..හ..ත්තයට සි..හිය ඒගෙන ආ..වා...'

'කො..හොමද එ..හෙම කියන්නේ...'

'ම..ට හිතුණා සුදු මහත්තයා... ඒක මට දැනුණා...'

සක්විතිට සිහිවූයේ මේධා කියූ කතාවය.





'සැහෙන වෙලා බලාගත් අත බලාගෙන හිටියා... ප..ස්සේ...'

'ම්...'

'මොනාද උනා... මං හිතන්නේ ඔළුව හිර කරන්න ග..ත්තා... කෑගැහුවා...'

'මො..නා කියලද...'

'බ..බා කියලා කෑ ගැහුවේ...'

ධනසිරි සක්විති දෙස බලාම කිව්වේය.

'පුංචි මහත්තයට සිහින එනවා සුදු මහත්තයා...'

'ම..ට..ත් හි..තෙනවා ධනේ අයියේ...'

'කෙල්ල ආවනේ... අත තිබ්බා විතරයි... ගල් ගැහිච්ච නහර වලට පණ ආවා...'

'ඔ..ව් පණ තිබ්බේ ඒකි ගාව...'

වෛද්‍ය සමරනායක මහතා දැඩිසත්කාර ඒකකයට ආවේ දුවගෙනය.

'ඩො..ක්..ටර්...'

'මං බලනවා සක්විති... ඉන්න... මං කතා කරන්නම්...'

සුරම්‍යා ආවේ හිමාලි සමඟය. ඇය හිතුවේ වැඩේ හරියයි කියාය.

'බැල්ලි එනකොට මං දැනගත්තා... කොල්ලට අසනීප වෙච්ච තැනටම දම්මා... ආවොත් බැල්ලි ඉවරයි...'

සක්විති ටික වේලාවක් යන තුරු කතා කළේ නැත.

'අයියා හො..ඳට ස..නීප වෙගෙන ආවේ...'

සක්විති දෙනෙත් ඔසවා හිමාලි දෙස බැලුවේ වියරුවෙන් මෙනි. ඒ බැල්මේ සැරට හිමාලි දෙනෙත් පහළටම බර කර ගත්තාය.

'දැන් ඉතින් මුල ඉඳන් වෙදකම් කරන්නෙපැයි...'

'අ..ම්මේ...'

සක්විති කතා කළේ ඇත්තටම අමාරුවෙනි.

'අම්මා කියන්නේ අර කෙල්ල ඇවිත් කොල්ලව ආයෙත් ලෙඩ කළා කියලද...'

'නැතුව...'

'බලන්නකෝ දන්... කෙල්ල ආපු තත්පර පහට දහයට ඌව කොච්චර සනීප වෙලාද කියලා...'

හිමාලිට බැලුනේ සුරම්‍යා දෙසය. 'දෙයියනේ මේ සනීප වෙනවද...' ඈය සිතුවේ ගැහෙමිනි.

ඔවුනට පැයක පමණ කාලයක් දැඩි සත්කාර ඒකකය අසළ රැඳී සිටින්නට සිදුවිය. ඒ අතරවාරයේ මේධා තුන් වතාවක් සක්විතිට කතා කළාය.

'තා..ම ඩො..ක්ටර් ආවේ නෑ බබා... මං ආවාම ග..න්..න..ම්...'

'මං බාරෙකුත් උනා... බයවෙන්නෙපා මහත්තයෝ...'

'ම්...'

දුරකථනය තබා සක්විති බැලුවේ අම්මා දෙසය. ඈය බැන්නේ මෙහෙම පිච්චෙන ගෑණිටය.

වෛද්‍ය සමරනායක මහතා ආවේ පැයකට පසුය.

'යං.. ටි..කක් කතා කරන්න ඕන...'

ඔහු ඇවිදගෙන කාමරයට ගියේය.

'ඩො..ක්..ටර්...'

'බයවෙන්න දෙයක් නෑ... එයාගේ මොළේ වැඩ කරන්න පටන් අරගෙන... සිහිය ඉක්මනට එයි... ඒත් අපි දිගටම විමුක්තිට නින්ද යන්න බෙහෙත් දීලා තියෙන්නේ... දවස් එකහමාරක් වත් විමුක්ති නිද ගනී... එයාගේ මොළේට ඒ රෙස්ට් එක ඕන... බොහෝ දුරට ඇහැරෙද්දී සිහිය යම් තරමකින් ඇවිත් තියෙන්න ඕන... මං එහෙම විශ්වාස කරනවා...'

සක්විතිගේ දෑස් තෙත් විය.





'තැ..න්..කියු ඩොක්ටර්...'

ඔහු කීවේ අඬමින් මෙනි.

'මට තැන්ක්ස් කරන්න එපා... ඒ ගෑණු ළමයට තැන්ක්ස් කරන්න... එයයි මේ දේ කළේ... මං මුල ඉඳලම කිව්වේ ඒකයි... එයාව ඕන කියලා...'

සක්විතිට බැලුනේ අම්මා දෙසය. සුරම්‍යා බිමට ඔරවාගෙන උන්නාය. හිමාලි යටි තොල ලේ රහ එන තරමට සපා ගත්තාය.

'දිගටම ට්‍රීට්මන්ට්ස් කරන්න වෙයි... නමුත් විමුක්ති සාමාන්‍ය තත්වයට පත් වෙයි... එක දෙයක්... සිහිය ආවත් එයාගේ තත්වය අවදනම්... ආයෙමත් කොමා තත්වයක් ඇති වෙන්න පුළුවන්... ඒ නිසා පරිස්සම් කරගන්න ඕන... දෙපාරක් ස්ට්‍රොක් උනොත් ඒක හොඳ නෑ.. මොළේ සෛල මැරිලම යන්න පුළුවන්...'

සක්විති කතා කළේ නැත. වෛද්‍යවරයා ඒ ටික කියූ එක හොඳය.

'දන් ඕන නම් බලන්න පුළුවන්... ඒත් මං වාට්ටුවට දන්නෑ... දිගටම අයි සී යූ තියන්න ඕන... සමහර විට දවස් දෙකක් විතර ඔහොම තියන්න වෙයි... එකපාර සිහිය එන්නත් හොඳ නෑ...'

වෛද්‍යවරයා ගියේ ඔය ටික කියාය. සක්විති දිග සුසුමක් හෙළුවේය.

'කෙල්ල ඇවිත් කරල ගියේ ඔය ටික තමා...'

සක්විතිට ඒ ටික කියන්නට ලොකු ඕනකමක් තිබුණි. සුරම්‍යා උන්නේ කතා කර ගන්නට පවා නොහැකිවය.

'අ..පි දු..ක් විඳලා ඔළුවේ තෙල් ගගා සාත්තු කළේ... ඒ වලටයි නහර බුරුල් උ..නේ...'

හිමාලි කීවේ සක්විති ඉදිරියට ගිය පසු ඔහුට නෑසෙන්නටය.

'එයාගෙත් සිහිය ආපුදෙන්කෝ... මං එයත් එක්ක ඒවා බේරගන්නම්...'

සුරම්‍යා කීවාය. සක්විතිට එය නෑසුනා නොවේ. එහෙත් දැන් කතා කර පලක් නැත.

* * * * * * * * * * * * * *

'තාත්ති ඉක්මනට සනීප වෙනවා... ඒක අම්මිට දැනෙනවා...'

වර්ෂා තෙත මුහුණ මත පුතුගේ පුංචි සුදු පා පොඩි තබා ගත්තාය. 'අනේ ඔයාව මට ඉක්මනට සුදු තාත්තිට පෙන්නගන්න තියේනම්...' වර්ෂා සිතුවාය.

කොහොමත් උදව් තිබුණේ තීරණාත්මක පැය විසි හතරකි... විමුක්තිගේ හිසට සම්බන්ධ කළ වෛද්‍ය උපකරණ වේගයෙන් ක්‍රියා කරමින් තිබුණි.

ඒ ලේ නහර පුරා දිව්වේ එක කෙල්ලෙකුගේ පරම පිවිතුරු ආදරයය... ඒ වියළී ගිය නහර පණ ගැහෙන්නට පටන් ගත්තේ ඒ සෙනෙහසිනි.

හවස සිට වර්ෂාට මොකක්දෝ දැනෙමින් තිබුණි. එය පපුව භාරන්නාක් වැනි හැඟීමකි. මේ පපුවට මොනවා හෝ දැනෙනවා නම් ඒ ඔහු ගැන පමණි. දැන් ඔහුගේ පුතා ගැන පමණි.

'මං ඔයාව බලලා ආවට පස්සේ මොනවා හරි වෙනවා... ඒක මට දැනෙනවා...'

පපුව හූරමින් මෙන් මේ දැනෙන්නේ ඒ හැඟීම බව වර්ෂා දනී.

'ඔයාට එක්කෝ සිහිය ඇවිත්... නැත්නම් සිහිය ඒගෙන එනවා... එහෙම එනවා කියලා මට දැනෙනවා...'

වර්ෂා පුතාව අත තබාගෙන සිතුවාය. ඇය අද දහස් වතාවක් පමණ කොල්ලාව ඉම්බාය.

තමාට මේ ලෝකයේ ජීවත් වන්නට තැනක් ඇත්නම් ඒ ඔහුගේ හදවතේ පමණක් බව වර්ෂා දන උන්නාය. මේ ලෝකයේ තව දුරටත් ජීවත් වන්නට අයිතියක් ඇත්නම් ඒ ඔහුගේත් ඔහුගේ ලෙයින් උපන් පුතාගේත් ආදරය වෙනුවෙන් පමණක් බව වර්ෂා





දනී.

ඔහුව අයිති වන්නට තව බොහෝ කල් බලා ඉන්නට වන බවද වර්ෂා දනී.

'ඔයාට දන්මම මං ළඟට එන්න බෑ කියලා මං දන්නවා... ඒත් කමක් නෑ... අපි අපි වෙනුවෙන් ජීවත් වෙනවා කියලා හිතන්න මට ඉඩක් තිබ්බොත් ඇති... ඔයා වෙනුවෙන් දැන් මං විතරක් නෙමේ පුතත් ජීවත් වෙනවා... එයා කතා කරන කාලෙකදිවත් ඔයා එනවානම්... පුතා ඉස්සෙල්ලම තා..ත්..ති කියනවා බලන්න මං ආසයි...'

වර්ෂා තනය බදගෙන නිදගත් කොල්ලාව පරිස්සමින් ඇඳ මත තැබුවාය. ඊටත් පසු කොල්ලාගේ වත වැසෙන්නට රෝස පාට රෙද්දෙන් ඔහුව පොරවා ඔහුගේ තුනී හිසකේ මත ඇඟිලි තුඩු ගෙන ගියාය. 'තාත්තගෙම කොණ්ඩේ...' වර්ෂා සිතුවේ ආදරයෙනි.

වර්ෂා කාමරයෙන් පිටතට ආවේ සැනසුම් සුසුමක් හෙළමිනි. අද අනුරාධපුරයට තරමක් සිසිල් රැයක් උදා වූ දිනයකි.

නුවර වැව දෙසින් හමා එන සුළඟේ වූයේ අලුත් සීතලකි. මහ කන්නයට වතුර පිරුණු වැව පිසගෙන එන සුළඟ තරමක් සීතලය. ඒ සුළඟ අවට කොහොඹ ගස් අතරින් එද්දී තවත් සිසිල් වී දැනෙයි.

'ඇ..යි කෙ..ල්ලේ...'

ප්‍රියංවද ඇසුවේ කෙල්ලගේ මුහුණේ වූ අමුත්ත දකය.

'ප්‍රි..යා...'

වර්ෂා කතා කළේ කටු සිමෙන්ති ගෑ පඩිය උඩ ඉඳගෙනමය. ප්‍රියංවදද පැමිණ එතනින්ම වාඩි වූවාය. මිදුල එළිය වී තිබුණේ සැන්දෑවේ දල්වූ බුදු පහනේ එළියෙනි.

ඒ බුදු පහනේ අහිංසක එළිය මිදුලට හොඳටම ඇතිය. පුංචි මැටි පහනට එතරම් ආලෝකයක් කොහෙන් එනවාදයි කෙල්ලෝ දන්නේ නැත.

'අපි අයියව බ..ල..ලා ආවට පස්සේ...'

‘ම්...’

‘එහේ මො..නවා හ..රි වෙ..න..වා...’

‘කිව්වේ කෙල්ලේ...’

වර්ෂාගේ මුහුණේ තිබුනේ පැහැපත් ලස්සන නිවී සැනසුන බවකි.

‘අයියට ස..නීප වේගෙන එනවා කියලා ම..ට හිතෙ..නවා...’

ප්‍රියංවද වර්ෂා දෙසම බලාගෙන උන්නාය. කෙල්ලට මේවාගේ දේවල් දනෙන බව ප්‍රියංවද දනී.

‘මං ඕ..න..නම් කෙල්ලේ සුජාට ක..තා කරලා බලන්න..ම්...’

‘අ..පි හෙට බලමු... මොනවත් නෙමේ අයියට සනීප වෙනවද බලන්න...’

‘ස..නී..ප නොවෙනවනම් පුදුමයි... උඹ ඇවිත් ගියාට පස්සේ...’

‘අ..පි හෙ..ට බලමු...’

වර්ෂා බුදු පහන දෙස බලාගෙන කීවාය.

‘හෙට ලැලි ටික එයි නේද ප්‍රියා... පුටු මේස ටික හදන්න...’

‘උදෙන්ම බාසුන්නැහේ එයි... දහයට විතර ලී ටිකත් එයි කෙල්ලේ...’

‘හෙට උදෙන්ම වැඩ පටන් ගමු... පුතාව අම්මා ළඟ තියලා අපි ටවුමට යන්...’

‘ගි..හි..න්...’

‘උයන භාජන එ..හෙම ගන්නෙපැයි ප්‍රියා... පිඟන් කෝප්ප වීදුරු ටිකත් ගන්න ඕන...’

‘ආප්ප දන්නනම් අර මං කතා කරපු මල්ලී එයි... කොල්ල අහිංසකයි...’

‘උ..දේටයි හවසටයි ආප්ප දන්නම ඕන... පොල් රොටි ටික දන එකත් ඒ මල්ලිම කරයි නේද ප්‍රියා...’





‘කරයි...’

‘මං පොල් රොටි පේස්ට් එකයි ආප්ප මිශ්‍රනෙයි හදලා දෙන්නම්... ආප්ප හොඳ කිරි රහට ගන්න ඕන... හෝටලේ දන්න කලින් අපි ගෙදර ආප්ප ටිකක් හදලා බලමු... තාච්චි ටික සීසන් කර ගන්නත් එපැයි...’

‘කෙ..ල්..ලේ...’

‘ම්...’

‘පැටියා එක්ක උ..ඹට අමාරු වෙයි..නේ...’

‘අ..නේ.. ඒකා වද දෙන්නෑ ප්‍රියා... පාන්දර තුනට විතර ඇහැරුණාම අම්මටයි මටයි කෑම ටික හදන්න පුළුවන්... අපි සීනි සම්බෝල වගේ දවස් තුනකට සැරයක් හදමු...’

‘ඉ..තින් දවල් බත්...’

‘තව ගෑණු කෙනෙකුත් ගන්නවනේ... අපිට පුළුවන්... ඒක උඹ හිතන්නෙපා... උඹ හෝටලේ කැෂියර් එක බලාගනිංකෝ...’

ප්‍රියංවද කෙල්ලගේ දණහිස මත සුරත තැබුවාය.

‘හෝ..ට..ලේ අ..ල්ලලා යයි කෙ..ල්ලේ...’

‘ම..ටත් හි..තෙනවා...’

‘කොහොමත් දන් හිතට නිවනයි ප්‍රියා... මට ආ..යේ කො..ළඹ ය..න්..න ඕ..නෙ..ත් නෑ...’

වර්ෂා ප්‍රියංවද දෙස බලා සිනාසුණේ සියල්ල දරාගත් හදවතිනි. ජීවිතයේ මීටත් වඩා දෙයක් වෙන්නට නැත. වුණද එය දන් දරාගත නොහැක. පපුව කියන්නේ එහෙමය.

# 19

දැඩි සත්කාර ඒකකයේ දිගු නින්දකට වැටී උන් කොල්ලා දෙස මේධා බලා උන්නේ දුවවද තුරුල් කරගෙනය. ජීවිතයේ මීටත් වඩා දුක් දර්ශනයක් නැත. එහෙත් ඒ දුක යටින් මේධාගේ හදවතට තුනී සතුටක් දනෙයි. ඒ විමුක්ති සුව වෙන බවට වෛද්‍යවරයා කියන කතාව නිසාය.

'ද..වස් එකහමාරක් වත් මෙ..හෙම ඉඳයිලු...'

'ම්.. පව්..'

'මල්ලි සනීප වෙනවා බබා...'

'වෙන්නම ඕන... යන ගමන් කෝවිලටත් ගිහින්ම යන්...'

වැල්ලවත්තේ කාලි අම්මාන් කෝවිල දන් මේධාට පුදුමාකාර විශ්වාසය. ඒ විශ්වාසය පපුවේ ඇති කළේ කෙල්ලය. අද මේ වඩාගෙන ඉන්නා දුවව ලැබුණේ කෙල්ල නිසාය. මේ කෝවිල් ගානේ ගොස් තෙල් ගෙනවිත් බඩට ගෑවේ ඇයය.

'අ..පි ය..න්... යන ගමන් දෙයක් තියෙනවා කියන්න...'

සක්විති කීවේය. මේධා බැලුවේ පුදුමයෙනි.





'මො..ක..ක්..ද...'

'ය..න්..කෝ...'

මේධා විමුක්තිගේ හිසත් මුහුණත් අතගෑවේ දුකෙනි.

'බාප්පිට උම්මා දෙ..න්..න...'

මේධා දුවව විමුක්තිගේ මුහුණට ළං කළාය. බාගෙට රැවුල් කොට වැවුණු විමුක්තිගේ මුහුණ ගෑවී කෙල්ල ගැස්සුණාය.

හිමාලිව මුණගැසුණේ මේධාත් සක්විතිත් දැඩි සත්කාර ඒකකයෙන් පිට වෙද්දීම වාගේය. මේධා එහෙමම නෙත් හරවා ගත්තාය. තමාට මහ ගෙදර අහිමි කළේ ඇය බව මේධා දනී. ඒ තරම් හතුරුකමක් කවුරුවත් කළේ නැත.

සක්විති මොහොතකට නැවතුණේය.

'බලන්න ගියාට කමක් නෑ... ඩොක්ටර්ස්ලා එක්ක අනම් මනම් කතා කරන්නෙපා...'

සක්විති කීවේ තරහින් නොවේ. සාවදානවය. හිමාලි කතා කළේ නැත. 'මේ ගෑණී තමා ඔක්කොම කරන්නේ. මෙකි නැත්නම් මේ කොල්ලෝ එක්ක ඕන දෙයක් කතා කරගන්න පුළුවන්...' හිමාලි සිතුවේ කේන්තියෙනි.

'මො..ක..ක්ද මහත්තයෝ කි..ය..න්..න ති..යෙ..න්නේ...'

වාහනයට ගොඩවූ වනම මේධා ඇසුවේ උගුරෙන් මෙනි. සක්විති තිහඬවම වාහනය පාරට දැම්මේය.

'අම්මා මට උදේ ගෙදරට එන්න කිව්වා...'

'ම්.. ම..ට බ..ණී..නවා අහ..න් ඉ..න්..න උ..නා නේ..ද...'

සක්විති වේදනාබර ලෙස බැලුවේය. ඒ කතාව ඇත්තය.

'ප..ව්...'

ඇය කීවාය. තමාට කවුරුවත් බණිනවා ඔහුට බලා ඉන්නට බැරි බව මේධා දනී. ඒත් වැදූ අම්මා බණිද්දී පුත්තුන්ට කර කියා ගන්නට දෙයක් නැත. නැන්දම්මලා උඩ යන්නේ එවිටය.

'අම්මට ගොඩක් පසුතැවෙන්න වෙයි...'

සක්විති කීවේය.

'මං ඕවා හිතන්නෑ... මට මොරගොඩ පවුලේ කොල්ලෝ දෙන්නව විතරක් ඇති...'

මේධා මේ කතාව කීවේ වරක් දෙවරක් නොවේ.

'අම්මා ඒ කසාදේ තීන්දු කරගෙන ඉන්නේ...'

'මො..න ක..සා..දෙද...'

'මල්ලිගෙයි හිමාලිගෙයි...'

මේධා සිනාසුණේ මහ පාරටය.

'එ..ක කසාදයක් රෙජිස්ටරුත් කළේ... දන් මේ තීන්දු කරන කසාද ගැන මොන කතාද...'

'ඒත් අ..ම්..මා මේක කරයි බබා...'

මේධා තර්ක කරන්නට ගියේ නැත. සමහර දේවල් ඇයට පුදුමාකාර ලෙස විශ්වාසය.

'අම්මට පුළුවන් තාත්තවත් නම්ම ගන්න... බැලූ බැල්මට හිමාලිගෙත් වැරැද්දක් පේන්නෑනේ...'

'ඒත් ම..ල්..ලී...'

'ඒ..ක ත..මා ප්‍රශ්නේ... එතනදී දෛවය මේ ප්‍රශ්නෙ විසඳයි...'

මේධා සැහෙන වේලාවක් කල්පනා කළාය.

'බ..බා...'

සක්විති කතා කළේය.

'ම්..'

'කෙල්ලට බබෙක් ලැබෙන්න උන්න කියල හොඳටම විශ්වාසද...'

මේධා ටික වෙලාවක් සක්විති දෙස බලාගෙන උන්නයා.

'මං එ..ද උ..ඩ මළුවෙදි ද..ක්..ක දේ ත..මා ම..හ..ත්..තයෝ... ප්‍රෙග්නී එකක් ඇඳන් උන්නේ...'

'ඒ ව..ගේ වෙ..න ඇඳුමක් වෙ..න්..නත් පුළුවන් නේ...'





'ම්.. වෙ..න්..න පු..ළු..ව..න්... එ..හෙම නොවෙන්නත් පුළුවන්...'

'කො..හො..ම..ත් බ..බා...'

'ම්...'

'මල්ලි ස..නීප උනාම ඔය දරුවා ගැන ක..තාව අපි ඇදලා ගන්නැතුව ඉමු...'

මේධා ටික වේලාවක් කල්පනා කර හිස වැනුවාය.

'එ..හෙම දෙයක් කියන්න තරම් සාක්ෂි අපි ළඟ නෑ ත..ම..යි...'

'ඒ..ක කො..ල්ලට එ..ක..පාර දරාගන්න බැරි වෙයි...'

ම..ට තේරෙනවා... ප්‍රශ්නේ තවත් අවුල් වෙ..න්..න..ත් පුළුවන්...'

'මා..ත් හිතන්නේ එහෙමයි... මේකා හරි බොළඳ හිතක් තියෙන එකෙක්... පිස්සු වැටෙයි...'

'ස..ම..හර විට මල්ලි අපි හිතන්නෙම නැති තීරණයක් ග..නී... නේද මහත්තයෝ...'

සක්විති දිග සුසුමක් හෙළුවේය.

'වෙන දෙයක් වෙයි... ඒත් අපිට ජීවිතවලට බලපෑම් කරන්න බෑ... කෙල්ලව හම්බ උනොත් අපි ඒකිට කරන්න පුළුවන් හැම උදව්වක් කරමු...'

'ඔ..ව් ඒක මනුස්සකම...'

'මෙ..හෙම දිගටම ගියොත් මටත් මහ ගෙදරට පය තියන්න බෑ... මේ තත්වේ එච්චර හොඳ නෑ...'

'මං ඒක නොදන්නවා නෙමේ... දරුවන්ට ආච්චිලා සීයලා බාප්පලා ඕන...'

මේධාට දුකය. ඒ දුක කෙල්ල වෙනුවෙන් උපදින දුකක්ද නොවේනම් විමුක්ති වෙනුවෙන් උපදින දුකක්ද කියා ඇය දන්නේ නැත.

'සමහර විට වර්ෂත් ජීවිතේ තීරණ ගනී... අ..රගෙනත් ඇති...'

'ගනී කෙල්ල කොහොම ජීවත් වෙන්නද බබා... අපේ එකාව මේ කපේදි ලබාගන්න බෑ කියලා කෙල්ල දන්නවනේ...'

'ඒ..ත් බල..න්..න ආවේ...'

'මං කිය..න්..නෑ එ..හෙමම කියලා... ඒත් කෙල්ල තීරණයක් ගත්තත් වැරදි නෑ...'

'මි.. වැ..ර..දි නෑ න..ම් ත..මා...'

'මේ ප්‍රශ්න කොහොමත් බර වැඩියි...'

'ම..ට..ත් හිතට නිවනක් ඇත්තෙම නෑ...'

'මල්ලිත් කැමති නම් ඒ දේවල් උනාදෙන්...'

'හි..මා..ලි..ට...'

'මි...'

'ඔ..ව්... සමහර විට එයා දිනයි... ඇලීගෙනම ඉන්නවා...'

හිමාලිවත් විමුක්තිවත් එක ළඟ තබා මේධා බැලුවාය. හති වැටෙන්නේ සිතමය. වෙන රූපයක් එතනට මැවෙන්නේම නැත. එ..හෙත් නපුරු කාලය ආ විට ඒ දෙන්නාටත් වෙන් වන්නට සිදු විය.

'සමහර විට උඹට මේ ආත්මෙම හූල්ල හූල්ල ඉන්න වෙයි...' මේධා සිතින් වර්ෂාට කීවාය.

* * * * * * * * * * * * * *

හිමාලිට එද රෑ නින්දක් ගියේම නැත. හෙට අනිද්දට මේ ගෙදර ඇතිවන තත්වය ලේසි නැත. මොනවා හෝ නොසිතුවහොත් වෙන්නේ තමාට ආපු ලෙසම ඉන්ටර්සිටියක නැගී නුවර යන්නටය.

මොරගොඩ ට්‍රාන්ස්පෝට් එකේ කිරි සුදු පාට වාහන වලින් සීතල ඒසී දමාගෙන නුවර ගිය තමාට එහෙම දන් කොහොමත් යා නොහැක.





'විමුක්තිට අනිද්ද වෙද්දී සිහිය එනවා... ඒක ෂුවර්... ඊට පස්සේ ගොඩක් දේවල් වෙයි...'

හිමාලි සිතුවාය.

'විමුක්තිගේ ඔළුවේ ඉන්නේ වර්ෂම තමයි... මට මේ සටන දිනන්න නම් මටත් වර්ෂා කෙනෙක්ම වෙන්න වෙනවා... ඒත් මේ ගෑණි කොහොම මෙයාව පිස්සු වට්ටලද කියලා කවුද දන්නේ...'

හිමාලි දහ අතේ සිතුවාය.

'ටික ටික මෙයාට කිට්ටු වෙන්නම වෙනවා... ගෑණි මෙයාගේ පස්සෙන්ම ඉඳලා තියෙනවා... නැනයි මස්සිනයිනේ... කවුරුත් ඒ ගැන හිතලත් නෑ...'

හිමාලි නැගිට කුස්සියට ගොස් කෝපි එකක් හදගෙන යළිත් කාමරයට ආවාය. මේ මොරගොඩ නිවසේ ඇති සැප සම්පත් පුදුමාකාරය. ටැප් එකක් වමට දැම්ම විට එන්නේ උණු වතුරය. දකුණට දමුව විට එන්නේ ඇල් වතුරය... සෑම කාමරයකටම ඒසී දමා ඇත. ඇමතුමක් ගන්නට ඕනා වූ විට වයර් නැති දුරකථන වටේම තබා ඇත. එළියට බසින්නට ඕනා වූ විට සුදු පාට කාර් දෙරකඩටම විත් නතර වෙයි. රියදුරුම පැමිණ වාහනයේ දොර අරියි. වහයි. නුවරදී නිකම්ම නිකම් හිමාලි වූ තමා දන් පුංචි නෝනාය. එහෙම කියද්දීත් ඇඟට මොනවද වෙයි.

'සිහිය ආපු වෙලාවෙ ඉඳන් ළඟම ඉන්නවා... කොහොමත් එයාට ටික දවසක් යන කල් සාත්තු කරන්නම වෙනවනේ... ඒ ටික මම කරනවා... අමුතුම රංගනයක් දන්න වෙනවා... මට යශෝධා විමලධර්මගේ චරිතෙ ගන්නම වෙනවා... හරි අහිංසක පාටට...'

හිමාලි කෝපි එක තොල ගාමින් සිතුවාය.

'ටික දවසකින් එයා බුක් ෂොප් එකට යන්න ගනී... එතකොට මාත් යනවා... අරකිත් කරලා තියෙන්නේ එහෙම තමයි... මෙයා එක්ක රෑ වෙලාලු එන්නේ...'

හිමාලි මේ සියල්ල දන උන්නාය.

'ඒකිට මේ ගෙදරට වත් බුක් ෂොප් එකටවත් එන්න බැරි එක ලොකු දෙයක්...'

මේ සියල්ල ලේසි නොවන බව හිමාලි දනී. අවුරුදු හතරක් විශ්ව විද්‍යාලයට බඩගා වතුර බේසම් වල කකුල් දගෙන පාඩම් කර උපාධිය ගෙන රස්සාවල් කිරීම ඊටත් වඩා දුකකි.

'කෙල්ලෙක්ට ඉගෙන ගන්නවට වඩා ලේසියි හොඳ සල්ලි තියෙන කොල්ලෙක්ව යාළු කරගෙන බඳින එක...'

හිමාලිට එහෙම හිතුනේ කොළඹ ආ පසුය. විමුක්තිව දුටු පසුය.

'ඒකි දිගටම බුක් ෂොප් එකට සාරි ඇඳලා තියෙන්නේ... ඒකිට වඩා මට සාරිය ලස්සනයි... ඔය හිත ටිකක් හොල්ලන එක මහ දෙයක්ද...'

හිමාලි මහ රෑ වන තුරු එහෙම සැළසුමක් ද ගත්තාය. කොහොමත් දන් මේ කසාඳය තීන්දුය.

'මිනිහෙක්ට වැරදෙන්න යන්නේ ටික වෙලාවයි... ඒ වෙලාව ඇති ගෑණියෙක්ට ඕන දෙයක් කරගන්න...'

හිමාලි යන්නේ ඒ වරදට විමුක්තිව පොළඹවා ගන්නටය. අනුරාධපුරයේ පුංචි පැලක නිදන පොඩි ඒකාගේ තාත්තාව පොළඹවා ගන්නටය.

'කොහොමත් එයාට අම්මා තාත්තා අමතක කරන්න බෑ... මේ මොරගොඩ මහ ගෙදර දලා යන්නත් බෑ... මංජුලාව බඳින්න කැමතිත් වෙලානේ උන්නේ... එහෙම තියෙද්දිලුනේ මේක උනේ...'

හෙට සිට ඒ සටන පටන් ගන්නවාදයි හිමාලි සිතා ගත්තාය. එපමණක් නොව ඇය තමාටම පොරොන්දු වූවාය.

'මං මේ යට කාමරේ වැඩි දවසක් නිද ගන්නෑ... එයාට මාව උඩට ගෙන්න ගන්නම වෙනවා...'





විමුක්ති වන් කොල්ලෙකුගේ ආදරය ලැබේනම් මොනවා කරන්නට බැරිදයි හිමාලි සිතුවාය. 'එහෙම වෙච්ච දකට මං ජීවිතේ හැම සැපක්ම ලබන ගෑණියෙක්' ඇය සිතුවාය.

'හෙට පාන්දරම යනවා හොස්පිටල් එකට... පා..න්දරම යනවා... මේ සටන කරනවා නම් මේධවයි සක්විතිවයිත් යාළු කරගන්නම වෙනවා... මං ඔය ගෑණිගේ කකුල් දෙක අල්ලලා වැඳලා හරි ඒක කර ගන්නවා...'

මේ පවුලට සම්බන්ධ වෙන්නට කරන්නට බැරි දෙයක් නැතැයි හිමාලිට සිතුණි.

* * * * * * * * * * * *

හිමාලි ඇන්දේ චාම් බටර් පාට සාරියකි. ඒ සාරියට චොකලට් පාට හැට්ටයක් ඇය ඇන්දය. ඒ සාරියට හිමාලි ලස්සනට පෙනුනාය. හිමාලි කැඩපත අසළට වී කොණ්ඩය එක එක ආකාරයට තබා බැලුවාය. අවසානයට ඇය කොණ්ඩය එක මිටකට ගෙන පෝනි ටේල් එකක් දම්මාය. එහෙම දමූ විට චාම්ය. ලා පාට රෝස පූයර ටිකක් පමණක් මුහුණට ගැල්වූ ඇය දෙතොල් පෙති චාම්ව තැබුවාය.

විමුක්ති මොරගොඩ පතන්නේ මෙහෙම පෙම්වතියකි. බිරිඳකි. ඔහුට ඕනා එහෙම නම් එහෙමම හැඩ වෙනවා යැයි හිමාලි සිතා ගත්තාය.

සමනල පෙන්ඩනයක් තිබූ රන් චේන් පට හිමාලි සකසා ගත්තාය. ඒ රන් සමනලයා පපුවේ මැදට එන ලෙසිනි. තොල් පට මුව තුළට ගත් හිමාලි එය දිවගින් තෙමාගෙන පිබිදෙව්වාය.

මේ ලස්සනට විමුක්තිගේ පපුව ගැස්සෙන්නේ නැත්නම් පුදුම යැයි හිමාලිට සිතුණි.

'සිහිය ආපුදෙන්කෝ... මම එද ඉඳලා තමා එයාව පුදුම කරවන්නේ...'

හිමාලි සාරිය ඇඳගෙන ඇවිඳගෙන එද්දී ඇත්තටම හැඩය.

ඇගේ පුළුල් උකුල සාරියට මනාව කැපී ආවේය. ඒ උකුලටම සරිලන ගමන් ලතාවක් ඇයට තිබුණි. ඒ නුවර පරම්පරාවෙන් ආ ගමන් ලතාවය.

'බලමු සටන දිනන්නේ රත්නපුරෙන් ආපු කෙල්ලද නුවරින් ආපු කෙල්ලද කියලා...'

හිමාලි කාමරයෙන් පිට වෙන්නට ප්‍රථම අවසන් වතාවටත් කැඩපතේ ඇඳෙන තමාගේ රුව දෙස බලා උන්නාය. ඊටත් පසු ඇය එහෙමම සිනාසුණාය.

හිමාලි කෙළින්ම ආවේ කුස්සියටමය. අනුලා තේ හදන්නට සූදනම් කරමින් උන්නාය. තාම පාන්දර හයට වත් නැත.

'ගු..ඩ් මෝ..නිං පුංචි නෝනා...'

අනුලා මඳ සිනාවක් පා කීවාය. 'අද මොකද මේ උදේ පාන්දරම සාරියකුත් ඇඳගෙන...' අනුලා සිතුවාය.

'මෝ..නිං අනුලා...'

'පුංචි නෝනා එළියට යන්නද...'

'ඔව් අනුලා... තේ ටිකක් හදලා දෙන්න...'

'අද පුදුමයි... අමුතුම ළෙන්ගතුකමකින් කතා කරන්නේ...' අනුලා සිතුවාය.

'අනු..ලා...'

හිමාලි කතා කළේ ඇඟිලි පටලවමිනි.

'පුංචි නෝනා...'

'ධ..නසිරි ගෙදරද...'

'ඔ..ව් තා..ම නිදි පුංචි නෝනා...'

'නෑ.. ඒ..ද අර හොස්පිට්ල් එකේදි ප්‍රශ්නයක් උනානේ... එද මට මොනා කියවුණාද දන්නෑ... මං හිටියේ හරි කේන්තියෙන්... ඒ තරහ ගියේ ධනසිරිගේ පිටින්... අනේ මං ගැන මොනවත් හිතන්නෙපා කියන්න...'





අනුලා සිනාසුණාය.

'ඒ..යා ඒ..හෙම හිතන කෙනෙක් නෙමේ පුංචි නෝනා... ආශ්‍රය කළොත් පුංචි නෝනට තේරෙයි... ටිකක් දුකෙන් නම් හිටියා තමා...'

'මං දන්නවා... මං හම්බ උනාම සමාව ගන්නම්... මං ඒ..හෙම ක..තා කරපු එක වැරදියි තමා...'

අනුලාට පුදුමය. හිටපු හිමාලි මැරුණාද... මේ ඉන්නේ අලුත් හිමාලි කෙනෙක්ද...

'අ..නු..ලා උ..න..ත් මං ගැන වැරදියට හි..තනවා ඇති.. ම..ම...'

'මං ක..වුද පුංචි නෝනා... මේ ගෙදර උයන හෝදන ගෑණි...'

'මං ඒ..හෙම හිතුවේ නෑ... මං මේ ගෙදරට ආපු දවසේ ඉඳලා මට සැළකුවේ අනුලා... රෑට කාමරේට බඩත් උස්සගෙන ඇවිත් තේකක් ඕනද කියලා ඇහුවේ අනුලා... මට ඕවා මතකයි...'

අනුලා සිනාසුණාය. කවුරු හෝ වැරදි තේරුම් ගන්නවා නම් හොඳයැයි අනුලාට සිතුණි.

'ආ තේක පුංචි නෝනා...'

'පැටියා නිදිද...'

හිමාලි ආවේ කතාවටමය.

'තුන වෙනකල් ඇහැරගෙන... දන් නිදි... නමය වෙනකල් ඇහැරෙනවා බොරු...'

'මට රෑ ඇහෙනවා අඬනවා...'

'තනේ එල්ලෙන්න පුංචි නෝනා...'

'ලොකු කරගන්නකල් දුක නේද...'

'පුංචි නෝනටත් කවදහරි ඉතින් තේරෙයි... බැන්ද කාලෙක... ඒක දුකක්ම නෙමේ...'

'ම්...'

'ඉක්මනට මාත් බබෙක් හදයි' හිමාලි සිතින් කීවාය.

'උදෙන්ම පුංචි නෝනා හොස්පිට්ල් යන්නද...'

'ඔව් අනුලා... රෑට නි..න්..ද..ක් නෑ... ළඟ ඉන්නත් බෑනේ...'

'ම්...'

හිමාලි කෝප්පය තබා සිනාසුණාය.

'මං ය..න..වා... ධනසිරිට අරක කියන්න හොඳේ...'

'මං කිය..න්..න..ම්...'

අනුලා සිතුවේ මේ වෙනස කුමක්ද කියාය.

හිමාලි සාලයට ගියේ තනිවම සිනාසෙමිනි. 'මුන් මෝඩ ගෑණු...ටක් ගාලා අල්ලගන්න පුළුවන්... ටිකක් ඇලෙන්න කතා කරන්න ඕන... මේ ගෙදර වැඩකාරයන්ටත් ලොකු බලයක් තියෙනවා... ඒක මං කලින් දනං උන්නෑ...' හිමාලි සිතුවාය.

'අරකි මූන්ව හොඳට හුරතල් කරලා ඇති... අක්කේ බක්කේ ගාගෙන... ඒකයි පැලෙන්න යන්නේ...'

හිමාලි වාහනයට ගොඩවූයේ මේවා සිතමිනි.

* * * * * * * * * * *

හිමාලි පාන්දර එද්දී දැඩි සත්කාර ඒකකය අසළ උන්නේ සක්විතිය. හිමාලි ඔහු සමඟ අහිංසකව සිනාසුණාය.

'ඩො..ක්..ට..ර් ආවද අයියේ...'

'ඇතුලේ චෙක් කරනවා...'

'අ..යියට සි..හිය ඇවිත්ද...'

'හෙටවත් එයි කියනවනේ ඇහැරෙද්දී...'

'රෑ..ම මා..ත් ඇ..හැ..ර..ලා... රෑ අයියත් අයියා ගාව නෑනේ...'

'හෙට රූම් එකට දයි නංගී...'

සක්විති කීවේ සන්සුන් හඬිණි.





'අ..යියේ..'

සක්විති ඔහු ළඟටම පැමිණ කතා කළ හිමාලි දෙස බැලුවේ පුදුමයෙනි.

'ම.. ම..ගේ ක..ටි..න් වැරදි දෙය..ක් එ..ද පි..ට..වුණා න..ම් ම..ට ස..මා..වෙ..න්..න... මං එ..හෙම හි..තලා ක..තා ක..ළේ නෑ... ඇත්තටම නෑ...'

හිමාලිගේ දෙනෙතින් කඳුළු වැටිණි. සක්විති ඇය දෙස බැලුවේ අසරණවය.

'දැ..න් ඕවා අල්ලලා දැ..න්..න...'

'මං අ..ක්..ක..ව..ත් හම්බවෙන්නයි අද ඉන්නේ...'

'මේ..ඩ..ව...'

'ම්...'

'ඒ මොකටද...'

'අ..ක්..කා උ..න..ත් මං ගැන තරහින් ඇත්තේ...'

'එ..යා එ..හෙම නෑ...'

'ඒත් ම..ට අක්කගෙන් සමාව ගන්න ඕන.. ඇත්තටම ඕන...'

සාරි පට දෙනෙත් අද්දර තබාගෙන හිමාලි කීවාය. ඇත්තටම අද ඇය අඬයි.

'මේ..ක අ..යියේ කො..හොම බැදිච්ච බැ..දීම..ක්..ද දැ..න්..නෑ... මං ව..ත් දැ..න්..නෑ... මා..ව තේරුම් ග..න්..න... මං තාත්තත් නැතුව හැදිච්ච කෙල්ලෙක්... පිරිමි සහෝදරයෙක් වත් ආශ්‍රය කරලා නෑ... අයියට කිට්ටු වෙද්දී මො..නවද වු..ණා... මා..ත් කෙල්ලෙක්.. ම..ටත් ති..යෙ..න්..නේ හිතක්නේ...'

සක්විති කතා කළේ නැත. 'වදින්න වදින්න ගහන මිනිහත් මෝඩයලුනේ...' ඔහු සිතුවේය.

'අයියට සාත්තු කරද්දී මං.. දැ..න්..නෙම නැ..තුව එ..යා..ට ළං

වු..ණා... ලෝ..බ..ක..මට මං කෑ ගැහුවේ... එයාටයි ඉ..ස්ඹුස්සෙල්ලා ආදරේ කළේ...'

'ඒවා අපි පතාගෙන ආපු විදිහට වෙයි හිමාලි...'

'ඔ..ව්.. ඒත් අ..යියේ මං වැරැද්දක් ක..ළේ නෑ... කෙනෙක්ට ආදරේ කරන්න ගත්තාම තමන් වැරදියි කියලා පේන්නෑනේ...'

සක්විති හිස වැනුවේ නිහඬවමය.

'පු..ළු..ව..න් උ..නො..ත් සේ..රම අ..ම..ත..ක කරලා මං නු..වර බ..ස් එකට නගින්..න..ම්... එ..ත..කල් ම..ට ඉ..න්..න දෙ..න්..න...'

හිමාලි ගියේ දෑත් එකතු කරය. දෙහි බෑයක් මිරිකද්දී මෙන් ඇගේ දෑසින් කඳුළු කඩා වැටෙන්නට විය.

'මං කවදවත් නංගිට මෙහෙත් ය..න්න කිව්වේ නෑනේ... ඉගෙන ගන්න එක කරගෙන ඉන්නනේ කිව්වේ...'

'ඔ..ව්.. ඒත් දන් මං පරක්කු වැඩියි... මොනා කරන්නද... කාගේ අතිනුත් වැරදි වෙනවනේ අයියේ.. මං එයාට ආදරේ කළේ විශ්ව විද්‍යාලෙට තේරිච්ච ඉගෙන ගත්ත කෙල්ලෙක් විදිහට නෙමේ... ගමේ මෝඩ බොළඳ කෙල්ලෙක් වගේ...'

සක්විතිට පුදුමාකාර අපහසුතාවයක් දැනුණි. මොනවා කියන්නදැයි ඔහුටම තේරෙන්නේ නැත.

'නංගී... මල්ලිට ආදරේ කරන්නෙපා කියලා ඔයාට කියන්න මට අයිතියක් නෑ... ඒක මේ ලෝකෙ ඉන්න හැමෝගෙම අයිතියක්... මං ආදරේ කරන කෙනාට මට ආදරේ කරන්න අයිතියක් තියෙනවා... එහෙම කරන්නෙපා කියන්න තරම් මං කුරිරු මිනිහෙක් නෙමේ... මාත් හොඳට ආදරේ ගැන දන්නවා... ඒත් ඔයා ආදරේ කරන්නේ මට නෙමේනේ... මල්ලිට... ඌ සිහිය නැතුව ඉන්නේ... ඌට සිහිය ආව දවසට ඌ තීරණයක් ගනී... සමහර විට ඌ ඔයා දිහාත් බලයි... ඒක මං දන්නෑ... දෛවයේ හැටි...'





'මං ද..න්..න..වා මං කියන්නේ ම..ට..ත් අයියව ද..න් අ..ම..ත..ක කරන්න බෑ කියලා... මං ඒ ගර්ල්ට වරදක් කළා නෙමේ... මං එයා ගැන දනං උන්නෑ... ඇත්තටම නෑ...'

'මේකට සිහිය එනකල් ඉන්න නංගී... ඊට පස්සේ මල්ලි එක්කම මේවා කතා කරන්න... උගේ සතුට ඔයාව බඳින එක නම් මගෙයි මගේ ගෑණිගෙයි සතුටත් ඒක... එහෙම උනොත් ඔයාව මං මගේ නෑනා කියලා පිළිගන්නවා... ඒත් ඒ නෑදෑකම හදගන්න වෙන්නේ මල්ලී එක්ක... ඌ මේ කා..ම..රේ... සිහියත් නැතුව...'

සක්විති දඩි සත්කාර ඒකකය දෙසට අත දිගුකර කීවේය.

'ආදරේ කරන කෙ..නෙ..ක් අතින් අ..යියේ ව..ර..දක් වෙ..න්නෑ නේද...'

සක්විති හිස වැනුවේය. හිමාලි දෙකම්මුල් තෙතමාත්තු කර ගත්තේ බිම බලාගෙනය. 'මොරගොඩලා මහ පුදුම මිනිස්සු... මෙයාලා එක්ක ඔළුව පාත් කරගෙනම ඉන්න ඕන...' හිමාලි සිතුවාය.

# 20

හිමාලිව ගේ දෙරකඩ දකිද්දී මේධාට පුදුම සිතුණි. 'මෙයා ඇයි මෙහේ' මේධා පුදුමයෙන් සිතුවාය.

'මං.. අ..ක්..කේ මේ...'

හිමාලි ගොත ගැසුවාය.

'එ..න්..න...'

මේධා කතා කළාය. හිමාලි ගෙට ගොඩවූයේ සාරි පොට ඉදිරියට අල්ලාගෙනමය. මේධාට අමුත්තක් දැනුණි. ඒත් ඇය පෙන්නුවේ නැත.

'මං අ..ක්..කේ අ..ක්..කත් එ..ක්ක වු..ට්ටක් ක..තා කරන්න කියලා ආවේ...'

'ඉ..ඳග..න්..න...'

හිමාලි ඉඳගත් පසු මේධාද ඉඳගත්තාය.

'සක්විති නම් හොස්පිට්ල් ගිහින්...'





'නෑ.. මං... අ..ක්..ක..ව චුට්ටක් හම්බවෙන්නයි ආවේ... මං හොස්පිට්ල් එකටත් ගිහින් ආවේ...'

'ආ...'

හිමාලිට කතා කර ගන්නට බැරුවාක් මෙන් මොහොතක් සාරි පට අතේ පටලවාගෙන උන්නාය.

'ම..ගෙ..න් අ..ක්..කේ අක්..කටයි අයියටයි ව..ර..ද..ක් උ..නානම් සමාවෙන්න...'

මේධා හිමාලි දෙසම බලාගෙන උන්නාය.

'නෑ... මට එ..හෙම වරදක් උ..ණේ නෑ... නංගිත් එක්ක මං කතා කරලවත් නැතේ වචන තුන හතරක්වත්...'

'මං මෝ..ඩ..කමට දෙ..තුන් පා..ර..ක් අයිය..ත් එ..ක්..ක ක..තා කරගෙන ගියා..ට අයියගෙනුත් සමාව ඉල්ලුවා...'

'මේ වෙලාවේ හිමාලි සක්විති බලන්නේ මල්ලිව සනීප කරගන්න... ඔයාටම පේනවා ඇතිනේ... සක්විති මොහොතක් ගෙදර නෑ... එයා මල්ලිට පුදුම ආදරෙයි... ඒ වැඩ පිළිවෙලට කරගෙන යන්න බැරි උනාම එයාටත් කේන්ති යනවා...'

'මං.. දැ..න්..නවා අ..ක්..කේ...'

'අයියටවත් මටවත් ඔයත් එක්ක තරහ වෙන්න හේතුවක් නෑ...'

'ම..ට..ත් නෑ අ..ක්..කේ...'

'මේ ගෑණිට අද මොකද වුණේ... හිතාගන්නවත් බෑ...' මේධා සිතුවාය.

'මං හ..රි අමාරුවෙන් ඉගෙන ගත්ත කෙල්ලෙක් අක්කේ... තාත්තත් නැතුව මට අම්මා හරියට දුක් විඳලා ඉගැන්නුවේ...'

'මං දැ..න්..නවා නංගී...'

'වැරැද්දක් උනානම් ම..ගේ මෝ..ඩ..ක..මට... අ..ක්..කයි අයියයි

ව..ගේ දෙ..න්..නෙ..ක් එක්ක එ..හෙම ප්‍රශ්..න ඇති කර ගන්න තරම් මං ලොකු කෙ..ල්ලෙක් නෙ..මේ...'

කියන්නට එක එක දේවල් හිතට ආවද මේධා කීවේ නැත. ගෙදරට පැමිණ මෙහෙම කියද්දී බණින්නට හිතෙන්නේ නැත.

'මං ඔයාට බො..න්..න මොනවා හ..රි අරගෙන එ..න්..නම්...'

'ක..ම..ක් නෑ අ..ක්කේ...'

'ඉ..න්..නකෝ...'

'මා..ත් එ..න්..න..ම් අක්කේ...'

හිමාලි මේධා පසුපසින්ම ගියාය.

'දුව නිදිද අක්කේ...'

'දැ..න් නා..ලා කිරි බීලා නිදගත්තේ...'

'අනේ අක්කේ... ගෙදර වැඩක් හරි තියෙනවනම් කියන්න... මං එන්නම්... ලෙක්චර්සුත් යන්නැති නිසා මාත් පාළුවෙන් ඉන්නේ...'

මේධාට විදුලියක් සේ සිහිවූයේ වර්ෂාවය.

'එ..හෙ..මම කියලා අමාරු නෑ නංගී...'

මේධා කේතලය තැබුවාය.

'අ..ක්..කේ...'

හිමාලි මේධා ළඟටම ආවාය. මේධා බැලුවේ පුදුමයෙනි.

'අ..නේ අ..ක්..කේ ව..රදක් උ..නා..නම් ස..මා..වෙ..න්..න...'

මේධාගේ දෑතම අල්ලාගෙන උන් හිමාලි එහෙමම මේධාට පහත් වී වැන්දය. මේධා එහෙමම ඇයව අල්ලා ගත්තාය.

'අ..නේ.. මේ මොක..ද... ඔ..යා මොකටද ම..ගෙ..න් ස..මාව ග..න්..නේ...'

'ම..ට..ත් අ..නු..කම්පා ක..ර..න්..න අ..ක්..කේ... මා..ත් ඔ..යාලා එ..ක්ක ජීවත් වෙ..න්..න ආසයි...'

හිමාලි කරන්නේ රඟපෑමක් යැයි නොහිතෙන තරමට මේධාගේ





පපුව කඩා වැටුණි.

'ඔ..යා ගැ..න එ..හෙම හිතන්න ම..ට ඕ..න නෑ... ඒත්...'

'ඇ..යි අක්කේ...'

'අපි මුලින්ම හිතන්න ඕන මල්ලිගේ ජීවිතේ ගැනනේ...'

'ඔ..ව් ම..ටත් වටින්නේ ඒ..ක... මා..ව විශ්වාස කරන්..න අ..ක්..කේ... මා..ත් එ..යා..ට...'

හිමාලි කියන්නට යන්නේ මොනවාදැයි මේධා දනී.

'ජීවිතේ කාටවත්ම එ..හෙ..ම ආදරේ ක..රලා නෑ... ඒත් එ..යා දැ..න්..නෑ මෙ..ච්..චර එ..යාට ආදරේ කරන කෙල්ලෙක් ඉන්නවා කියලා...'

මේධා බලාගෙනම උන්නාය.

'හැ..ම..දේම මල්ලිනේ නංගී තීරණය කරන්නේ... එ..යයි දන්නේ එයාට කවුද ආදරේ කියලා...'

'එ..යා ත..ව අවුරුදු දහයක් ඔහොම ඉන්නවා කියලා හිතන්න අක්කේ... ඒත් ම..ම එයාව මගේ දරුවෙක් වගේ බලාගන්නවා...'

මේධා තේක හඳ හිමාලි අතට දුන්නාය.

'නංගී උදේට කා..ලද...'

'කො..හො..මද අ..ක්..කේ ක..න්..නේ... මං ඊයේ රෑටවත් කා..ලා නෑ...'

මේධා බිස්කට් ටිකක් ගෙන පීරිසියකට දැම්මාය.

'මේක කාලා තේ බොන්න... මං ඉක්මනට ක..න්න මො..නවා හරි හදන්නම්... සක්විති එද්දී බත් පැකට් අරන් එනවා කිව්වා...'

'මේ ඇ..ති අ..ක්..කේ... ම..ගේ හිතට අද හරි නිදහසක් දැනෙනවා... පු..දුම නි..ද..හ..ස..ක්...'

හිමාලි දිග සුසුමක් ගෙන කීවාය.

'ස..තු..ටින් ඉන්න බලන්න... අපි ඔයත් එක්ක මොකට තරහ

වෙන්නද... අයියත් ඔය තරහට නෙමේ බනින්නේ... එයත් මේ දවස්වල අවුල් වෙලා ඉන්නේ...'

'මං ඒක දන්නවා අක්කේ... මං අයියව තේරුම් අරන් ඉන්නේ... අක්කා මේ ඔක්කොම විඳගෙන ඉන්න එකයි පුදුමේ...'

'මට මේ කොල්ලව සනීප උනොත් ඇති... මහගෙදර මට නැති උනත් කමක් නෑ...'

මේධා එහෙමම කීවාය.

'නැන්ද ඔය තරහට කියෙව්වට අක්කා ගැන අහිතකින් නෑ... එයා හිත යටින් සතුටු වෙනවා අක්කයි අයියයි හොඳට ඉන්න එක ගැන...'

හිමාලි යටි සිතෙන් හිනැහෙමින් කීවාය. 'කොහොමත් උඹට ඉස්සරහට මහ ගෙදරට ගොඩ වෙන්න මං ඉඩ තියන්නෑ...' හිමාලි සිතින් කීවාය.

'දැන් නංගී කැම්පස් යන්නෙම නැද්ද...'

'ගොඩක් ලෙක්චර්ස් මග ඇරුණා අක්කේ... ඒ ගැන මං දැන් හිතන්නේ නෑ...'

හිමාලි ගියේ පැයක් පමණ මේධා සමඟ කතා කරමින් සිටය.

'අ..ක්..කා මහ ගෙදර නැවිත් ඉන්නත් එපා... ඒ අක්කගෙත් මහ ගෙදරනේ...'

මේධා සිනාසුණාය.

'මගෙන් වරදක් වුණානම් තව පාරක් මට ස..මා..වෙ..න්..න අ..ක්කේ... මං ය..න්..න..ම්...'

'එ..හෙම ප්‍රශ්නයක් නෑ නංගී...'

'මං ය..න්..නම් අක්කේ...'

'හොඳයි නංගී...'

හිමාලි ගියේ මේධාව වැළඳගෙන ඇගේ දෙකම්මුල්ද සිපගෙනය.





මේධා හිමාලි යන තුරුම බලාගෙන උන්නාය. ඇය හිමාලි ගිය වනම සක්විතිට ගත්තාය.

'ම..හ..ත්..තයෝ... ඔයා කොහෙද...'

'මං තා..ම හො..ස්පිට්ල් එ..කේ බබා ඇයි...'

'නෑ.. මේ... හිමාලි දැන් ටිකකට කලින් ආවනේ... මෙ..හේ...'

'මට කියලා ගියේ...'

'මේ මො..ක..ද මහත්තයෝ...'

මේධා ඇසුවාය.

'ගැණි මෙතනත් දගෙන ඇඩුවා...'

'මට වැ..න්..දැ..ත් එ..ක්ක...'

'අ..නේ මන්ද බබා...'

'කපටිකමක් කරනවා කියලා හිතන්න අමාරුයි... ඇරත් ඔයාගෙනුයි මගෙනුයි සමාව අරන් මොනා ගන්නද...'

'ම්.. ගැණිත් මේකට මැරෙන්න යනවා... හිතෙත් ආදරයක් ඇති... මං බණිද්දිත් ආවේ ඒකනේ...'

'ම්...'

'බ..ල..මු බ..බා...'

'කෙල්ලව දක්කාමනම් හිතෙනවා ඒකිත් මල්ලිට නරකම නෑ කියලා... ල..ස්ස..න කෙ..ල්ල...'

'කොහොමත් අපේ එකාට තීරණයක් ගන්න වෙනවා... නැත්නම් ආයෙත් ඒකගේ ජීවිතේ වතුරේ... අම්මා ජීවත් වෙනකං වර්ෂව ගේන්න බැනේ...'

'අනේ ම..න්..ද... හොඳ විදිහකට මේවා විසඳෙනවා නම් හොඳයි...'

'හැබැයි හි..මාලිටත් ලොකු කැක්කුමක් නම් තියෙනවා මේකා ගැ..න... ලෙක්චර්සුත් පාඩු කරගෙන මූව බලා ගන්නේ...'

'ම්.. මං තියන්..නම්...'

මේධාට වරින් වර වර්ෂාව සිහි වන්නට විය.

'ස..ම..හර විට කෙල්ලේ උඹට මේ ආත්මේ විමුක්ති ළඟට එන්න වාසනාවක් නැතුව ඇති... උඹත් ඒක දන්නවා ඇති...'

මේධා සිතුවාය.

'මං උඹට හැමදමත් ආදරෙයි... ඒත් උඹ වෙනුවෙන් පෙනී ඉන්න මට හැමදම අමාරු වෙයි... එහෙම උනොත් මගේ පවුලත් ඉරි තලන්න පුළුවන්... මට මහ ගෙදර නැති කරගන්නත් බෑ... ප්‍රශ්න ඇති කරගෙන මේ රට දාලා යන්නත් මං ආස නෑ...'

සමහර විට සක්විති කියන්නාක් මෙන් වර්ෂා ඇගේ ජීවිතය ගැන මොනවා හෝ තීරණයක් දැනටමත් ගෙන ඇතැයි මේධාටද සිතුණි.





Hemantha007
For Free Distribution Only

# 21

එළඹෙමින් තිබුණේ තීරණාත්මක පැය විසි හතරකි. විමුක්ති තවමත් ඉන්නේ තද දිග නින්දකය. දැන් වේලාව දහවල් එකය. විමුක්ති හෙට හවස් වන තුරුම මෙහෙමම සිටිය යුතුයැයි වෛද්‍යවරයා නියම කළේය.

ඔහු නැගිටිද්දී ඔහුගේ පියවි සිහිය යම් පමණකින් ලැබී තිබෙන්නට බොහෝ දුරට ඉඩකඩ ඇතැයි වෛද්‍යවරයා සිතුවේය.

දැඩි සත්කාර ඒකකයට ආ හිමාලි විමුක්තිගේ ඇඳ ළඟට වී සෑහෙන වේලාවක් උන්නාය. බටර් පාට සාරිය ඇඳගෙන උන් ඇය ඔහු දෙස බලා උන්නේ තොල් පට තද කරගෙනය.

'මං අදයි ඇත්තටම ඔයාව අයිති කර ගන්න මෙහෙයුම පටන් ගත්තේ... අයිති කරගෙන මිසක් මේ හිමාලි ය..න්..නෑ... මේ ජීවිතේ වටේ අරකිගේ අවතාරේ තියෙනවා... මං ඒකිට වඩා ගොඩක් හොඳ කෙනෙක් කියලා මං ඔප්පු කරලා පෙන්නනවා... ඒ ඇරෙන්න මට මාර්ගයක් නෑ... කොහොමත් මං මේ සටන දිනනවා... ඔයාට මට

'ආදරේ නොකර ඉන්නම බැරි තැනට මං ඔයාව ගේනවා... ඊට පස්සේ ඔයා මේ සුදු කකුල් දෙක ඉඹ ඉඹ ඉඳී... වැටිලම ඉඳී...'

හිමාලි විමුක්තිගේ ගිලන් මුහුණ දෙස බලාගෙන එහෙම පැතුමක් කළාය.

හිමාලි විමුක්තිගේ ඉහ ඉද්දර ඉඳ විමුක්තිගේ අවුල්ව තිබූ හිසකේ ඇඟිලි තුඩු වලින් සැකසුවාය. නවලෝක රෝහලේ සේවය කරන ප්‍රියංවදගේ මිතුරිය ප්‍රියංවදගේ කීමට විමුක්තිව බලන්නට දැඩි සත්කාර ඒකකයට ආවේ ඒ මොහොතේදීය.

දුටු දෙයින් සුජානිට කිසිවක් සිතා ගන්නට බැරි විය.

'කෙ..ල්ලෝ දෙන්නෙක්ම එයාට ආදරේ කරනවා වගේ...'

සුජානි සිතුවාය. ඇය දැඩි සත්කාර ඒකකයේ මිතුරු හෙදියක් ළඟට ගියේ නිකමටය.

'අ..ර පේෂන්ට්ට කො..හොමද නිරංජි අක්කේ...'

'දිගටම නින්ද යන්න බෙහෙත් දීලා තියෙන්නේ... එයාට සනීප වේගෙන එන්නේ...'

'මේ.. එයාගේ...'

'කවුද කියලා පේනවනේ... ආවාම ඔහොමයි... බලාගෙනම ඉන්නවා... හරි ආදරේ ඇති...'

'ම්...'

සුජානිට පුදුමය. ඇය හිමාලි දෙස හොඳින් බැලුවාය. ඇය වර්ෂා තරම්ම ලස්සනය.

'අ..නේ මන්ද...'

සුජානි හූල්ලමින් සිතුවාය. සුජානි ගියේ හිමාලි දෙස බලා සිනාසෙමිනි. හිමාලි ඇය හා සිනාසුණේ සුහදවය.

'ඇ..තු..ලේ ඒසී එකට මිස් කොණ්ඩේ වේලිලා තියෙන්නේ...'

සුජානි නිකමට හිමාලිට කීවාය.

'ඔ..ව් හොඳටම වේලිලා...'





'අයි සී යූ ඉන්නකොට ඔහොම තමයි... බයවෙන්නෙපා... තොල් වේලිලා ඇස් ගිලිලා වගේ ඉන්නේ... බයවෙන්නෙපා...'

'මට ඒ..ත් බ..ය..යි...'

හිමාලි දුක්බර ලෙස කීවාය.

'ය..න්..නම් මිස්...'

'හො..දයි...'

සුජානි පහළට ගියේ දහසක් දේ සිතමිනි. 'වර්ෂත් විමුක්තිට මැරෙනවා... මේ ඉන්න කෙල්ලත් හරි ආදරෙයි වගේ...' මොනවා වෙන්නට යනවාදැයි සුජානිට සිතා ගත නොහැක.

ඇය ප්‍රියංවදට ගත්තේ පහළට ගොස්ය.

'ප්‍රියා ම..ම...'

'සු..ජා.. අයියට කොහොමද...'

'විමුක්ති අයියා ඉන්නේ අයි සී යූ යුනිට් එකේ... දිගටම නින්ද යන්න බෙහෙත් දීලා තියෙන්නේ... ටි..ක ටික සනීප වේගෙනලු එන්නේ...'

'අ..නේ ඇත්තද...'

'ම්.. ප්‍රියා...'

'ඇයි සූජා....'

'උ..ඹ මේක වර්ෂට කියන්නෙපා...'

'ම්...'

'විමුක්ති අයියා ළඟ අර ගර්ල් දිගටම ඉන්නේ... ඔළුව අතගගා...'

'මං ද..න්..නවා සුජා... කෙල්ලට එහෙම ඉන්න බෑනේ...'

'ඒ..ත් ප්‍රියා... මේ කෙ..ල්ල හ..රි ආදරෙන් ඉ..න්..නේ...'

'වැ..ඩ..ක් නෑ සුජා... අයියට සිහිය ආවාම කෙල්ලවමයි හොයන්නේ...'

'ම්.. කො..හොමත් ඉ..ක්..මනට සිහිය නම් එයි...'

සුජානි කීවේ සුසුමක් හෙළාය.

හිමාලි නවලෝක රෝහලින් පිටවූයේ පැයකට පමණ පසුය. අද හොඳ දවසකැයි හිමාලිට සිතුණි.

හිමාලි රෝහලින් පිටට ඇවිදගෙන ආවේ සැහෙන දේවල් සිතමිනි. විමුක්තිට සිහිය ආ පසු කරන්නට දහසක් දේ ඇත. ඔහුගේ ජීවිතයට කිට්ටු විය යුත්තේද මේ ලෝකයේ ඉන්නා අහිංසකම කෙල්ල තමා බව ඔප්පුවෙන ලෙසිනි. ඒ ටික කරන්නට අමාරු නොවන බව හිමාලි දනී.

'අරකිට එකපාර විමුක්තිගේ ජීවිතේට එ..න්න බෑ... ඒකි විනාඩි පහකට ඇවිත් ගියේ ඒකනේ... ඒකත් හරි බයෙන්... එහෙමවත් ඒකිට ළං වෙන්න තියන්න නරකයි... විමුක්ති ළඟම ඉන්න ඕන...'

ඒ ටික සුරම්‍යා ලවා කර ගත හැකි බව හිමාලි දනී.





# 22

ප්‍රියංවදා සිතුවේ හිමාලි ගැනය. ඇය මංජුලා නොවේ. මංජුලා නම් බයක් නැත. ඇය විමුක්තිගේ හිතට කොහොමටවත් ළං වෙන්නට බැරි හෝන්තුවකි. ඒත් හිමාලි එහෙම නොවේ. හිමාලිවත් විමුක්තිවත් ප්‍රියංවද මුලින්ම දක්කේ මාළිභාව ළඟදීය. ඇය විමුක්තිව අල්ලාගෙන මාළිභාවට ගිය අයුරු ප්‍රියංවද සිහි කළාය.

'පිරිමියෙක්ට නිකම්ම එහෙම ළංවෙන්න ගෑණියෙක්ට බෑ... පපුවේ ලොකු දෙයක් තියෙන්නම ඕන...'

ප්‍රියංවද සිතුවාය.

'ඒකිත් සටන අත් අරින්නෙම නෑ... එද විමුක්තිව අරගෙන මාළිභාවට ආවෙත් බාර වෙන්න වෙන්න ඇති... අද වෙනතුරුත් ඒකි අයියා ගාවට වෙලා ඉන්නවා... ළඟටම වෙලා ඔළුව අතගගා ඉන්නවලු...'

ප්‍රියංවද බය වූයේ හිමාලිද වර්ෂා වෙන්ම යුවතියක් නිසාය. මංජුලා වැනි සංකර කෙල්ලෙකුට කරන්නට බැරි දෙයක් හිමාලිට කරන්නට පුළුවන් බව ප්‍රියංවද දනී.

'මොනවා උනත් අයියට සිහිය එද්දී එයා ගාව ඉන්නේ හිමාලි... සාත්තු කරන්නේ හිමාලි... රෑක් දවාලක් නැතුව එයා අයියා ගාව ඉන්නවා... මොනවා වෙන්න බැරිද...'

පිරිමි ගැන මහ විශ්වාසයක් ප්‍රියංවදගේ සිතේ නැත. විමුක්ති ගැන වර්ෂාගේ හිතේ ඇති විශ්වාසයට ප්‍රියංවද ගරු කළාය. එහෙත් ඔහු අයත් වන්නේද සුලභ පිරිමි අයත් වන ගොඩටය. විමුක්ති යනු දෙවියෙක් නොවේ.

'වෙන දෙයක් වෙයි... දුක මෙකි බලාගෙන ඉන්න එක පැලීගෙන...'

එහෙත් විමුක්තිට එසේ කරන්නට ඉඩ දියද නොහැක. දන් ඔහුගේ ලෙයින් තවත් ජීවිතයක් ඉපදී අවසානය.

'එ..යා එ..හෙම දෙයක් කරන්න යනවා නම් කොළඹ යන්නේ මම... කෙල්ල නෙමේ... ගිහින් මහ ගෙවල් දෙදරන්න කෑ ගහනවා...'

කොහොමත් අනාගතය එතරම්ම විශ්වාස නැත. ප්‍රියංවද දුරකථනය තබා දෙරකඩට පැමිණ බැලුවාය. වර්ෂා උන්නේ හෝටලයේ ලැලි මේස ගහන තැනය. මේ හෝටලය පටන් ගන්නේ ඇගේ හිතේ ඇති ධෛර්යටමය.

ප්‍රියංවදට කෙල්ල ගැන දුකය. හිමාලි කියූ සමහර දේවල් ඇයට කිව යුතු නැතැයි ප්‍රියංවද සිතා ගත්තාය.

'සු..ජා ක..තා ක..ළා..ද ප්‍රියා...'

ප්‍රියංවද දුටුවනම වර්ෂා ඇසුවාය.

'ද..න් ග..ත්ත කෙල්ලේ...'

'ඉ..තින් අයියට කො..හොමද...'

'දන් අයි සී යූ එකේලු ඉ..න්නේ...'

'අ..නේ දෙයියනේ අයි සී යූ එකේ... ඇ..යි ප්‍රි..යා...'

'අයියට නින්ද යන්න බෙහෙත් දීලලු තියෙන්නේ... ඩොක්ටර් කියන්නේ අයියට සනීප වෙගෙන එනවා කියලලු...'





කෙල්ලගේ ඇස්වල කඳුළුය.

'එ..යා..ට ස..නීප වෙනවා ප්‍රියා... මට ඒක දනෙනවා...'

'ම්...'

'ස..නීප වෙද්දී ළඟ ඉන්න තිබ්බනම්...'

'ඒ වාසනාව වෙන කෙනෙක් ළඟ' ප්‍රියංවදට කියන්නට සිතුණේ එහෙමය.

'අපිට ඕන අයියව සනීප වෙන්නනේ කෙල්ලේ...'

'ම්...'

'දන් ඉතුරු ටික අයියට දීපන්... එයාට සිහිය ආවට පස්සේ එයත් දුකක් විඳින්නෙපැයි... නේද...'

වර්ෂා කතා කළේ නැත.

'ය..න්..න හදන්නෙපා කෙල්ලේ... අයියට එ..න්න දීපන්...'

'නෑ ප්‍රියා... මං කො..හොමත් ය..න්..නෑ... එයාට මාව හොයාගෙන එ..න්..නම වෙ..නවා...'

'සමහර විට නැවිදින්ම ඉඳී...' එසේ කියන්නට සිතුණ මුත් ප්‍රියංවද කීවේ නැත.

'ප්‍රි..යා...'

'ම්...'

'ලබන සතිය අග විතර අපට පුළුවන් හෝටලේ පටන් ගන්න...'

'කල් ඇත්ද...'

'ඇති ප්‍රියා... තවත් හිරවෙන්න බෑ...'

'ම්.. අපි වෙලාවක් බලමු...'

වර්ෂා දුක්බර ලෙස සිනාසුණාය. වේලාව හොඳද නරකද කියා දන්නේ දෙවියන් පමණි.

වර්ෂා දිගටම සිතුවේ විමුක්ති ගැනය. 'ඔයා ආවොත් ඔයාට කියන්න කොච්චර දේවල් තියෙනවද...' ජීවිතේ අමාරුම දවස් ටික

දරා ගත්තේ කවද හෝ ඔහු එන බව දනගෙනය. ඒ විශ්වාසයෙනි. ඔහු එනතුරු ජීවිතයේ මේ ඉතුරු දුකත් දරාගන්නවායැයි වර්ෂා සිතා ගත්තාය.

කවද හෝ දවසක ඔහුගේ වාහනය මේ අනුරාධපුර මාර්ගය දිගේ පැමිණ මේ කොහොඹ ගහ යටින් මේ මිදුලට දමන බව වර්ෂාට සහතිකය.

'එදට මේ ආත්මේ මං ලබන ලොකුම සතුට මට දනෙයි...'

ඒ සතුට ඇයට දෙන්නට විමුක්තිට හැකි වේද... එය දන්නේ ඔහුත් දෙවියනුත් පමණි.





# 23

හිමාලි සිතුවේ මේධා ගැනය. 'ගෑණි මේ වෙලාවේ මහ ගෙදරින් කැපිලා ඉන්නේ... ඒක ගෑණිට දරුණුවට බලපාලා තියෙනවා. එයාට ආයෙත් මහ ගෙදරට එන්න පුළුවන් විදිහක් මං හැදුවොත් ගෑණි මං ගැන මාර විදිහට පැහැදෙනවා. මං ගැන හිතේ තියෙන කහටත් යනවා. විමුක්ති සනීප වුණාම නැත්නම් එයාව චුත් කරන්නේ එයා තමා... කෙළින්ම විමුක්තිව අරකි ගාවට යවයි...' හිමාලි සිතුවාය.

'ගෑණිටත් කොහෙවත් ඉන්න කෙල්ලෙක්ට වඩා එයාගේ මිනිහගේ මහ ගෙදර වටිනවා ඇතිනේ...' හැම ගෑණියෙක්ම එහෙමයි. හිතන්නේ තම පවුල ගැනය.

හිමාලි හිමිහිට සුරම්‍යාට ළං වූයේ මේවා සිතමිනි. සුරම්‍යා උන්නේ කාමරයේය. හවසට බෙල්ලන්විලට වත් යන්නට ඕනා යැයි සුරම්‍යා සිතමින් උන්නාය.

'නැ..න්..දේ..'

සුරම්‍යා සිනාසුණේ දයාබර ලෙසිනි.

'අද පාන්දරම ගියාද...'

'ඔව් නැ..න්දේ රෑ..ම මං නිදි නෑ... පස්සේ පහට විතර ඇඳගත්තා...'

'අනුලා මට කිව්වා පාන්දරම ගියා කියලා...'

'අයි සී යූ එකේ ඉන්නවා දක්කම බලන් ඉන්න බෑ දුකයි... තොල් කට වේලිලා ගිහින්... පැය කීයක්ද...'

'මා..ත් ලොකු පුතාට කතා කළා... හවස යනවා බලන්න... යන්නැත්තේ දුක නිසා... මටත් බලන් ඉන්න අමාරුයි දුවේ...'

'එ..හෙම ත..නි ක..ර..න්නත් බෑනේ නැන්දේ...'

හිමාලිගේ මේ වචන සුරම්‍යාව පුදුමාකාර ලෙස රසවත් කළේය. පවුලට සම්බන්ධ වෙන කෙල්ලෙකුගේ හිතේ තිබිය යුත්තේ මේ කැක්කුමය.

'නැ..න්දේ...'

'ම්...'

හිමාලි සුරම්‍යා ළඟින්ම වාඩි වූවාය.

'මං නැ..න්දේ අද ස..ක්විති අයියලගේ ගෙදරටත් ගියා...'

'එ..හේ...'

'ඔව්... මේධක්කව හම්බවෙන්න...'

'මො..නවම හරි කියන්න ඇති...'

'නෑ නැන්දේ... අක්කා එහෙම මොනවත් කිව්වේ නෑ... එයත් ඉන්නේ හරි දුකින්...'

සුරම්‍යා හිමාලි දෙසම බලා උන්නාය.

'නැ..න්..දේ... පවුලට කො..හෙ..ත්ම සම්බන්ධ නැති මේ පිට කෙනෙක් නිසා මේ පවුල කඩා වැටෙන්න දෙන එක හොඳ නෑ නේද...'

'මාත් කියන්නේ ඒකනේ දුවේ... මේ දෙන්නට මේක





තේරෙන්නැනේ...'

'ඒ පිට කවුරුවත් නෙමේනේ නැන්දේ... පුතයි ලේලියිනේ... අපි එයාලගෙන් ඈත් වෙනකොට එයාලත් අපෙන් ඈත් වෙනවා... නැන්දට නැන්දගේ ලොකු පුතාව අමතක කරන්න පුළුවන්ද... අර පොඩි කෙල්ලව... එයාලා මේ රටවල් දාලා ගියොත් නැ..න්දේ... කො..හොම ද..රා..ග..න්..න..ද...'

සුරම්‍යාට ඇඬුණි. ඇය එහෙමම හිමාලිගේ උරතලයට සුරත තැබුවාය.

'ම..ට..ත් ඒ..ක වාව..න්..නෑ ත..මා දුවේ... මේධා නර..ක කෙල්ලෙක් නෙමේ... හරිම හොඳයි... ඔය ලොක්කව හැදුවේ එයා... මේ අර පට්ට බැල්ලි තමා ඒ කෙල්ලවත් මගෙන් ඈත් කළේ...'

'එයා නිසා තමන්ගේ අයව නැති කරගන්නෙපා නැන්දේ... මේධක්කා දැන් තනිවෙලා ඉන්නේ... අයියත් ගොඩක් වෙලාවට ගෙදර නෑ... පව්... තනියම ඔය වැඩ කොහොම කරගන්නවද දන්නෑ...'

සුරම්‍යා කඳුළු පුරවාගෙන හිස වැනුවාය.

'මේ පවුලට දහයක් දෙළහක් නෑ... අයියලා දෙන්නයි මේධක්කයි විතරයි ඉන්නේ... එයාලට විසිරෙන්න දෙන්නෙපා නැන්දේ... නැන්දට සැනසීමක් නැති වෙයි... එක පුතෙක් විතරක් ඉඳලා අම්මා කෙනෙක්ට සැනසීමක් නෑ...'

සුරම්‍යා හිමාලි දෙස බැලුවේ ඇගේ වචනවලට වශී වී ගිය හදවතිනි. නන්දනී හඳ ඇත්තේ කොතරම් හොඳ කෙල්ලෙක්දැයි සුරම්‍යා සිතුවාය.

'මේ ඔක්කොම දාලා සක්විති අයියා ගියොත් ඒ මිණිපිරිව නැන්ද කවද දකින්නද... එ..හෙම ඉන්න පුළුවන්ද... බෑනේ...'

'ඔ..යාවත් හිටිය එක කොච්චර හොඳද මේවා කියන්න...'

'මං මේ පවු..ලට හ..රි ආදරෙයි නැන්දේ... මේක දෙයියන්ගේ බැල්ම තියෙන පවුලක්...'

'ඔ..ව් ඒ දේව බැ..ල්ම පහුගිය කාලේ නැතිවෙලා තිබ්බේ...'

'එ..හෙ..ම වෙ..න්..න දෙන්නෙපා... ලේලිලා දිහා තරහින් බැලුවාම ලේලිලත් පස්සේ වෛර බැඳ ගන්නවා... එතකොට පවුල් අවුල් වෙනවා... මේධක්කා හරිම හොඳ කෙනෙක්... මා..ත් අදයි දැනගත්තේ... මං එයාගේ කකුල් දෙක අල්ලලා වැඳලා ආවේ...'

'ඔ..යා ක..රපු දේ ගොඩ..ක් හොඳයි...'

'හිතන්නකෝ නැන්දේ එයාලට කවුද ඉන්නේ...'

'ම්..'

'මේ පවුල අවුල් කළේ එක්කෙනෙක්... ඒත් ඒ තරහව ඉන්න අය පිටින් යවන්න හොඳ නෑ... මේධක්කයි දූවයි අයියයි මේ ගෙදර එන්නැත්නම් මේක කොහොමද මහ ගෙදර වෙන්නේ... මොන දුක උනත් මෙතනට දුවගෙන එන්න එයාලට ඉඩ තියන්න ඕන... මේ එයාලගේ ඇත්ත ගේ...'

සූරම්‍යා හිමාලිගේ හිස පිරිමැද්දය. 'මේ ගෙදර පොඩි ලේලි වෙන්න ඕන ඔයාම තමා...' සූරම්‍යා තවත් වරක් සිතා ගත්තාය.

'අ..යියටත් ස..නීප උ..නාම නැ..න්දේ මේ ගෙදර කිරි දානයක් දීලා පිරිතක් කිව්වොත්...'

'මා..ත් හි..ත..න් ඉ..න්නේ දුවේ... හිතේ නිදහසක් තිබ්බේ නෑ...'

'ඒ වගේ දේවල් පහු කරන්න නරකයි... මට දෙයක් හිතෙනවා...'

'මො..ක..ක්..ද...'

සූරම්‍යා ගැස්සී මෙන් ඇසුවාය.

'නෑ.. මං රෑට ගොඩක් වෙලාවට ඇහැරිලානේ ඉන්නේ...'

'ඉතින්...'





'අමුතු සද්ද එනවා... මං ගේ වටේම ගිහින් බලනවා... හිටපු ගමන් මහ අමුතු හුළං පාරවල් එනවා... ජනේලෙත් වහලා... කොහෙන් එනවද දන්නෑ...'

'මේ ගෙදරට බැල්ම දන්නේ එක බැල්ලියයි... ඒ අර මෙහේ හිටපු එකීගේ අම්මා... නාලිනී...'

'ම..ට..ත් හි..තෙනවා... ඒ..කයි මං නැ..න්..දට කිව්වේ පිරිතක් වත් කියමු කියලා...'

'ඒක ඇත්ත...'

'මේ ගෙදර කවුරුවත් සැනසීමෙන් නෑ නැන්දේ... බලන්න... මේධක්කා සක්විති අයියා මේ ගෙදර ලොකු පුතයි ලොකු ලේලියි... දෙන්නම දැන් ගෙදර එන්නෑ... පොඩි පුතා හොස්පිට්ල් එකේ... මාමත් ගෙදර එන්නේ මහ රෑ වෙලා... අපි දෙන්නා විතරයි ගෙදර ඉන්නේ... ඒත් හිතේ දුකින්...'

'ඔ..යා කියන්නේ ඇත්ත...'

'ඉඩක් තියෙන වෙලාවක නැන්ද මේධක්කවයි දූවවයි බලන්න යන්න... කවුරුවත් නිසා නැන්ද නැන්දගේ දුවෙක්ව තරහ කරගන්නෙපා... ඊට පස්සේ නැතිවෙන්නේ ලොකු පුතා... ඒක දරාගන්න බැනේ...'

හිමාලි ලස්සනට කීවාය. සූරම්‍යා ගාණට වශී වූවාය.

'මං හවස් වෙලා ය..න්..න..ම්... මේ පවුල ආයෙත් එකතු වුණොත් ඒ ඔයා නිසා දුවේ...'

හිමාලි හිත යටින් තමාටම සැලියුට් ගසා ගත්තාය. ඇයට ඕනා කළෙත් මේ ටික කරගන්නටය. අද මෙහෙම කියන්නේ ඇය පමණි. එහෙත් හෙට හැමෝම එසේ කියනු ඇත. එදාට විමුක්තිට අහක බලන්නටම බැරිය.

# 24

හිමාලි හවස් යාමයේ මොරගොඩ නිවස වටේම ගියාය. ඇය උන්නේ එක සිහිනයකින් දවෙමිනි. ඇය මේ ඒ හීනය පාට කරමින් ඉන්නා දවස්ය.

'මේ ගෙදර වටේ ඇවිදින්නම පැයක් යනවා... ගෙයක් නෙමේ සාගරයක්නේ... මේ ගෙදර යතුරු ටික මගේ අතට ගත්ත දවසට තමා මේ හිමාලිට නින්ද යන්නේ...'

උඩු මහල පුරා ඇවිදිමින් හිමාලි සිතුවාය.

'මං දන් මේ සටන දිනන්නේ කොහොමද කියලා හොඳට දන්නවා... මොරගොඩලා එක්ක ජීවත් වෙන්න ඕන අමුතුම යාප්පුවකින්...'

හිමාලි ඉහළ මාලයේ සිට පහළට ආවේ සන්සුන්කමකිනි. මේ නිවස කොහොමටත් අත් හරින්නට දන් බැරිය. ඇය විමුක්තිගේ කාමරයට ගොඩ වී ඔහු අවසන් වරට ඇඳගෙන උන් කමිසය අතට ගත්තාය. ඊටත් පසු එය මුහුණට මොහොතක් තබා ගත්තාය.

'ම..ට ඔයාව දන් නැතුවම බෑ... ඉක්මනට ඔයාව මගේ ගාවට





ගන්නවා... අර පල්ලෙහා කාමරේ තනියම මට නිදගන්න බෑ...'

එක් පැත්තකින් පපුවට දනෙන ආශාවත් අනිත් පැත්තෙන් දනෙන ලෝබකමත් හිමාලි ඉවසාගෙන උන්නේ අමාරුවෙනි.

'එ..ක රැක් ඔයා මට දෙන්න... ඊට පස්සේ අපි හැමදම එකට ඉඳී... ඔයාට මේ හිමාලිව නැතුවම බැරි වෙයි...'

හිමාලි කීවේ වෙව්ලමිනි.

'ඔයා සිහිය ඇවිත් මේ ගෙදරට එන්න... මං ඔයාගේ ජීවිතේ පුරාම ඇවිදින්න ගන්නවා... ඔයාට වර්ෂා කෙනෙක් ඔයාගේ ජීවිතේ උන්නද කියලවත් අමතක කරනවා...'

හිමාලිට සිහිවූයේ රෝහල් කාමරයේදී වර්ෂා විමුක්තිව අසිහියෙන් මෙන් සිපගෙන සිපගෙන ගිය අයුරුය.

'එ..හෙම ඉම්බේ විමුක්ති ඒකිගේ කියාල හිතාගෙන... එහෙම වෙන්න මං ඉඩ තියන්නෑ...'

තද දම් පාට සායට ලා රෝස පාට බ්ලවුසයක් ඇඳ උන් හිමාලි උඩ සිට පහළට එන අයුරු අනුලා පහත සිට බලාගෙන උන්නාය.

'සමහර විට මේ ලස්සන දකලා පුංචි මහත්තයත් පිස්සු වැටෙයි...'

අනුලා සිතුවාය. ඇත්තටම හිමාලිට තිබුණේ පිරුණු සුන්දර රූ සපුවකි. ඇය ඇඳගෙන උන්නේ ඇඟට තරමක් තද වූ සායක් නිසා ඒ පිරුණු රවුම් උකුල සුන්දරව නෙරා විත් තිබුණි.

'කම්මැලිකමට උඩ ඇවිද්ද අනුලා... පු..දුම පාළුයි ගේ...'

'එ..හෙම තමා පුංචි නෝනා... පුංචි මහත්තයත් නැනේ...'

'ම්.. දන් සනීප වෙලා ආවාම ගේම පිරිලා තියෙයි...'

'පුංචි නෝනට දෙඩම් ටිකක් හදලා දෙන්නද...'

'මො..නවත් බොන්න බෑ අනුලා... යටි බඩම රිදෙනවා...'

'ආ.. ඒ ඇයි...'

'අනේ මන්ද මේක හැදුණාම පුදුම අමාරුයි... ඉවසන්න බෑ...'

අනුලා සිනාසුණාය.

'බැන්දට පස්සේ ඕවා හරියනවා...'

'ඒ කොහොමද...'

හිමාලි රහසින් මෙන් ඇසුවාය.

'බ..ල..න්..නකෝ බැන්දම...'

'ඉතින් කියන්නකෝ මොකද වෙන්නේ කියලා...'

'ද..වස ගානේ ඉතින් මහත්තයෙක් එ..ක්ක ඉ..න්..නවනේ...'

'අ..නු..ලා ඉ..න්..නවා වගේ...'

හිමාලි පෙරේතකමින් ඇසුවාය.

'මේ දවස්වල ටිකක් නිදහස්...'

දෙන්නාම සිනාසුණේ එකටය.

'ඉ..තින් හිටියා..ම...'

'එ..තකොට ඉ..තින් ඔය අමාරු නෑ...'

හිමාලි සිතුවේ විමුක්ති ගැනය. ඇගේ ගත පුරාම තුනී විදුලියක් පැතිරීගෙන ගියේය.

'කෝපි එකක් හදලා දෙන්නද...'

'බොමු...'

හිමාලි අනුලාත් සමඟම කුස්සියට ගියාය.

'පුංචි නෝනා...'

'ම්...'

'අනේ මං පුංචි නෝනගෙයි ලොකු නෝනගෙයි කතාව අහන් හිටියා නෙමේ...'

'ම්...'

'ඒත් මට ඇහුණා... මේධා නෝනා ගැන අරම ලොකු නෝනට කිව්ව එක නම් ලොකු දෙයක්...'





'අක්කා පව් අනුලා...'

'ඇ..ත්..ත..ටම පව්.. එච්චර හොඳ කෙනෙක්...'

'මට ඒකිගේ හොඳින් වැඩක් නෑ... මං ගැහුවේ ගහන්න තියෙන හොඳම තුරුම්පුව' හිමාලි සිතුවාය.

'මේ පවුල එකට ඉන්න ඕන අනුලා...'

'ඇත්ත පුංචි නෝනා... මේධා නෝනා මේ පවුලට හරි ආදරෙයි...'

'අරම මේවා වෙද්දී ඉතින් නැන්දත් කලබල වෙනවනේ...'

අනුලා වර්ෂා ගැන කතා කළේ නැත. හිතට එකඟව ඇයට දෙයක් කියන්නට අනුලාට නොහැක.

'හෙට වෙද්දී වත් පුංචි මහත්තයට සිහිය ආවොත් හොඳයි...'

'අයියා සනීප වෙයි අනුලා... බය කවුරුහරි ආයෙත් ලෙඩ කරයිද කියලා...'

හිමාලි කීවාය.

'මො..නවා හරි කමක් නෑ හොඳ දෙයක් උනොත් හොඳයි... මේ ගෙදර ඉස්සර හරි සාමයෙන් තිබ්බ ගෙයක්...'

'ඒත් මං එද්දී තිබ්බේ මළ ගෙයක් අනුලා...'

'නරක කාල එනවනේ පුංචි නෝනා...'

'ම්... අනුලලා ඇයි තවම ගෙයක් දෙරක්වත් හදාගන්න ගත්තේ නැත්තේ...'

'අනේ හැමදම හිතනවා පුංචි නෝනා... මාත් ඩනේට කියනවා...'

'අනුලලට මැරෙනකල් මෙහේ ඉන්න පුළුවන්... ඒක ඇත්ත... ඒත් ඉතින්...'

'කවුද ආස නැත්තේ පුංචි නෝනා ගෙයක් දෙරක් හදාගන්න තමන්ගෙම කියලා...'

'හිමිහිට ගෙවන්න ඉඩමක් වත් ගන්නෙපැයි... දූන් දරුවත් ඉන්නෙකේ..'

'ඒ..ක..නේ...'

'අයියා සනීප උනොත් මං අයියට හිම්හිට කියන්නම්... අයියා අරන් දෙයි...'

'අපි කියන්නේ කොහොමද පුංචි නෝනා...'

'ඉ..න්..න..කෝ... මං ඒක කරලා දෙ..න්..න..ම්... අනුලයි ධනේ අයියයි මේ ගෙවල්වල වැඩ කරන එක හරි කියමු... ඒත් දරුවාත් මේ වලටම යට කරන්න එපා... එයාලට හොඳට උගන්නලා තැනකට ගන්න...'

අනුලා හිමාලි දෙස බැලුවේ ගෞරවයෙනි. ඇය කියන්නේ ඇත්ත බව අනුලා දනී. මේ දක්වා කවුරුවත් එහෙම කියා නැත.

'කවදහරි හොඳ ඉස්කෝලෙකට දලා හොඳට උගන්නන්න...'

'ම්.. මූ..ණ දිහා බලාගෙන මාත් හිතන්නේ ඕවා තමා...'

'උඹලා එහෙම හිතන බව දන්න නිසා තමා මං මෙහෙම කියන්නේ...' හිමාලි සිතින් කීවාය.

'අඩුම ගානේ දරුවට අවුරුදු පහක් වෙද්දිවත් ඔයාලගේ ගෙයක් දෙරක් හදගන්න...'

'අනේ එහෙම කිව්වටත් පින් පුංචි නෝනා... හිතට හරි හයියයි...'

'ධනේ අයියටත් කියන්න ඉඩම් කෑල්ලක් බලලා මාමා එක්ක කතා කරන්න කියලා... එයත් ජීවිත කාලෙම මේ වාහනම කරකවන කෙනානේ... අතක් හිරිවැටිලා ගියොත් කොහේ ඉන්නද...'

අනුලා හිස වැනුවාය. හිමාලි මෙහෙම කියද්දී අනුලා ඇයට පුදුමාකාර ලෙස වහ වැටුණාය. ගෑණි සෑහෙන්න දන් හිතන්න ගන්නා බව හිමාලි දනී.

'ආ පුංචි නෝනා... මං ටිකක් තදට හැදුවේ... එතකොට අඩුවෙයි...'

'මේක අඩුවෙන්න නම් ඔයා කියනවා වගේ බඳින්නම වෙයි...'





හිමාලි කීවේ තොල් පට තද කරගෙනය. හිමාලිගේ නෙත් පුරා වූයේ අනුරාගී බවකි. ඇය කාමරයට ගියේ සාලයේ වූ විමුක්තිගේ පින්තූරය දෙස බලාගෙනමය. 'අපි එකට තුරුල් වෙලා හිටපු රෑවල් මට තාමත් මතකයි... ආයේ එහෙම එක දවසක් වත් එනව නම්...' හිමාලි සිතුවේ වතම උණුසුම් වීගෙන එද්දීය.

* * * * * * * * * * *

වර්ෂා ප්‍රියංවදත් සමඟ හවස මහ මළුවට ගියේ විමුක්ති වෙනුවෙන් කරන බෝධි පූජාව පටන් ගන්නේ අද නිසාය. ඒ බෝධි පූජාව පේ වීම තබන්නට වර්ෂා සිතාගත්තාය. මේ දවස් හතට මාළු කෑල්ලක් වත් කන්නේ නැතැයි ඇය සිතා ගත්තාය.

වර්ෂා බෝධි පූජාව තබන්න යන්නට ඇඳගත්තේ සුදු පසුබිමේ ලා කොළ පාට හීන් මල් වැටුණු ගවුමය. මේ ගවුමක් අඳින්නේ අවුරුද්දකට පමණ පසුය. පුතා ලැබෙන්නට උන් මාස දහයටම කෙල්ලට එහෙම ඇඳුමක් අඳින්නට ලැබුණේ නැත.

ඉස්සර උන් අහිංසක ලස්සන කෙල්ල ආයෙත් ඉපදී ඇතැයි ප්‍රියංවදට සිතුණි. කෙල්ලගේ හැඩ ඇඟ ආයෙත් පිපීගෙන ආවේ දරුවා වැදූ පසුය. පිරිමි පුතෙක් ලැබුණ පසු අම්මා කැත වෙනවා කියන කතාව බොරුය. කෙල්ල තවත් ලස්සන වී ඇතැයි ප්‍රියංවදට සිතුණි.

වර්ෂා ගියේ පුතාව තබාය. කොල්ලාට දිග කිරි වඩියක් දුන් වර්ෂා අලුත් නැපි එකක්ද අන්දවා අම්මා අතට දුන්නාය.

'ආච්චම්මා එක්ක ඉන්න හොඳේ... අම්මා තාත්තිගේ බෝධි පූජාවට ගිහින් එන්නම්...'

'ය..න්..න ඕ..නි අම්මීත් එක්ක... බෑ... බෑ... ආච්චම්මා එක්ක ඉමු... ම්...'

අම්මා කොල්ලාව ගත්තේ හුරතල් කරමිනි.

'පොඩ්ඩක් ඇහැරවගෙන තියාගන්න අම්මේ... එකපාර නිදි කරවන්න ඕන...'

'හා පුතේ...'

වර්ෂා හීන් සුදු පටි සහිත පාවහන් යුගළ දමා ගත්තාය. මේවා ගත්තේ නුගේගොඩ වැඩ කරද්දී සාරියට දමන්නටය. ආයෙත් සාරියක් කොහාට අඳින්නදැයි වර්ෂා සිතුවාය.

'යං ප්‍රි..යා...'

ප්‍රියංවද මහට බැස්සේම සිනාසීගෙනය. ගවුමට කෙල්ලගේ හැඩ ඇඟ බේරී පුංචි කෙල්ලෙක් තරමට ලස්සන වී තිබුණි.

'ඇයි ප්‍රියා...'

'ඉස්සර රත්නපුරේ හිටපු ලස්සන කෙල්ල ආයෙත් ඇවිත්...'

කෙල්ලගේ මූවහට ලස්සන සිනාවක් ආවේය.

'කුක්කු දෙන නිසා මේවා චුට්ටක් රවුම් වෙලා ඇවිත්... එච්චරමයි වෙනස...'

'මේ ග..වු..මට ප්‍රියා...'

'ගවුමට නෙමේ... උඹේ ඇඟට... තව ලස්සන වෙලාද කොහෙද... මූණත් පාට වෙලා...'

කවදක හෝ ඔහු එන තුරු මේ ලස්සන තිබ්බොත් ඇතිය.

'ජීවිතේ ප්‍රශ්නම එල්ලගෙන දුක් විඳින්නත් එපා කෙල්ලේ... අපි ටිකක් ලස්සනටත් ඉමු...'

'ම්...'

'ඉඳලා හිටලා ගස්ලබු ටිකක් වත් මූණේ ගා ගමු... මේ වේලිච්ච හුළඟට මූණම වේලිලා...'

'මා..ත් හිතුවා... කොණ්ඩේත් ටිකක් මො..නාද වෙලා...'

'මං ගිහින් දවසක හොඳ තෙලක් හොයාගෙන එන්නම්... ළමයි හම්බ උනාට තාම අපි කෙල්ලෝ බං... අවුරුදු කීයද... ඇඳුමක්





පැළඳුමක් ඇඳලා ලස්සනට ඉන්න බලමු...'

එහෙම අඳින්නට නම් ඒ ලස්සන බලන්නට කෙනෙක් සිටිය යුතුය. හිතට උවමනාවක් එන්නේ එවිටය.

'දවස් හත එමු ප්‍රියා හොඳේ...'

'අනේ එමු...'

'මං බාරෙකුත් වෙලා බෝධි පූජාව තියන්නේ...'

ප්‍රියංවදට සිහිවූයේ සුජානි හිමාලි ගැන කියූ කතාවය. ඒවා කියා කෙල්ලගේ හිත වල්මත් කිරීම පව්ය.

'කෙල්ලේ...'

'ම්...'

'අයියා සනීප උනොත්...'

'ඉතින්...'

'අපි මෙහේ කියලා කියනවද...'

'එ..ක..පාර ප්‍රියා...'

'නොකියා ඉන්නත් බෑ නේද...'

'මං දන්නවා... එයාටත් හිතන්න කාලයක් දෙන්නෙපැයි... හිතම ගල් වෙලානේ තිබ්බේ... අනික...'

'ඇයි...'

'එතනත් ප්‍රශ්නනේ... මාව ක..වුරුවත් පිළිගන්නෑනේ ප්‍රියා...'

'ඒ කොහොම උනත් කෙල්ලේ දරුවා ගැනත් එයා දැනගන්න ඕන...'

වර්ෂා ටික දුරක් යන තෙක් කතා කළේ නැත.

'නෑ ප්‍රියා... මං හම්බ උනත් එයාට පුතා ගැන කියන්නේ අන්තිමට... ම..ට එයත් එ..ක්ක කතා කරන්න ඕන...'

'ඔව් පුතාට කලින් අයියා උඹව බාරගන්නෙපැයි...'

'සමහර ප්‍රශ්න ප්‍රියා කාලය විසඳයි... සමහර ප්‍රශ්න දෙයියෝ විසඳයි...'

ඒ කවුරුත් ප්‍රශ්න විසඳ දෙන්නට පෙර වෙන කෙනෙක් පැමිණ සියල්ල වෙනස් කරන්නටද පුළුවන. එදට කෙල්ලට දෙවියෙකුත් නැත. ඇයට සැමියෙකුත් නැත. කොල්ලාට තාත්තා කෙනෙකුත් නැත.

කෙල්ල මොනවා කිව්වත් කොළඹ වෙන්නේ මොනවාදැයි බලාගෙන සිටිය යුතුය.

වර්ෂා බෝධි පූජාව තබන්නට ගියේ බෝධි පූජා බඩු සියල්ල ගෙන බෝධි පූජා ගාථා ඇතුළත් පොතක්ද ගෙනය. මේ බෝධි පූජා පොත ඇය ගත්තේ නුගේගොඩ පොත් හලේ වැඩ කරද්දීය. එය දැන් අතටම පරණ වී ඇත. ඒ තරම්ම කෙල්ල බෝධි පූජා තියා ඇත.

තවම ඒ බෝධි පූජා තැබූ කුසල ඵල නොදුන්නේ ඇයිදැයි වර්ෂා කවදවත් දෙවියන්ගෙන් බුදුන්ගෙන් අසා නැත.

ප්‍රියංවද කෙල්ල බුදුන් වැඳ එනතුරු බලා උන්නාය. දෙහොත් මුදුන් දීගෙන වැඳ ඒද මදිවී උඩ මළුවේ දණ ඔබා හිස ඔබා වඳින කෙල්ල දෙස බලද්දී පපුව හැරීගෙන යයි.

ආදරයක් වෙනුවෙන් මේ තරම් දුක් විඳින කෙල්ලට කිසිවක් නොවෙනවානම් පුදුමය.

වර්ෂා ප්‍රථම කළය රැගෙන මහ මළුවට ගියේ මුමුණමින් දහසක් දේ සිතමිනි.

'මේ මහා ජය ශ්‍රී විජය ශ්‍රී මහා ජය ශ්‍රී මහ බෝධියට අධිගෘහිත දේවතා කළු බණ්ඩාර දේවතාවුන් වහන්සේට... මම හත් දවසක් පැමිණ... ඇප වී... කැප වී පේ වී කියමි... අනේ මගේ මේ පූජාව පිළි අරගෙන එයාව සනීප කරන්න... එයාව ආරක්ෂා කරන්න... මගේ පුතාගේ තාත්තාව ආරක්ෂා කරන්න... සාදු සාදු සාදු...'

කෙල්ල බෝධිය වටා යන්නේ ඔහොම මුමුණමිනි. වට හත යන්නට පෙර කෙල්ලගේ දෑස් තෙත් වෙයි... දෑතින්ම පැන් කළය රැ ගෙන යන නිසා ඇයට ඒ කඳුළු පිස ගන්නට නොහැක. ඒ නිසා





කෙල්ල යන්නේ කළය දේතින්ම රැගෙන ගවුම් කරේ දෑස් උලමිනි.

ප්‍රථම පැන් කලයෙන් වර්ෂා මහ බෝධිය නැව්වේ දෑස් පියාගෙනය.

'ම..ගේ ආදරේ ස..ත්..ත නම්... එයා ස..නීප වෙ..න්..න ඕ..න...'

එය පුදුමාකාර ප්‍රාර්ථනාවකි.

# 25

**කොළඹ** නවලෝක රෝහලේ දැඩි සත්කාර ඒකකයේ තුන්වෙනි ගිලන් ඇඳේ උන් විමුක්තිගේ දෑස් යංතමට සෙළවුණේ වර්ෂා මහ බෝධිය නාවද්දීය.

ඒ දෑස් සෙළවෙනු කිසිවෙකු දුටුවේ නැත. විමුක්ති දෑස් ඇරියේය. යළිත් දෑස් පියා ගත්තේය...

කිසිවෙකු ඒ දෑස් සෙලවෙනවා දුටුවේ නැත. විමුක්ති උන්නේ මඳ සිහියෙනි. කවුදෝ මොනවාද දෙසවන් ළඟට වී මුමුණන්නාක් මෙන් විමුක්තිට ඇසෙයි...

විමුක්තිගේ දෑස් දැඩි සත්කාර ඒකකය පුරා රවුමට කරකැවෙන්නට විය... ඔහුට දෑසට පෙනෙන්නේ එක් දෙයකි. හිතෙන්නේ තවත් දෙයකි. දෑස් පුරා මොන මොනවදේ පැටලෙන්නට විය.

විමුක්තිට දිගටම දෑස් ඇරගෙන ඉන්නට පණක් තිබ්බේ නැත. ඇරුණු දෙනෙත් හෙමින් හෙමින් යළි පියවෙන්නට විය. එහෙත් ඔහු දෑස් ඇරගෙන උන් මොහොතේ උන්නේ පියවි සිහියෙනි...





'ම..ට ව..තුර ටි..කක්...'

එහෙම ඉල්ලන්නට ඔහුට සිතුණි. ඒ ඔහුගේ හිත වැඩ කරන්නට පටන් ගත් අයුරුය. එහෙත් ඔහුට එන්නත් කර තිබූ බෙහෙත් වල සැරට එහෙමම විමුක්තිට නින්ද ගියේය.

විමුක්තිව ඇහැරවූයේ යම් බලගතු බලයකිනි. ඒ දෑස් ඇරුණේ ඒ බලයෙනි. අනුරාධපුරයේ මහ මළුව වටා පැන් කලය ගෙන යන කෙල්ල ගාථා කියමින් බෝධිය වටා ඇවිද්දේ වෙව්ලමින් මෙනි.

ඒ බලයට විමුක්තිගේ දෑස් නොඇරුණේ නම් පුදුමය...

* * * * * * * * * * * * *

ගෙවෙමින් තිබුණේ කොහොමත් තීරණාත්මක රැයකි. මේ තීරණාත්මක රැයේ විමුක්ති උන්නේ කොළඹ නවලෝක රෝහලේ දැඩි සත්කාර ඒකකයේය. ඒ මොහොතේද වර්ෂා උන්නේ ජය ශ්‍රී මහ බෝධි මළුවේය. ඇය දන් උඩ මළුවට නැග පැයකට වඩා අධිකය. ඒ රෑම හිමාලි උන්නේ මොරගොඩ නිවසේ සැප ඇඳක සැතපී දෙපා සොලවමින් කල්පනා කරමිනි.

විමුක්තිගේ වෛද්‍යවරයා අනුමාන කරන්නේ හෙට විමුක්ති මේ දිග නින්දෙන් ඇහැරෙද්දී විමුක්තිට සිහිය එන බවය... අඩුම තරමේ ඔහු උන් තත්වයෙන් ගොඩට එන්නට පටන් ගෙන බවය.

එය ඇත්ත නම් හෙට උදෑසන හයෙන් පසු උදවන දවස තීරණාත්මකය.

වර්ෂා අවසාන කලයෙන්ද බෝධිය නහවා දෙහොත් මුදුන් දී වැන්දය. ඇය හැරුණේ සැනසුම් සුසුමක් හෙළමිනි.

'බෝධි පූජාව හො..දට කෙරුණා ප්‍රියා...'

කෙල්ල බැස්සේ ප්‍රියංවදට එසේ කියමිනි. කෙල්ලෝ දෙන්නා මහ මළුවෙන් පිටවෙද්දී රෑ නමයටත් කිට්ටුය.

'ප්‍රියා...'

'ම්...'

'මං බඩුවක් අහන්න හිටියේ...'

දෙන්නා පිය මැන ආවේ ඇහැළ මල් පිපුණු මාවත දිගේය. රෑට ඒ මාවත නිස්කලංකය. සුවදයකය.

'මො..ක..ක්ද කෙල්ලේ...'

'අපි හොඳ අයියා කෙනෙක් බලලා යාළු වෙමු...'

ප්‍රියංවදා ලස්සනට සිනාසුණාය.

'කො..හෙ..න් හොයන්නද රත්තරනේ...'

'ඉ..න්..නා..ව නම්...'

'හිතලා බලනවා... මං ජීවිතේ බැට කාපු හැටියට බයයි කෙල්ලේ...'

'ඒ අතීතේ අමතකම කරලා දමු...'

'ඒවා ගැන දන් හිතන්නෙම නෑ...'

'මෙ..හෙ..ම..ම ඉ..න්..නා..ත් බෑනේ කෙල්ලේ...'

'අපි ඔහොම යන්කෝ කෙල්ලේ...'

'ආදරේ මහ දුකක් තමා... ඒත් ජීවත් වෙන්නත් බලාපොරොත්තුවක් එපැයි...'

'ම්...'

'අම්මයි මායි ඊයේ පෙරේද දවසක කතා කළා ඔය ගැන...'

'අම්මා මොනාද කියන්නේ...'

'උඹ එහෙම හිතනවනම් එයත් ආසලු... අම්මා කෙනෙක්නේ ප්‍රියා... බයයි...'

'මේ දුප්පත් ජීවිතේට අහිතක් නැතුව අත තියන්න පුළුවන් කොල්ලෙක් ලැබුණොත් ප්‍රියංවදත් ආදරේ කරයි බං...'

'මං කියන්නේ ලැබෙනවා... ඒ වගේම පතනවා...'

ප්‍රියංවද වර්ෂා දෙස බැලුවේ සෙනෙහෙබර දෑසිනි.





'උඹ ම..ගෙයි මගේ කොල්ලගෙයි ජීවිතේ වෙනුවෙන් කරන ටිකම ඇති උඹට හරියන්න...'

'එ..හෙම හිතන්නෙපා කෙල්ලේ... අපි එකට වැටිලා එකට දුක් විඳගෙන එකට සතුටු වෙනවා...'

'ම්... හිත දන් ඉස්සරට වඩා මගෙත් හයියයි...'

'ඒක වටිනවා... අපිට ඉස්සර වගේ කඩා වැටෙන්න බෑ...'

'දන් කොල්ලා එක්ක අම්මට උයන්න බෑ... අපි ආප්ප අරන් යං...'

'හා.. තේ හදගෙන ආප්ප කමු... සෙනසුරාදට පොඩි මාමලගේ ගෙදර හොඳ කයි බතක් හදනවා... අපිත් යන්...'

'මටත් කිව්වා... උදව් කරන්නම ඕන...'

'කයි බත් රහයි...'

ජීවිතයේ අප්‍රමාණ දුක... පාළුව... අසරණකම... තනිකම... දුප්පත්කම සියල්ල සම සිතින් දරාගෙන කෙල්ලෝ දෙන්නා පූජා නගරය හරහා යයි. පුදුමය. ගෑණු ළමයි ඉගෙන ගෙන ජීවත් වන්නේ නැත. ජීවත් වෙමින් ඉගෙන ගනිති.

කෙල්ලෝ ඉක්මනට මෝරන්නේ ඒකය.

වර්ෂා සුදු ආප්පය මැදට සීනි සම්බෝල චුට්ටක් තියාගෙන දෙකට නවා ගත්තාය. ඇය කෑවේ පුතා ළඟ තියාගෙනය. වර්ෂාව දුටුවනම කොල්ලා තනය බදගෙනම පැය බාගයක් පමණ කිරි බිව්වේය. කොළ මැල්ලුම් ටිකක් කොස් ටිකක් වැඩිපුර කෑ යුතුයැයි වර්ෂා සිතා ගත්තාය. අම්මා හදන කිරි අඟුණ කොළ සම්බෝලයටත් හොඳට කිරි වඩයි. උණු උණුවේ බාන කරවල හොද්දත් සමඟ කිරි අඟුණ කොළ හැදි දෙකක් පමණ කෑ හැක.

පසුගිය දවස්වල මූණත් ටිකක් සුදු වී ඇත්තේ ඒ මැල්ලුම් වල ගුණයට විය යුතුය. ඒ තරමටම මැල්ලුම් ඇය කෑවාය. ඒ දරුවා වෙනුවෙනි.

වර්ෂා ආප්පය කෑවේ කොල්ලාගේ දෙපා පිරිමදිමිනි.

"අම්මි බෝධි පූජාව තියද්දී තාත්තිට ගුණයක් ලැබෙන්නම ඕන... ඒක මං දන්නවා..."

මේ ආප්ප රස නැත. කාඩ්බෝඩ් කන්නාක් වැනිය.

"අනේ ඔය ඉතින් කෑවේ නෑනේ..."

වර්ෂා තේක අතට ගනිද්දී අම්මා කීවාය. ප්‍රියංවදද බැලුවාය.

"රහ නෑ අම්මේ... හයියම හයියයි..."

"ඒක නම් ඇත්ත... ආප්ප කොච්චර රහට හදන්න පුළුවන්ද..."

"අපි අපේ හෝටලේ හොඳ ආප්ප දමු අම්මේ... රස කිරි රහ ආප්ප... නේද ප්‍රියා..."

"මට ඒ ආප්පේ මැවිලා පේනවා..."

"හොඳට යහමින් පොල් කිරි ටිකක් දලා ආප්ප මිශ්‍රණේ හදන්න ඕන..."

"අපි ලස්සනට හෝටලේ දමු අම්මේ..."

වර්ෂා කීවාය. තේක ගෙන වර්ෂා පුංචි සාල කෑල්ලට ආවේ තනිවමය. කළුවර මිදුල පුරා මොකක්දෝ එළියක් විහිදෙනවා වර්ෂා දක්කාය. ඇය පා ඉක්මන් කර මිදුලට ආවේ ඒ දැකය.

මිදුලට එද්දී අර එළිය තිබ්බේ නැත. එහෙත් වර්ෂාට අර දවසක් රෑ දනුණ සමන්මල් සුවඳ ආවාය.

"අ..ම්..මේ..."

වර්ෂා කතා කළේ උගුරෙන් මෙනි. ඇත්තටම නාලිනී කෙල්ල ළඟ උන්නාය.

වර්ෂාට බැලුනේ බුදු පහන දෙසය. එහි එළිය දන් වැඩිවී ඇත.

"වෙ..නදට මේ වෙද්දී නිවිලා..."

වර්ෂා තමාටම කියා ගත්තාය.

"මං දන්නවා ඔයා ඇවිත් කියලා... බෝධියට ගිහින් දන් ආවේ..."





වර්ෂා කතා කරන්නේ තනිවමය.

"අ..ම්..මේ... එ..යා අයි සී යූ එකේලු... මං ළඟ නෙ..මේ එ..යා ළඟ ඉ..න්..න... එයාවයි ආරක්ෂා කරන්න ඕන... මටයි ම..ගේ කොල්ලටයි ඉන්නේ එච්චරයි..."

දැස් තෙත්ව යද්දී වර්ෂා කීවාය.

"එයාව දවසක එක්කගෙන එන්..න... අ..ම්මේ... ඔ..යාට ඇහෙනවද..."

අමුතුම සුළං පහරක් තමාගේ මුහුණ අද්දරින් යනවා වර්ෂාට දනුණි. ඒ අම්මා ඉන්නා බව පෙන්වන හැටිය.

"අපේ රෝස බෝලේ දක්කද... දන් හරි ලස්සනයි..."

කෙල්ල කියන්නේ වෙව්ලමිනි... දන් වේලාව රෑ එකොළහය...

"මං වෙනුවෙන් එයාව ආරක්ෂා ක..ර..න්..න..."

වර්ෂා දෑස් පියාගෙන මෙන් කීවාය.

* * * * * * * * * * *

බ්‍රහස්පතින්ද උදේ හිමාලි නවලෝක රෝහල වෙත ගියේ තනිවමය. ඇය වාහනයට ගොඩ වෙද්දී පාන්දර හය පැන්නා පමණි. ඇය අද ඇන්දේද සාරියකි. සුදට හුරු ක්‍රීම් පැහැගත් සාරියේ පුංචි මෝස්තරයක් ලා දුඹුරු පැහැයෙන් විසිරී තිබුණි.

වාහනයට ගොඩ වෙද්දීම හිමාලිට අමුත්තක් දැනුණි. ඇය වාහනයේ රියදුරු දෙස බැලුවේ ඒ හැඟීමෙන්ය.

"ය..න් ර..ත්..නා..ය..ක..."

වාහනය නාවල පාරෙන් කොළඹ දෙසට හැරවිණ. අර අමුත්ත දිගටම හිමාලිට දනෙයි. "තව කවුරුහරි වාහනේ ඉන්නවා වගේ" හිමාලි සිතුවාය.

"ඒ..සී එ..ක ටි..කක් වැඩි කරන්න රත්නායක..."

රියදුරු වායුසමීකරණය වැඩි කළේය. හිමාලි පිටුපස ආසනයේ

හිස් පැත්ත දෙස බැලුවේ නිකමටය. 'මහ අමුතු දෙයක් හිතෙන්නේ...'

හිමාලි රෝහල ළඟින් වාහනය නවත්වද්දීම දෙර ඇරියාය. වාහනය ඇතුළේ සිට තද සුළං පාරක් ගියාක් වැනි හඬක් හිමාලිට දැනුණි. ඇය දෙර වැසුවේ වෙව්ලමින් මෙනි.

'මෙ..හෙම දෙතුන් පාරක්ම උනා... ඇත්තටම මගේ පිටිපස්සේ අමනුස්ස බලවේගයක් එනවද...'

හිමාලි නවලෝක රෝහලේ විදුලි සෝපානය වෙත ගියේ ඉක්මන් ගමනිනි. ඇය ඇගේ කරේ වූ අත් බෑගයෙන් ලේන්සුව ගෙන දහදිය පිස ගත්තාය. අර තරම් සීතල වාහනයේ ආ තමාට මෙහෙම දහදිය දැම්මේ කෙසේද...

විමුක්ති උන්නේ අඩ නින්දේ දෑස් සොලවමිනි. වෛද්‍යවරයා ඔහු ළඟම උන්නේය.

'කාටවත් එන්න දෙන්නෙපා විමුක්තිව බලන්න...'

ඔහු හෙදියකට දැනුම් දුන්නේය. ලෙඩාව පරිස්සම් කළ යුත්තේ දැන්ය.

විමුක්තිගේ දෑස් ඇරි ඇරී තිබුණි. වෛද්‍යවරයා පරිස්සමින් ඔහුගේ හෘද ස්පන්දනය පරීක්ෂා කළේය. සියල්ල සාමාන්‍යය.

'ම.. ම..ට ව..තු..ර... ටි..ක..ක්...'

විමුක්ති තොල් මිමිණුවේය. වෛද්‍යවරයාගේ මුවේ ලස්සන සිනාවක් මතු විය.

මේ විමුක්ති සිහිය ලබන්නේ වසරකට පසුය... ඔහු වසරක් මේ සියල්ලගෙන් වෙන්ව උන්නේය.

ඊත් දැන්... යළිත් දුෂ්කර ජීවිතයට ඔහු එමින් උන්නේය.

අවට ලෝකය විමුක්තිට පෙනුණේ බොඳ වූ සිතුවමක් ලෙසිනි. දින තුනක් එක දිගට තද නින්දක උන් විමුක්තිගේ හිස කරකැවෙන්නට විය. ඊටත් වඩා ඔහුගේ හිර වූ ස්නායු පණ ගැහෙන්නට ගත්තේ දැන්ය. ඒ නිසාම විමුක්තිට ලෝකය පෙනුණේ යළි උපදින දරුවෙකුගේ දෙනෙතිනි. ලෝකයම වෙනස් තැනක් ලෙස ඔහු දක්කේය.





'ම..ට ව..තු..ර ටි..ක..ක්...'

විමුක්ති යළිත් වියළි තොල් පට සොලවමින් කීවේය. විමුක්තිගේ සිහිය නිසැක ලෙසම එමින් පවතින බව දත් වෛද්‍යවරයා දනී. මේ එන්නේ ඔහුගේ පියවි කටහඬය.

'න..ර්..ස්...'

'ඩො..ක්..ට..ර්...'

'අපි කොල්ලට වතුර ටිකක් පොවමු... ජස්ට් අ ලිට්ල්...'

'ඕ..කේ ඩොක්ටර්...'

හෙදිය විමුක්තිට වතුර හැඳි දෙකක් පෙවූයේ තෙත පුළුන් කැබැල්ලකින් ඔහුගේ වියළි දෙතොල්ද තෙමාය.

විමුක්තිගේ දෙනෙත් ඇරුණි. යළිත් පියවිණි. තවමත් ඔහු ඉන්නේ තද නිදිබර බවකිනි.

'ආයෙත් නින්ද ගියාද කොහෙද ඩොක්ටර්...'

'ඩෝන්ට් වොරි... ඒකට කමක් නෑ... එයාට සිහිය ආවා... මට ඒ ඇති... රෙස්ට් කරන්න දෙන්න... මොළේ කියන්නේ ලොකු මැෂින් එකක්... ඒක හිමිහිට තමා ස්ටාට් වෙන්න ඕන...'

විමුක්ති වටා රැස්වී උන් හෙදියන් හිස වැනුවෝය.

'ඩො..ක්..ටර්...'

'ම්...'

'පේෂන්ට්ව බලන්න විසිටර් කෙනෙක් ඉන්නවා... බැලුවට කමක් නැද්ද...'

'කවුද ඒ...'

'මේ පේෂන්ගේ නංගි කෙනෙක්...'

'බැලුවට කමක් නෑ... ඇහැරවන්න දෙන්නෙපා... විමුක්ති නැගිටින වෙලාවට නැගිටියි... මං උඩ ඉන්නවා... ඇහැරුණොත් මට කතා කරන්න...'

‘හොඳයි ඩොක්ටර්...’

වෛද්‍ය සමරනායක තවත් වරක් විමුක්ති දෙස බැලුවේය. ‘ඇඟ පත විතරයි මෝරලා තියෙන්නේ... හිත මෝරලා නෑ... ජීවිතේ ප්‍රශ්නයක් ආවාම ඔළුව අවුල් කරගන්නවා...’ වෛද්‍යවරයා සිතින් කීවේය.

වෛද්‍යවරයා ගිය පසු හෙදියක් දැඩි සත්කාර ඒකකයේ වීදුරු දොර විවර කළාය.

‘එ..න්..න... දැන් බලන්න පුළුවන්...’

‘තැන්කියූ නර්ස්...’

‘හරි ලස්සන ගර්ල් කෙනෙක්’ හිමාලි සාරි පොටද අල්ලාගෙන දැඩි සත්කාර ඒකකයට ඇතුල් වෙද්දී හෙදිය සිතුවාය. ඇය අයි සී යූ යුනිට් එකට ආ විගසම මිහිරි මල් සුවඳක් පැතිර ගියේය.

‘එ..යා..ට න..ර්..ස්...’

‘දැ..න් ටි..ක..ක..ට ක..ලින් එයාට සිහිය ආවා... ආයෙත් නිදගත්තා... ඇහැරවන්නැතුව බලන්න හොඳද...’

‘හො..ඳයි...’

‘එහෙනම් ඔයාට සිහිය ආවා... මේ මොහොතේ ඉඳලා ඔයාගේ ලෝකෙට මං කුණාටුවක් වගේ එනවා... ඔයාට මොනවත්ම කරන්න බැරි වෙයි විමුක්ති...’ හිමාලි සිතුවේ විමුක්ති ළඟින් ඉඳ ගනිමිනි. ඇය සුදු සයනය මත වැටී තිබූ ඔහුගේ අප්‍රාණික අත ගෙන තම උකුල මතින් තබා ගත්තාය. ඊටත් පසු එය සුරතින් මෘදුව පිරිමැද්දය.

‘ඔයාව මෙ..හෙම අල්ලනකොටත් මාව වෙව්ලනවා... හිතාගන්න බෑ මං ඔයාට කොච්චර ලෝබද කියලා...’

හිමාලි ඒ මුහුණ දෙස බලාගෙනම උන්නාය. ඊටත් පසු ඇය ඉස්සී ඔහුගේ නළලත වැටී තිබූ කෙස් රොදක් පිටුපසට කළාය. විමුක්තිගේ දෑස් යංතමට සෙලවිණ. හිමාලි දිගටම හිස පිරිමැද්දය.

‘බ..දි..න්..න ඉ..න්..න කෙ..ල්ල වෙ..න්නැ..ති... පුදුම ලව් එකක් තියෙන්නේ...’





හිමාලි දෙස බලා උන් හෙදියක් රහසින් තවත් හෙදියකට කීවාය. හිමාලිගේ අත පහළට ආවේ විමුක්තිගේ මුහුණද ඇගේ සිනිඳු ඇඟිලි තුඩුවලින් පිරිමැදගෙනය... දින දෙකක් තුනක් නොකැපූ රැවුල් කොට සිනිඳු අත්ලේ තැවරෙද්දී හිමාලිගේ වතට දැනුණේ වෙනස්ම හැඟීමකි.

‘ඔයා මට මො..නාද කරනවා විමුක්ති...’

හිමාලි දිගටම ඒ පපුව මත සුරත තබාගෙන උන්නාය. ඇගේ ඇඟිලි දෙක තුනක් ඔහුගේ කමිසය අතරින් ඇතුළට ගොස් පපුව මත රැඳී තිබුණි. ඒවා සෙලවුණේ පුදුමාකාර ආදරයකින් මෙනි.

විමුක්තිගේ දෑස් යළිත් සෙලවිණි. හිමාලි තවත් ළං වූවාය. ඔහු පිබිදිය යුත්තේ මේ වතේ රස්නය විඳිමින්මය. ‘නැගිටින්න ර..ත්..ත..රන්... ඇහැරිලා එකපාරක් මං දිහා බලන්න...’ හිමාලි ඔහුගේ සුරත පුදුමාකාර ආදරයකින් පිරිමදිමින් සිතින් කීවාය.

ඒ දෑස් නාරං බිකක් තරමට විවර විය. විමුක්ති දක්කේ බොඳව ගිය සුදු පාට සිතුවමකි...

‘අ..යි..යේ... සු..දු අයියේ...’

හිමාලි කතා කළේ අඬමින්මය. ඒ දෑස් තව ටිකක් විවර විය.

‘බ..ය..වෙ..න්..නෙපා මං ඔ..යා ළඟ ඉ..න්..නවා... මං නු..ව..ර චූ..ටි නංගී...’

හිමාලි මිමිණුවේ උගුරින් මෙනි. ඒ දෑස් විමුක්තිගේ පපුවට කිඳ බහින්නට මෙන් ඒ වෙතම යොමුව තිබුණි.

‘ම.. ම..ට ති..බ..හ..යි...’

යළිත් විමුක්ති කීවේය.

‘අ..නේ.. ඉ..න්..න මං ගේ..න්..න..ම්...’

හිමාලි නැගිට්ටේ ඒ හිස අතගාගෙනමය. ඒ අත හිස පුරා යද්දී විමුක්තිට වෙනස්ම සනීපයක් දැනුණි. ඒ තරමටම ඔහුගේ හිස කැක්කුම් දෙයි.

‘ව..තු..ර චු..ට්..ටක් දු..න්..නට ක..ම..ක් නැ..ද්ද...’

‘සි..හිය ආවද ආයෙ..ත්...’

‘යංතමට ඇස් ඇරලා ඉල්ලුවා...’

‘හැ..න්..දක් වගේ පොවන්න... අපි ඩොක්ටර්ට කතා කරන්නම්...’

‘ම්...’

හිමාලි ඉඳගත්තේ ඒ පපුව ගාවමය. ඇය හැන්දෙන් වතුර බිංදුව බිංදුව පෙවූයේ ඔහුගේ හිසත් මුහුණත් අසාමාන්‍ය ලෙස පිරිමදිමිනි. විමුක්තිගේ දෑස් තිබ්බේ හිමාලිගේ මුහුණ මතමය.

‘ත..ව ති..බ..හ..ද...’

ඇය විමුක්තිගේ මුහුණට මුහුණ ළං කළාය. පිරිමියෙකුගේ මුහුණකට ඒ තරම්ම එබිය හැක්කේ පෙම්වතියකට හෝ බිරිඳකට පමණි.

‘ති..බ..හ..යි...’

‘මං පො..ව..න්..න..ම්...’

හිමාලි ඔහුගේ හිස මත තිබූ අත ඒ උරතලය මත තිබ්බාය.

‘ඕ..එ..ව...’

විමුක්ති උගුරෙන් මෙන් කීවේය. හිමාලිගේ දෙතොලතරට ලස්සන සිනාවක් ආවේය.

‘ඕ..එව අ..ත..ගානකො..ට ස..නීප..ද... ම්...’

විමුක්ති හිස වැනුවේය.

‘මං ළඟම ඉඳගෙන අතගාන්නම්... හො..දේ...’

සතුටට හිමාලිගේ දෙනෙත් පවා තෙත් විය. ‘ඔයා කියනව නම් මං රෑක් ඇහැරගෙන අතගාන්නම්... ඔයාව ලබාගන්න මට කරන්න බැරි දෙයක් නෑ...’ හිමාලි සිතින් කීවාය.

හිමාලි ඇඳේ ඉඳගත්තේ විමුක්තිගේ හිස ඇගේ බඳට ළං කරගෙන මෙනි. බලන කෙනෙක්ට හිතෙන්නේ එක දෙයකි. මේ නිදගෙන ඉන්නා ජීවිතයට ඇය කොතරම් ආදරේද කියාය. එපමණය.

හිමාලි ඒ හිසත් නළලත් පුරා ඇගේ දිග ඇඟිලි රුගෙන ගියේ මේ ඇඟිලි වලට සුරංගනාවියකගේ බලය ලැබේවායි පතමිනි.





කොහොමත් ගැණුන්ගේ ඇඟිලිවල ඉලෙක්ට්‍රික් බලවේගයක් ඇත. ගැණුන්ගේ අත් ගෑවී පිරිමි පිස්සු වැටෙන්නේ ඒකය.

මේ මොහොතේ ඒ විදුලිය හිමාලිගේ ඇඟිලි තුඩුවල තිබුණි. ඇය ඒ හිස පිරිමැද්දේ මුළු ජීවිතයේම සාරය ලේ වලට මුසුකර ඒ ලේ වල රස්නය ඇඟිලි තුඩු වලින් ඔහුගේ හිසට යවමින් මෙනි... ඇගේ සුරත නළලත පුරා තැවරෙද්දී කන්පෙති අතරින් යද්දී විමුක්ති වෙනස්ම සුවයක් වින්දේය. ඒ සනීප පාට ඔහුගේ මුහුණ පුරාම විහිදී තිබුණි.

පුදුමයකට මෙන් හිමාලිගේ දෑස් තෙත් විය. ඔහු දෙසම බලාගෙන සිටිද්දී එහෙම දෑස් තෙත් වූයේ ඇයිදැයි හිමාලි දන්නේ නැත. ‘මං දේවාලේ ඉස්සරහ වැලි පොළවේ තණ පටයක් ඇඳගෙන පාන්දර පෙරලෙන්නම්... පෙරලි පෙරලි වඳින්නම්... ඔබ වහන්සේ ළඟ බිම නළල තියලා නළලෙන් ලේ අරගෙන ඒ ලේ වලින් ඔබ වහන්සේට පොට්ටුවක් තියන්නම්... මට මගේ කොල්ලව දෙ..න්න...’ හිමාලි එහෙම හිතින් බාර වූවාය.

විමුක්ති ඔහුගේ මුහුණ ඇගේ බඳ දෙසට ළං කළේය. හිමාලි තොල් පට තද කළාය. ඇයට ඇඬෙන්නට යන්නාක් මෙනි...

වෛද්‍ය සමරනායක ආවේ සක්විති සමඟය. හිමාලි විමුක්තිගේ හිස අද්දර ඉඳගෙන ඒ හිස අතගාන අයුරු දකිද්දී සක්විතිගේ පවා පපුව සෙලවිණ. ‘කෙල්ල කියනවා වගේ ආදරේ ඇති...’ ඔහු පවා එහෙම සිතුවේය.

වෛද්‍යවරයා බැලුවේ සක්විති දෙසය. හිමාලි හිස එසවූයේ එවිටය. ඒ ඇස්වල තිබූ තෙත පාට සක්විති පමණක් නොව වෛද්‍යවරයාද දක්කේය.

හිමාලි එහෙමම නැගිටින්නට ගියාය. එහෙත් වෛද්‍යවරයා අතින් ඇයට යළිත් ඉඳගන්න යැයි කීවේය.

‘ඔයා මසාජ් කරන්න පුතා... නෝ ප්‍රොබ්ලම්... දට්ස් වරීස් හී නීඩ්ෆුල්...’

ඔහු කීවේ විමුක්තිට අවශ්‍ය එය බවය.

‘තව පා..ර..ක් සිහිය ආවා ඩොක්ටර්...’

හිමාලි කීවාය. සක්විති බලා උන්නේ විමුක්තිගේ මුහුණ දෙසය.

˝සක්විති...˝

˝ඩොක්ටර්...˝

˝පේනවද මූණේ තියෙන සනීප පාට...˝

˝ඒ..ක තමයි ඩොක්ටර්...˝

˝එ..යා ඩො..ක්..ට..ර් මං ඔ..ළුව අත ගා..ලා අත ග..ත්තම ආ..යෙත් ඔ..ළුව කියලා කිව්වා...˝

හිමාලි හැහීම්බරව කීවාය.

˝ආ.. ඒ කියන්නේ සක්විති විමුක්තිට හොඳට ෆීල් වෙනවා...˝

˝ඔ..ව් ඩො..ක්..ටර්...˝

˝ගෙදර අරගෙන ගියත් සක්විති උදේ හවස පැය ගානේ විමුක්තිගේ ඔළුව මසාජ් කරන්න ඕන... නර්විස් පණ ගහලා ආවා විතරයි... තාම හරියටම පණ ගහලා ආවේ නෑ...˝

˝ඔ..ව් ඩොක්..ටර්...˝

˝මේ ගර්ල් මො..නවද කරන්නේ...˝

හිමාලි බැලුවේ සක්විති දෙසය.

˝මේ ඩොක්ටර් අපේ නංගි කෙනෙක්... යුනිවර්සිටි එකට සිලෙක්ට් උනා... පස්සේ ඒකත් අමතක කරලා මල්ලිට සාත්තු කළා...˝

˝ගුඩ්... එයා විමුක්ති ළඟම තියන්න... එයාට කවුරුහරි ළඟටම වෙලා ට්‍රීට් කරන්න ඕන... ෂී විල් ඩූ දිස්...˝

හිමාලිට ලොතරැයියක් ඇදුනාක් වැනිය. ˝සක්විති අයියගේ හිතෙත් මං ගැන දන් තරහක් නෑ... ගැණිටත් වැදලා ආවනේ... ඒකයි අද ඔහොම කතා කරන්නේ...˝ හිමාලි සිතුවාය.

˝මං දවල්ට විමුක්තිව රූම් එකට දනවා... විමුක්ති ළඟම ඉ..න්න ඕන... එකපාර එයාව ගොඩක් ටයර්ඩ් කරන්නෙපා... හිමිහිට කතා කරයි...˝





˝හොඳයි ඩොක්ටර්...˝

˝අයියට කන්න බො..න්න දුන්නට කමක් නැද්ද ඩොක්ටර්...˝

˝අපි හවස ඉඳලා දෙමු... දනට තේ ටිකක් වගේ දුන්නට කමක් නෑ...˝

වෛද්‍යවරයා විමුක්තිගේ හෘද ස්පන්ධනයත් දැසුත් පරීක්ෂා කළේය.

˝ඔ..ක්..කො..ම නෝමල්... මං උඩට යනවා සක්විති... හවස මං ආයෙත් විමුක්තිව චෙක් කරන්නම්...˝

සක්විති වෛද්‍යවරයාගේ දෑතින්ම අල්ලා ගත්තේය.

˝ඩොක්ටර්ට මං තැන්කියු කියන්නෑ... ඩොක්ටර්ට පින්...˝

වෛද්‍යවරයා සක්විතිගේ පිටට තට්ටු කළේය.

˝ඉ..ට්..ස් ඕ..කේ සක්විති...˝

වෛද්‍යවරයා ගිය පසු සක්විති විමුක්තිගේ ඇඳේ අනෙක් පැත්තට ආවේය. හිමාලි විමුක්තිගේ හිස පිරිමදිමින්ම සක්විති දෙස බැලුවාය.

˝ම..ල්ලී නං..ගිව අඳුනගත්තද...˝

˝එ..හෙම ද..න්..නෑ අයියේ... ඒත් එයා බලාගෙන හිටියා...˝

˝නංගී...˝

˝ලො..කු අ..යියේ...˝

˝කොල්ලව සනීප වෙච්ච එකේ ගෞරවයෙන් ටිකක් ඔයාටත් ය..නවා... ඔයා මගෙන් බැණුම් අහ අහත් කොල්ලා ළඟ උ..න්..නා...˝

සක්විති හැඟීම්බරව කීවේය.

˝අ..යියයි අ..ක්..කයි ගැන ම..ගේ තු..න් හිත..ක..ව..ත් තරහක් නෑ... ඒ..ක හ..රි අමාරු කාලයක්නේ අයියේ...˝

˝ඇ..ත්..ත..ටම අමාරු කාලයක් තමා... මං දනුයි ජීවත් වෙන්නේ...˝

˝එ..ය..ත් ද..න්නේ ජීවත් වෙන්නේ... ඒ ඇස් මම දක්කා...˝

'කොල්ලට සිහිය ආවාම මං කියන්නම් මාත් එක්ක ඔයයි ඌව බලාගත්තේ කියලා...'

හිමාලි අසරණව සිනාසුණාය. 'අම්මා නුවර ඉඳගෙන දේවාල වටේ යනවා ඇති... ඒකයි මෙහෙම වෙන්නේ... පුදුමයි...' හිමාලි සිතුවාය.

'අ..යියේ...'

'ම්...'

'අ..ක්..ක..ව අ..රම මහ ගෙදරින් ඇත් කරලා තියන්නෙපා... එයා පව්... ගෑණියෙක් විදිහට එයා ඒකෙන් පිච්චෙනවා... ඒක මට දැනෙනවා...'

'ඒක මාත් දන්නවා නංගී...'

'මං නැන්දටත් එයාගේ වැරදි පෙන්නලා දුන්නා... පස්සේ ඇඩුවා... ඔයාව හැඳුවේ එයා නෙමේලු... මේධලු... අයියා ඔහොම හිටපු කෙනෙක් නෙමේලු... නාස්ති වෙලාමලු හිටියේ... කොල්ලව ගොඩ ගත්තේ මේධලු... පෙන්නුවේ නැති උනාට අක්කට හරි ආදරෙයි...'

'ඇ..ත්..ත..ටම මාව හැදුවේ මේධා තමා නංගී...'

'එහෙම පරිත්‍යාගයක් කරපු කෙල්ලට මහ ගෙදර නැති කරන්නෙපා... පව්...'

'අම්මත් තේරුම් ගන්නවනම් මට ඇති...'

'නැන්දව තේරුම් ගන්න ටිකක් අමාරුයි... ඒත් එයා නරක අම්මා කෙනෙක් නෙමේ... එයාගේ පණ තියෙන්නේ ලොකු පුතයි පොඩි පුතයි ළඟ... මං ඒක දැක්කා...'

'ම්...'

'අන්තිමට ඔක්කොම හොඳ වෙයි... ඔයත් මහ ගෙදර එයි... මේධක්කා තනිවෙයි... ඒ කෙල්ල මොනා කළාටද...'





සක්විති හිමාලි දෙසම බලා උන්නේය. කෙල්ල කියන්නේ ඇත්තය. ඒ බව සක්විතිටත් තේරෙන්නේ දැන්ය.

'මං දවසක් නුගේගොඩින් එද්දී අක්කා දුවවත් අරගෙන ෆුඩ් සිටි එකට ගියා... හරි අමාරුවෙන් දුවවත් තියාගෙන ගියේ... මට හරියට දුක හිතුණා... මං හිතුවා මං එක්ක එච්චර හොඳ නැති නිසා මං ගියොත් ගණන් ගන්නෙකක් නෑ කියලා... නැත්නම් මං ගිහින් දුවව තියාගන්නවා... මේ අතේ බඩු මල්ලත් අරගෙන අනිත් අතේ දුවව තියාගෙන අක්කා ආවා... ඇවිත් ගොඩ වුණේ මොකටද... ත්‍රීවිල් කට්ටකට... මගේ පපුව පත්තු උනා... මොරගොඩ ට්‍රාන්ස්පෝට් එකේ වාහන උතුරනවා... ඒත් ඒ ගෙදර ලොකු ලේලි ත්‍රීවිල් වල යන්නේ... වරද කොතනද... කවුද එයාට ඒ අසාධාරණේ කළේ...'

සක්විති බිම බලාගෙන හිස වැනුවේය. 'හොඳට දන් තැම්බෙනවා...' හිමාලි සක්විතිගේ මුහුණ දෙසම බලාගෙන සිතුවාය.

'මේධා තනි වුණා තමා නංගී...'

'නෑ අයියේ එයාව කොන් වුණා... තනිවෙන එක මොකක්ද... ඒක ගෑණියෙක්ට දරාගන්න පුළුවන්... ඒත් කොන් වුණාම ඒක දරාගන්න බෑ... මහ ගෙදර තැනක් තියෙන්නෝන විමුක්ති අයියා බඳින කෙල්ලට නෙමේ... ඒ පොඩි ලේලි... මේධක්කයි ඒ ගෙදර ලොකු ලේලි... ලොකු දුව.. එයාට ඒ තැන ලැබෙන්නම ඕන... ඒක අරන් දෙන්නෝන ඔයා...'

හිමාලි සක්විතිගේ ඔළුව ගානට හැදුවාය. හිමාලි මේ තරම්ම හොඳ කෙල්ලෙකැයි සක්විති හීනෙකින්වත් සිතුවේ නැත. ඔහුගේ හිතේ උන්නේ වර්ෂාය. දැන් හිමාලි නැගිටින්නේ මේ හිත්වල වර්ෂා ගැන මැවුණ සිතුවම මකාගෙනය. 'මං ඕකිව මකවලම දනවා...' හිමාලි සිතුවාය.

'අම්මට මේවා තේරුම් කරලා දෙන්න ඔයාවත් උන්න එක ලොකු දෙයක් නංගී...'

'මේ ප..වු..ලට මං පු..දුම ආදරෙයි අ..යියේ... මොන හේතුවක්ද මන්දන්නෑ ඒක ආපු දවසේ ඉඳලා මට දැනුණා... ඒත් ඒ ගේ මළ ගෙයක්... දවාලකට ගිහින් බලන්න... අනුලක්කගේ බබා නැත්නම් එහෙමවත් සද්දයක් නෑ...'

'ම්...'

'ජීවිතේ සතුට තියෙන්නේ ලොකු ගෙවල් වලවත් සැප වාහනවලවත් නෙමේ අයියේ... අම්මයි මායි නුවර ගෙදර තනියෙන් උන්නේ... අපි බත් චුට්ටක් හදගෙන කාලා හරි සතුටින් උන්නා... පන්සල් ගියා... මං ඉගෙන ගත්තා... එහේ ඉඳලා කොළඹ ආවාම මං මහගෙදර දැක්කේ හරි සීතල පාළුවක්... කොල්ලෝ හැදුවාම කොහොමත් ගෙවල් පාළුවට යනවලු... ඒක නැති කරන්න ඕන කොල්ලෝ ගේන කෙල්ලෝ... දැනට කෙල්ලෝ දෙන්නෙක් නැතේ... ඉන්නේ මේධක්කා විතරයි... එයා...'

'මේ ප්‍රශ්න විසඳෙයි නංගී...'

'මං නැන්දගෙන් ඇහුවා ලොකු පුතා මේධක්කවත් අරගෙන දුවවත් අරගෙන රට ගියොත් ඉන්න පුළුවන්ද කියලා... අර පොඩි කෙල්ල දකින්නැතුව ඉන්න පුළුවන් කියලා... නැන්ද පොඩි ළමයෙක් වගේ ඇඬුවා...'

සක්විති බලාගෙනම උන්නේය.

'දැන් ප්‍රශ්න ඉවරයි අයියේ... පොඩි අයියටත් සිහිය ආවා... ගෙදර පිරිලා තිබ්බොත් එයත් ඉක්මනට සනීප වෙයි... ඔයා දුවවත් අරන් රට යන්න හදනවා... එතකොට කෙල්ලට කියලා ආච්චිලා බාප්පිලා නෑ... ඔයාට අසනීපයක් වුණා... මේධක්කා කාටද කියන්නේ... මේධක්කට අසනීපයක් වුණා... ඔයා කාටද කියන්නේ... කවුද බලාගන්නේ... දුව ලොකු වෙන්නේ වෙන රටක... භාෂාව දන්නෑ... සංස්කෘතියක් නෑ... මොනාද මේ කරන්න හදන්නේ...'





සක්විති හිස වැනුවේය. මේ ටික කියා දුන්නාට කෙල්ලට පින් දිය යුතුය.

'ඔයාට රටවල් දලා යන්න තරම් දෙයක් නැතිවෙලා නෑ...'

හිමාලි සක්විතිගේ දෙනෙත් දෙසම බලාගෙන කීවාය. ඇත්තටම තමාට නැතිවී ඇත්තේ මොනවාදැයි සක්විති සිතුවේය.

# 26

දවල් ගෙදර ගිය විට සක්විති හිමාලි කියූ සියල්ලම මේධාට කීවේය.

‘කෙල්ල කියන ඒ ඔ..ක්..කො..ම ඇත්ත ම..හත්තයෝ...’

මේධා දෙනෙත්වල කඳුළු තබාගෙන කීවාය.

‘දවසක් ත්‍රීවිල් එකේ දුවවත් අරන් ෆුඩ් සිටි ගියාද...’

‘මේ.. ගෙදර බඩු මොනවත්ම තිබ්බේ නෑ... දුවගේ බඩුත් ඉවරවෙලා... ඔයා හොස්පිට්ල් එකේ... මල්ලී ගාව... රෑ නිදි මරලා එන ඔයාට මං කියන්නේ කොහොමද... එද මටත් හරියට දුක හිතුණා...’

‘කෙල්ල ඒ වෙලේ ඉඳලා එතන... එ..න්..න බයවෙලා ඉඳලා තියෙන්නේ...’

‘හිමාලි හොඳ කෙල්ලෙක් බලන් ගියාම... ඊට වඩා දැනුම් තේරුම් තියෙන කෙල්ලෙක්...’

‘ම්.. අම්මටත් කියලා... අම්මා අඬලා...’





‘එයා තේරුම් ගත්තනම් ඇති...’

‘කොහොමත් මේ ප්‍රශ්න විසඳගන්නම ඕන බබා...’

‘විසඳගන්න එහෙම ප්‍රශ්නයක් නෑ මහත්තයෝ...’

‘ඒක හිමාලිත් කිව්වා... රට දලා යන්න අයියට මොනාද උනේ කියලා...’

‘ඇත්ත... මං ඔයා කියන ඕන දේකට කැමති වෙනවා... ඒත් මාත් හිතුවා... කෙල්ල කියනවා වගේ අපි තනිවෙනවා... කවුද අපිට ඉන්නේ...’

‘මං ඒ අදහස අත් ඇරලා දම්මා...’

‘ඒක ගොඩක් හොඳයි... මං ඒකෙන් හරි අසරණ වෙලා උන්නේ...’

‘කි..ය..න්..නෙපැයි...’

‘මං එ..හෙම විරුද්ධ වෙන්නේ කොහොමද... හිමාලිවත් ඒක වැරදියි කියලා පෙන්නලා දීපු එක හොඳයි...’

‘හරි කැක්කුමෙන් ක..තා ක..ර..න්..නේ...’

‘ම්...’

‘මල්ලිට සිහිය එද්දී ඌ ගාව හිටියේ හිමාලි...’

‘මල්ලි මල්ලි කැමති දෙයක් තීරණය කරපු දෙන්... කොහොමත් මල්ලිට වර්ෂව මහ ගෙදරට ගේන්න බෑ...’

‘එහෙම උනොත් ප්‍රශ්නේ ආයේ මුලටම යනවා...’

‘ම්...’

මේධා හූම්ටි තැබුවාය. මහ ගෙදර ඇවිලෙන්නේ නැතුව තියෙනවා නම් ඇයද කැමතිය. එසේ වුවහොත් ඒ ගිනි පුපුරු මෙහෙටත් විසිවෙන බව මේධා දනී.

‘අ..නික බ..බා...’

‘ම්...’

'වර්ෂා ආවනේ මල්ලිව බලන්න... මේ අවටමයි ඉන්නේ...'

'ඔව්...'

'ඔයා මෙච්චර ආදරෙන් හිටියා කෙල්ලට... ඇයි බැරි වුට්ටක් අපට මුහුණ දෙන්න... ඔයාව හම්බුණා කියලා උදව්වක් මිසක එයාට නරකක් කරන්නෑනේ...'

'ම..ටත් ඒක දස දහස් පාරක් හිතුණා...'

'මූ..ණ දෙ..න්..න බැරි දෙයක් වෙන්න බැරිද...'

'ඒ කියන්නේ...'

'ස..ම..හ..ර විට වර්ෂා වෙන කෙ..නෙ..ක්..ව මැරි කරලද කියලා කවුද දන්නේ...'

'එ..හෙම වෙ..න්..න...'

එහෙම හිතද්දීත් මේධාට පුදුමය.

'එහෙනම් ඇයි බැරි ඔයාට මූණදෙන්න... කොච්චර ආදරෙන්ද හිටියේ...'

'ඔ..ව් ඒ..කිට මට කියන්න බැරි දෙයක් නම් නෑ ත..මා... කොල්ලා ඉම්බත් කියනවා...'

'ඒකනේ... ධනේ අයියා ඉන්න වෙලාවක් බලල හොස්පිට්ල් ආවා... මං යනවා බලන් ඉදලා වෙන්න ඇති උඩට ආවේ... ඇයි ම..ට මූ..ණ දෙ..න්න බැරි... ඒක පුදුම දෙයක්නේ... මං ඒකිට වරදක් කරනවද... මේ ඔක්කොම ප්‍රශ්න උනේ ඒකි වෙනුවෙන් කතා කරලනේ...'

'ඔ..ව්.. අ..ම්..ම..ට මා..ත් එ..ක්..ක වෙ..න ත..රහ..ක් නෑ...'

'කොහොමත් මල්ලිට සිහිය ආවාම අපිට නිහඬව ඉන්නම වෙනවා... මට වටින්නේ මගේ මල්ලිව...'

'ම..ට..ත් එ..හෙ..ම..යි... කෙ..ල්ල ම..ට ගොඩක් උදව් කළා...





මාත් ඒකිට උදව් කළා... ඒක වෙනමම දෙයක්...'

'ඒත් ඒ නිසා ගෙදර ප්‍රශ්න හදා ගන්නෝන නෑ බබා...'

'කො..හො..ම..ටවත් නෑ...'

මේධා ස්ථිරවම කීවාය.

හිමාලි හිතූ දේ ලස්සනට සිද්ධ වුණේය. මේ කිසිවෙක් ඇගේ හිතේ ඇති ඇත්ත දේ දන උන්නේ නැත. හිමාලි උදේ සක්විතිට කීවේ මාළිගා වැනි ගෙවල් වල සැප නෑ කියාය. සතුට නෑ කියාය. සැප වාහන වල සතුට නෑ කියාය. එහෙත් ඇය සිතන්නේම සතුට ඇත්තේ ඒ වල කියාය. 'මාකුඹුර පාරේ ඉදලා බස් පාරට එන්න පැය බාගයක් පයින් එන්නෝන... එතන ඉදලා නුවර එන්න බස් එකේ හිරවෙලා එන්නෝන... එතනින් කොළඹ බස් එක ගන්න පැයක් ස්ටෑන්ඩ් එකේ පෝලිමේ ඉන්නෝන... ඒ වගේද සුදු කාර් එකේ කුඹුර මැද්දෙන් එනකොට... ඒසී කරපු එක ඇතුලේ... මාරයි... ඇවිත් බහිද්දී වටේ පිටේ උන් බලන්නේ වෛශ්වර්යා බහිනවා වගේ. ඒ සතුට බස්වල ඇවිත් ගන්න බෑ... ගෙදර එද්දී දඩිය වැක්කෙරෙනවා ඇහේ... කකුලේ දූවිලි... කියුටෙක්ස් ටිකක් ගාගෙන දවස් දෙකක් යන්න නෑ... වතුරට ගැලවෙනවා... ඒ වගේද වාහනේ යද්දී... ඇරත් මේ වගේ කොල්ලෙක් එක්ක... ඉස්සරහ සීට් එකේ... මාරයි...' හිමාලි සිතුවේ එහෙමය.

ඒ අදහාගත නොහැකි සැප වෙනුවෙන් කොහොම දුක් වින්දත් කමක් නැත. කාගේ කකුල් අල්ලා වැන්දද කමක් නැත.

'විමුක්ති සිහිය ආපු ගමන් විමුක්තව වයින් කරන්න ඉන්නේ මේධා... ඒ ගෑණිව අල්ල ගත්තම ඇති... ගෑණි ඊට පස්සේ වර්ෂව විමුක්තිගේ ජීවිතේට ගේන්නෑ...'

හිමාලි සිතුවේ විමුක්තිගේ හිස පිරිමදිමිනි.

'අනිත් එක්කෙනා අර ගෙදර ඉන්න වහන්තරාව අනුලා... හොඳ අම්මණ්ඩි... ගෑණිව නම් මෙහෙම කරනකොට අල්ලන්න පුළුවන්... මුන් ඔක්කොම හිස් තැන් තියාගෙන ජීවත් වෙන අය... ළඟට ඇවිත් ඒ හිස් තැන් පුරවපු ගමන් පුදුම විදිහට වැදෙනවා...

අරකි කළේ ඒක... මුත් වහ වැටුණා... මත්වෙලා ගියා...'

දන් ඒ හිස් තැන් ටික පුරවගෙන පුරවගෙන යන්නේ තමාය.

'අරකිට මෙහෙට එන්න බැරි එක ලොකු දෙයක්... මට තරහයක් නෑ... තරහයක් දෙන්න ඒකිට එන්නත් බෑ... මට ඒ වෙලාවේ ඔයාව මත් කරගන්න පුළුවන්...'

හිමාලි තුනී සිනහවක් සහිතව විමුක්තිගේ කන් පෙති පිරිමැද්දය.

'ගෙදෙට්ට අඳින්න ලස්සන ඇඳුම් ටිකක් ගන්නෝන... ඔයාව ගෙදර එක්කගෙන එන්න කලින් හෙයා කට් එකක් ගන්නත් ඕන... ඊට පස්සේ මට ඔයා ළඟින් හෙලවෙන්න ලැබෙන්නෑ... හෙලවෙන්නෙත් නෑ... එදට ඔයාට මේ හිමාලිව නැතුවම බැරි වෙයි... මේ ලෝකෙ ඉන්න අහිංසකම කෙල්ල ඔයා ළඟ ඉඳී... මං එහෙම වෙනවා...'

හිමාලි තොල් පට මුව තුළට ගෙන කල්පනා බරව සිතුවාය. 'අදින් පස්සේ නුවර යන්නෑ අම්මට එන්න කියනවා...'

'මි..ස්...'

හෙදියක් පැමිණ හිමාලිට කතා කළාය.

'මි.. ඇ..යි...'

'මි..ස්ට තේ..ක..ක් දෙ..න්..නද...'

හිමාලි සිනාසී හිස වැනුවාය.

'අයි සී යූ එකේ කාටවත් ඉන්න දෙන්නෑ... ඒත් ඩොක්ටර් මිස්ට ඉන්න දෙන්න කියලා ගියේ...'

ඒ ලැබෙන සැලකිලි පුදුමාකාරය. හිමාලි බලාපොරොත්තු වූයේද එයමය.





# 27

වර්ෂා ප්‍රියංවදගේ අම්මාත් සමඟ පටන් ගන්නා හෝටලයට පහේ හදන්නට ගත්තාය. අද පාන්දර සිට මුළු ගේම පහේ සුවඳය. කෑම ටික රහට දෙන්නට නම් ගෙදරම පහේ ටික වේලා බැද කුඩු කරගත යුතුය.

පහේ හදන්නට ඕනා කරන කොත්තමල්ලි සූදුරු මාදුරු උළුහාල් මිරිස් වැනි කුළුබඩු දවස් දෙක තුනක්ම දෙන්නා සෝද වේලා ගත්තෝය. වර්ෂා ඒවාත් කරන අතරතුර පුතාවද තබාගෙන උන්නාය. හෝටලේ හදන තැන වැඩද බැලුවාය.

දුකය. මහන්සිය. තෙහෙට්ටුය. ඒත් කරන්නට දෙයක් නැත. ගෑණු තුන්දෙනාට ජීවත් වෙන්නට වෙන විදිහක් ඇත්තටම නැත. රස්සාවකට වුව යන්නට පුළුවන් ප්‍රියංවදාට පමණි. ඒ ගිහින් ගත්තද රුපියල් හත්අට දහකි. ඉන් ජීවත් විය නොහැක.

වර්ෂා හෝටලය හදන්නට ගත්තේ ඇගේ බැංකු පොතේ ඉතිරි වී තිබූ අන්තිම සල්ලි ටිකය. කොල්ලා ඉපදෙද්දී ඒ බඩු ගන්නටද ඒ වලින් සල්ලි ගන්නට සිදු විය.

මින් මත්තට එහෙම ඉතුරු කර ගත් මුදලක් අතේ නැත. කරේ

ඇති වේන් පටත් මුදු දෙකත් කරාබු දෙකත් පමණක් හදිස්සියකට උකස් කඩයට තියන්නට ඇත.

ඒත් ජීවිතය පල්ලමට වැටුණා කියා කෙල්ල හිතුවේ නැත. එහෙම හිතන්නට ඇයට හිත් දෙන්නේද නැත.

‘ඔයා එනකල් රත්තරන් මං කොහොම හරි ජීවිතේ ගැට ගහගන්නම්... ඔයාගේ පුතාට දුකක් නම් දෙන්නෑ... කවදවත් නෑ... මං අනුරාධපුර පොළේ එළවළු විකුණලා හරි ඔයාගේ පුතාව රකිනවා...’

ඇත්තටම වර්ෂා උන්නේ එහෙම හිතාගෙනය. අවසන් වරට විමුක්තිව බලා නවලෝකයෙන් පිට වූයේ එහෙම සිතාගෙනය. ඒ අධිෂ්ඨානය කෙල්ලගේ හදවතේ ඇත.

‘අපිට හෝටලේ සාර්ථක කරගන්න පුළුවන් වෙයි... දෙයියොවත් බලලා මේ දුප්පත් පොල් අතු හෝටලෙන් කන්න දවසකට සීයක් වත් එවන්න...’

වර්ෂා සිතුවාය. පොත් හලේ රස්සාව කළ ජීවිතයේ ලස්සනම දවස් ටික වර්ෂා සිහි කළාය. ලස්සන සාරියක් ඇඳගෙන පොත් හලේ එහෙට මෙහෙට යමින් පොත් ඇණවුම් කරමින් ගෙවූ කාලය සිහිනයක් වැනිය. ඒ කුළුදුල් රැකියාව කළේ ඔහුගේ ඇල්ම බැල්ම සෙනෙහස විඳිමිනි. ඒ දෑස් අතරය.

‘ඒ පහන ජීවිතෙන් ඇත් වුණා... ඒත් එළිය මට මතකයි...’

ජීවත් වන්නේ එහෙම සිතාගෙනය. අමාරුම දුකක් විඳගෙන අමාරුම කාලයක ජීවත් වීම ඇත්තටම අමාරුය.

‘මට ජීවත් වෙන්න ලොකු ධෛර්යයක් ඕන... පපුව කඩාගෙන යන විදිහට නැගිටින්න හිතන්නවත් බෑ... ඔයාගේ පුතාගේ චූටි කකුල් අතගගා මූණ අතගගා මං ධෛර්ය ගන්නවා... ඒක ඔයාට කවදහරි දනෙන්නෝන විමුක්ති...’

වර්ෂා යටි තොල හපාගෙන සිතුවාය. පුතාට පහේ සැර යන නිසා පහේ බදින්නේ ගේ පිටුපස කොස් ගස් දෙක යට ලිපක්





බැඳගෙනය. තරමක් ලොකු ලිපට කැලෑ දර දමා ගින්දර අඩු වැඩි කරමින් දර කෑලි අදිමින් පහේ ටික පරිස්සමින් බැදිය යුතුය.

‘අ..ම්මේ... කොත්තමල්ලි ටික බැදිලා ඇති නේද... දන් සුදුරුයි මාදුරුයි දන්නද...’

වර්ෂා හැන්ද අත තබාගෙන ඇසුවාය.

‘ඇති වගේ නේද පුතේ...’

‘රම්පේ කරපිංචා ටිකත් මේ ගමන්ම දමු අම්මේ...’

‘ම්...’

අම්මා සෝද වියලා තිබූ රම්පෙ කරපිංචා ටිකත් ලොකු තාච්චියට දම්මාය. මුළු පළාතම ටිකකින් බැදපු පහේ සුවඳින් සුවඳවත් විය. කළු පහේ බැදීගෙන එද්දී එහෙමය. පළාතම සුවඳය.

‘සුවඳට ආවා වගේ නේද අම්මේ...’

‘ම්.. හොඳ අලුත් පහේ සුවඳයි... ගම්මිරිස් ඇට ටිකත් දමු...’

‘සැරට තියෙන්නෙපැයි නේද...’

ප්‍රියංවද පුතාවද කොට් ෂීට් එකේ තබාගෙන පිටුපස දෙරකඩට ආවාය.

‘සු..ව..දේ බෑ කෙ..ල්ලේ... ගේ ඇතුලේ ඉන්න බෑ සුවඳයි...’

‘දරුවව මෙහෙට ගේන්නෙපා...’

අම්මා කීවාය.

‘හෝටලේ නැගලා යයි වගේ... නේ..ද පු..තු... අ..ම්මි ර..හට ප..හේ බදින..වා...’

වර්ෂා පහේ ටික කබල් ගාමින් බැලුවේ පුතා දෙසය. ‘ඔයාට දවසක මේ කතාවම මං කියනවා... ඒක පුතෙක් විදිහට ඔයා දනගන්නම ඕන...’ වර්ෂා සිතුවාය.

කළු පහේ ටික බැද අවසානයේ වර්ෂා හදන්නට ගත්තේ මස් වලට මිරිස්ය. එය හොඳ රතු මිරිස් කරල් ගෙන යංතමට බැද කුඩු කරගත යුතුය. මස් හොද්ද රස එච්චරය.

'අනේ කෙ..ල්ලේ මිරිස් බදිනවා පැටියට කැස්ස එයි...'

වර්ෂා තාච්චියට මිරිස් ටික දන්නට පෙර කීවාය.

'අපි දුවමු අපි දුවමු... සුදු අම්මි රතු මිරිස් බදිනවා... පුතුට කැස්ස එයි...'

ප්‍රියංවද කොල්ලාව තුරුල් කරගෙන ගෙට දිව්වාය.

'හම්බවෙච්ච මිරිස් ටික නම් ෂෝක් නේද අම්මේ... හොඳ රතු පාට...'

'හොඳට වේලුනත් එක්ක...'

මිරිස් කිලෝ තුනක් පමණ එකවර කබල් ගාද්දී අමාරුය. කෙල්ලගේ දෑස් තෙමී ඉහින් කනින් දහදිය වැගිරෙන්නට විය. වර්ෂා මිරිස් ටික බැද්දේ සුදු රෙදි කඩක් මුහුණට තබාගෙනය.

'අමාරුයි නේද පුතේ... කෝ දෙ..න්..න...'

'මහ්.. අම්මට කැස්ස එනවා... ඔයාගේ පපුවේ සෙම...'

අම්මා කෙල්ල දෙස අනුකම්පාවෙන් බැලුවාය. දුකය. ඒත් කරන්නට දෙයක් නැත. සත් පත්තිනි අම්මා ඉන්නවා නම් මේ කෙල්ලන් දෙස බැලිය යුතුය.

'මේ.. ඇ..ති නේ..ද අ..ම්මේ...'

'අ..නේ ඇ..ති ර..ත්..ත..රන් දෑ..න් ටි..ක..ක් ඉ..න්..න...'

වර්ෂා එහෙමම මිරිස් ටික බා දුව ගොස් ළිඳෙන් වතුර එකක් ඇදගෙන මුහුණ තෙමා ගත්තාය. ඇස් පැදුනේ සීතල වතුර ටිකක් වැටුණු පසුය.

කෙල්ල නැවත ආවේ ගවුම උඩින් ඇඳ උන් චීත්ත පටින් මුහුණ පිසදගෙන කොණ්ඩයත් බැඳගෙනය.

කෙල්ල මෙහෙම උන්නද ලස්සනය. පිච්තුරු පාටය. එහෙමම ආ ඇය යළිත් ගින්දර මෙලවූවාය.

'අමු පහේ හරි... කළු පහේ හරි... මස්වලට මිරිස් හරි... තව මොනාද අම්මේ...'





'උළුහාල් ටිකක් කරපිංචා එක්ක දලා බැදලා තියාගමු... එතකොට රහයි...'

'ම්.. අම්මත් එහෙම බැදලා තියාගන්නවා තමා...'

වර්ෂා උළුහාල් පත්සීයක් පමණ තාච්චියට දැම්මාය. උළුහාල් බැදෙද්දී එන්නේ පුදුමාකාර සුවඳකි. එහෙමම ඇය අලුත් කරපිංචා ඉති තුන හතරක් ගෙන හුරා එයටම දැම්මාය.

'අ..ම්මේ සුවඳ...'

'ඕකෙන් ටිකක් දලා අල හොද්දක් කිරි හොද්දක් හැදුවාම හරි රහයි...'

'ම්...'

වර්ෂා ඒ සුවඳ වින්දය.

'ඔයා නැති දුක මට හරියට තියෙනවා... නැත්නම් මෙහෙම ජීවත් උනත් මට ඇති... මහ සැපක් ඕන නෑ...'

වර්ෂා සිතුවාය.

'අම්මේ...'

'පු..තේ...'

'හවස බෝධි පූජාවට යද්දී මේ ටික කුඩු කරන්න මෝලට දීගෙන යන්නම්... ගෙනත් ලොකු බෝතල් ටිකක දගමු නේද අම්මේ...'

'ඔව්.. පහේ ටික රත්තරන් වගේ රැකගන්නෝන...'

'ම්...'

අද ඔහුගේ බෝධි පූජාවේ දෙවන දවසය. මේ බෝධි පූජාව තබා අවසාන වෙද්දී ඔහු සුවය ලබන බව කෙල්ලට විශ්වාසය. විමුක්තිට සනීප වෙන්නට ගත්තේ ඊයේ වර්ෂා බෝධිය නාවද්දීය. ඒ බව කෙල්ල දන්නේ නැත.

'හ..ම්..මේ...'

වර්ෂා කාමරයට විත් ඇඳ මත ඉඳගත්තේ අමාරුවටය. කෙල්ලව දකිද්දී ප්‍රියංවදට දුකය.

'උ..ඹ..ට අමාරුයි කෙල්ලේ...'

වර්ෂා සිනාසුණාය.

'අ..නේ ලස්සනට සාරියක් ඇඳගෙන බුක්ෂොප් එකේ වැඩ කරපු කෙල්ලනේ මේ පහේ බදින්නේ...'

'ජී..වි..තේ එ..හෙම තමා ප්‍රියා... එ..ක වි..දිහට ග..ල..න්..නෑ... තැනිතලා හම්බවෙනවා... කඳු උඩින් පහළට ගලනවා... ගල් පර මැද්දෙන් යනවා...'

'ඔ..හොම කොණ්ඩෙ බැන්දමත් උඹ ල..ස්ස..නයි...'

'මෙ..හෙ..ම බැඳලා...'

'ම්...'

වර්ෂා ලස්සනට සිනාසුණාය.

'දවසක් අයියත් කිව්වා... මං නාලා තුවාය පිටින් එද්දි එයා කාමරේ...'

'ම්...'

'ඒ ද..ව..ස් වල යාළුවෙලා නෑ...'

ඉන් එහාට ප්‍රියංවද ඇසුවේ නැත.

'පහේ ටික නම් ඉවරයි ප්‍රියා...'

'දැන්...'

'අපි උදේට මොනාද හදන්නේ... දවල්ට මොනාද හදන්නේ... රෑට මොනාද හදන්නේ කියලා තීරණය කරලා බඩු ලිස්ට් එක හදන්නෝන...'

'රෑට බෝධි පූජාවට ගිහින් ඇවිත් පොතක් තියාගෙන හදමු...'

'හා.. බඩු අඩුවට ගන්නෝන... හාල් ටිකයි එළුවු ටිකයි මස් මාළු ටිකයි...'

'පොඩි මාමා අපට උදව් කරයි...'





'ඒ මනුස්සයා දෙවියෙක්...'

වර්ෂා එහෙමම කීවාය.

'කෙල්ලේ...'

'ම්...'

'අපට ස..ල්ලි මදිවෙයිද...'

කෙල්ලෝ දෙන්නා මූණට මූණ බලාගෙන මොහොතක් උන්නෝය.

'ම..ට..ත් හි..තු..නා ප්‍රි..යා... එ..හෙම උ..නොත්...'

කෙල්ලගේ අත ගියේ කරේ වූ රන් චේන් පටටය.

'මේක..ව..ත් ති..ය..මු...'

'අ..නේ දෙ..යිය..නේ... ඒක කරන්නේ කොහොමද...'

'වෙ..න වි..දි..හ..ක් නෑ ප්‍රියා...'

'මං පො..ඩි නැ..න්..දගෙන් වත් ඉල්ලගන්න බලන්නම්...'

'එපා ප්‍රියා... එහෙමම කරදර කරන්නෙපා... එයාලා අපිට ගොඩක් උදව් කළා...'

'ඇ..ත්..ත.. මා..ත් කැමති නෑ...'

'ර..ත්..තර..න් ගන්න පුළුවන් ප්‍රියා...'

ජීවිතයේ උන් එකම රත්තරන් කඳ නැතුව මොන රත්තරන්ද... වර්ෂාට හිතෙන්නේ එහෙමය.

'බ..ලමු කෙල්ලේ... අපි පිරිමහ ගමු...'

'අන්තිමට මදි වෙනවා ප්‍රියා... මේක පවුම් දෙකක් විතර... පනහක් විතර ගන්න පුළුවන්... දන් පවුම වැඩියිනේ...'

වර්ෂා පුතු දෙස බලාගෙන කීවාය. 'තාත්ති නැතුව අපට මොන රත්තරන්ද.. නේද පැටියෝ...' කෙල්ල සිතින් කීවේ එහෙමය.

* * * * * * * * * * *

විමුක්තිට නැවත සිහිය එද්දීත් ඔහු ළඟ උන්නේ හිමාලිය. ඒ මොහොතේදීත් විමුක්තිගේ හිස මත හිමාලිගේ සුරත විය.

'අ..යි..යේ...'

හිමාලි ඒ මුහුණටම බරව කතා කළාය. විමුක්ති අඩවන් දෙනෙතින් හිමාලි දෙසම බලා උන්නේය. 'හිරි වැටිලා යනවා ඔහොම බලද්දී...' ඇය සිතින් සිතුවාය.

'මා..ව ම..ත..ක..ද... ම්...'

හිමාලි ඇසුවේ පුදුමාකාර සෙනෙහෙබර බවකිනි. කෙල්ලෙකු සතු උපරිම ළඟන්නා බව ඒ වචන දෙක තුළ විය.

විමුක්ති බලාගෙනම උන්නේය. ඔහු යංතමට හිස වැනුවේය. හිමාලිගේ පපුවට සැනසීමක් දනුණි.

'බ..ය..වෙ..න්..නෙපා... දැන් ඔයාට ස..නීපයි... ඩොක්ටර් කිව්වා...'

විමුක්තිට මොනවද අහන්නට සිතෙයි. එහෙත් වචන පිටවෙන්නේ නැත.

'ම්.. මො..න..ව..ද ඕ..න... කිය..න්..න සුදූ අයියේ...'

ඇරුණ විමුක්තිගේ දෙනෙත් වලට පෙනෙන්නේ ඇයව පමණි.

'ඉ..න්..න.. මං තේ චූ..ටිටක් පො..ව..න්..නම් තිබහයි නේ..ද...'

'ඔ.. ඔ..ව්..'

'මං පාන්දර ඉඳලා ඔයා ළඟ... ඉ..න්..න..කෝ...'

හිමාලි උණු වතුරු බෝතලයෙන් තේ ටිකක් ගෙන නිවා ගත්තාය. ඊටත් පසු සාරි පොටද හදගෙන ඇය ඔහුගේ වතට ඇලීම ඒ මුහුණ ඉදිරියේ ඉඳ ගත්තාය.

'ම්... චූ..ටිටක් උ..ඩ..ට එමු... නැත්නම් ඉස්පොල්ලේ යයි...'

හිමාලි විමුක්තිව කොට්ටයේ උඩට ගත්තේ ඇගේ දෑතම ඔහුගේ හිස පිටුපසට තබාය. එහෙම කරද්දී ඇගේ මුළු පපුවම විමුක්තිගේ වතට තද විය. ඇගේ මුහුණ තිබ්බේ ඒ මුහුණ අද්දරමය.

'හ..රි... අපි චූ..ටි..ට චූ..ටිට බොමු...'

විමුක්තිගේ දෑස් ඉබේටම මෙන් පියවෙයි.





'සු..දු අ..යියේ...'

ඇය ඔහුගේ දෙනෙත් ඇර ගත්තේ ඒ මුහුණ අතගා මෙනි.

'මේ..ක බී..ලා නිද..ග..න්..න... හිස් බ..ඩනේ...'

හිමාලි ළඟටම වී තේ එක පෙව්වාය. ඊටත් පසු ඇය සාරි පටින්ම ඔහුගේ දෙතොල් පිස දම්මාය.

'තම ඔ..එව හිරයි වගේද...'

විමුක්ති අඩවන් දෙනෙතින් බලා හිඳී.

'නිදගන්..න... මං ළඟ ඉඳගෙන අතගාන්නම්...'

විමුක්තිගේ දෑස් පියවී ගියේ ඒ රුව දෙස බලා සිටිද්දීමය. 'මං ඔයා වෙනුවෙන් ඔයාට පුදුම හිතෙන දුකක් විඳලා පෙන්නනවා...' හිමාලි දැඩිව අධිෂ්ඨාන කර ගත්තාය.

සක්විති නැවත එද්දීත් හිමාලි උන් අයුරින්ම ඒ ඉහ අද්දර ඉඳ කොල්ලාගේ හිස අතගායි. 'ආදරයක් පපුවේ නැත්නම් මෙහෙමම කැප වෙන්න බෑ... හිමාලිට කොල්ලෙක් එක්ක යන්න බැරි කෙල්ලෙක් නෙමේ... ඉගෙන ගෙන තැනකට ආවානම් මල්ලිට වඩා හොඳ කොල්ලෙක් ලැබෙයි...' සක්විති සිතුවේ එහෙමය.

පිරිමි ගෑණු ගැන දන්නේ නෑ යැයි කියන්නේ ඒකය. එකම ගෑණි ඇතුලේ තව ආත්ම හතක් ඇත.

'දැ..න් ටි..ක..කට කලිනුත් සිහිය ආවා අයියේ...'

'නංගිට මහන්සියි නේද...'

'අනේ නෑ අයියේ...'

'මල්ලි කතා කළාද...'

'ම්.. ටි..ක..ක්.. මං ඇහුවා මාව දන්නවද කියලා... ඔළුව වැනුවා එතකොට...'

සක්විති ඔහු ළඟින්ම ඉඳගත්තේය.

'නංගී තාම උදේටවත් කාලා නෑ නේද...'

'ම..ට බ..ඩ..ගි..නි නෑ අයියේ...'

'ආ.. අක්කා ඔයාට සැන්ඩ්විචස් ටිකක් හදලා දුන්නා.. ක..න්..න...'

සක්විති සැන්ඩ්විචස් පාර්සලය හිමාලි අතට දුන්නේය. 'ගැණී වශී වෙලා ඉන්නේ... මට ඒ ඇති...'

'අක්කා දුවවත් බලාගෙන මහන්සි වෙලා...'

'ඔයා බඩගින්නේ ඉන්නේ කියලා අක්කා දන්නවා...'

'නංගී...'

'අ..යියේ...'

'නංගී අපි ළඟ හැමදම ඉන්නෝන...'

සක්විති කීවේය. හිමාලිගේ දෑස් තෙත් විය.

'මේ දු..ප්පත් කෙ..ල්ලට එ..හෙ..ම ඉ..න්..න දෙ..න එ..ක..ත් පි..න..ක් අයියේ...'

හිමාලි කීවේ අඬමිනි. සක්විතිගේ පපුව උණු වීගෙන ගියේය.

අඩ නින්දේ උන් විමුක්ති දෙනෙත් හීනියට විවර කළේ හිමාලි අඬද්දීය. ඔහුගේ දෙනෙත් තිබ්බේ හිමාලිගේ කඳුළුබර දෙනෙත් වෙතය.

විමුක්ති හිමාලි දෙස බලාගෙනම උන්නේය. ඔහුගේ දෙනෙත් නතරව තිබුණේ හිමාලිගේ සුදු මූහුණ මතමය. සිහිය ආ හැම මොහොතකම තමා ළඟ උන්නේ ඇය බව විමුක්තිට මතකය. ඒත් දැන් ඇය අඬන්නේ ඇයි... යංතමට එහෙම හිතෙනවා මිසක පැහැදිලි සිතුවිල්ලක් විමුක්තිට එන්නේ නැත.

එහෙමම විමුක්ති දෙනෙත් කරකැවූයේ සක්විති වෙතටය. හිමාලි දෙස බලාගෙනම උන් සක්විති විමුක්ති දෙස බැලුවේ නිකමටය. තමා දෙසම බලාගෙන උන් විමුක්තිගේ දෙනෙත් ඔහු දැක්කේ එවිටය.

'ම..ල්..ලී...'

සක්විති එහෙමම විමුක්තිගේ ළඟින් ඉඳගත්තේය. සක්විතිගේ සුරත එහෙමම විමුක්තිගේ පපුව මතට ගියේය. හිමාලිද තෙත දෙනෙත් සාරි පටින් තවාගෙන විමුක්ති දෙසටම හැරුණාය.





'අ..යි..යේ...'

සක්විතිගේ මුවහට ලස්සන හිනාවක් ආවේය. මේ එන්නේ කොල්ලාගේ ඇත්ත පියවි කටහඬය.

'උ..ඹ..ට දන් කො..හො..මද කොල්ලෝ...'

විමුක්ති බලාගෙනම උන්නේය. එහෙමම ඔහු යළිත් හිමාලි දෙස බැලුවේය. 'ඔහොම බලනකොට පපුව ගිනි ගන්නවා...' හිමාලි හුස්මකින් පපුව පුරවාගෙන කීවාය.

'මේ චූ..ටි නංගි... නුවර නන්දනී නැන්දගේ දුව... නංගියි මායි තමා උඹව බලාගත්තේ...'

විමුක්තිගේ දෙනෙත් වල වූයේ අහිතක් නොවේ. සුහද බවකි.

'සු..දු අ..යි..යේ... මො..න..ව..ද ඕ..න මි...'

සිහිය ලද පසු ඔහුගේ මුහුණේ මතුවූ ප්‍රථම සිනාරැල්ල මේ මොහොතේ සටහන් විය. එය පරිස්සමින් බැලුවොත් පමණක් පෙනෙන හීන් අහිංසක සිනහවකි.

'අ..යි..ය..ට ස..නී..ප වෙ..ලා..ම ත..මයි ලො..කු අ..යියේ...'

දෙනෙත් තෙත් කරවාගෙනම හිමාලි කීවාය.

'අ..පි හරි දුකෙන් කොල්ලෝ උන්නේ... දැනුයි අපේ ඇඟට හුස්මක් වැටෙන්නේ...'

'මො..ක..ද වු..ණේ අයියේ...'

සක්විති සිනාසී ඒ හිස අතගෑවේය.

'ඒ..වා අ..පි ප..ස්..සේ ක..තා ක..ර..මු...'

'ඔව් ඒ අතීතේ කතා නොකරම ඉන්නවනම් හොඳයි. ඒ අතීතෙයි ඒකිවයි එහෙමම භූමිදානය කරලා දන්න ඕන...' ඒ අතීතයම අමතකව ගොස් අලුත්ම විමුක්ති කෙනෙක් උපදිනවානම් හොඳය. එවිට ඒ විමුක්තිම තමාගේය.

'මං අ..යි..ය..ට ත..ව තේ චු..ට්ටක් පො..ව..න්නද මි... මේ තොල් වේලිලා ලොකු අයියේ...'

'තේ ටිකක් බොමුද කොල්ලෝ...'

විමුක්ති හිස වැනුවේ හිමාලි දෙස බලාය. තමාට ආවතේව කරන්නේ හිමාලි බව දන් විමුක්ති දනී. සාරි පටද ඉනේ ගසාගෙන තමා ළඟින් නැගිට්ට ඇය දෙස ඔහු බලාගෙනම උන්නේය.

'නංගිටයි මටයි නින්දක් නෑ... උඹ ගාව තිස්තුන් පැයේම...'

'ම..ම ද..ව..ස් කී..ය..ක් මෙ..හෙද අ..යියේ...'

සක්විති සිනාසුණෝ හිමාලි දෙස බලාය.

'උ..ඹ අ..වු..රු..ද්දක් මෙ..හෙම ම..ල්ලියේ...'

'අ..වු..රු..ද්ද..ක්...'

'ම්.. ඒක හරි අමාරු කාලයක්...'

හිමාලි යළිත් විමුක්තිට මුහුණ ලා ඉඳගත්තේ සාරි පටද ඉනේ ගසාගෙනය.

'අ..පි ලො..කු අ..යියේ හවස් වෙලා ඔරේන්ජ් ජූස් ටිකක් පොවමු නේද... තේම පොවන්නැතුව...'

'ම්...'

'හවස නැන්ද බලන්න එද්දි හදන් එ..න්..න කිව්වා නම් හරි...'

හිමාලි තේ ටික පෙව්වේ විමුක්තිගේ නිකටද මෑදුව අල්ලාගෙනය. දන් ඇය හැසිරෙන්නේ විමුක්තිගේ නියම බිරිඳ ලෙසිනි.

'රෑ..ට ඉ..දි ආප්ප ටි..ක..ක් වත් කමු... එ..තකොට ඔය හාමත් ගතිය යයි... අක්කට කිව්ව නම් හදයි නේද ලොකු අයියේ...'

එහෙම කියද්දී විමුක්තිට බැලුනේ සක්විති දෙසය.

'අ..ක්..කා කෝ...'

'සු..දු අ..යි..යා ද..න් සුදු බාප්පි කෙනෙක්... මේධක්කට දන් සුදු බෝලයක් වගේ දුවෙක් ඉ..න්..නවා...'

විමුක්තිගේ දෑස් එළිය විය. ඔහුට මේ මොනවත් තේරුම් ගත නොහැක.

'අ..ක්..ක..ට...'





'ම්..'

'හවස අයියා අක්කවයි දුවවයි එ..ක්කං එයි... ආවාම දුවව බලන්නකෝ...'

'ක..ව..ද්ද අ..යියේ...'

විමුක්ති ඇසුවේ අමාරුවෙනි.

'ද..න් ගො..ඩ..ක් ද..වස් ම..ල්ලී...'

'අ..ක්..කා අයියව බලන්න ආවාම දුවව මේ ප..පුව උඩි..නු..ත් තියනවා... ම..ත..ක නෑ...'

විමුක්ති නැතැයි කියන්නට මෙන් හිස වැනුවේය. විමුක්ති එහෙමම රූටා උඩට එන්නට හැදුවේය.

'ඔ..හො..ම..ම ඉ..න්න අ..යියේ... චූ ය..න්..න බටයක් ද..ලා ති..යෙ..න්..නේ... ඉ..න්..න මං උ..ඩ..ට ග..න්..න..ම්...'

විමුක්තිගේ සරමට අලුත් ගැටයක් ගසා ඔහුගේ දෑතින්ම අල්ලා ඔහුව ටිකක් උඩට ගත්තේ හිමාලිය. ඊටත් පසුව ඔහුගේ කමිසය හද සරම යටින් ආ මූත්‍රා බටය ඇය උඩට කළාය.

'උදේට ඇඟ චු..ට්..ට..ක් ව..ත් හෝදන්..න පුළුවන් නම් නේ..ද ලොකු අයියේ... මේ රැවුලත් කපලා... එ..ත..කොට ස..නීපයක් එ..යි...'

හිමාලි මෙහෙම ඒවා කියන්නේ විමුක්තිගේ හදවත පතුලටම වැදෙන්නටය.

'මං ප..ස්..සේ හෝ..ද ග..න්..න..ම් නංගී...'

හිමාලි සිනාසුණාය.

'අ..පි අවු..රු..ද්දක් අ..යි..ය..ව හේ..දුවා... ඇ..න්..දුවා... හෙට උදේ මො..ක..ක්ද නේද අයියේ...'

'ක..ව..න්..න..ත් ඕ..න...'

හිමාලි ඔහු දෙස බලා උන්නේ අසාමාන්‍ය ආදරයක් පපුවේ උතුරන දෙනෙතකිනි. ඒ දෙනෙත් හිමාලි මවා ගන්නේ හිතාමතාය. එහෙම බලද්දී පපුවකට වෙන්නේ මොනවාදයි දන් හිමාලි දනී.

සක්විති එහෙමම ඔහුගේ ජංගම දුරකථනය ගෙන මේධාට ගත්තේය.

'බ..බා...'

සක්විති කතා කළේ සතුටිනි. විමුක්ති බලා උන්නේ සක්විතිගේ මුව දෙසමය. හිමාලිගේ වමත තිබුණේ විමුක්තිගේ පපුව මතය. ඒවා ඔහුටත් නොදැනෙන සේ ඇය පිරිමැද්දය.

'ම..හ..ත්..තයෝ හො..ස්පිට්ල් එ..කේ නේ..ද...'

'ම්.. කො..ල්ලට සිහිය ආ..වා...'

'අ..නේ...'

මේධාට හීල්ලුනි.

'ඉ..න්..න... අක්කා ක..තා කරන්නේ කොල්ලෝ...'

සක්විති එහෙමම දුරකථනය විමුක්ති දෙසට පෑවේය.

'ඉ..න්.න මං අල්ලන්නම්...'

හිමාලි ඔහුට බරවී දුරකථනය විමුක්තිගේ කණට කර ඇල්ලුවාය.

'අ..නේ සු..දු ම..ල්ලියේ... දැ..න් සනීපද ම..හ..ත්..තයෝ...'

'අ..ක්..කේ...'

විමුක්ති එහෙම කියද්දී එහා පසේ උන් මේධාට ඇඬුණි. එහෙම අහන්නේ කී දවසකට පසුද...

'ඇ...යි අ..ක්..කේ අ..ඬ..න්නේ...'

'ම..ට ස..තුට ද..රාග..න්..න බෑ ම..ල්ලියේ...'

'දු..ව කෝ...'

විමුක්ති ඇසුවේය.

'අ..නේ මේ ළ..ඟ ඉ..න්..නවා ම..හ..ත්..තයෝ... මං එ..ක්..ක..ගෙ..න එ..න්..න..ම්... මං උපදිව්ව දූ ඉඳලා කෙ..ල්ලව ඔයා ළඟට ගෙනාවා...'

'ම..ට ම..ත..ක නෑ...'





'දැ..න් බල..න්..න..කෝ... කියන්..න ම..හත්තයෝ මො..නාද ඕ..න... මං හදාගෙන එ..න්..න..ම්...'

'අ..ක්..කා.. එ..න්..න...'

'ඔ..යා..ට තිස් තු..න් කෝටියක් දෙවි දේවතාවුන්ගේ පිහිටයි ර..ත්..ත..ර..න්... අ..නේ අපි බ..යවෙලා හිටපු තරමක්... බ..ත් ක..ටක් සතුටින් කෑවේ නෑ... මං ඉ..ක්..මනට එ..න්..න..ම්...'

විමුක්තිට කතා කළ පසු මේධා කතා කළේ හිමාලිටය.

'නංගී...'

'අ..ක්..කේ...'

'දි..ග..ට..ම කො..ල්ලා ගා..ව ඉ..න්..නවා නේ..ද...'

'ඔ..ව් අ..ක්..කේ... මං අයියා ගාවම ඉ..න්..නා..වා...'

'දන් ඉතින් උඹලා කිව්වත් මං එයා ළඟින් හෙලවෙන්නෑ...' හිමාලි සිතින් කීවාය.

'ම..ට උ..ඹ..ත් එ..ක්..ක ක..තා කරන්..න ඕ..න... මං එ..න්..න..ම්...'

'ඔය එන්නේ ගෑණි ගාණට...' හිමාලි සිතුවේ සතුටිනි.

'මං අයියා ගාව ඉ..න්..නවා අක්කේ...'

'මං එ..න්..න..ම්...'

'අ..ක්..කේ අයියට රෑ..ට ක..න්..න මො..නවා හරි...'

'මං හ..දන් එ..න්..නම් කෙල්ලේ...'

'සුදට මො..නා හරි ඉඳි ආප්ප එ..ක්..ක... දැ..වස් ගා..ණන..කට පස්සෙනේ ක..න්..නේ... තෙල් මිරිස් කෑවොත් බඩ දවිල්ල අල්ලයි...'

විමුක්ති බලා උන්නේ පුදුමයෙන් මෙනි. තමා වටා ගොඩ නැගී ඇති මේ ආගන්තුක ලෝකය ඔහු හෙමින් හෙමින් තේරුම් ගනිමින් උන්නේය. ඒ ලෝකය මැද ඔහු දිගටම දක්කේ හිමාලිවමය.

'හා අක්කේ හා... බු..දු ස..රණයි...'

හිමාලි දුරකථනය තබා බැලුවේ සක්විති දෙසය.

'අ..ක්..ක අඬනවා ත..මා අයියේ... අක්කට හරි සතුටුයි...'

ඒ තරමටම සතුටු වන්නට තමාට හැදී තිබූ අසනීපය කුමක්දැයි විමුක්ති සිතුවේය. තවමත් කිසිවක් පැහැදලිව සිතෙන්නේ නැත. සිතන්නට හයියක්ද නැත.

'මේ ගෙ..වල් දෙකේම බතක් ඉදුනේ නෑ ම..ල්ලී...'

විමුක්ති බලාගෙනම උන්නේය.

'මේ කෙල්ල කොළඹ ආවේ යුනිවර්සිටි එකට සිලෙක්ට් වෙලා... ඒත් අන්තිමට ඉගෙනීමත් කැප කරලා මාත් එක්ක උඹව බලාගන්න නතර වුණා...'

විමුක්ති එහෙමම දෑස් ඇය දෙසට හැරවූවේය. 'දැන් මං කියන්න ඕන ඒවා මෙයාලා කියන්නේ...' හිමාලි සිතුවාය.

විමුක්තිගේ හිතට විදුලියක් වැදුනාක් මෙන් වර්ෂාව සිහිවූයේ එවිටය. මොහොතක සිට හදවතේ ඇදෙමින් මැකෙමින් උන්නේ ඇයය.

'අ..යි..යේ...'

'ම..ල්ලී...'

'ව..ර්..ෂා කෝ...'

හිමාලි ගැස්සුණාය. දවුණාය. පිච්චුණාය. එහෙමම ඇගේ දෙනෙත් බිමට බර විය. 'පට්ට බැල්ලිව මතක් වුණානේ...' ඇය සිතුවේ වෛරයෙනි.

'ඊට ප..ස්සේ හ..ම්බවුණේ නෑ ම..ල්ලී...'

හිමාලි ඒ පිළිතුරෙන් සතුටු වූවාය. 'මං හිතුවා මාගල අදී කියලා... මළ ඉලව් ලව් ජාතකේ...' හිමාලි සිතුවේ ඇවිලෙමිනි.

'කෝ ඒ..යා...'

'ද..න්..නෑ ම..ල්ලී... ද..න් උ..ඹ ඕවා හිතන්න ය..න්..නෙ..පා... අපි උඹව ගොඩ ගත්තේ නොවිදිනා දුක් විඳලා...'

සක්විති හිමාලි දෙසද බලා කීවේය. විමුක්ති සක්විති දෙසම





බලාගෙන උන්නේය.

'මා..ව බ..ල..න්..න ආ..වේ නෑ...'

'නෑ... දැන් ඔළුව අවුල් කරගන්නෙපා මල්ලී... දැන් උඹට ප්‍රශ්න නෑ... මංජුලත් එ..න්..නෙම නෑ... වර්ෂත් නෑ...'

'දැන් ඉන්නේ ම..ම...' හිමාලි ඔහු දෙස අහිංසක බැල්මක් හෙලා සිතින් කීවාය. පරිස්සමින් දැන් ඔහු දෙස බැලිය යුතුය.

'වෙ..ඩි..න් එ..ක...'

'ඒ ප්‍රශ්..නේ ද..න් නෑ... මේ අහපන්... ද..න් ටිකක් නිස්කලංකේ ඉඳපන්...'

විමුක්ති කතා කළේ නැත. 'ඔයාට මොකද වුණේ...' විමුක්තිගේ සිතේ ඒ ප්‍රශ්නය ගිනි කන්දක් මෙන් ඇවිලෙන්නට විය. 'ඒකි ගැන දැන් හිතනවා... ඒකිව මකවලා දන්න පුළුවන් මේ දෙන්නටම තමා... එයාලා කියන එක අහනවා...' හිමාලි සිතුවාය.

'ලො..කු අයියේ...'

'නංගී...'

'රැ ය..න්..න කලින් මට අයියගේ සරමක් එ..හෙම මාරු කරලා දෙ..න්..න හොඳේ... මේ දිගටම ඇඳන් හිටිය ඇඳුමනේ...'

'රැ නංගිට ඉ..න්..න පුළුවන්ද... පාන්දර ඉඳලනේ...'

ඔහුට අස්සවන්නට ඕනාද මේවාය. හිමාලි මේ කතා අහන්නේ ඒකය.

'මං ඉ..න්..නා..ම්...'

'මේ සාරිය ඇඳගෙන...'

'මං ඇඳුමක් ගෙ..නා..වා... අද අයියා අක්කත් එ..ක්..ක ඉ..න්..න...'

'අද නම් නින්ද යයි...'

සක්විති දිග සුසුමකින් පපුව නිදහස් කරගෙන කීවේය. 'මට අද ඉඳලා තමා නින්ද යන්නැත්තේ...' හිමාලි සිතින් කීවාය.

# 28

මොරගොඩ මහතාත් සුරම්‍යාත් විමුක්තිව බලන්නට එද්දී විමුක්තිව දැඩිසත්කාර ඒකකයෙන් කාමරයට ද තිබුණි. ඔවුන් එද්දී විමුක්ති උන්නේ නිදාගෙනය. හිමාලි විමුක්තිගේ හිස අද්දරම ඉඳගෙන ඔහුගේ හිස මෘදුව මසාජ් කරමින් උන්නාය. ඇය ඒ හිස පිරිමැද්දේ හිස ඇගේ නිතඹ දෙසට බර කරගෙනය.

'කෙ..ල්ල ඇස් දෙක වගේ බලාගන්නේ...'

සුරම්‍යා ඒ සිදුවීම දුටු වනම මොරගොඩ මහතාට කීවාය. මොරගොඩ මහතාද හිමාලි දෙස බැලුවේ තරමක ප්‍රසාදයකිනි.

'මා..මේ...'

'ක..ම..ක් නෑ දූ..ව දිගටම මසාජ් ක..ර..න්..න...'

'ඩො..ක්..ටර් කිව්වා මාමේ නහර වලට ලේ එනකල් මසාජ් කරන්න කියලා... දන් ඇහැරලා හිටියේ... ඔළුව අතගාද්දී නිදගත්තේ...'

'අවුරුද්දක් හිරවෙලා තිබ්බ ඔළුවනේ...'

'අයියට හො..දට සිහිය ආවා මා..මේ... ලොකු අයියයි මායි





එක්ක හො..දට ක..තා ක..ළා...'

එහෙම කියද්දී හිමාලිගේ දෙනෙත් තෙත් විය. මේ බොරුවක් කරනවාද නැතහොත් හදවතේ ඇත්තම හැඟීම් කියා ඇයම දන්නේ නැත.

'අ..යි..යේ... සු..දු අ..යියේ...'

හිමාලි කතා කළේ ඔහුගේ පපුවට අත තබාය. විමුක්ති දෙනෙත් ඇරියේ යංතමටය.

'මා..ම..යි නැ..න්..දයි ඇවිත්... චු..ට්.ට..ක් ක..තා ක..ර..න්..කෝ...'

ඇස් අරිද්දීම විමුක්ති දක්කේ අම්මාවය.

'අ..ම්මේ...'

'අ..නේ ඔ..යාට ස..නීප උ..නානේ ර..ත්..ත..රන්... මං කොච්චර බ..යේද හිටියේ...'

සුරම්‍යාගේ දෙනෙතින් කඳුළු වැගිරෙන්නට විය. ඇය දිගටම විමුක්තිගේ මුහුණ අතගෑවාය.

'අදයි අපේ පපුවලට හුස්මක් වැටුණේ...'

මොරගොඩ මහතා කීවේය. හිමාලි ඔහුට ඉඳගන්නට පුටුවක් ගෙනවිත් ඇඳ අද්දරම තැබුවාය.

'අ..යියටයි මේ කෙ..ල්ලටයි දෙස්තර මහත්තයටයි පින් දෙ..න්..න පොඩි පුතේ... ඔයාව ගොඩ ගත්තේ ඒ තුන්දෙනා... අයියා රස්සාවෙන් පවා අස්වුණා... ඔයාව බලාගන්න... මේ කෙල්ල විශ්ව විද්‍යාලෙට වත් ගියේ නෑ... අපි බත් කටක් කෑවේ නෑ... පන්සල් වලමයි...'

සුරම්‍යාගේ දෙනෙතින් එක දිගට කඳුළු ගලයි.

'දූ..න් දරුවට සනීපයිනේ නෝනා...'

'හතුරෙකුගේ දරුවෙකුටවත් මෙ..හෙම වෙ..න්නෙපා කියලා මං ඉ..ල්ලු..වේ...'

මොරගොඩ මහතා බැලුවේ හිමාලි දෙසය. සාරි පටද ඉනේ ගසාගෙන ඇය උන්නේ සුරම්‍යාටත් මොරගොඩ මහතාටත් තේ හදමිනි.

'ලො..කු අයියා කෝ දුව...'

'අයියා මේධක්කවයි දුවවයි එක්කං එන්න ගියා මාමේ... අක්කත් අඩනවා...'

'කෙල්ලට සතුටු ඇති...'

'ම..ල්ලිට ප..ණ..නේ...'

සුරම්‍යා කීවාය. සුරම්‍යා දිගටම විමුක්තිව අතගාමින්ම උන්නාය.

'එකපාර වැඩට බහින්නෙපා... බුක් ෂොප් එකත් අයියා හොඳට බලාගත්තා... ටි..ක..ක් නිවී සැනසිල්ලේ අපි ඉ..මු... හොඳද පොඩි පුතා...'

සුරම්‍යා කියද්දී විමුක්ති හිස වැනුවේය. පරිස්සම් කර ගත යුත්තේ දන්ය. 'කොයි වෙලාවක අරකි එයිද දන්නැ...' සුරම්‍යා සිතුවාය.

'කා..ලද මගේ ර..ත්..තරන්...'

තේ ගෙනෙද්දී සුරම්‍යා හිමාලිගෙන් ඇසුවාය. හිමාලි සිනාසුණාය.

'මං රෑ වෙ..ලා මො..නවා හරි ක..න්..නම් නැ..න්දේ...'

'පේනවා නේ..ද... අද පාන්දර හතරයි නංගී එද්දී...'

'රෑට ධ..නසිරිද ඉන්නේ දුව...'

මොරගොඩ මහතා ඇසුවේය.

'එ..පා මා..මේ... බෙහෙත් ටික වෙලාවට දෙන්න ඕන... ඒවා පිට කෙනෙක්ට කරන්න බෑ... මං ඉ..න්..නවා...'

ඇය මේ කියන්නේ තමා පිට කෙනෙක් නොවන බවය. මේ තරමටම තමාට කිට්ටු වී ඇති මේ අලුත් ජීවිතය තවමත් විමුක්තිට තේරුම් ගන්නට අමාරුය. 'එයාව දක්කම මතක් වෙන්නෙම වර්ෂව...' ඔහු සිතුවේය.

'ඔයා මාව බලන්න ඇවිල්ලත් නෑ ඒ ඇයි...' විමුක්ති සිතුවේය. 'ඔයාට බෑ එහෙම මාව දලා යන්න...'

* * * * * * * * * * * * * *





විමුක්ති රෝහල් කාමරයේ සිට එසේ සිතන මොහොතේ වර්ෂා උන්නේ බෝධි පූජාව නිමවා ගෙදර එමිනි. උදේ පාන්දර සිටම ගින්දර තාච්චිය ළඟ ඉඳගෙන මිරිස් පහේ බැද්ද නිසාදේ කෙල්ලගේ කකුල් ඇදුම් කයි. ඇය මේ තරම් දුර පයින් පැමිණ හත් වටයක්ම කැරකී බෝධි පූජාව කළේ එහෙම අමාරුකම් තිබෙද්දීය. ඔහු වෙනුවෙන් කරන දෙයක් එසේ ආවාට ගියාට කළ නොහැක.

'ඇයි කෙල්ලේ...'

වර්ෂාගේ විඩාබර මුහුණ දැක ප්‍රියංවද ඇසුවාය.

'නෑ ප්‍රියා...'

'උඹට අද අමාරුයි... පැය කීයක් පහේ බැද්දද...'

වර්ෂා සිනාසුණාය. 'ජීවිතේ කියන්නේ ඒ දුක නම් ඒ දුක මං බාරගන්නවා... මං විඳින්නේ මට උරුම දේ... ඒ උරුමය දුකක් නම් මං මොනවා කරන්නද... කොහොමත් සැනසීමක් වින්ද දවසක් මතක නම් නැත.

'ප්‍රියා...'

'කෙ..ල්ලේ...'

'අද වට හත යද්දී...'

'ම්...'

'ම..ට මො..නාද වු..ණා වගේ වු..ණා...'

'කිව්වේ කෙල්ලේ...'

'එයාට ස..නීප වෙලත් ඇති...'

'අයියට...'

'ම්...'

'එහෙමම හිතුණා...'

'අපි සුජාට හෙට අරගෙන බ..ල..මු...'

'ම්.. අයියව සමහර විට ගෙදර එ..ක්කගෙනත් යයි...'

ප්‍රියංවද බලාගෙනම උන්නාය. කෙල්ල වෙලාවකට කියන දේ පුදුමාකාරය.

'ස..නීප උනාම උ..ඹව දගෙන හොයයි...'

'ම්.. හො..යාගෙන එයි ප්‍රියා...'

'ය..න්..නේ නෑ...'

'එහෙම කො..හොම ය..න්..නද ප්‍රියා...'

'ය..න්..නත් ද..වස..ක් එයි කෙ..ල්ලේ...'

'දන් තනියම යන්නත් බෑනේ... එයාගේ පුතත් ඉ..න්...නවනේ...'

වර්ෂා ඇහැල ගස් අතරින් පූජා නගරය වෙත ඇවිදගෙන ගියේ ඔහු ගැනම සිතමිනි. 'ඔයා මාව හොයාගෙන එනව නම් තමා මං කැමති... එදට මේ පපුවට සැනසීමක් තියෙයි...' වර්ෂා සිතුවාය.

'ඒත් ප්‍රියා...'

'ම්...'

'එයා මං ළඟට ආවත්...'

'ඉතින්...'

'එකපාර එයා කො..හොම මා..ව...'

කියාගෙන ආ දේ මහදීම ඇයට බිඳී ගියේය.

'එහෙම කොහොම කරන්නද... දරුවෙකුත් ලැබිලා තියෙද්දී... අයියා ඒ වගකීම ගන්නම ඕන...'

'දෙයියොම බලලා මේ ප්‍රශ්න විසඳයි ප්‍රියා...'

'නෑ කෙල්ලේ... දෙයියන්ට ඒවා විසඳන්න බෑ... අයියයි ඒ ප්‍රශ්න විසඳන්න ඕන... එයා වෙනුවෙන් උඹ වින්ද දුක් කන්ද කවුරුවත් නෙමේ මාශ්ඨි දක්කේ...'

'ත..ව ටි..ක කා..ල..ය..ක් ඒ.. දු..ක විඳිනවා...'

වෙන මොනවා කරන්නද... දවසක ඔහුම මේ පපුවට සැනසීම ගෙනෙනු ඇත.

'උ..ඹට කෙල්ලේ...'

'ඉ..තින්...'





'අයියා ගාව ඉන්න අර බඩ්ඩ ගැන බය නැද්ද...'

එවර නම් වර්ෂා සිනාසුණාය.

'එහෙම කෙනෙක්ට මේ ආදරේ කඩන්න බෑ ප්‍රියා... එහෙනම් මේ ලෝකේ දෙයියෝ කියලා කෙනෙක් නෑ...'

'කවුද දන්නේ එහෙම කෙනෙක් ඇත්තටම ඉන්නවද කියලා... මෙච්චර පව්කාර වැඩ මේ ලෝකේ වෙන්නේ... තිස්තුන් කෝටියක් බලා ඉඳිද්දී...' ප්‍රියංවද එහෙම සිතුව මුත් කීවේ නැත. අමාරුවෙන් හිත හදගෙන ජීවත් වෙන කෙල්ලගේ හිත බිඳිය නොහැක.

'බලමුකෝ... අයියට සනීප වෙලා නම් අපට දනගන්න පුළුවන්නේ...'

'චූ..ට්ට දවසක් මෙහෙම ගියදෙන් ප්‍රියා...'

'ඉන්නව තමා කෙල්ලේ...'

'අපි මේ හෝටලේ කරගෙන ඉමු... දන් ලබන සතියේ පටන් ගන්නවනේ...'

වර්ෂා ජීවිතය ගැන සිතුවේ එහෙමය. ඇගේ හිතේ සැනසීමකට තිබූ එකම දේ විශ්වාසයය. මේ ආදරය ගැන උපන් අප්‍රමාණ වූ විශ්වාසයය.

'අවුරුද්දක් ඔයාට හිතන්න බැරුව තිබ්බා... ඒත් සනීප උනාම පුළුවන්... මගේ විමුක්ති මට ආයේ ලැබෙනවනම් ඒ පරණ විමුක්තිම වෙන්න ඕන... අලුත් විමුක්ති කෙනෙක් මට එපා...'

ඒ වර්ෂාගේ විශ්වාසයය. 'පුතා ගොඩක් ලොකු වෙන්න කලින් ඔයා එනවනම් හොඳයි...' වර්ෂා සිතුවාය.

'ප්‍රි..යා.. පුතා නේද අඬන්නේ...'

ගේ ළංවෙද්දී වර්ෂා ගැස්සී කීවාය.

'ඔ..ව් කො..ල්ල ත..මයි...'

'අ..නේ.. මො..කද දන්නෑ...'

වර්ෂා එහෙමම දිව්වාය. ප්‍රියංවදගේ පපුව ඇවිලීගෙන ගියාය. 'මේ කෙල්ලගේ ජීවිතේම තියෙන්නේ ඔයාගේ අතේ...' ගෙට දුවන

වර්ෂා දෙස බලා ප්‍රියංවද සිතුවාය.

'අ..නේ ඇ..යි අ..ම්මේ...'

වර්ෂා දුවගෙන ආවේ දවෙමින් මෙනි. අම්මලාට එහෙමය.

'බ..ඩ..ගි..නි වෙලාද කොහෙද පුතේ...'

'හරි ම..ගේ පැටියෝ... අ..ම්මි ආවනේ... හරි හරි... සුදු මහත්තයට බ..ඩගිනි ආවද... අ..නේ...'

වර්ෂා එහෙමම බ්ලවුසයේ බොත්තම පන්නා සුදු තනය පිටතට ගත්තාය. කොල්ලාට ඉවසුමක් නැතුව තනය පුරා මුහුණම ඇකිල්ලුවේය.

'බ..ඩ..ගි..නි වෙ..ලා අ..ම්මේ... අද බෝධියේ සෙනග...'

කොල්ලන්ට එහෙමය. බඩගිනි ආ විට වියරු වැටෙයි. වර්ෂා තන පුඩුව ගෙන පුතාගේ කටටම තිබ්බාය. ලෝකයේ ඇති ලොකුම සම්පත ලැබුණාක් මෙන් කොල්ලා එය සූස් සූස් ගා උරන්නට විය. වර්ෂාගේ දෙනෙත් තෙත් වීගෙන ගියේය. ප්‍රියංවදත් අම්මාත් බලා උන්නේ හූල්ලමිනි.

'ඇඟ හෝදලා එහෙමනේ තිබ්බේ... චුට්ටක් වෙලා දහල දහල උ..ණ්.නා... පස්සේ අඩන්න ගත්තා...'

'දන් පූසා වගේ කිරි බොනවා...'

'පුත්තු ඔහොම තමා... අම්මලාට නිවනක් නෑ... තනේ එල්ලිච්ච ගමන්... අවුරුදු තුන හතරක් බොයි...'

'අනේ බීපුදෙන් අම්මේ... කිරි එරෙනකල් බීපුදෙන්...'

වර්ෂා ඇස් පියාගෙන කොල්ලාගේ හිස සිප ගත්තේ දරු සෙනෙහසින් මිරිකී යද්දීය. 'අපේ ආදරේ පපුවට දුන්න දුකත් ඇති මේකුත් ඇති...'

'ගේම ඉඳි ආප්ප පුවදයි අම්මේ...'

'ටිකක් යහමින් කන්න... ඔය කිරි එරෙන්නත් එපැයි...'

'එද අම්මා හදපු කඩල පරිප්පු තෙම්පරාදුව නම් හරි රහයි... නේද ප්‍රියා...'





'ම්...'

'මං දියේ දලා තියෙන්නේ... උණුවෙන් හදලා දෙන්නම්...'

කොල්ලා නින්දෙනුත් තනය උරයි. ඒ වටාම කිරි තැවරී ඇත. 'අනේ මෙහෙම ඔයාගේ පුතා පෙරේතයා වගේ කිරි බොනවා බලන්න ඔයා නෑනේ...' වර්ෂාට සිහි වන්නේ විමුක්තිවමය.

# 29

Hemantha007
For Free Distribution Only

**මේධා** විමුක්තිව බලන්නට ආවේ ලස්සන අලුත් මල් පොකුරක්ද රැගෙනමය. ඇයත් සක්විතිත් එද්දී සුරම්‍යාත් මොරගොඩ මහතාත් එහි උන්නෝය.

'අ..ම්මේ...'

'ආ.. මේ දන් අහ අහ හිටියේ... ඔයා ගැන...'

මේධා පහත් වී විමුක්තිව සිප ගත්තාය. ඇගේ ඇස්වල කඳුළුය.

'අපේ ම..ල්ලි ආ..යෙ..ත් අපිට ලැ..බුණා අ..ම්මේ...'

මේධා කීවේ අඬමින් මෙනි. ඇය එහෙමම සක්විති අතේ උන් දුවව ගත්තාය.

'මේ... ම..ගේ කෙ..ල්..ල ම..හ..ත්..තයෝ...'

මේධා කෙල්ලව එහෙමම තිබ්බේ විමුක්තිගේ පපුව උඩය. විමුක්ති කිරි කැටි දුව දෙස බලා උන්නේ දිළිසෙන දෑසිනි. තමාගේ ලෙයින් මේ ලොව මෙවැනිම පුතෙක් ඉපදී ඇති බව විමුක්ති දන්නේ නැත. මේ මොහොතේත් ඔහු කෙල්ලගේ තනය බදගෙන ඉන්නා බව ඔහු දන්නේ නැත.

පුදුම ඒකය.





විමුක්ති ආදරයෙන් දුවව පිරිමැද්දේය.

'අ..ක්..කා ව..ගේ ල..ස්ස..නා..යි...'

විමුක්ති කීවේ ආදරයෙනි.

'එ..යා ඉ..පදිච්ච ස..තු..ට..ත් අදයි අපි වි..න්.දෙ...'

සක්විති කීවේය.

'මං ව..ත් තා..ම කෙ..ල්ලව හරියට තියාගෙන ඉඳල නෑ... පපුවේ ගින්දරනේ...'

දුව දෙස බලා සිටිද්දීත් විමුක්තිට සිහිවූයේ වර්ෂාවය. අක්කාගේ බඩට මේ දරුවාව ගන්නට වැඩියෙන්ම දුක් වින්දේ ඇයය. 'ඔයා මේ දුවවවත් බලන්න ආවේ නැද්ද...'

දුව දෙස බලාගෙන කොල්ලා සිතන්නේ කුමක්දැයි මේධා ඉවෙන් මෙන් තේරුම් ගත්තාය. මේධා විමුක්ති දෙස බලා යංතමට සිනාසුණාය. 'කෙල්ල වැස්සක් වගේම ආවා... වැස්සක් වගේම ගියා...' මේධාගේ දෙනෙත් වල වූයේ එහෙම කතාවකි.

'පිරිතක් එහෙම කියලා හොඳ සාංඝික දනයක් දීලා තමා හුස්මක් ගන්නෝන...'

සුරම්‍යා කීවාය.

'මේ පවුලට මොකක්ද අපලයක් තිබ්බා... ඒ අපල මෙහෙමම ගෙවෙයි... ලොකු පුතත් දන් රස්සාවෙන් අස් වෙච්ච එකේ ට්‍රාන්ස්පෝට් එකේ වැඩ බලාගන්න...'

සුරම්‍යා ලද අවස්ථාවෙන් ඒ වචන ටික කීවාය. 'ඊට පස්සේ ඔයාගෙයි මගෙයි වෙඩින් එක...' හිමාලි සිතුවාය.

'ගෙවල් දෙරවල් තිබ්බද කියලවත් මතක නෑ... කවදද ලොකු පුතේ මල්ලිව ගෙදර එක්කගෙන යන්න පුළුවන්...'

'හෙට අනිද්ද පුළුවන් තාත්තේ... එහෙම ගියත් මල්ලිට එකපාර වැඩ කරන්න බෑ...'

'කරන්න ඕනෙත් නෑ...'

'දුවත් දන් ඉන්න එකේ පොඩි පුතා ගෙදරට වෙලා ටිකක්

නිස්කලංකේ ඉන්න... මං ආරක්ෂාවකුත් දන්න උන්නේ... දිගටම අපලමයි තිබ්බේ...'

හිමාලි ඒ ළඟට වී පුදුමාකාර අහිංසක බවකින් උන්නාය. මේධාගේ අතින් දූවව ගත් ඇය තනිවම දූවා සුරතල් කළාය.

'ඉක්මනට මල්ලිව ගෙදර එක්කං එන්න ලොකු පුතේ... පවුලම එකට ඉඳලා කිරිබත් කැල්ලක් කන්නයි මට ඕන... ගිය සිංහල අවුරුද්දට ගෙදර කිරිබත් ඉව්වෙත් නෑ...'

'අ..පේ ගෙදරත් ඉව්වේ නෑ අම්මේ...'

'ඒ ඔක්කොම කරදර දැන් ඉවරයි...'

විමුක්ති උන්නේ දහසක් ප්‍රශ්න හිතේ තබාගෙනය. එහෙත් ඒවා කොහෙන් හිතන්නට පටන් ගන්නදැයි ඔහුටම තේරෙන්නේ නැත. තාමත් ඔළුව තෝන්තු වූවා සේය.

* * * * * * * * * * * * *

මේධා මොහොතකට හිමාලිව රෝහල් කාමරයෙන් එළියට එක්කාගෙන ගියාය.

'නංගී...'

මේධා කතා කළේ හිමාලිගේ අතින් අල්ලාගෙනමය.

'අ..ක්..කේ...'

'හෙ..ට ගෙදර ය..න ගමන් චුට්ටකට ඒ පැත්තෙන් එ..න්..න...'

'මං එ..න්..නම් අක්කේ...'

'නංගී අයියට කියපු හැමදේම මට කිව්වා...'

'මට එ..හෙ..ම කියවු..ණා අක්කේ...'

'ඒකට ම..ට උඹට පින් දෙන්න ඕන... උදේ එන්න හොඳද...'

'ම්...'

'මාරයි...' හිමාලි සිතුවාය. මොරගොඩ පවුලේ මහ කට්ටිය පමණක් නොව ලේලිලාද අන්දවන එක මහ දෙයක් නොවේ.





සුරම්‍යාද දෙර ඇරගෙන පිටතට ආවාය.

'අක්කා තනියම ඔක්කොම කරගන්නවලු... චූට්ටක් කතා කළානම් එයා එනවලු... මට කතා කරලා කියන්නලු...'

සුරම්‍යා කීවාය. මේධා සිනාසුණාය.

'දැ..න් මල්ලිගෙත් වැඩනේ අම්මේ...'

'ඇස්දෙක වගේ බලාගන්න වෙයි... ඔය හිටියට කොහොමත් පොඩි ළමයා වගේ...'

'මං ඒ පොඩි ළමයව ගාණට හදලා ගන්නම් මට ඕන විදිහට...' හිමාලි සිතින් කීවාය.

'මං හෙට ඒ පැත්තේ එන්නම් පුතේ...'

සුරම්‍යා මේධාගේ අතින් අල්ලා ගත්තාය.

'අ..ම්මා දවල්ටම එන්නකෝ බත් ටිකක් කාලා ය..න්න...'

'ම්... ඔයාගේ බත් කටක් කැවෙත් නෑ තමා කාලෙකින්...'

'මං කිරි කොස් හදලා තියන්නම්...'

මේධා සිනාසී කීවාය.

'සාරියට ඔයා ලස්සනයි...'

සුරම්‍යා ගිය පසු මේධා කීවාය. මේධාට වර්ෂාව සිහි නොවෙනවා නොවේ.

'නිකං ඇන්දේ අක්කේ...'

'එහෙනම් උදේ එන්න හොඳේ...'

'හා...'

මේ තරම් ප්‍රතිඵල ලැබෙන බව දන්නවා නම් මේ සටන මෙහෙම පටන් ගන්නේ මීට පෙරය. 'දැන් කමක් නෑ... වෙලාවට ඔක්කොම වුණා... දැන් තමා විමුක්ති සටන පටන් ගන්නේ... අද රෑ ඉඳලා...' හිමාලි දැඩිව අධිෂ්ඨාන කර ගත්තාය.

* * * * * * * * * * * * * *

සියල්ලන්ම ගිය පසු හිමාලි විමුක්ති දෙස බැලුවාය. 'ඔයාට දැන් ඉන්නේ මං විතරයි...' කියන්නාක් බඳු බැල්මක් ඇගේ දෑස්වල විය.

විමුක්ති යංතමට සිනාසුණේය. හිමාලිගේ පපුව අලුත් ලෝබකමකින් පිරුණි. ඇය එහෙමම පැමිණ බරවූයේ විමුක්තිගේ ඇඳේ ඔහුගේ දෙපා අද්දරටය.

'බ..ඩ..ගි..නිද අයියේ.. ම්...'

හිමාලි පුදුමාකාර සෙනෙහෙබර කටහඬකින් ඇසුවාය.

'ප..ස්..සේ ක..න්..න..ම් නංගී...'

'තේ චු..ට්..ට..ක් පොව..න්..නද එ..හෙ..නම්...'

'ක..ම..ක් නෑ...'

'ඉ..න්..න..කෝ තේ ටිකක් බීලා අපි පස්සේ කමු...'

ඇය කාමරයේ වූ මේසය වෙතට යද්දී විමුක්තිගේ දෑස් ඇය පසුපසම ගියේය. 'ඔයා මං දිහා බලනවා... මං දන්නවා...' ඔහුට බලාගන්නටම දී හිමාලි පසුපස හැරීගෙන උන්නාය.

මෙහෙම කෙනෙක් මේ ජීවිතයට හිටි හැටියේ ආවේ කෙසේදැයි විමුක්ති සිතුවේය. හිමාලිව දක්කේ මීට අවුරුදු තුන හතරකට පෙරය. ඒ දවස්වල ඇය පාසල් යන පුංචි කෙල්ලෙකි. අද මෙහෙම ඉන්නේ ඒ කෙල්ලමදැයි විමුක්තිට පුදුමය.

'නිකං තේකක්ම බොමු... කිරි තේ බිව්වොත් බඩ පිරෙයි...'

හිමාලි සාරි පට ඉස්සරහට ගෙන ඔහු ළඟින්ම ඉඳගත්තාය.

'කෝ... ඔ..හොම බෑ... ඉ..ස්පොල්ලේ යයි...'

හිමාලි තේක තබා ඔහුගේ දෙඋරට දෑත් තැබුවාය.

'මි.. ම..ගේ ඇඟට බර දීලා ඉස්..සෙ..න්න...'

විමුක්ති එහෙමම කළේය. එහෙම කරද්දී ඒ මුහුණ ඔහුගේ මුහුණ අද්දරටම එයි.

'හ..රි... තාම අත් ප..ණ නෑ වගේද...'

'මො..නා..ද වෙ..ලා ව..ගේ...'





'ඒව හ..රි යයි... ගෙදර ගියාම තෙල් ටිකක් ගාලා මසාජ් කරමු...'

'ම..ට මො..කද වු..ණේ නංගී...'

හිමාලි සිනාසුණාය.

'වෙච්ච දේවල් ගැන දැ..න් අයියා මොකට හිතනවද... ඔයා ස..නීප උ..නානේ... මං ගෙදරට එද්දී අයියා හිටියේ මෙ..හෙම නෙ..මේ...'

විමුක්ති ඇය දෙස බලාගෙනම උන්නේය.

'එ..ච්..චර දු..ක..ක් න..ම් දනිලම නෑ...'

'නංගි මො..න කැ..ම්පස් එ..ක..ටද තේ..රුණේ...'

'සෞන්දර්ය කැම්පස් එකට... මං නුවරින් වැඩිම ලකුණු අරන් ආවේ... ආට්ස් වලට...'

'ඇ..යි ඉ..ති..න්...'

එවරද හිමාලි ලස්සනට සිනාසුණාය.

'සක්විති අයියා ඇවිත් පාන්දරම අයියව නාවලා අන්දවලා එහෙම දීලා ය..නවා... එතන ඉඳලා බලාගත්තේ ම..ම... ස..නීප වු..ණාම කැම්පස් යනවා කියලා හිතුවා... එහේ නැවතිලා කැම්පස් යන්නනේ ආවේ...'

'අ..පේ ගෙ..දර...'

'ම්.. අම්මා ඇවිත් නැවැත්තුවේ මෙහේ...'

'දැ..න් කවදද ය..න්..නේ...'

හිමාලි මොහොතක් ඔහුට තේ පෙව්වාය.

'දැ..න් ෆස්ට් ඉයර් එක ඉවර වෙන්නත් ආවා... විභාගෙත් ලබන ස..තියේ...'

'එ..ත..කොට...'

'ඒකට කමක් නෑ... අයියට ස..නීප උ..නානේ... තව ටිකක්

සනීප උනාම මං නුවර ය..නවා...'

'එ..තකොට ස්ටඩීස්...'

'දැ..න් ආයෙත් ගිහින් කොහොම ක..ර..න්..නද අයියේ... මං කැම්පස් එකේ නෝට්ස් අරන් ඇවිත් රෑට අයියා ළඟ ඉඳගෙන බැලුවා...'

විමුක්ති බලාගෙනම උන්නේය.

'අ..මාරුයි...'

'මං නිසා... අ..ප..රාදේ...'

හිමාලි ලස්සනට සිනාසුණාය. 'දැන් ඒකට වන්දි ගෙවන්න...' ඇය සිනින් කීවාය.

'මං කළේ ම..ට හිතිච්ච දේ... අයියා හිටියේ කොමා තත්වෙක... ඔයාව ගොඩ ගන්න පුළුවන් වෙයි කියලා හිතුවේ නෑ... සක්විති අයියා රට එක්කං යන්නත් හිතුවා... එයා රස්සාවෙනුත් අස් වුණා... ඔයාව බලාගන්නෝන නිසා... අපි දෙන්නා මාරුවෙන් මාරුවට ඔයා ගාව හිටියා... ඔ..යා අද මෙ..හෙම ඉන්..නකොට වැඩියම සතුටු ම..ටයි ලොකු අයියටයි... අපි දෙන්නා ඔයාගේ කක්කි ටික පවා හේදුවා... හ..රි ආදරෙන් එ..හෙම කළේ.. අහිතක් නැතුව...'

හිමාලිගේ දෑස්වල කඳුළුය. විමුක්ති කතා නොකර බලාගෙනම උන්නේය.

'අ..යියා... ලස්සනට ඇඳගෙන ට..යි එ..ක දගෙන බුක් ෂොප් එකට යන දවසට...'

'ම්...'

'මා..ව..ත් පිටකොටුව ස්ටෑන්ඩ් එකෙන් නුවර බස් එකට දගෙන ය..න්..න ම..ට ඒ ඇති...'

තවත් තේ උගුරක් ඔහුගේ නිකට අල්ලා පොවමින් හිමාලි කීවාය.

'මං එ..ක්..ක නුවර ගියා අයියට මතක නෑ...'





'ම..ම ගි..යා.. නංගි එ..ක්..ක...'

'ම්.. දැන් මාස දෙ..ක..ක් වි..තර ඇති... නුවර දේවාලෙක පූජාවක් ලැස්ති කළා අම්මා... මං අයියව එක්කගෙන ගිහින් ලොකු සෙත් ශාන්තියක් කළා... මාළිගාවට එක්කං ගිහින් බාර වුණා... දැ..න් ඒවා ගි..හි..න් ඔ..ප්පු ක..ර..න්..නත් ඕ..න...'

මේ අසාමාන්‍ය කතන්දරය ඉදිරියේ විමුක්ති ඉන්නේ ගල් ගැසීය.

'උ..ණු ව..තු..ර ටිකක් ගෙනත් මූණයි අත් දෙකයි කකුල් දෙකයි මං ස්පොන්ජ් කරන්නම්... වේලිලා ගිහින්... අයිසීයූ එකේ උන්නේ මිනියක් වගේ... තොල් සුදු වෙලා තිබ්බේ...'

'ම..ට නැ..ගිටි..න්..න බැරිද නංගී...'

'තාම බැ..නේ... මේ වූ ය..න්..න බ..ට එ..හෙම දලනේ...'

හිමාලි විමුක්තිගේ ඇඳ යට පිරී තිබූ මූත්‍රා බේසම රැගෙන බාත්රූම් එකට ගොස් දමා සෝදගෙන ආවාය. විමුක්තිට මේ සියල්ලම පෙනෙයි.

'ගෙදර ගියාම උදේට ලොකු තැඹිලි ගෙඩියක් බොන්නෝන... හවසට බෙලි මල් වතුර ටිකක් බොන්න ඕන... ඒ තරමට වූ කහ පාටයි... ඇයි පුදුම බෙහෙත් කන්දරාවක් ගැහුවේ...'

හිමාලි සැනසුම් සුසුමක් හෙළා යළිත් ඉඳගෙන ඔහු දෙස බැලුවාය.

'නංගිව අ..ඳුනන්..න..ත් බෑ...'

'මං ලස්සන වෙලා නේ...' හිමාලිට සිතෙන්නේ එහෙම අහන්නටය.

'අයියා අවුරුදු හතරකින් විතර මා..ව දැ..කලා නැනේ...'

'ලො..කු වෙ..ලා...'

'ඒ සාරියට...'

හිමාලි දෙනෙත් බර කරගෙන සිනාබරව කීවාය. 'ඔයත් හිටියනම් මෙහෙම මං ළඟට වෙලා ඉඳියි...' විමුක්ති සිතුවේ වර්ෂා ගැනය.

ඇයට කුමක් වූවාද... 'මූණ එකපාර අමුතු වුණා... අරකිව මතක් වෙන්න ඇති...'

'අයියේ... මං පාන්දර ඉඳලා මේක ඇඳගෙන... චූ..ට්ටක් වොෂ් එකක් දගෙන ඇඳුමක් දගෙන එ..න්..න..ද...'

විමුක්ති හිස වැනුවේය.

'මං නර්ස් කෙනෙක්ට කතා කරලා එන්න කියන්..නද...'

'එ..පා...'

'ඇඳෙන් එකපාර බහින්න එහෙම ය..න්..නෙපා... මං ඉ..ක්..ම..නට එ..න්..න..ම්...'

'හි..මි..න් ක..ර ග..න්..න...'

'ඉ..න්..න..කෝ මං ටී..වී එ..ක දලා ය..න්..නම්...'

'එ..පා... මං මෙ..හෙම ඉ..න්..න..ම්...'

හිමාලි ඇඳුමකුත් රැගෙන නාන කාමරයට ගියාය. විමුක්ති එහෙමම දෑස් පියාගෙන වර්ෂා ගැන සිතුවාය... ඔහුට සිහිවූයේ අවසන් වරට මංගල උත්සවය යෙදුන දිනවල ඇය ගැන සිතූ දේවල්ය. එකවරම ගැස්සී මෙන් විමුක්ති දෑස් ඇරියේය. 'ඔයාට එහෙම මාව දල ය..න්..න බෑ... ඔයා කොහෙද ඉන්නේ... ඇයි මාව බලන්නවත් ආවේ නැත්තේ... මේධක්කා දන්නවා ඇ..ති...' විමුක්ති සිතුවේ යළිත් දෑස් පියා ගනිමිනි.

* * * * * * * * * * *

මේ රෑ... මේ මොහොතේ වර්ෂා උන්නේ පුතාව නිදිකර චිත් ගේ දෙරකඩ කටු සිමෙන්ති පඩියට වී මිදුල දෙස බලාගෙනය.

'ඔයා මේ රෑ මො..නවා කරනවා ඇත්ද...'

වර්ෂා සිතුවාය. ඔහු ළඟ ඇතුවාක් වැනි හැඟීමක් ඇයට දනෙයි.

'ටි..ක කාලයක් මායි මගේ කොල්ලයි මේ දුක විදින්නම්





ර..ත්ත..රන්... ඒත් ඔයා ලැබෙනවනම්... නැත්නම් කලා වැවට පැනලා මැරෙනවා ම..ම... ම..ගේ පැටියත් එක්කම...'

හේතුවක් නැතුවම වර්ෂාගේ දෙනෙතින් කඳුළු කැට දෙකක් පැන්නේය. අසාමාන්‍ය දුකක් විඳින ඕනම ගැණියෙක්ගේ දෙනෙත් මෙහෙමය. ඒවාට නිවනක් නැත. ඉඩක් ලද විගස ඒවා වලින් කඳුළු පනියි.

උළුවස්සට බරවී උන් වර්ෂා ඒ ගලන කඳුළුවලට එහෙමම ගලා යන්නට දුන්නාය. අම්මා මිය ගිය ද සිට මේ දෙනෙතින් ගලන කඳුළු තවමත් නතර වී නැත. ඒ ගලන කඳුළු අලුත් වෙනවා පමණි.

'මං හින්ද අම්මේ ඔයාටත් සැනසීමක් නැතුව ඇති... මාව දලා යන්න බැරුව ඔයත් මං වටේට වෙලා ඇති... පව්...'

අම්මාගේ ආත්මය මේ අවට සැරිසරනු වර්ෂාට මේ මොහොතේදීත් දනෙයි. ඒ හැඟීම පුදුමාකාරය.

'ජීවිතේ එකලාසයක් වෙන්න ටික කාලයක් යයි අම්මේ... එහෙමම කියලා සැනසීමක් නෑ...'

'හිතන් හිතන් ගියාම හරියට දුක හිතෙනවා... අපි කොහොමද එකතු වෙන්නේ... එයා ඒ ඔක්කොම දලා එයිද... එන්න දෙයිද...'

කෙල්ල නාසය උඩට ඇද්දය. ආදරය කොතරම් දුකක්ද... පපුවට ලෝ දිය දන්නාක් බඳුය. ඒ ලෝ දිය උතුරන දුක් ගංගාවේ පීනමින් විඳිනා සැප කුමක්ද...

'ඔයාව අමතක කරලා ජීවිතේ හදගන්න බෑ අයියේ... කොහොමත්ම බෑ... පුළුවන් නම් මේ දුක් ගින්දර උහුල උහුල මං ඉන්නෑ... ඔයාට සුදු ලස්සන අනාගතයක් පතලා මේ නාලිනී නැන්දගේ දුප්පත් කෙල්ල ඔයාගෙන් ඈත් වෙනවා...'

ඒත් එසේ කරන්නේ කෙසේද... දැන් මේ ආදරය නිසා තවත් ජීවිතයක් මෙලොව එළිය දැක අවසානය. අර ගඩොල් කාමරයේ මේ කිසිවක් නොදන නිදන්නේ ඒකාය.

'තාත්තා කෙනෙක් නැති දරුවෙක් විදිහට මං විඳපු දුක මායි දන්නේ... මගේ කොල්ලට ඒ දුක විඳින්න මං දෙන්නේ කොහොමද... ඔයා වගේ සුදු රත්තරන් තාත්ති කෙනෙකුත් ඒකට ඉඳිද්දී...'

හදවත බුර බුරා අහන්නේ ඒ ප්‍රශ්නයය. දෙනෙත් පලාගෙන මේ ගලන්නේ ඒ ගිනි කන්දේ ගිනිගත් ලාවාය.

'බලන් ඉන්න එක කොච්චර අමාරුද කියලා මායි දන්නේ රත්තරන්...'

සැනසීමක් ජේන තෙක් මානයකවත් නැති කතරක බලා ඉන්නේ හිස් දූවිලි සුළඟ එන තෙක්ද... කාන්තාරයට වැහි අනෝරා වැටෙන තෙක්ද...

'ඒ..ත් මං බ..ල..න් ඉ..න්..න..ම්...'

වෙන කරන්නට දෙයක් නැත. ජීවිතයේ පිළිතුරු ඇත්තේ ඔහු අතය. මේ සියොළඟ පුරා ප්‍රශ්නය. දුකය.

කෙල්ල යළිත් නාසය සීරුවාය.

'කෙ..ල්ලේ...'

ඉඳි ආප්ප බෙදාගෙන ආ ප්‍රියංවද ඉඳගත්තේ පිහාන ඇය අතට දෙමිනි.

'ඇයි ර..ත්..තරන් මේ...'

'නිකං ප්‍රියා...'

අඬන හේතු අසා වැඩක් නැත. හදවත කඳුළු උල්පතක් වූ කල ඇස් ගැන කවර කතාද...

'මං උණුවෙන්ම බෙදාගෙන ආවා...'

ඉඳි ආප්ප මත කඩල පරිප්පු තෙම්පරාදුව බෙද තිබුණි. උණුවෙන්ම බෑ පොල් මැල්ලුම් හැන්දක්ද පැත්තක බෙද ඇත.

'කාපං කෙල්ලේ...'

'හරි සුවඳයි ප්‍රියා...'

'උණුවෙන්ම කාපං...'

ඉඳි ආප්ප කට රසය.





'කෙ..ල්ලේ...'

'ම්...'

'ජීවිතේ ටිකක් අමාරු තමා කෙල්ලේ...'

'ම්...'

'ඒත් අපි සතුටින් ඉන්න බලමු...'

'මං ද..න්..නවා ප්‍රියා...'

'ඒත් උඹ හිටපු ගමන් කඩා වැටෙනවා...' ප්‍රියංවද සිතුවේ දුකෙනි.

# 30

ඇඟ සෝද ගන්නට ගිය හිමාලි නැවත ආවේ සාරිය උනා දමා ගොම පැහැ ගත් සායට සුදු කමිසයක් වැනි බ්ලවුසයක් ඇඳගෙනය. බැඳගෙන උන් කොණ්ඩය උරහිස මතට වැටෙන්නට දමූ ඇය නාන කාමරයේදීම රෝස පුයර බිඳක් මුහුණට ගල්වා ගත්තාය. ඊටත් පසු විලවුන් බිංදු කිහිපයක් ගෙළට ඉසගත් ඇය කුඩා කණ්ණාඩියෙන් තම රුව දෙසම බැලුවාය. රන් චේන් පටේ පැන්ඩනය පපුව මැදට වෙන්නට වැටෙන්නට දමූ ඇය එහෙමම කැඩපතේ උන් හිමාලිට සිනාසුණාය.

'මං ඔයාව පුදුම කරන්න පටන් ගත්තා විතරයි...'

හිමාලි ඇගේම රුවට කියා ගත්තාය.

'සටනක් පටන් ගත්තාම ඒ සටන අත් අරින්න නරකයි... එල්ලීගෙනම ඒ සටන කරන්න ඕන... ජය ගන්නවමයි...'

හිමාලි සිතා උන්නේ එලෙසිනි. සටනක් දිනන්නේ අරමුණු යහපත් වූ විට පමණක් බව ඇය දන උන්නේ නැත. සටන අත් නොහැරම උන් ප්‍රභාකරන් නන්දිකඩාල් කලපුවේ මිය ගියේ පරාජිතයෙකු ලෙසිනි. දෛවය එහෙමය.

ඒත් හිමාලි සිතුවේ අරමය. ඇය ඇගේ රෝස පාට තොල් පට කෙළ පොදකින් තෙමාගෙන නාන කාමරයේ දෙර ඇරියේ ඔහු දෙස





බලාගෙනමය.

විමුක්ති දක්කේ ටිකකට කලින් උන් හිමාලිව නොවේ. වෙනස්ම යුවතියකි. 'මොනවද ඔයාගේ ඇස් වලට වෙන්නේ... ම්...' එහෙම අහන්නේ ඇගේ හිතය.

'දැ..න් ක..මු අයියේ...'

සුවඳ දනෙන තරමටම ළංව ඇය ඇසුවාය.

'නංගී...'

'අ..යියේ...'

'මා..ව බ..ල..න්..න කවුද ආවේ...'

එහෙම අහද්දී හිමාලි ගැස්සුණාය.

'කවුරුවත්ම ආවේ නෑ... ආ... දවසක් බුක් ෂොප් එකේ ළමයි ටික ආවා...'

'වෙ..න...'

'එ..හෙ..ම විශේෂ කෙ..නෙක් ආවේ නෑ අයියේ... මං ඔයා ළඟමනේ උන්නේ...'

විමුක්ති බලාපොරොත්තු කඩ වූ නෙතින් ඇස් හැරවූවේය. 'අර බැල්ලි ආපු එක දනගන්න තියන්නම නරකයි...' හිමාලි සිතුවාය.

'නංගි...'

විමුක්ති කතා කළේ වෙනස්ම ස්වරයෙනි. හිමාලි කොණ්ඩය ගෙළ අද්දරින් ඉදිරිපසට ගනිමින්ම ඔහු දෙස බැලුවාය. 'දෙයියනේ ඒ ඇස් අමුතුයි...' හිමාලි සිතුවාය.

විමුක්ති කියන්නට ආ දේ ගිලගෙන මෙන් ඇය දෙසම බලාගෙන උන්නාය. හිමාලි දක්කේ මෙතුවක් තිබූ විමුක්තිගේ දෙනෙත් නොවේ. ආදර ගින්දරෙන් දැවුණු අතීතයේ තිබූ ඇස්ය. අසරණ ආදරවන්තයාගේ පරාජිත ඇස්ය.

'ඇ..යි අ..යියේ...'

හිමාලි ඇසුවේ උගුරින් මෙනි.

'එ..යා...'

'අර බැල්ලි ගැනයි ඔය අහන්න යන්නේ...' හිමාලි ගැහෙන පපුවෙන් සිතුවාය.

'ක..වු..ද අ..යියේ...'

'ව..ර්ෂා...'

හිමාලි බලාගෙනම උන්නාය. ඒ නම ඇහෙද්දීත් හිමාලිව වෙව්ලයි.

'ද..න් ඇයි මේ පරණ දේවල් මතක් කරන්නේ... ගිනි ගොඩක නේද හිටියේ... ම්...'

ආදරය ගිනි ගොඩක් නම් පෙම්වතුන්ගේ පපුව ගිනි මැලයකි. ඒ ගිනි ගොඩ එසේ නිවෙනා ගිනි ගොඩක් නොවේ.

විමුක්ති කතා කළේ නැත.

'අ..යියගේ ජීවිතේ කඩාගෙනම වැටුණා... මං එද්දී ඔයා අර උඩ කාමරේ බිත්තියක් දිහා බලාගත්ත අත බලාගෙන උන්නේ... ඔයාව බඳින්න ගිය කෙනත් නෑ... ඔයා බඳින්න හිතාගෙන ආදරේ කරපු අයත් නෑ... පාළු මූසල කාමරේක ඇඳක් උඩ බාජ්ජු කොට කලිසමක් ඇඳගෙන මේ විමුක්ති උන්නේ... එන කෙනෙක්ට එනවනම් එකපාරට දහපාරක් එන්න තිබ්බා... ඒත් ඔයාගේ අර රත්තරන් අයියා ඇරෙන්න කෙනෙක් ආවේ නෑ...'

විමුක්ති දෑස් අඩවන් කරගෙන අසා උන්නේය. වෙන කුමක් කරන්නද...

'නුවර ඉඳලා ආපු මට ඔයා දිහා බලද්දී දරාගෙන ඉන්න බැරි වුණා... ඒත්...'

කියන්නට ගිය දේ හිමාලි ගිල ගත්තාය. නොවේ නම් ඉතුරු ටික ඔහුට හිතන්නට ඉඩ තිබ්බාය.

'අ..යියේ...'

හිමාලි කතා කළේ ඔහුගේ හිරිවැටුණ හිසට අත තබාය. දෙනෙතට දෙනෙත් තබාය.

'ඔ..යා වෙ..නුවෙ..න් දු..ක් වි..න්ද ගෙදරට දන් ඉරක් වෙන්න...





ආයෙත් ඒ වැහි අන්ධකාරෙන් මුළු ජීවිතයම අඳුරු කරගන්නෙපා... ජීවිතේ අලුතින්ම පටන් ගන්න... හි..මි..හි..ට...'

ජීවිතය පටන් ගන්නේත් අවසන් කරන්නේත් ආදරය වෙනුවෙන් යැයි සිතූ සිතක් එලෙස කරන්නට හිත හද ගන්නේ කෙසේද... විමුක්තිට සිතා ගන්නට නොහැක.

'එ..යා කෝ නංගී...'

'මාත් අහන්නේ ඒකම තමා... එයා කෝ... අහන්න ඔයාගේ අයියගෙන්... අක්කගෙන්... එයා කෝ කියලා... තමන්ගේ අය කියන්නේ දුක බෙදගන්න අයට... දුකට කර ගහන අයට...'

'මං වගේ...' හිමාලි මේ නොකියා කියන්නේ එයය.

'ක..මු අ..යියේ...'

හිමාලි ඉඳි ආප්පත් කිරි හොදිත් සීනි සම්බෝල ටිකකුත් බෙදගෙන ඔහු ළඟින් ඉඳගත්තාය.

ඇය නෙත් බර කරගෙන ඉඳිආප්ප ඇනුවේ ඔහුට ඕනා තරම් තමාව බලාගන්නට දීය.

එහෙත් මේ මොහොතේ විමුක්තිගේ දෑස් තිබුණේ හිමාලි වෙත බව ඇත්තය. ඒත් හිත තිබ්බේ වර්ෂා ළඟය.

'ම්.. ක..න්..න...'

පිඟාන ඔඩොක්කුවේ තබාගෙන ඔහුගේ නිකටට වමත තබා හිමාලි විමුක්තිට කැව්වාය.

'අ..ප්පිරියයි ව..ගේ..ද...'

විමුක්ති සිනාසුණා පමණි.

'එකපාර කන්න අමාරුයි තමා... ගෙදර ගියාට පස්සේ ආස ආස දේවල් කියන්නකෝ හදන්න... කිරිබත් නම් දවසක් ගොඩක් කෑවා... මං හොඳට මාළු එහෙම දලා කැව්වේ... කාලා පැය පහක් විතර නිදගත්තා...'

අතීතය හිමාලි මැව්වාය. ඒ හිතේ ඇන්දය.

'නං..ගි බු..ක් ෂො..ප් එ..කට ගියා..ද...'

'ම්... එ..කම එක දවසක් නැන්ද එක්ක ගියා... ම..ට ඉතින් ඔයාගේ වැඩනේ... කාමරෙන් මාත් යන්නේ විනාඩි දහයකට පහකට විතරයි... ලොකු අයියා තමා ඔක්කොම බැලුවේ... දැන් සනීප වෙලා ඒ වැඩ පටන් ගන්න...'

හිමාලි තවත් කටක් කවමින් කීවාය.

'අ..යියේ...'

'නංගී...'

'අයියයි අක්කයි දුවයි ගැන හොඳට බලන්න... ඒ තුන් දෙනා ඇස් දෙක වගේ බලාගන්න... ඔයාට මං.. ද..න්..නෑ පු..දුම ආදරෙයි... මේඩක්කා ඔයාගේ නෑනා නෙමේ... ලොකු අක්කා... ඒ ගෑණි ආවාම මේ ඇඟම අතගාලා අඩලා යන්නේ... අක්කා කෙනෙක්වත් තමන්ගේ මල්ලිට එච්චර ආදරේ නෑ...'

විමුක්ති බලාගෙනම උන්නේය. මේවා කියද්දී ඔහුට සිහිවන්නේම වර්ෂාවය.

'එයාලා කෑවේ නෑ... බිව්වේ නෑ... අද ගෙවල් දෙකේම උයයි... හෙට කිරිබතුත් හදයි... ම්...'

හිමාලි තවත් කටක් කැව්වාය.

'නංගී ක..න්..නෑ...'

'මං අයියට හැමදම කවලා ඒ ඉතුරු ටික තමා කන්නේ...'

මෙහෙම කතා කියන්නට පුළුවන් බිරිඳකට පමණි. හිමාලි මේ වදන් කියන්නේ ඒවා කෙතරම් බරදැයි දනගෙනමය.

'නංගී මො..නාද ක..ර..න්..න හිතන් ඉ..න්..නේ...'

හිමාලි මහා අසරණ සිනාවක් පෑවාය. 'මං හිතං ඉන්නේ මොරගොඩ පවුලේ පොඩී ලේලි වෙන්න... ඒක කරගෙන මීසක් මම නුවර යන්නෑ...'

'හි..තං හිටියේ ඩිග්රිය අරගෙන ටිචින් වත් කරන්න... ගෙදර ටිකක් අමාරුයි නේ අයියේ... අම්මයි මායි විතරනේ...'





'ම්...'

'දැන් ඉතින් අයියට සනීප උනාම නුවර ගිහින් මොනා හරි හිතනවා...'

හිමාලිගේ දැස් ලා තෙතකට හැරෙයි.

'නු..ව..ර ගිහින් මො..නා ක..ර..න්..න..ද ඉතින්...'

'අම්මයි මායි ඉස්සර ඕකිඩ් පැල බෝ කළා... පොඩි පොට් වල... ඒකවත් කරනවා... නුවර ආපු වෙලාවක එන්න හොඳේ අපිවත් බලන්න...'

හදවත හිල් කරන හැටි හිමාලි හොඳට දනී.

'ම..ට ඇ..ති නංගී ක..න්..න...'

'අ..නේ මේ ක..ට විතරක්... ගෙදරින් බැහැලා ඇවිදගෙනම යන්න ඕන... එතකොටනේ ලස්සන...'

'මා..ව...'

'උස්සන් ආවේ...'

හිමාලි ඔහු ළඟටම වී ඉඳි ආප්ප කටවල් දෙක තුනක් කැවාය. විමුක්ති හිමාලි දෙස බලා උන්නේ අහසේ මතුවූ අලුත් හඳක් දෙස බලා ඉන්නාක් බඳු පුදුමයකිනි. 'මට එයාව පුරුදු නැති උනාට එයාට මාව පුරුදුයි...' විමුක්ති සිතුවේය.

'මං බෙහෙත් ටික දෙන්න මතක් කරලා එන්නම්... සේලයින් එක කන්ටිනිව් කරන්නෝනද දන්නෙත් නෑ...'

හිමාලි ගියේ විමුක්තිට වතුර ටිකකුත් පොවාය. ඇය ළඟින් යද්දී එන මල් සුවඳ කාමරයේ වූ අපුල බෙහෙත් ගඳ නැති කරන්නට තරම් ප්‍රබලය.

* * * * * * * * * * * * *

වර්ෂාට නින්ද යන්නේම නැත. පුතත් නිදිය. ඇය කොල්ලව තදින් පපුවට ළං කරගෙන ඇස් පියාගෙන නිදන්නට වෙර දරුවාය.

නැත. මේ දැස් පියවෙන්නේ නැත.

පුතාගේ පුංචි කකුල් වර්ෂාගේ කුසේ වැදෙයි. ඒවා සමනල පිහාටු වැනිය. ඇය දෙතොලම කොල්ලාගේ සිනිඳු හිසකේ වලට තැබුවාය.

'තාත්තිට මොනවා වෙලාද කියලා අම්මි දන්නැනේ පැටියෝ... ඔයාට සුරංගනාවියෙක් වත් ඇවිත් කියන්නැද්ද මී... කියන්නකෝ පැටියෝ...'

වර්ෂාගේ දෙනෙත් අසීමාන්තිකව තෙත් වෙයි.

'තාත්තිට සනීප වෙලා නම් ඔයාවත් වඩාගෙන එයාව බලන්න අම්මට යන්න තිබ්බ නම්... අම්මි හිතන දේවල් එහෙමම වෙන්නැ වගේ පැටියෝ...'

වර්ෂා උඩුබෙලි අතට හැරී කොට්ටය ඇඳ විට්ටමට ගත්තාය. එහෙමම උඩට ආ ඇය පපුවම හිස් කරන්නට මෙන් දිග සුසුමක් හෙළුවාය.

'වෙච්ච හැම දෙයක්ම ඔයාට මංම කියන්නෝන... ජීවිතේ වින්ද දුක් කන්දරාව මං විතරයි දන්නේ...'

කොහොමත් වර්ෂාගේ සිතට මොකක්දෝ වෙනසක් දනෙයි. එය ගින්දරකට සමානය. පිච්චීමකට සමානය.

'සමහර විට පුතා ටිකක් ලොකු කරගන්නකල් මට ඉන්න වෙයි... ඒත් ඔයා මගෙන් අහයි ඇයි ආවේ නැත්තේ කියලා... අයියේ... ඒකට උත්තරේ තමා මේ නිදගෙන ඉන්නේ...'

වර්ෂා කොල්ලාගේ සිනිඳු හිසකේ අතර ඇඟිලි තුඩු යවමින් සිතුවාය. වර්ෂා ඇඟිලි තුඩින් ඔහුගේ නම ගඩොල් බිත්තියේ ලීවාය.

'අපට එකතු වෙන්න තිබ්බ හැම ප්‍රශ්නයක්ම තාම එහෙමමයි අයියේ... ඔයාට ඒ ඔක්කොම පැත්තක ඉඳලා විසඳගෙන එන්න පුළුවන් වෙයිද...'

දෙකඳුළක් ගලාගෙන යද්දී වර්ෂා ඇස් මිරිකා දමන්නට මෙන් දැස් තද කළාය...





# 31

"අ..යියා නිදගන්..න... මං මේ විටමින් ටැබ්ලට් එක දලා ඔළුව මසාජ් කරන්නම්... ඒවලට තමා ඔය නහර පණ ගහලා එන්නේ...'

ලා කහ පාට විටමින් කැප්සියුල් දෙකකුත් ගෙන හිමාලි ඔහුගේ ඉහ ඉද්දරට ආවාය. ඇය ඉඳගත්තේ ඇගේ මුදු බඳේ රස්නය ඔහුගේ මුහුණට දනෙන තරම් ළං විය.

'නං..ගිට ම..හ..න්..සිනේ... ද..න් ටි..ක..ක් ඇලවෙලා ඉ..න්..න...'

හිමාලි සිනාසුණාය. ඒ ඔහුගේ මුහුණට එබීය.

'දැන් එ..හෙම දහයට එකොළහට නින්ද යන්නැ... රෑ එක වත් වෙනවා... ඒත් විඩින් විඩේ ඇහැරෙනවා... මං ඉතින් ළඟට වෙලා පොතක් බලනවා... චූ බර ආවාම මගේ අතක් අල්ලනවා... ඉ..තින් මං එ..ක්කගෙන යනවා...'

විමුක්තිගේ දැස් ඒ ඇස් මතම නතරව තිබුණි. ඇය ඒ තරමටම තමාට සමීපව උන්නාද...

'නු..ව..ර ඉ..ද..න් ආ..වේ අයියේ පිරිමි ළ..මයෙක් එ..ක්..ක එ..ක ළඟවත් වාඩි වෙ..ලා ගිය නැති කෙල්ලෙක්... ඒත්... මං ඔයා ළඟදි ඒ ඔක්කොම අමතක කළා... ඔයාව ගොඩ ගන්න මේ අ..ත් දෙ..කි..නුත් දෙයක් කළා නේද කියලා හිතද්දී මට පුදුම සතුටුයි...

ඒ ඇති මට අයියේ...'

ඔහු බලා උන් නිමේෂයේම ඇය කීවාය. ඒ වචන ගොස් නවතින්නේ හෘද වස්තුවේ බව හිමාලි දනී.

'අ..යියේ...'

'ම්...'

හිමාලි කතා කරන්නේ ඔහුගේ හිසට අල්ලා විටමින් කැප්සියුල් කඩමිනි. තෙල් වැනි විටමින් සැර බිංදු හිසට වැටෙයි.

'කවදහරි අයියේ එ..හෙම උ..න්..නා කියලා...'

'ම්...'

'අයියගේ නෝනට වත් කියන්නෙපා... හොඳ නෑ... මං හරි පිරිසිදු හිතින් ඒවා කළේ... ඒත්...'

'මං ද..න්..න..වා...'

විමුක්ති උගුරෙන් මෙන් කීවේය.

'ඒවා දැන් හරි... දැන් ළමයා නිදාගන්න... අද කතා කළත් වැඩියි... කෝ... ඇස් පියාගන්න...'

හිමාලි කීවේ අතක් ඔහුගේ දෙනෙත් මත තබා ඒවා වසමිනි. ඇයට ඕනා ඒ සුදු අතේ මෘදු බව ඔහුගේ මුහුණට දනවන්නටය.

'මං ලයිට් එක අඩු කරලා එන්නම්... නැත්නම් නිද ගන්නෑ...'

හිමාලි නැගිට ගොස් රෝහල් කාමරයේ වූ එළිය වැඩි විදුලි පහන නිවා දමා ඉතාම තුනී අන්ධකාර මන්දලෝකයක් පමණක් එන කුඩා පහන දල්වූවාය. ඒ පහනට පෙනෙන නොපෙනෙන තරම්ය.

'මේ අන්ධකාරේ ඔයා ළඟටම වෙලා මං ඉන්නකොට ඔයාට හිතෙන දේවල් මට තේරුම් ගන්න පුළුවන්... එහෙම ඉඳපු රෑ වල මට හිතිච්ච දේවල් මට මතකයි...' හිමාලි යළිත් පැමිණ ඒ හිස උකුලටම ළං කරගෙන මෙන් ඉඳ ගත්තාය. ඊටත් පසු ඇය ඇඟිලි තුඩු මෘදු ලෙස ඔහුගේ නළලතටත් හිසටත් තිබ්බාය.

'ඉ..ති..න් නි..ද..ග..න්..න...'





ඒ හඬ පුදුමාකාරය. කෙල්ලෙක් එහෙම ආදරබර ලෙස කතා කරන්නේ තල්ලෙන් නොවේ. උගුරෙනි.

'මං අයියේ...'

'ම්...'

'බබෙක්ව නිදි කරනවා වගේ නැලවිලි ගීතත් කියලා තියෙනවා... එතකොට නිදගන්නවා...'

දැන් විමුක්ති තමාගේ මැරුණු අමතකව ගිය යුගය ගැන චිත්‍රයක් හදගෙන යන්නේය. ඔහු ඒ රූප රාමු හදගෙන යන්නේ හිමාලි කියන වචන ඔස්සේය. හිමාලිට ඕනත් ඒකය.

'දවසක්.. අයියේ...'

'ම්...'

'ම..ගේ අ..ත..ත් අ..ල්ලගෙන නිදි...'

'ම..ම..'

'නැතුව... අත් දෙකින්ම අල්ලගෙන නිදි... මටත් ඒක දැනුණේ නෑ... ටිකකින් මට හරි වූ බරක් ආවා... අ..ම්..මේ ඉ..ව..ස..න්නම බෑ... මං අත ගන්න හැදුවා...'

'ම්...'

'දුන්නෙම නෑ... මගේ අම්මේ තද කරගෙනම ඉන්නවා... පොඩි එකෙක් වගේ... මට මේක දැන් ඇදේ යන්න වගේ... ඒත් අත දෙන්නෙම නෑ...'

'ප..ස්සේ...'

'මො..නා ක..ර..න්..න..ද මං ත..ද ක..ර..ගෙ..න උ..න්..නා...'

විමුක්ති සිනාසුණේය. ඒ සිනහව ඇය දකියි.

'ඊට පස්සේ...'

'අත දුන්නෑ...'

'අ..නේ නෑ... එ..හෙම කරනවද...'

'එ..හෙ..නම්...'

˙මං ඇඳට එ..න්..න කලින් හොඳට වූ දලම එනවා...˙

හිමාලි සිනාබරව කීවාය. කෙනෙක් මෙහෙම කියද්දී තවත් කෙනෙක් ඒවා අහන්නේ රූප මවාගෙනය. රූප මැවෙනම ලෙස සමහර දේවල් කියන්නට සමහරුන්ට පුළුවන. කොහොමත් මේ කතාවේ තිර රචනය හිමාලි ලියන්නේ ඒවා හොඳටම මැවෙන ලෙසය. නැතහොත් වරදින්නේ තමාගේ ජීවන තිර නාටකය බව ඇය දනී.

හිමාලිගේ සිනිඳු ඇඟිලි තුඩු ඔහුගේ කන් පෙති අතර දුවයි. ඒවා එහෙමම ගෙළ පාමුළට එයි. යළිත් නළලතට එයි.

අලුත් විමුක්ති කෙනෙක් හෙමින් හෙමින් උපදින බව හිමාලිට දැනෙයි. ඒත් හිමාලි සිතුවා වැරදිය. තවම හරි විමුක්ති ආවේ නැත. මේ ඉන්නේ එලොවත් මෙලොවත් අතර උන් විමුක්තිය. ඔහුට ආවේ මතකය පමණි. තවම පපුවෙන් හැඟීම් ගලන්නට ගත්තේ නැත.

මතකය ඇත්තේ මනසේය. හැඟීම් ඇත්තේ පපුවේය. මනස දැන් වැඩ කරයි. ඒත් පපුව තවමත් නිදිය. වර්ෂා උන්නේ ඒ පපුවේය. කෙල්ල ඒ පපුව පුරාමය. ඇයට ඔහුව පුබුදුවන්නට සර්වාංගයම අත ගාන්නට ඕන නැත. එක පාරක් බැලුවාම ඇතිය. විමුක්තිට එතැන සිට පිස්සුය.

˙අ..යියේ නි..දිද...˙

˙ම්...˙

නැත. ඔහු නිදි නැත. විමුක්තිට දහසක් දේ සිහිවෙයි. මැවෙයි. එහෙත් තවමත් ඒ මැවෙන සියල්ල පැහැදිලි නැත. තවමත් ඔහුට මෙහෙමය. මහන්සිය.

හිමාලිගේ ජංගම දුරකථනය නාද විය... හිමාලි එය ළඟම තියාගෙන උන්නාය.

˙හෙ..ලෝ...˙

කතා කළේ මේධාය.

˙කෙල්ලේ ම..ම...˙

˙අ..ක්..කේ...˙

˙ම..ල්ලි නි..දිද කෙල්ලේ...˙





˙මේ නි..දි කරනවා...˙

හිමාලි සිනාබරව කීවාය.

˙කොල්ල ඉඳි ආප්ප ටික කෑවද...˙

˙ම්.. හරි රහයි... ඒ සීනි සම්බෝලේ නම් මරු අක්කේ...˙

˙අයියත් අද රහයි කිය කිය ඒක කෑවා පාන් එක්ක...˙

˙අයියට ටිකක් දෙන්නද අක්කේ...˙

˙නැගිටලා නම් දීපන් වස්තුවේ...˙

˙ඔය එන්නේ වස්තු ගාගෙන... මට උඹේ වස්තුව වෙන්න ඕන නෑ... මට ඕනා මේ වස්තුව...˙ හිමාලි සිතින් සිතුවාය.

˙අයියේ... අ..ක්..කා...˙

හිමාලි ජංගම දුරකථනය විමුක්තිට දුන්නාය.

˙අ..ක්..කේ...˙

˙ඔයාගේ කටහඬක් අහන්න ආසයි... ඒකයි කතා කළේ...˙

˙දු..ව නි..දිද අක්කේ...˙

˙මේ කිරි බො..නවා ම..ල්ලියේ...˙

˙ප..ව්...˙

˙කෙල්ල පව් නෑ... ෂෝයි බාප්පි කෙනෙක් දැන් ඉන්නේ...˙

˙ම්...˙

˙නිදගන්න මහත්තයෝ එහෙනම්... මං උදේට බලන්න එන්නම් අයියත් එක්ක...˙

˙හා අක්කේ...˙

˙බුදු ස..ර..ණ..යි...˙

විමුක්ති ඇමතුම අවසාන වූ පසුව හිමාලිගේ ජංගම දුරකථනයේ මුහුණත දෙස නිකමට බැලුවාය. ඔහුට පුදුම සිතුණි. එහි වූයේ ඔහුගේම පින්තූරයකි. තැඹිලි පාට ටීෂර්ට් එකක් ඇඳගෙන උන් එහි විමුක්ති උන්නේ කැමරාව දෙස බලාගෙනමය.

˙මේ.. නංගී ම..ගේ...˙

'ම්... තව පෙන්නන්නද...'

හිමාලි දුරකථනය ගෙන එහි පින්තූර ගැලරියට ගියාය. එහි විමුක්තිගේ පින්තූර සීයක් පමණ ගබඩා කර තිබුණි.

'මේ ඇඟ පුරාම සබන් ගාගෙන... මං නාවනවා පොඩි බබාව...'

සැබෑය. ඒ පින්තූරය ගෙන තිබුණේ තමාගේ කාමරයට යාබඩ නාන කාමරයේදීය. හිමාලි මේවා ගත්තේ මතු දවසක ඕනා වෙන බව දනගෙනමය.

'මේ.. දෙයි... නාලා කාලා කිරි බීලා දෙයි...'

කාමරයේ වූ අඳුර මැද ඒ පින්තූර ලස්සනට පෙනුණි.

'මේ මං කිව්වේ නුවර එක්කගෙන ගියා කියලා...'

'ඔ..ව්...'

'මාළිගාවේදී... මේ උඩ මළුවේදී ගත්තේ...'

සුදු කමිසයක් ඇඳ උන් පින්තූරය දෙසම ඔහු බලාගෙන උන්නේය.

'මේ අපේ නුවර ගෙදර... මං සීතල නිසා මගේ ස්වීටරයක් ඇන්දුවා...'

මේ කිසිවක් තමාට මතක නැත්තේ ඇයි...

'ම..ත..ක..ද...'

'නෑ නංගී...'

'සිහිය ආපු දවසක පෙන්නන්න තමා ගත්තේ... මේ මායි අයියයි... හරියටම වෙසක් දවසේ රෑ...'

ඒ පින්තූරයේ ඇය උන්නේ සුදට හුරු ක්‍රීම් පාට රෑ ඇඳුමක් ඇඳගෙනය. පුදුමය. තමා උන්නේ ඒ වතටම ළං වීගෙනය.

අතීතයේ බොහෝ දේ වෙන්නට ඇත. කිසිවක් මතක නැත. එහෙත් ඒවා සිදුවී ඇත. මේ සාක්ෂි කියන්නේ ඒවා සිදුවූ අයුරුය.

'නා..ත්..තල් සීයෙක් පෙන්නන්නද...'

'ම්...'

'මේ...'





රැවුල කපන්නට ගල්වන ෂේවින් ක්‍රීම් මුහුණ පුරා ගාගෙන උන්නේ තමා බව විමුක්ති අඳුන ගත්තේය.

'ක..වු..ද...'

'ම..ම...'

'ම්... මං රැවුල ෂේව් කරන්න ෂේවින් ක්‍රීම් ගාලා ගත්තේ... අම්මෝ ඒක කපන්න තියෙන වදයක්...'

'ඇයි...'

'දහලනවා... ම..ට පුරුදුත් නෑ... ඒත් දන් පුරුදුයි... කැපුවට පස්සේ හරි ලස්සනයි...'

'මේවා ඔයාගේ අර බැල්ලි කළාද...' එසේ අසන්නට හිමාලිට සිතෙයි.

'නං..ගී...'

'ම්...'

'නංගී ගෙ..දර ගි..යේ නෑ...'

හිමාලි සිනාසුණාය.

'අයියව එක්කගෙන ගිය පාර තමා... ද..ලා ය..න්..න බෑනේ ඉතින්... ගෙදර තියා මං හෙයා කට් එකක් ගන්නවත් ගියේ නෑ...'

ඒ තරම් කැපවෙන්නට තරම් බැඳීමක් කොහොම ඇතිවුණාද... විමුක්තිට සිතාගන්නට නොහැක. ඒත් එහෙම බැඳීමක් ඇති වී ඇත.

'නි..න්..ද යන්නැත්නම් මම කිරි එකක් හදලා දෙන්නද අයියේ...'

'ම්...'

'කිරි තේ එකක්...'

'හා...'

හිමාලි ඒ හිසින් අත ගත්තේ ඒ හිස ලස්සනට අතගාගෙනය. හිමාලි හීටරය ගසා හැරුණාය. විමුක්ති උන්නේ බලාගෙනමය.

හිමාලි ලස්සනට සිනාසුණාය. ඒ සිනහව කෙනෙකුගේ සිත අලවන තරම්ය.

හිමාලි රහ තේකක් හදන්නට ගත්තාය. අද රෑ පුදුමාකාරම රෑ යකි. මොරගොඩ පවුලේ බාල පුතාට වසරකින් පසු සිහිය ආවේ අදය. එහෙම දවසේ ඔහුව තමාට බාරදී මොරගොඩ පවුලම නිදිය. ‘ගෑණියෙක්ට ටිකක් දුක් විඳින්න පුළුවන් නම්... කැපවෙන්න පුළුවන් නම්... තමන්ව ටික කාලයක් අමතකම කරලා දලා කාලි අම්මා වගේ පේ වෙන්න පුළුවන් නම් ඒකිගේ අනාගතේම ගොඩ...’ හිමාලි සිතුවේ එහෙමය.

‘මං විඳපු දුක් වල හැටියට මේ මොන දුකක්ද... ඒත් මොරගොඩ පවුලට මේ විඳින දුකට වන්දි ගෙවන්නම වෙනවා...’ ඒ වන්දියට ඇය ඉල්ලන්නේ ඒ පවුලේ රන් කඳය. බාල පුතාය.

දෙන්නටම සිදු වෙන බව හිමාලි දනී. ‘නොදුන්නොත් එදට මං තමා කාලි අම්මා වෙන්නේ...’ ඇය යටි තොල හපාගෙන සිතුවාය.

‘ම් බොමු... මං ටිකක් නිවාගෙන ආවේ...’

රෝහල් කාමරය පාළුය. නිස්කලංකය. මේ රෑ හෙදියන් පවා නැත. මුළු රෝහල පුරාම ඇත්තේ පුදුමාකාර නිහඬ නිසංසල බවකි. හිමාලිට ඇත්තටම නිදිමත නැත. කොහෙත්ම නැත.

රෝහල් කාමරයේ දොර ඇරිණි. ඉන් ඇතුල් වූයේ මොරගොඩ මහතාය. ඔහු දොර අරිද්දීම දක්කේ හිමාලි විමුක්තිට තේ පොවන දසුනය. ‘සුරම්‍යා කිව්වා වගේ කෙල්ල නැහීගෙන අපේ එකාව බලාගන්නේ... තමන්ගේකම කියන්නේ ඒකයි...’ මොරගොඩ මහතා සිතුවේය.

‘මා..මේ...’

මොරගොඩ මහතා ආවේ සිනාසෙමිනි.

‘තා..ත්..තේ...’

‘පොවන්න පුතේ...’

‘නිදගන්නෑ මාමේ... පස්සේ මං මේ කිරි තේකක් හදලා පොවනවා...’

‘නිදගෙන උන්නනේ පුතේ ඇතිවෙන්න...’

‘ම්...’





‘තා..ත්..තා රෑ...’

‘ගල්හේන අන්කල් එක්ක ගංගාරාමෙට ආවා... ඒ ගමන් ඔයාවත් බලලා යන්නම ආවා...’

ගංගාරාම විහාරය පිහිටා ඇත්තේ නවලෝක රෝහල ළඟමය.

‘කො..හොමද පුතේ ද..න්...’

‘හොඳයි තා..ත්..තේ...’

‘අයියට දන් හොඳයි මාමේ... මාත් එක්ක කතා කර කර උන්නේ...’

‘ඔයා ළඟම ඉන්න...’

‘අන්න එහෙම කියන්න... මං පපුවම දීගෙන ඉන්නම්... භුක්තියට හිමි වෙන්නේ එතකොටයි...’ හිමාලි සිතින් කීවාය.

‘මා..ම..ටත් කිරි තේ එකක්ම හදන්නද...’

‘බොමු පුතේ...’

මොරගොඩ මහතා කොල්ලාව අතගා සිනාසුණේ ආදරයෙනි.

‘හොඳ කාර් එකක් ඊයේ ගත්තා... ලස්සන මෙරූන් පාට... මං ඒක ඔයාටම වෙන් කරලා තියෙන්නේ...’

මොරගොඩ මහතා කීවේය. මේ කියන ඒවාට ලෝබකමින් පුපුරන්නේ හිමාලිය.

‘තා..ත්..තේ...’

‘පොඩි පුතේ...’

‘ඒ..ක අ..යිය..ට දෙ..න්..න...’

‘මං අයියට එකක් දෙන්නම්... එයාට පොඩි ජීප් එකක් හොඳ... ඒක පවුලක්නේ... මේක ලස්සන ඔයාට... මං යාඩ් එකේ ගහලා තියෙන්නේ... කාටවත් අල්ලන්න දුන්නෑ... ඔයාම ඇවිත් ගන්න...’

විමුක්ති සිනාසුණේය. ‘ඒ එන දවසට මාවත් එක්කගෙනම යන්න...’ හිමාලි සිතින් කියයි.

‘ආ මාමේ...’

හිමාලි පීරිසි කෝප්පයකට කිරි තේක ගෙනවිත් දුන්නාය.

‘දුවට තව ටික කාලයක් අයියව බලාගන්න වෙයි...’

හිමාලි සිනාසුණාය. ‘ටික කාලයක් මොකටද... මං දිගටම බලාගන්නම්...’

‘ම..ට ඒ..ක පුළුවන් මාමේ...’

‘කැම්පස් එක පාඩු උනාට ඒක හිතන්නෙපා... ඔයාට අපි ඉන්නවනේ...’

හිමාලි බිම බලාගෙන හිස වැනුවාය. විමුක්තිද ඒ මුහුණ දෙස බලා උන්නේය.

‘ම්.. ද..න් නිදගන්න... මං ගිහින් එ..න්නම්...’

මොරගොඩ මහතා විමුක්තිගේ හිස අතගෑවේය.

‘මං ය..නවා දුවේ...’

‘හොඳයි මාමේ... බුදු සරණයි...’

ඔහු ගිය පසු හිමාලි යළිත් විදුලි පහන අඩු කළාය.

‘ගෙදර ගියාම අයියේ...’

‘ම්...’

‘හවසකට අපි පන්සල් යන්... හොඳ බෝධි පූජාවක් එහෙම තියලා... පිරිත් චුට්ටක් අහලා... ආ...’

විමුක්ති හිස වැනුවේය.

‘ආ මට කියන්න අමතක උනානේ...’

‘මො..ක..ක්ද නංගී...’

‘එකට ඉගෙන ගත්තද දිල්ලි වල ගර්ල් කෙනෙක්... ශානියා කියලා... එහේ යුනිවර්සිටි එකේ...’

‘ඕ..ව් ශානියා කපූර්...’

‘අ..න්..න හ..රි... එයා කතා කළා...’

‘ඉතින්...’

‘අනුලා ගත්තේ... ගැණී දන්න ඉංග්‍රීසියක් නැනේ ඉතින්...





පස්සේ දුවන් ඇවිත් මට කිව්වා...’

‘නංගී ක..තා කළාද...’

‘ම්.. අයියට කතා කරන්න ඕන කිව්වා... මං මෙහෙම වෙලා කියලා කිව්වේ නෑ... මං කිව්වා මේ වෙලාවෙ නෑ කියලා... එයා මැරි කරනවලු... වෙඩින් එකට ඉන්වයිට් කරන්න අයියට කතා කරලා තියෙන්නේ...’

‘ලස්සන ළමයා... එහෙදිම කොල්ලෙක් එක්ක යාළු වුණා... මුම්බායි වල...’

‘ඇත්තද... වෙඩින් එක දිල්ලිවල ටාජ් හොටෙල් එකේ කිව්වා... නම්බර් ඔක්කොම දුන්න විමුක්තිට කතා කරන්න කියලා... දන් මාස එකහමාරක් විතර ඇති...’

‘වෙඩින් එක ලස්සනට තියෙන්න ඇති...’

‘සනීප වෙලා උන්නනම් යනවද...’

විමුක්ති සිනාසුණේය. ‘එහෙනම් අපි දෙන්නම දිල්ලි යන්නෝන...’

‘අපි ගියාම ගමු... අ..ම්මේ එයා නිවේදිකාවක් වගේ...’

‘කඩේ තමා... හැබැයි හොඳයි... නංගි හොඳට කතා කළාද...’

‘ම්... පැය බාගයක් විතර කතා කළා...’

හිමාලි ඉන් අහවන්නට උත්සාහ කළේ ඇය ඒ තරම් ලස්සනට ඉංග්‍රීසි කතා කරන බවය.

‘ම..ට ගෙ..දර ගියාම න..ම්..බර් එ..ක දෙ..න්..න...’

‘මං අරගෙ..න දෙ..න්..න..ම්.. අයියා ඉතින් දිල්ලි ය..නව..ද...’

‘කා..ලෙ..ක ය..න්..න ඕන...’

තව යමක් කියතැයි හිමාලි සිතුවද ඔහු කීවේ නැත.

‘ම්... දන් නිදගන්න... ගොඩක් රෑ වෙලා...’

හිමාලි විමුක්තිට පොරවා රෙද්ද ඔහුගේ පපුව ළඟටම ගෙන ආවාය.

# 32

වර්ෂා පුංචි හෝටල් කැල්ලට නමක් සිතුවාය. එය පටන් ගන්නට සිතා උන්නේ සෙනසුරාදය. සෙනසුරාද හොඳ දවසකි. බෝධි පූජාවක් වුව පටන් ගන්නේ සෙනසුරාදය.

'ඔයාගේ බුක් ෂොප් එකට විමුක්ති බුක් සිටි කියලා නම දැම්මේ මම... එදා ඔයා කළුතර හෝටලේකට කෑමට එක්කගෙන ගියා... එතනදී තමා මම නම දැම්මේ... ඒ වෙලාවේ ඔයා මං දිහා බලාගෙන හිටපු හැටි මට තාම මතකයි... ඒත් රත්තරන් මං අමාරුවෙන් ගොඩ එන්න හදන මේ පුංචි පොල්අතු හෝටල් කැල්ලට ඔයාගේ නම දන්නේ කොහොමද... නේද... ඔක්කොටම හරියන්න මං අපේ පුතාට ඔයාගේ නමම දැම්මා... තාත්තත් විමුක්ති... පුතත් විමුක්ති...'

තාම පාන්දරය. වර්ෂා මේවා හිතන්නේ මහ පාන්දර දොරකඩට වී පොල් අතු හෝටල් කැල්ල දෙස බලාගෙනය. එය සිරියාවන්ත පාටය.

ජීවිතය අල්ලාගෙන යන්නට කොතරම් අමාරුදැයි දුෂ්කරදැයි කෙල්ල දනී. බලාපොරොත්තු ජේන තාරකාවක් ලෙසවත් නොවූ අහසක් දෙස බලාගෙන ජීවත් වීම දුකකි. ඒත් ඒ දුක දන් තමා





විඳින බව වර්ෂා දනී. 'දුෂ්කරයි කියා අතහැර යා යුතුද ජීවිතය... කටු පොකුරු සිප ගනිමි හෙට මලක් වනු පිණිස...' වර්ෂා කවි පදයක් මිමිණුවාය.

'ආදරේ ගින්දර ගැන හිතද්දී අයියේ... ජීවිතේ ගින්දර මහ ලොකු ගින්දරක් නෙමේ...'

ජීවිතයත් සමඟ මෙහෙම සටන් කරන්නට ගත්තේ එහෙම සිතාය. හත් දවසක් මල් එන ගහකට හත් අවුරුද්දක් පොහොර කවා බලා සිටීම කොතරම් අමාරුද...

'ජීවිතේ ආපු කරදර කොච්චරද... එන්න තියෙන කරදර මොනාද... ඒ මොනවත් නොදන ජීවත් වෙන්න ධෛර්ය ගන්නෙක විමුක්ති අයියේ පුදුම දෙයක්... රත්නපුරේ වර්ෂා සත්සරණී කොළඹ ඇවිත් ආදරේ කරලා අද අනුරාධපුරේ දුක් විඳිනවා... හෙට...'

වර්ෂා දහ අතේ නමක් සිතුවාය. වැව ඇත්තේ මේ ළඟය. වැව් සුළඟ හමන දුරය. කොහොමත් මේ වැව් බැඳි රටය.

'වැවේ කැලේ...'

එකවරම ඒ නම කෙල්ලගේ සිතට ආවේය. වර්ෂාගේ සිතට අමුතුම මිහිරක් ආවේය. ඇය එහෙමම දිව්වාය. ප්‍රියංවද උන්නේ ඇහැරුණු ගමන්ය.

'ප්‍රි..යෝ...'

කෙල්ල කෑගැසුවාය. නිදිගැට කඩමින් උන් ප්‍රියංවද දුවගෙන කුස්සියට ආවාය.

'කෙ..ල්ලේ ඇ..යි රත්තරන්...'

වර්ෂා සිනාසුණාය.

'අම්මේ මං බයවුණ තරමක්... මේකිට පිස්සු...'

ප්‍රියංවද කෙල්ලට ගැසුවාය.

'මො..කද බං කෑගැහුවේ...'

'හෝටලේට නමක් ආවා...'

අම්මාද සිනාසී කළු කේතලය තේ කොළ ජෝග්ගුවට වක් කළාය.

'මො..ක..ක්ද කෙල්ලේ...'

'වැවේ.. කැලේ...'

'ෂා...'

'ල..ස්ස..නද...'

'නියමයි කෙල්ලේ... නියමයි...'

'හොඳද අම්මේ...'

'ෂෝක් නම... සිංහල ගතියකුත් තියෙනවා...'

'පොඩි මොඩ් ගතියකුත් තියෙනවා නේද ප්‍රියා...'

'ම්.. දන්ද ආවේ...'

'ම්... අයියගේ බුක් ෂොප් එකට නම දම්මෙත් මම...'

'විමුක්ති බුක් සිටි කියලා...'

'ම්... වැවේ කැලේ... ඇත්තටම හොඳයි නේද...'

'නියමයි කෙල්ලේ... වැව පේන මානෙනේ... අපි අදම බෝඩ් එක අදින්න දෙමු...'

'හා... නිකං ගඩොල් පාට පසුබිමේ සුදු අකුරු වලින්...'

එහෙම කියද්දී ප්‍රියංවදට දුකය.

'උ..ඹ කෙ..ළඹ දලා ආවේ අපරාදේ කෙල්ලේ...'

'එ..න්..න උ..නා..නේ ප්‍රියා...'

'ම්.. තේ බීලා එ..න්..න... දරුවා පුතේ...'

'කොල්ලා නිදි අම්මේ... පාන්දර ඇහැරුණා... පැයක් විතර හිටියා... මං මේ ඒ පාර ඇහැරුණ ගමන්...'

වර්ෂා තේකත් රැගෙනම මිදුලට බැස්සාය. යංතම් පාන්දර අරුණළු රජරට අහසින් මතු වන්නට විය. පාන්දර ඇහැරුණ නිසා තේ එක පුදුම රහට ඇයට දනෙයි.

'කෙල්ලේ...'

ප්‍රියංවද තේක රැගෙන මිදුලට ආවාය.

'ප්‍රියා...'





'මං රෑ හීනයක් දැක්කා බං...'

'මො..ක..ක්ද ප්‍රියා...'

'මේ අපේ අයියා... විමුක්ති අයියා...'

'ඉතින්... අයියා...'

දැන් කෙල්ලට දැහිලිල්ලය. ඒ නම මතක් කළත් ඇයට ඇතිය.

'මෙ..හේ ආ..ව..නේ...'

'මේ... අනුරාධපුරේ...'

'ඔ..ව්.. උදේක... ඕන් ඔතන වාහනේ නැවැත්තුවේ... බැහැලා ආවා...'

'ඉ..තින්...'

වර්ෂා ඇසුවේ හුස්ම උඩටම ගෙනය.

'මං දුවන් ආවා...'

'ආ...'

'කෝ නංගී මගේ කෙල්ල කියලා ඇහුවා...'

'ඉ..ති..න්...'

දැන් කඳුළු ගලයි. හෝ ගා ගලයි.

'මං අ..තින් අ..ල්ලගෙන කෙල්ලෙ ගෙට එක්කගෙන ආවේ... ඒ එක්කම වගේ ඇහැරුණා...'

'අ..නේ...'

කඳුළු වැටිණි. හීනයකින් නොව හැබෑවකින් එය වෙනවානම්... මේ.. පා..න්දර...

'කෙල්ලේ...'

'ප්‍රියා...'

'අපි සුජාට කතා කරමු... අයියගේ තත්වේ දන්නෙත් නැනේ...'

'ම්...'

'අටට විතර ගමු... බලලම කතා කරන්න කියමු...'

'ම්.. එ..යාට සනීපවෙලා කියලා ම..ට හිතෙන්නේ...'

'ක..තා කරමුකෝ... හීනෙත් දක්ක නිසා මටත් එහෙම හිතෙනවා...'

'එ..යා මො..නවද ඇඳලා උන්නේ...'

'ඩෙනිමකුයි සුදු ෂර්ට් එකකුයි...'

'එ..හෙම තමා අඳින්න ආසම...'

ආදර කුරුටු ගී පපුවේ ලියවී ඇත්තේ ලේ වලින්ද... මේ තරම් ඒ හදවත් ඇවිලෙන්නේ ඒකද...

* * * * * * * * * * * * *

හිමාලි විමුක්ති ළඟින් හෙලවුණේ නැත. පාන්දර ඇය විමුක්ති නිදගෙන සිටිද්දී පැයක් පමණ වෙලා ගෙන නෑවාය. ඉන්පසු ඇය ඊයේ ඇන්ද සාරියම ඇඳගත්තාය.

පාන්දර හය වෙද්දී හිමාලි මේ දන් පිපුණ මලක් මෙන් තෙත කොණ්ඩයද විහිදුගෙන ඔහු ළඟ උන්නාය. නෑමෙන් සීතලව තිබූ අත්ල ඇය හරි ලස්සනට ඒ නළලත මත තිබ්බාය. පසුව එහෙමම අවුල්ව තිබූ ඔහුගේ හිසකේ පසුපසට කළාය.

විමුක්ති පිබිදුනේ ඒ සීතලටය. නළලතට දැනුණු සීතල පහසටය. ඔහු දෙනෙත් අරිද්දී ඇය තෙත කොණ්ඩය එහෙමම ගෙලෙන් එක පැත්තකට ගෙන බර වූවාය.

ඇය ළඟින් එක එක සුවඳවල් එමින් තිබුණි. පාන්දර නාගෙන එන කෙල්ලෙක් ළඟ කොහොමත් සුවඳය.

'ගු..ඩ් මෝ..නිං අ..යියේ...'

'මෝ..නිං නංගී...'

ගෙළ පැත්තකට කර ඇය සිනාසෙයි. දෙතොල් මත පැහැයක් ගල්වා නැත. ඒත් ලස්සනට ඒවා දිළිසෙයි. ඒ ගැහැණු ළමයින් දෙතොල් වල ගල්වන රහස් ආලේපනයක් නිසාය.

'අ..ද කොහොමද අ..යියේ...'

ඇගේ කොණ්ඩයෙන් හීන් දිය බිංදු ඔහුගේ ගෙල මතට වැටෙයි. ගතට සිසිලසක් දනෙයි.





'හො..දයි නංගී...'

'ඇයි අයියේ...'

ඔහු මොනවද කියන්නට යද්දී ඇය ඇසුවාය.

'ම..ට..ත් නා..න්..න ආ..ස..යි...'

'මං නාලා ඉන්නකොට ඔයාටත් ආස හිතුණද...' ඇය සිතුවාය.

'මං හතරට නැගිටලා නෑවේ...'

'කො..හෙද නිද ග..ත්..තේ...'

'මෙ..න..න.. චු..ට්ටක් ඇහැ පියෙව්වා...'

ඇය උන්නේ එතනටම වී බව විමුක්ති දනී. රෑ පුරා ඒ පහස ඔහුට දැනුණි.

'මේ චූ බට ඔක්කොම අ..ද අයින් කරයි... ඩොක්ටර් ආවාම මං අහන්නම්... ඊට පස්සේ නාමු... මං නාවන්නම්... හොඳ ෂැම්පු එකක් එහෙම ගෙනත්... අන්තිමට නෑවේ සතියකට විතර කලින්... උදේ පොඩි ස්පොන්ජ් වොෂ් එකක් දුමු...'

විමුක්ති සිනාසුණේය.

'තේ බොමු..ද...'

'තිබ..හ..යි තමා...'

'ඉ.න්..න..කො කට ටිකක් හෝදලා වතුර ටිකක් බීලා ඉමු...'

හිමාලි කට හෝදන්න කුඩා බේසමක් වතුර වීදුරුවක් රැගෙන ආවාය. ඇය විමුක්තිව එසෙව්වේ ඔහුව පපුවේම තියාගෙනය.

'ම්.. හරි... දන් කට හොඳට හෝදගන්න...'

ඔහු කට සෝද ඇය අත තිබූ බේසමට දම්මේය.

'අයියේ...'

'ම්...'

'කක්කි බරද...'

විමුක්ති ඇත්තටම මහා දුකකින් මෙන් සිනාසුණේය.

'තා..ම නෑ...'

'වෙනදට හතට විතරනේ කරන්නේ...'



Hemantha007
For Free Distribution Only

'ම..ම...'

'ම්... ලොකු අයියා හිටියොත් එයා කරනවා... නැත්නම් මම... දවසක් රෑ කිරිපැණි කවලා උදේ බඩ ගියා... තුන්පාරක් ගියා... මං බයත් වුණා... පස්සේ කෝපි හදලා පෙව්වා...'

'එතකොට...'

'නතර වුණා... එදා...'

'ම්...'

'එක්කෙනෙක්ගේ ඇහෙත් කක්කි චුට්ටක් ගියා... අනේ පව්... පස්සේ මං ආයෙත් හේදුවා... හොඳට ඩෙටෝල් සබන් දලා හේදුවා...'

විමුක්ති බලාගෙනම ඉඳියි.

'ඔය ටික බොන්න... මං තේ හදන්නම්...'

ඔහුට හිතන්නට දී ඇය යයි. මේ කියන දේවල් කවුරුවත් හාර හාරා බොරුයි කියන්නේ නැත.

විමුක්තිගේ දෙනෙත් තිබ්බේ හිමාලි වෙතමය. කොහොමත් සාරියට හිමාලි හැඩය. ඊටත් ඇය සාරිය ලස්සනට ඇන්දය. ඇය අඳින්නේ ඔසරියම නොවේ. ඉන්දියන් ස්ටයිල් එකක් මිශ්‍ර කළ ඔසරියය. ලස්සන ඒ නිසාය.

ඔහුගේ දෑත් ඇත්තේ තමා වෙත බව හිමාලි දනී. කෙනෙක් බලා සිටිද්දී එය නෙතින් නොදක්කත් කම්මුල් වලට දනෙයි. උදෙන්ම නෑව නිසා ඒ මුහුණ තවත් ලස්සනය. තෙත කොණ්ඩය පිට දිගේ බේරෙයි. එය හැට්ටයේ පිටුපස පිට මැද තෙමා ඇත.

විමුක්තිට සිහිවූයේ වර්ෂාවය. ඇයත් මෙහෙමය. උදේට බුක් ෂොප් එකට එන්නේ තෙත කොණ්ඩයෙනි. වාහනයේ ඇය සමඟ යද්දී ඇය නිතර ගල්වන ආයුර්වේද ෂැම්පු සුවඳ එයි.

ඒ සුවඳ තවමත් විමුක්තිට මතකය. ඔහුගේ දෙනෙත් මෙහෙම හිමාලි ළඟ රැඳෙන බව සැබෑය. ඒ කොල්ලෙක්ගේ ඇස්වල හැටිය. ඒත් මේ හදවත පුරාම ඇත්තේ ඇයය. වර්ෂාය. එය පපුවකට එසේ මෙසේ වැටුණු වැස්සක් නොවේ.

එකවර හිමාලි හැරුණාය. 'බලන් ඉන්නේ මං දිහා... ඒත්





හිතන්නේ වෙන දෙයක්...' හිමාලිට එය දැනුණි. ගැණුන්ට එහෙමය. ඇත්තේ පුදුමාකාර ඉවකි. ආදරේ කරන්න ගත් විට එහෙමය. වතුර පහළටම ගලනවා සේ සිතුවිලි ගලන්නේ සිතේ ඇල වූ පැත්තටය. 'මේක කඩාගන්නම ඕන... ඔළුව පැදෙන්න පැදෙන්න ඒකිව මතක් වෙනවා... ඒකිත් හිහන බඩ්ඩනේ... පෙරහැරවල් හතම ගිහින් කොල්ලව අල්ලගෙන... ආව දවසේ ඉම්බ හැටි මං දැක්කනේ... සිහිය තියෙන කාලේ කොහොම ඉඹින්න ඇත්ද... මෙහෙම පිස්සු වැටෙන්න... කොල්ලට ඉන්න දෙන්නෙම නැතුව ඇති... එක ගෙදරමනේ උන්නෙත්... රෑට එනවා ඇති...' හිමාලි සිතුවේ එහෙමය.

ඇත්තටම ඒ තරම් අසිහියෙන් දෙයක් වුණා නම් ඒ වූයේ කළු ගං මෝය ළඟ අර හෝටලයේ තනිවූ උදේය. ආදරය ශාරීරික ඇවිළීමක් පමණක් නොවේ. පෙම්වතුන් ශරීරවලින් ඇලෙන්නේ හිත්වල ඇලවීම තහවුරු කරගන්නටය. එය ලෝකෙම දන්න දෙයකි. මාල හතක් දමා මුදු දමා පෝරු මස්තකයේ දෑහිලි බැඳ බඳින දෙන්නා ඇත්තටම බැඳෙන්නේ එදා රෑටය. නෑ සිය හිතවතුන් මැද එකට බැඳෙන දෙන්නාව නෑසියන්ම එකතු වී හනිමූන් එකට පිටත් කර යවන්නේ ඒකය.

අර බැඳීම ඇඟවල් අතුල්ලාගෙන තහවුරු කරගනිල්ලා කියාගෙනය. ශරීරයක රත්වෙන හැඟීම් තාවකාලිකය. ඒවා ඇති වෙයි. නැති වෙයි. සිඳී යයි. නිවෙයි. සන්සුන්ව සීතල වෙයි. ඒත් ආදරය එහෙම නැත. එය සදාකාලිකව උණු දියම ගලන උණු දිය උල්පතක් මෙනි.

වර්ෂාගේ පපුවෙන් නම් මේ මොහොතේ ගලන්නේ උණු දිය නොවේ. ලෝ දියය. එහෙත් එය විමුක්ති දන්නේ නැත.

හරියටම පපුවෙන් ලෝ දිය ගලන තරමට මේ සිහිය ආ වෙලාවට විමුක්ති ඔළුව හැරුණ අතේ දුවනු ඇත. එය හිමාලිද දනී. ඇය මේ හදන්නේ ඊට කලින් ඔහුගේ පපුව පුරා ඇල වෙන්නටය.

'ම්... බොමු...'

තේක රැගෙන එන හිමාලි තේක පුංචි බෙඩ් කබඩ් එක මත තබා ඔහුට දැතින්ම අල්ලයි.

'ඔහොම ඉන්නෙපා... චූ බ..ට දලා නිසා අමාරුයි... කෝ ඇලවෙන්න...'

එහෙම කියා විමුක්තිව යකඩ ඇඳ විට්ටමට හේත්තු කරන ඇය ඇගේ මුළු පපුවේම පහස ඔහුට විඳගන්නට දෙයි. සිල්ක් සාරියෙන් වැසුණු පපුවේ පහස කොල්ලෙකුට දනෙන හැටි ඇය දනී.

'ඇ..හ ර..ස්..නෙයි ව..ගේ..ද...'

හිමාලි නළලට ගෙළට පිටි අත්ල තබා බලයි.

'ඒ නිදි රස්නේ නේ..ද...'

'උ..ණ..ක් නෑ නංගී...'

'තියෙන අසනීප ඔක්කොම වැටිලා හිටිය කාලේ හද ගත්තනේ... දන් හැදෙන එකක් නෑ...'

සාරි පොට ඉදිරියට ගෙන ඇය විමුක්තිට තේ පොවයි. උදේට තවමත් ඔහුගේ අත් හිරි වැටුණු ගතියය.

'අ..යියේ...'

'නංගී...'

'පාස්ට් දේවල් ගැන ගොඩක්ම දන් හිතන්නෙපා... ආයෙත් අවුල් වෙලාම යයි... මේ නහර සනීප වෙන්නත් ටික කාලයක් යයි... ලේ උනන්නේ දන්නේ...'

'ම්...'

හිමාලි තේ පොවන්නේ විමුක්තිගේ ගෙළ පාමුලට සුරත තබාගෙනය. ඒ ඇඟිලිවල රස්නය එහෙමම ඔහුට දනෙයි.

'කරන්න වැඩ ගොඩක් තියෙනවා අයියට... ඒ නිසා හිමිහිට අලුත් ජීවිතයක් පටන් ගන්න...'

විමුක්ති අසරණ ලෙස සිනාසුණේය. අලුත් ජීවිතයක්... එහෙම කෙනෙකුට සියල්ල අමතක කර අලුත් ජීවිත පටන් ගන්නට පුළුවන් නම් බැඳීම් කියා දෙයක් ඉතුරු වන්නේ නැත.

'තේ..ක රහද...'





'හ..රි රහයි...'

'ගියාම මීට වඩා රහට හදන්නම්... මෙහේ බඩු නැනේ...'

'නෑ රහයි නංගී...'

'ඔයා පිස්සු වැටෙන්නේ මේ කෙල්ලගේ ජීවිතේට රහ වැටිච්ච දට...' හිමාලි සිතයි. එහෙත් කොල්ලාගේ පපුවේ ඇත්තේ ඇයට හිතාගන්නටවත් බැරි තරම් රහ කෙල්ලෙකුගේ ජීවන රහය.

ඔස්ට්‍රේලියාවේ සිට ආ විමුක්ති මලක් මෙන් පිපී ආවේ ඒ සුවඳටය. ජීවිතයම හෙල්ලුම් කෑ ආදර කතාවක කෙළවර මේ දුක් ගොඩ තිබූ බව ඇත්තය. එහෙත් ආදරේ අලුතින් පැල වෙන්නට අතු කැල්ලක් පොළොවේ ගැවුණත් ඇතිය. හරියට මයියොක්කා දඬු පැල නොකළත් පැලවෙන්නාක් ලෙසින් ඒවා දළුලයි.

'හිතනවා හිතනවා ඉවරයක් නෑ...' හිමාලිට ලොකු බයක් දනෙයි. මේ හිතන හිතිල්ලට තව මොනාහරි බැලුව ගමන් ඉවරයි. ළඟින් හෙලවෙන්නම නරකයි. මොකා ඇවිත් මොනා කියලා යයිද දන්නෑ...' හිමාලි සිතුවාය.

හයාමාරට පමණ හිමාලි මද රස්නේ ඇති වතුර බේසමක් ගෙනවිත් පුංචි සුදු තුවායෙන් ඔහුගේ වතම ස්පොන්ජ් කොට තවා පිරිසිදු කළාය.

'සරම ඔහොමම තිබ්බදෙන්... අපි ෂර්ට් එකක් මාරු කරමු...'

හිමාලි ඔහුගේ කමිසයේ බොත්තම් විවර කළාය. එහෙම කරද්දී ඇගේ වතම ඔහු ඉදිරියේය. විමුක්තිට බැලුනේ ඇගේ පපුව මැදට වන්නට තිබූ රන් මාලයේ පෙන්ඩනය දෙසය. එය සුදු පපුව උඩ ලස්සනට රැඳී තිබුණි.

ඒ පපුවෙන් එන සුවඳක් ඇයට ළං ළංව දනෙයි.

'ඇහත් චුට්ටක් ස්පොන්ජ් කරමු... ම්...'

විමුක්ති ඒ සියල්ලම කරන්නට ඉඩ දුන්නේය. ඇගේ එක අතක් එහෙමම ඒ පපුව මතය. එය එහෙමම ඒ වත රැඳී තිබුණි. හිමාලි පහළ වත ස්පොන්ජ් කළේ ගොස් දෙරේ අඟුලද දමාය.

'ම්.. හ..රි...'

සරමට පුංචි ගැටයක් ගසා ඇය ඒ මුහුණ දෙස බැලුවේ තුනී

සිනාවක් සහිතවය. පසුව හිමාලි ගොස් ලොක් කර තිබූ දෙරේ අඟුලු ඉවත් කළාය.

විමුක්තිට පුදුමය. කෙනෙක්ට මේ තරමටම තවත් ජීවිතයක් වෙනුවෙන් කැප විය හැකිද...

'මේක අඳිමු...'

හිමාලි ගත්තේ ලා රෝස පාටට හුරු අත් කොට කමිසයය.

'මේ..ක නංගී...'

ඒ කමිසය ඔහු දක නැත.

'මෙහෙම කමිසයක් තිබ්බේ නෑ කියලා මතකද...'

'ම්...'

'ති..බ්..බේ නෑ තමා... දවසක් මං නෝලිමිට් එකට ගිහින් අයියට කොට කලිසම් දෙකකුයි වෙස්ට් දෙකකුයි සැහැල්ලු කමිස දෙකකුයි ගත්තා... තිබ්බ ඇඳුම් අඳින්නම බැරි වුණානේ... ඒවා හිරයි... මේ එහෙම ගත්ත එකක්...'

තුනී විස්කෝස් වැනි රෙද්දකින් මසා තිබූ ඒ කමිසය ඇත්තටම සනීපය.

'ම්.. ද ගමු...'

කමිස අන්දවන්නට හිමාලිට දන් පුරුදුය. අත් දෙකම දමූ ඇය විමුක්තිගේ බඳ ළඟම ඉඳගෙන බොත්තම් පියවන්නට ගත්තාය. එය ඇය කළේ ඉක්මන් ලෙසින් නොවේ. හිමිහිටය.

එක් මොහොතක ඇය බොත්තම් දමන අතරතුර දෑස් එසෙව්වාය. විමුක්ති උන්නේ හිමාලි දෙස බලාගෙනමය.

හිමාලිගේ යටි පතුල් පවා සීතල වීගෙන ගියේ ඒ බැල්මටය. 'මොනවද වෙනවා ඔහොම බලන් ඉඳිද්දී...' හිමාලි සිතුවාය.

'ගෙදර ගියාම...'

'ආ නංගී...'

'චේන් එකක් ද ගමු හොඳේ... කර පාළුයි...'

වචනයක් හැඟීමක් පපුවක් කඩා දමන ලෙස නොව නිවා දමන ලෙස කියන්නට හිමාලිට හැකිය. ඒ ලස්සන ගැණු ළතාව





ඕනවටත් වඩා ඇයට පිහිටා තිබුණි.

'අසනීප වෙන්න කලින්...'

'ඕ..ව් නංගී...'

'ළමයා ජෙල් තලි තලි ගාලා නේද...'

විමුක්ති සිනාසුණේය.

'බාත් රූම් එකේ ජෙල් බෝතල් දෙකක්ම තිබ්බා... මං පළවෙනි පාරට ඔළුවට අත තියද්දී කොණ්ඩෙම නාස්ති වෙලා...'

'මගේ...'

'නැතුව මගේයැ...'

'ටි..ක..ක් වේලිලා නම් තමා තිබ්බේ...'

'ටිකක් නෙමේ... හොඳටම වේලිලා තිබ්බේ... මං ඉතින් තෙල් ගාන්න ගත්තා... දන් බලන්න මේ කොණ්ඩේ...'

හිමාලි ඔහුගේ අත ඇයම ගෙන ඒ කොණ්ඩයට තිබ්බාය. සැබෑය. දන් හිසකේ මෘදුය.

'තේරෙනවද...'

'ම්...'

'මං හොඳට කළු කරලා තියෙන්නේ... දන් ජෙල් තහනම්... තෙල් චුට්ටක් යාංතමට දලා ඔළුව ටිකක් මසාජ් කරලා පීරුවම අයියේ ජෙල් වලට වඩා ලස්සනයි...'

දන් ඇය කොණ්ඩය පීරයි.

'මේ... දක්කද...'

හිමාලි ඔහුගේ අත ගෙන පෙන්නුවාය. ඒවාවල නියපොතු ලස්සනට කපා ඇත.

'මං මගේ නියපොත්තක කියුටෙක්ස් ටිකක් ගෑවේ නෑ... ඒ වුණාට මේවා ලස්සනට තිබ්බා... හොඳද...'

විමුක්ති හිස වනයි.

'මේ පිළිවෙල බිඳ ගන්නෙපා අයියේ හොඳද...'

විමුක්ති සිනාබරව ඒ දෑස් දෙස බලා උන්නේය. ඔහුට කරන්නට

වෙන දෙයක් තිබ්බේද නැත. දෛවය ඔහුට සිහිය එද්දී මේ දේවල් ඔහු වටා හද තිබුණි. ඊට එරෙහිව දෙයක් කරන්නට ඔහුට නොහැක.

ජීවිතේ අමාරුවෙන් අල්ලාගෙන ගොඩට එන්නට හදද්දී කෙනෙක් ජීවිතය වටේ ඇති සියල්ල කඩා බිඳ දමන්නේ නැත. එහෙම ජීවත් වන්නට අමාරුය. ඇත්තටම අමාරුය.

‘මේ දක්කද... පොඩි බබෙක්ට ක්‍රීම් ගාලා ක්‍රීම් බෝතලේ දන් චුට්ටයි තියෙන්නේ...’

ඇත්තටම කෝමාරිකා ක්‍රීම් බෝතලයේ තිබ්බේ ටිකකි. ඒ ඔක්කොම ගෑවේ ඔහුට නොවේ. මහ රෑට ඔය ක්‍රීම් එකෙන් තලි තලි ගෙන වැඩිපුරම ගා ගත්තේ ඇයටය.

‘මේ සුවඳ...’

ක්‍රීම් තැවරුණ අත්ල ඇය විමුක්තිගේ නැහැයට ළං කළාය. ඊටත් පසු ඒ අතක් ගෙන හිමිහිට ක්‍රීම් ගෑවාය.

‘ඇඟට සීතලයි නේද...’

‘ම්...’

‘ඇලෝවේරානේ... කෝමාරිකා... ඒකට සීතලයි...’

ඇත්තටම කෝමාරිකා සාරය අඩංගු ක්‍රීම් ගාද්දී සීතලය. අත් වල ක්‍රීම් ගැල්වූ හිමාලි ඊටත් පසු පහළට ගොස් දෙපා වලද ක්‍රීම් ගෑවාය. කකුලේ උඩ සිට පහළටම ක්‍රීම් ගැල්වූ ඇය අවසානයේ මුහුණ දෙපස දෑත් තබා එහිද ක්‍රීම් ගෑවාය.

‘ඔන්න දන් බබාගේ වැඩ ඉවරයි... ඇ..ඟට ස..නීප..ද...’

‘හ..රි සනීපයි...’

‘ගෙදර ගියාම නාමු හොඳද...’

‘ම්...’

‘කොච්චර වෙලා නානවද ඉස්සර...’

‘විනාඩි පහයි...’

‘මං පැයක් නාවනවා... ෂැම්පු දලා පස්සේ ඔළුව හෝදලා කන්ඩිෂනර් දලා විනාඩි පහක් තියනවා... එතකල් කකුල් හෝදනවා...’

හිමාලි අඳින සිතුවම් ඔහු දිගටම මවාගනී. කරන දෙයක්





කොහොමත් ඉක්මනට කළ යුතුය.

‘තව තේකක් හදලා දෙන්නද... ප්ලේන්ටි එකක්...’

‘දෙ..න්..න..ම බො..මු නංගී...’

‘අ..යියේ...’

හිමාලි කතා කරන්නේ තේ හදමිනි.

‘නංගී...’

‘ගෙදර ගියාම චුට්ටකට නුවර දුවලා එන්න යන් හොඳේ... මගේ බාරේ ඔප්පු කරන්න...’

‘හා...’

‘මං ඒ සතියම මස් මාළු නොකා ඉන්න ඕන... පුළුවන් ඉක්මනට යන්...’

මේ ජීවිතය වෙනුවෙන් පේ වෙන්නේ තමා යැයි හිමාලි විමුක්තිට දනවයි. ‘ඔයා කොහොමත් යුතුකම් දන්න මිනිහෙක්... ඒ නිසා ඔයාට බෑ මාව අහක දන්න... බාරගන්නම වෙනවා... ඒ නිසා මේ අල්ල ගත්ත අත අතාරින්නම නරකයි...’

‘මාළිගාවට බාරයයි නාථ දේවාලෙට තව බාරයයි තව විනායාග මූර්ති කෝවිලට තව බාරයයි... දවස් දෙකක් උන්නම ඇති...’

‘අ..පි එ..හේ ගියාද නංගී...’

‘ම්.. හැබැයි අයියේ ගියාම ඉන්න වෙන්නේ අපේ දුප්පත් ගෙදර තමා හොඳද...’

විමුක්ති සිනාසුණේය. දුප්පත් ගෙවල් වල ඉඳ දුප්පත් කෙල්ලෙකුට ආදරය කර ඒ මතක පුරුද්ද ඔහුට හොඳට ඇත.

‘එහේ නැයෝ ඉන්නේ අයියේ...’

‘නුවර...’

‘ම්... කරුණාරත්න මාමලා එයාලගේ දුවලා එතකොට ඔය මානෙල් පුංචිලා එහෙම...’

‘ඉති..න්...’

‘නෑ එ..ක එ..ක ක..තා අම්මට කියලා තිබ්බා...’

'මො..නාද...'

''ඒවා ඕන නෑ... පස්සේ මං නුවර ගියේම නෑ... ගියත් හවස ගිහින් උදේ ආවා...'

ඇය මේ කියන්නේ දන් තමාට නුවරත් ඉන්නට බැරි බවය.

'ගතු කිව්ව නැයෝ හෙට අනිද්ද එයි ඔයාව බලන්න පෝලිමට... සුදු පුතේ අයියේ කියාගෙන... එදටත් මම පැත්තකට වෙලා ඉන්නවා...'

'මං එයාලා එක්ක එච්චර නැනේ නංගී...'

'ඔව්... ඔයා මත්වෙලා වැටිලා හිටියේ රත්නපුර නැන්දගේ දුවගේ පැණි හැලියෙනේ... නුවර පැත්ත බැලුවේවත් නෑ...' හිමාලිට කියන්නට හිතෙන්නේ එහෙමය.

'ලෝ..කෙ හ..රි පු..දුමයි...'

හිමාලි දිග සුසුමක් හෙළා කීවාය.

'කාටුත් බලන්න ආසයි නේද...'

'ම..ම...'

'ම්...'

'බැලුවද...'

'බැලුවෙම ඒවා... හිතාවෙවී බලාගෙන ඉන්නවා පොඩි එකා වගේ... සීඩී දලා බැලුවේ... සූර පප්පා එකට තමා ආසම... රෑට බලනවා...'

විමුක්ති සිනාසුණේය.

'ඒවා අත් අරින්නත් එපා... නරක කාලේ අයියේ හොඳ දේවලුත් සිද්ධ වුණා... ගියාම බලමු...'

අසාමාන්‍ය ලෝබකමකින් උතුරන බැල්මක් ඇය හෙළුවාය. පිරිමියෙකුගේ හදවතක ලේ නහර උණු කරන එවැනි බැල්මක් යුවතියකට හෙළිය හැක්කේ ඉතා සීමිත වාර ගණනක් පමණි.





# 33

ප්‍රියංවදාත් වර්ෂාත් නවලෝක රෝහලේ සුජාතාට කතා කළේ උදේ හතහමාරට පමණය. මොකක්දෝ හේතුවක් නිසා රෝහලේ තත්වය දනගත යුතුම යැයි වර්ෂාටද සිතුණි.

'කෙල්ලේ...'

'ම්...'

'රිං වෙනවා... උඹම කතා කරපන්...'

ප්‍රියංවද දුරකථනය වර්ෂාට දුන්නාය.

'සුජා ම..ම.. වර්ෂා...'

'අ..නේ ගුඩ් මෝනිං කෙල්ලේ...'

'මෝ..නිං සුජා ද..න්..ද ආවේ...'

'ඔව් වර්ෂා... ඔය අනුරාධපුරේද...'

'ඔ..ව්... ආයෙත් කරදරයක් කරන්නයි කතා කළේ...'

'ඒක මොකක්ද කෙල්ලේ... කියපංකෝ...'

'එ..යාට කො..හො..මද ද..න්..නෑ සුජා...'

'විමුක්ති අයියට නේද...'

'ම්...'

'මං ඊයේ ගියේ නෑ... අද උදේම යන්නම්... ගිහින් උඹට ගන්නම්...'

'උඹට පින් සූජා...'

'මං බලලා ගන්නම්කෝ...'

සුජානි දුරකථනය තැබූ පසු වර්ෂා බැලුවේ ප්‍රියංවද දෙසය.

'බ..ල..ලා ග..න්..නම් කි..ව්වා ප්‍රියා...'

'කෙල්ල යයි...'

'ස..නීප වෙලා නම් නේද ප්‍රියා...'

'උඹ තිබ්බ බෝධි පූජාවේ හැටියට සනීප වෙන්නම ඕන...'

පුදුමය. ඇත්තටම කොළඹ උන් විමුක්ති සනීප වූයේ ඒ ප්‍රතිකාර වලටම නොවේ. හිමාලි මවන ඇගේ සත්කාර වලටම නොවේ. එද රෝහලේදී කෙල්ලව දැක ඇතිවූ කම්පනය නිසාය. කෙල්ලව දකිත්ම විමුක්තිගේ මාස ගණනාවක් පුරා... තදවී තිබූ නහර බුරුල් වී උණු විය. එද ඇය අවසිහියෙන් මෙන් ඔහුව වැළඳගෙන ඉඹ ගනිද්දී ඒ වතට මොනවද විය.

ඒ රස්නය වතට වැටුණ මොහොතේ සිට විමුක්ති උන්නේ යළි නැගිටිමිනි. ඔහු නැගිට්ටේ ඒ අදහස නිසා මිසක හිමාලි අතුල්ලන කෝමාරිකා ක්‍රීම් වලට නොවේ.

මිය ගිය... හිරි වැටී ගිය... හදවතක් ප්‍රාණයක් වතක් හිතක් එහෙම ඇලෝවේරා ක්‍රීම් ගා පණ ගස්සවන්නට බැරිය.

කෙල්ල ජය ශ්‍රී මහා බෝධියේ බෝධි පූජාව පටන් ගත්තේ එද ආ පසුය. බෝධිය නැවූ කිරි කල වලට පුංචි විමුක්ති වෙනුවෙන් තනයෙන් ගැලූ කිරි බිංදු දෙක තුනක්ද ඇය දම්මාය.

ඇය බෝධි පූජාව කළේ එලෙසිනි. ලේ කිරෙනි. දෙයියෝ බුදුන් පවා කොල්ලාගේ තාත්තාව නැගිට්ටෙව්වේ ඒ අනුහස් වලටය.

ඒත් ඒ අනුහසින්... අනුරාධපුරයේ බෝධි වටේ යමින් කෙල්ල කළ වීර්ය පාරමීතාවයෙන් නැගිට්ට විමුක්ති කෙල්ලගේ කිසිවක් දක්කේ නැත. දක්කේ හිමාලිවය. ඇය කියූ දේවල්ය. මැවූ දේවල්ය.

පුදුමත් ඒකමය.





'ඇයි ස..ත්..ත..රන් ම්... කුක්කු ඕන... බාගිනියි මගේ පැටියට... ම්... බෑ බෑ... දත් මදින්නැතුව කුක්කු බොන්න බෑ... ද..ත් නෑ... ලේන් අම්මි දත් දුන්නෑ පැටියට.. ආ සුද්දේ... ඇයි ඔච්චර පෙරේත... ම්...'

දහසක් සුරතල් බස් කියන වර්ෂා කිරි කැටියාව පපුවට ගනී. තාම ලේ කැටියාය. ඉපදී දවස් කීයද... ඒත් වර්ෂාට හිතෙන්නේ එහෙම නොවේ.

දන් සුදු තනය කොල්ලා උරයි. වර්ෂා උන්නේ පුදුමයෙන් බලාගෙනය. 'කවුරු හරි පුරුදු කරලා වගේ තනේ උරන්නෙ...' ඇය ඒ තුනී හිස අතගාමින් සිතයි.

'ඔයා අම්මි කුක්කු බොන එක නතර කරන්න කලින් අපේ තාත්ති එනවනම්... මට ආසයි පෙන්නන්න... එයා බලාගෙන ඉදියි...'

මේවා දෙවියන් කරන වැඩද... දෛවය කරන වැඩද... මෙහෙම දහස් වර සිතන ඔහු දන් හිමාලි ළඟය. වර්ෂා කිරි පොවන අතරතුර පුතාගේ කන් පෙති අතගෑවේ උදේ කිරි බිබී ආයෙත් නිදගන්නට යන නිසාය. උදේට එහෙම නිදගත් විට පාළුය.

'අම්මි පැටියෝ පුංචි හෝටලයක් දනවා... ඒකේ නම වැවේ කැෆේ... ලොකු වෙලා මට උදව් කරන්නෝන... හොඳද... වද දෙන්න බෑ කුක්කු චන්ඩියා... මගේ සත්තරං වද දෙන්නෑ නේද... මගේ නාරං පැටියා...'

වර්ෂා පුදුමාකාර ආදරයකින් කොල්ලාගේ වතම අතගායි.

* * * * * * * * * * * *

සුජානි විමුක්තිගේ රෝහල් කාමරයේ දොර අරිද්දී හිමාලි උන්නේ ඔහු ළඟටම වී තේ පොවමිනි. එක අතකින් තේ පොවමින් අනිත් අතින් ඔහු ආදරයෙන් අල්ලාගෙන උන් හිමාලිව දකිද්දී සුජානිට බොහෝ දේ සිතුණි. 'කෙල්ලට ළං වෙන්නවත් බැරි වෙයි...' සුජානිට සිතුණි.

‘එ..න්..න නර්ස්...’

‘කමක් නෑ... මං පස්සේ එන්නම්...’

‘කමක් නෑ එ..න්..න තේ බීලා ඉවරයි...’

හිමාලි ඒ මුව පිස දම්මේ සාරි පටිනි. ‘මාරයි’ සුජානිට සිතුණි.

‘වි..මු..ක්..ති ස..ර්ට දන් ස..නීපද...’

‘ඔව් නර්ස්.. අයියට දන් හොඳයි... නර්ස් මේ වෝඩ් එකේ නෙමේද...’

‘නෑ මං ස..ර්ව ගෙනාපු දවසේ ඩ්‍යුටි කරන්න ආවා...’

සුජානි බොරුවක් කීවාය.

‘මේ ආපු ගමන් සර්ව බලලා යන්න ආවා...’

සුජානි විමුක්ති සමඟ සිනාසුණාය. විමුක්තිද සුහද ලෙස සිනාසුණේය.

‘ස..ර්ට මාව මතකද...’

‘එ..හෙ..ම... ම..ත..ක නම් නෑ..නේ...’

‘ගො..ඩක් නර්ස්ල ආවනේ නර්ස්...’

‘ඒක තමා මිස්... වොෂ් කරන්න ඇටන්ඩන්ස්ලා ආවද මිස්...’

‘මං වොෂ් කරලා තියෙන්නේ... එයාලට කරන්න දෙන්න නෑනේ...’

‘ආ... එහෙනම් ය..න්නම් සර්... විෂ් යූ ස්පීඩ් රිකවර්...’

සුජානි පැතුවේ ලෙඩුන්ට පතන සුලභ පැතුමකි. ඉක්මන් සුවවීමක් පතනවා කියාය.

‘හී හැස් ඕල්රෙඩී රිකවර්ඩ් නර්ස්... විෂ් හිම් ෆෝ හැපි හෝම් කමිං...’

හිමාලි ඉංග්‍රීසියෙන්ම කීවාය. විමුක්තිට බැලුනේ ඒ මුව දෙසය. සුජානි යංතමට සිනාසී කාමරයෙන් ගියාය.

‘නේ..ද අයියේ... තව මොනා සනීප වෙන්නද...’

හිමාලි කියද්දී විමුක්ති සිනාසුණේය.





‘නංගිට හොඳටම ඉංග්‍රීසි කතා කරන්න පුළුවන්ද...’

‘චු..ට්ටක්... පස්සේ ටිකක් අයියගෙන් ඉගෙන ගන්නෝන...’

ඒ කතාව කිව්වේ සෑහෙන කාලයක් ඇය රැඳෙන බව කියන්නටය.

‘ඔය හොඳට කතා කළේ...’

‘කතා කරන්න කෙනෙක් නෑනේ... ඉතින් දන්න ටිකත් අමතක වෙනවා...’

විමුක්ති බලාගෙනම උන්නේය. ඇත්තටම ඔහුගේ සිතේ හිමාලි ගැන ඇතිව ඇත්තේ ප්‍රසාදයකි. ඒත් එය පපුව කළඹවාලූ කුණාටුවක් වන තුරු ඇය බලා උන්නාය.

වටින්නේ පිරිමින්ගේ පපු කඩාගෙන එන එවැනි කුණාටුය.

* * * * * * * * * * *

සුජානිට විමුක්තිගේ කාමරයෙන් පිටට එද්දී බොහෝ දේ සිතුණි. ‘මාර කෙල්ලෙක් විමුක්ති අයියා ගාව ඉන්නේ... ලේසි නෑ...’ සුජානි සිතුවාය. ඇය විමුක්ති උන් වාට්ටුවේ නර්ස් ඩෙස්ක් එක වෙතට ගියේ තව ටිකක් කරුණු දනගන්නටය.

‘ගුඩ් මෝනිං සුජා... මොකද මේ පැත්තේ...’

‘ආ... අපට දන් මේ පැත්තේ එ..න්න බෑ... උඹලට විතරයි මැටනිටි වෝඩ් එන්න පුළුවන්...’

‘අපි ඉතින් කවදහරි මැටනිටි වෝඩ් එන්නම එපැයි බං...’

හෙදිය සිනාසී කීවාය.

‘චාරු...’

‘ම්...’

‘අර විමුක්ති ස..ර්ට දන් කොහොමද... ටූ සීරෝ ෆයිව් වල ඉන්න...’

‘ඒ සර්ට දන් හොඳයි සුජා... මං හිතන්නේ හොඳටම හොඳයි...

ඔය ගර්ල් ෆ්‍රෙන්ඩ් එක්ක හොඳට ඉන්නේ... මාර ල..ව්...'

'එයා...'

'ම්... මං හිතන්නේ ඊයේ රෑ පැයක් නිදාගත්තේ නෑ... පාන්දර තුනටත් ඇවිත් කතා කළා...'

'එ..ච්චර...'

'ලව් කරන්න ගියාම එහෙම තමා සුජා... ෆන් රස ඕනවට වැඩියි...'

හෙදිය කිව්වේ ජනප්‍රිය පැණි බීම වර්ගයක දැන්වීමක ගිය පාඨයකි. සුජානි සිනාසුණාය. 'අනේ දෙයියනේ එතකොට අර පිච්චි පිච්චී ඉන්න කෙල්ල...'

සුජානි පහළට ගියේ වර්ෂාට මොනවා කියන්නදැයි සිතා ගන්නට බැරුවය. කෙල්ලෙක්ගේ මූණට අරම කියන්නේ කෙසේද... 'ඒත් ජීවිතයක්නේ...' සුජානිට සිතෙයි.

සුජානි පහළට පැමිණ දහ අතේ සිතුවාය. 'මේ දක්ක දේවල් කිව්වොත් කෙල්ල මැරෙයි... මේ අලුත් ආලයක් වගේ...' සුජානි සිතුවාය. මේ මොනවත් කෙල්ලට නොකියා දැන් සුවවීගෙන එන්නේ යැයි කියනවා යැයි සුජානි සිතා ගත්තාය. කතා කරන්නේ ප්‍රියංවද නම් මේවා කිව හැක. එහෙත් වර්ෂාට කිව නොහැක.

'කෙල්ලෙක්ට ඒක දරාගන්න අමාරුයි... ඒකිට බලන්න එන්නත් බෑ...'

සුජානි අවසානයේ ගත්තාය. නාද වෙද්දීම ගත්තේ වර්ෂාය.

'සුජා...'

කෙල්ල උන්නේ කොතරම් තද ආදරයකින්දැයි සුජානි දනී.

'එ..යාට කො..හො..මද සුජා...'

සුජානිට වචනයක් හද ගන්නට පවා අමාරුය.

'වි..මුක්ති අයියට කෙල්ලේ ද..න් ස..නීප වේගෙන එ..න්නේ...'

'අ..නේ ඇත්තමද...'

'ඔ..ව්.. ද..න් ටි..ක ටි..ක කතා කරනවා...'





'සිහිය ඇවිත්ද...'

'ඒ ව..ගේ... තාම හොඳටම හොඳ නෑ... ඒත් ඇවිත්...'

'උ..ඹ..ට පි..න් සුජා මේක කිව්වට... මං පිච්චි පිච්චී උන්නේ...'

'දක්ක දේවල් කිව්වොත් පිච්චිච්ච උඹ අළුවෙලා යයි...' සුජානි සිතුවාය.

'සුජා...'

'කෙ..ල්ලේ...'

'එයා ගා..ව ක..වු..ද හිටියේ...'

කෙල්ල කෙළ පොදක් ගිල්ලාය.

'මේ.. මං ඒක ද..න්නේ නම් නෑ... දෙතුන් දෙ..නෙක් උ..න්..නා...'

'ම්...'

'හෙට අනිද්දා ටිකට් කපයිද සුජා...'

'ඒ ව..ගේ කෙ..ල්ලේ...'

'ගෙ..දර එ..ක්..කං ය..යි නේද...'

'උ..ඹට බලන්න විදිහක්ම නැ..ද්ද...'

'නෑ සු..ජා...'

'දැන් නම් උඹට කොහොමත්ම බලන්න ලැබෙන්නෑ...' සුජානි සිතින් කීවාය.

'කෙල්ලේ...'

'සුජා...'

'මෙ..හෙම ඉඳලා ඉතින්... උඹට විමුක්ති අයියව හම්බවෙන්නත් බැරිනම්...'

'ද..න්..නවා සුජා...'

'ඔහෙට වෙලා...'

'ම්...'

'තේරුම...'

'එ..යා ද..වසක එ..යි සූ..ජා...'

එයිද... සදහටම යන්නටම යයිද.... දන්නේ නැත. 'ඒ කෙල්ල හිටපු හැටියට ලේසියෙන් විමුක්තිව අත් අරින්නෑ...'

'සුජා...'

'ම්...'

'එයාට සිහිය ඇවිත්...'

'ඉතින්...'

'මාව අ..හ..න..ව..ද දන්නෑ නේද...'

සුජානිගේ පපුව හෝස් ගා ද ගියේය. 'උඹ ගැන අහන්න තියා හිතන්නවත් එයා දෙන්නේ නැතුව ඇති...' ඒත් සුජානි ඔය ටික කිව්වේ නැත. මේ අහිංසක පපුවට ගිනි අඟුරු විසි කළ නොහැක.

'මං ළ..ඟ උ..න් නෑනේ කෙල්ලේ...'

'ම්...'

'අහනවා ඇති... එයා එහෙමයි... බබා කියා ගත්ත ගමන් හිටියේ...'

'උ..ඹට බබාද කිව්වේ...'

'ම්...'

'දෙයියන්ටම කියපං කෙල්ලේ...'

'ම්...'

වර්ෂා ඇඹුම්බර ලෙස හූමිටි තිබ්බාය.

සුජානි කතා කළ පසු වර්ෂාගේ නෙත් පුරා කඳුළුය.

'තාත්තිට සනීප වෙලාලු පැටියෝ... දැන් එයා අපිව හොයයි... තාත්ති එහෙමයි... එයාට අම්මි නැතුව ඉන්නම බෑ... හරි වදේ ඉතින්...'

වර්ෂාට ඇඬෙයි. ප්‍රියංවද පැමිණ කෙල්ල ළඟින් ඉඳගත්තාය.

'කෙ..ල්ලේ...'

'අයියට සනීප වේගෙන එනවලු ප්‍රියා... ගොඩක් හොඳලු...'





'සුජා කිව්වද...'

'ම්...'

'අනේ ජය ශ්‍රී මහා බෝ සමිඳු පිහිටයි...'

ප්‍රියංවද කිව්වේ වැඳගෙනය.

'පුදුමයි නේද ප්‍රියා...'

'ඒකනේ... උඹ ගිහින් අත තිබ්බා විතරයි...'

'මං ඒක දන්නවා ප්‍රියා...'

'උඹ බයවෙන්නෙපා... හොඳ දෙයක් වෙයි...'

'මාව හොයනවත් ඇති...'

'අපි බලමු...'

'නෑ ප්‍රියා මං යන්නෑ... එහෙම ගිහින් අමාරුයි... මෙහෙම ඉන්නවා...'

'උඹට ඉන්නම වෙනවා කෙල්ලේ...'

'ම්...'

'අර සකබඹරේ ඇති අයියා ගාව...'

'ම්.. සුජා කියන්නෑ... ඒත් ඇති...'

'උඹට දුකයි...'

'බෑ ප්‍රියා... එයාට බෑ...'

'මොනාද...'

'ඒ පපුව එහෙම හොල්ලන්න බෑ...'

ඒත් දෛවය නරකම අතට පෙරලෙන වෙලාවල් ඇත. ගල් කුළු පවා හරහට පෙරලෙන වෙලාවල් ඇත.

'බෝධි පූජාව සම්පූර්ණ කරන්න ඕන...'

'කරමු...'

'කිරි පිඬු පූජාවකුත් දෙන්න ඕන... සමන් දේවාලෙට තිරයකුයි රූපෙකුයි පූජා කරන්න ඕන...'

'තව...'

'පත්තිනි දේවාලෙට මව්කිරි දලා හදපු කිරිබතක් දෙන්න ඕන...'

'ම්..'

'බාර ටික ඔක්කොම මං ඔප්පු කරනවා... තව බාර වෙන්නෑ...'

'ඇයි...'

'ඉතුරු ටික දෙයියන්ට කරන්න බෑ ප්‍රියා... මගේ දෙයියම කරන්න ඕන...'

ප්‍රියංවද කෙල්ල දෙස බලාගෙනම උන්නාය. ආදරයක් වෙනුවෙන් නැහෙන ගෑණියෙක්ගේ පපුවකට ගරහන්නට හොඳ නැත. යා දෙන්නේ නැත.

'කෙල්ලේ...'

'ප්‍රියා...'

'දන්ම නෙමේ... ටිකක් ඉඳලා...'

'ඉතින්...'

'අයියට ගනිං...'

'ම..ම...'

'ම්...'

'එහෙම ගන්නේ කොහොමද ප්‍රියා... එයා මේ මොනවත් නොදන...'

'ඒකත් ඇත්ත... ප්‍රාතිහාර්යයක්ම වෙන්න ඕන...'

'එ..හෙම වෙයි...'

එය ආදරයක් නමින් හදවතක ඇති විශ්වාසයය. අධිෂ්ඨානයය.

'මෙතන ඉඳලා දෛවයට ඉඩ දෙනවා. අපි හෝටලේ කරගෙන ඉමු දන්...'

'ම්...'

'ආයෙත් මං කඩා වැටෙන්නෑ ප්‍රියා... ගොඩක් දේවල් උනා...





මං ඇඩුවා... පන්සල් ගානේ බෝධි වටේ ගියා... දන් ඇති... එයාට දන් මං ඉන්න පැත්තවත් දනෙන්න ඕන...'

'ඕ..ව්... එහෙම වෙ..න්නම ඕන...'

'මං මගේ යුතුකම කළා... එයා වෙනුවෙන් ලොකුම යුතුකම කරන්න දන් මං හිත හද ගන්නවා...'

'ඒ මොකක්ද...'

'මේකව ලස්සනට හදගන්න පටන් ගන්නෙක...'

'අපි එකතු වෙලා හදමු...'

'ම්.. කොහොමත් සනීප උනත් මට ඒ ගෙදරට බුක් ෂොප් එකට යන්න බෑනේ... ඔය ඔක්කොටම දන් මං වැරදිකාරි වෙලා ඉන්නේ... එද පන්නද්දී කෑ ගහලා ආවාට දන් හයියක් නෑ... දන් මාත් අම්මා කෙනෙක්නේ ප්‍රියා...'

කෙල්ල නාසය උඩට අදියි.

'තව ගොඩක් දේවල් වෙයි... එහෙම නොවී තියෙන්නෑ...'

'කිව්වේ...'

'පරණ සන්නිය පටන් ගනී මොරගොඩ ගෙදර... එයාලා පුතාට අලුත් ජීවිතයක් දෙන්න හදයි... එහෙම වෙද්දී මට මගේ කොල්ලව උස්සගෙන ඒ දෙරකඩට යන්න බෑ...'

'හිතන්නවත් එපා...'

'මේඩක්කලා උනත් වෙනස් වෙලා ඇති...'

'උඹට එහෙම හිතෙනවද...'

'මොනවද නොවෙන්නේ ප්‍රියා...'

ඇයට හිතෙන මේ දේවල් ඇත්තටම සිදු වී ඇත. පුදුම ඒවා එහෙමම වර්ෂාට සිතෙන එකය.

'උඹ දන්නවද... දන් මං කතා කළත් එයාට මාව එක්ක යන්න බෑනේ... ආයෙත් එතකොට ප්‍රශ්නේ මුලට එනවා... වෙන දෙයක්



Hemantha007
For Free Distribution Only

වෙච්චදෙන්... වට දහක් කැරකිලා හරි එයා එයි... එන්නම වෙනවා...'

'එදට මේකා ලොකු වෙලත් ඉදී...'

වර්ෂා සිනාසුණාය.

'ඔ..ව් ලස්සන පුතෙක් වෙලා ඉදියි... විඳවන එක දන් දුකක් නෙමේ ප්‍රියා... බලාපොරොත්තුවක් නැතුව විඳවනවට වඩා බලාපොරොත්තුවක් පපුවේ තියාගෙන විඳවද්දී දුක අඩුයි...'

වර්ෂා කීවේ පොඩි එකාගේ චූටි දෙපා අල්ලාගෙනය. ඒ දෙපා වල සිනිඳු බව ඇගේ අතට පුදුමාකාර ලෙස දනුණි.

'බුක් ෂොප් එකටත් දන් යයි...'

'ම්...'

'එයාට එහෙම අමතක කරන්න බෑ... එහෙමයි ප්‍රියා අපි උන්නේ...'

'මං දන්නවා කෙල්ලේ...'

'ජීවිතේ රැක ගත්ත හැම දේම එයාට දෙද්දී බයක් හිතුණේ නැත්තේ ඒකයි...'

'ඒක එයත් හිතන්නම ඕන...'

'මාත් කියන්නේ ඒකයි... හිතන්න ඕන... ඒත් මං හිත්තවන්න යන්නේ නෑ... මං එයා බලන්න යන්නෑ... එයා මාව බලන්න එන්න ඕන...'

වර්ෂා යටි තොල හපාගෙන කීවාය. අනන්ත කරදර මැදත් කෙල්ලගේ පපුවේ ඇති ආත්ම අධිෂ්ඨානය පුදුමය.

*වර්ෂා - විමුක්ති පෙම් කතාවේ*
*9 වෙනි දිග හැරුම මින් නිමාවේ.*

***වර්ෂා-10*** *ළඟදීම පිටවේ.*



Hemantha007
For Free Distribution Only



# වර්ෂා 9

You are the only releaving shower on my parched soul

ඔබ මගේ දැවී ඉරිතැලුණු ආත්මයට වට එකම අනෝරා වර්ෂාවයි...

කොහේ කොතනක උන්නත් මම...
ඔහේ පාවෙලා වගේ ඇවිත් හිත...
ඉබේ වැටෙනවා ඔබ ළඟට...
අනේ පුදුමයි එහෙම වෙනකොට...

මේයි කියලා කියන්න බැරි සතුටක්...
මේ විශ්වයේ කා ළඟවත් නැති සැනසීමක්...
දැනෙනවා ඔබේ දෑස් ළඟ...
අනේ අංජනයක්ද ඔය දෙනුවන...

පියාගෙන දෑස... තබා ඔබ පපුවට හිස...
දරු පැටියෙක් වගේ නිදන කොට...
මතුරනවා වගේ ඔබ තුන් පිරිත් පොත...
ඒ තරම් පින්බරයි තුන් හිත...

නොදොඩා ඉන්නේ ඇයි කියලා...
හැමදාම අහනවනේ ඔබ...
මට ඇත්තටම බයයි එක වදනකින් පවා...
බිඳෙනවා දකින්නට ඔබගෙයි මගෙයි සමාධිය...

ප්‍රේමය භාවනාවක්... ඔබ මට කමටහනක්...
සුව සදන මේ උකුල මට අසපුවක්...
තාරකා ඇසිපිය සලන මේ දෑස...
අනේ මේ හදවතට උතුම් නිර්මාණයක්...

කොහේ කොතනක උන්නත් ඔබ...
[illegible] න් මා ගාවට...
[illegible] වූ කුටියක...
සින්නක්කරයි ඔබට මේ ප්‍රේමය...

සුජීව ප්‍රසන්න ආරච්චි

Hemantha007
For Free Distribution Only

Lake House Bookshop
9010821
Rs.350.00
021357
0192L25GR1101CHM2100/LO

Rs: 350/=

...lara Author Photograph:Waruna Sooriyaarchchi
MADHARA BOOKS